මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
Central Environmental Authority

වාර්ෂික වාර්තාව - 2021



පරිසර අමාත්‍යාංශය
சுற்றாடல் அமைச்சு
Ministry of Environment

දැක්ම

විශිෂ්ට සේවාවක් තුලින් "
පිවිතුරු
හරිත පරිසරයක් "

මෙහෙවර

"මනා සම්බන්ධීකරණය, ප්‍රවර්ධනය,
මහජන සහභාගීත්වය, නීති ක්‍රියාත්මක කිරීම,
නිසි තාක්ෂණික මැදිහත්වීම්
සහ
පරිසර අධ්‍යාපනය හා දැනුවත්කිරීම් මඟින්
පරිසරයේ ගුණාත්මක බව සුරකින
සහ
හසුරුවන ජාතියේ පෙර ගමන්කරු"

පෙරවදන

2021 වර්ෂය සඳහා වූ මෙම වාර්ෂික වාර්තාව මෙම අධිකාරියේ අංශ / ඒකක 15 ක, පළාත් කාර්යාල 09 ක අධ්‍යක්ෂවරුන්, ඒකක ප්‍රධානීන් හා පරිසර සභාව විසින් සපයනු ලැබූ තොරතුරු මත සම්පාදනය කරන ලදි. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය හා අදල තොරතුරු මෙහි අන්තර්ගත වී ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ප්‍රධාන කාර්යාලයේ ඒ ඒ ප්‍රධාන අංශ / ඒකකයන්හි හා පළාත් කාර්යාල වල ප්‍රගතිය පිළිවෙලින් වාර්තා වී ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාර හා යහ පාලන ගුරු උපදෙස් අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික ප්‍රගතිය, වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාව ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවට ද ඉදිරිපත් කළ යුතුය.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා ඒ ඒ අංශ / ඒකක/ පළාත්කාර්යාල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය තොරතුරු සපයා දෙමින්, දෙනු ලැබූ අගනා සහයෝගය හා දායකත්වය සම්බන්ධයෙන් ඔවුනට ස්තූතිය පිරිනැමීම සඳහා සැලසුම් හා පසුවිපරම් ඒකකය මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නෙමු.

සැලසුම් ඒකකය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමාගේ පණිවුඩය

මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇතුළත් විගණනය කරන ලද ගිණුම් ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඇති වී ඇති සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි දී පරිසර සංරක්ෂණය පිළිබඳ කටයුතු කරන ප්‍රධානතම ජාතික ආයතනය වන මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික අවශ්‍යතා සහ සංවර්ධන අවශ්‍යතා එක් පොදු වේදිකාවක් තුළට ගෙන ඒමෙන් ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් සිටී.

පිවිතුරු හරිත පරිසරයක් උදෙසා ක්‍රියා කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ප්‍රධානතම නෛතික මෙවලම ලෙස ක්‍රියා කරයි. කර්මාන්ත ක්‍රියාකාරකම් වලින් මුදා හරින වායුන් හා දූෂකාරක ජාතික පාරිසරික පනතේ ඇති ප්‍රතිපාදන ඔස්සේ පාරිසරික තත්වයන්ට අනුගත වන ලෙස කර්මාන්ත වල මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය භාවිතා කරයි. 2021 වසරේ දී එකී පරිසර ආරක්ෂණය සඳහා මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත 947 ක් සඳහා සහ මධ්‍යම ප්‍රමාණයේ දූෂකාරක කර්මාන්ත 517 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇත.

අවාසනාවන්ත ලෙස සිංගප්පූරුවට අයත් එක්ප්‍රස් පර්ල් නෞකාව කොළඹ වරාය ආසන්නයේ දී ගිනිගත් අතර, එමඟින් සාගර පරිසරයට විශාල හානියක් සිදුවිය. එහිදී වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියාත්මක වී සාගර අවට අහසේ වායු තත්ව පරීක්ෂාව සිදුකර ඇත. ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 500 ක් පමණ වන ප්ලාස්ටික් පැලට් නිසියාකාරව එකතු කර නිසියාකාරයෙන් බැහැර කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම අප අධිකාරිය එම තත්වය පාලනය කර ගැනීමට, අනෙකුත් ආයතන සඳහා උපරිම සහය ලබා දී ඇත.

2020 වසරේ දී සිදුකල ගංහා ආශ්‍රිත සමීක්ෂණයෙන් සොයාගත් ගැටළු නිරාකරණය කිරීම සඳහා "සුරකිමු ගංහා" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කොට ඇත. එහි සමාරම්භක උත්සවය 2021 මාර්තු මස 22 වන දින ඓතිහාසික රුහුණු කතරගම පුදබිම පාදක කරගෙන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල සහභාගීත්වයෙන් මැණික් ගඟ අසබඩ දී පවත්වන ලදි.

පරිසර පනත මඟින් බලගන්වා ඇති පරිසර නියාමන මෙවලම් අතරින් තවත් එක් ප්‍රධානතම මෙවලමක් ලෙස පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සඳහන් කල හැක. එහිදී, 2021 වසර සඳහා නව ව්‍යාපෘති 15 ක් සඳහා පරිසර බලපෑම් ඇගයීම් (EIA) අනුමැතියත්, ව්‍යාපෘති 207 ක් සඳහා මූලික පාරිසරික පරීක්ෂණ (IEE) අනුමැතියත් සහ ව්‍යාපෘති 06 ක් සඳහා පරිසර බලපෑම් ඇගයීම් (EIA) කාල සීමාව දීර්ඝ කිරීම සඳහා අනුමැතියත් ලබා දී ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය මේ වනවිට පරිසර ආරක්ෂණ කලාප 10 ක් ප්‍රකාශයට පත්කර ඇති අතර, එම කලාප කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය අබන්ඩ පසුවිපරම් කටයුතු සිදු කරමින් සිටී. මීට අමතරව හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අදාල කටයුතු මේ දිනවල සිදු කරමින් පවති.

බලපත්‍ර සහිත ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතුකරන්නන් එකොළොස් දෙදෙකුගේ සහභාගිත්වයෙන් බස්නාහිර පළාතේ නිවාස මට්ටමෙන් ජනනය වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ වැඩසටහක් දියත් කරන ලදි. එහිදි ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ටොන් 4.2 ක් එක්රැස්කර නිසිලෙස බැහැර කිරීමට කටයුතු සිදු කර ඇත.

පොලිතින් කළමනාකරණ රෙගුලාසි යටතේ 2211/51 දරණ රෙගුලාසිය මඟින් එක්වරක් පමණක් භාවිතා කර ඉවතලන අයිතම වර්ග 5 ක් නිෂ්පාදනය සහ භාවිතය තහනම් කර ඇත. මෙම අයිතම වලට පොලිතින් ටෙරෙපැකලේට් (PET) ගෙන පොලිවයිලින් ක්ලෝරයිඩ් ෂැෂේ පැකට්, හුළං පුරවන සෙල්ලම් බඩු, ප්ලාස්ටික් මීට සහිත කොටන් බට් යන ආදිය ඇතුලත් වේ. එමෙන්ම ප්ලාස්ටික් කේන්ත කිරීමට අදාල රෙගුලාසිය 2211/50 ද මෙම වසරේ ප්‍රකාශයට පත්කර ඇත. එමඟින් සමහර ප්ලාස්ටික් වර්ග එක්රැස් කිරීමෙදී හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේදී හඳුනාගැනීමේ හැකියාව ලැබේ.

රට තුල පැවති කොවිඩ් වසංගත තත්වයේදී වුවද, මධ්‍යම පරිසර අධිකාරිය තහනම් ආහාර දවටන නිෂ්පාදනය අලෙවිය හා ගබඩා කිරීමේ වැටලීම සඳහා දිවයින පුරා වැටලීම් 3512 ක් සිදුකර රෙගුලාසි උල්ලංඝනය කරන්නන්

522 ක් හඳුනාගත් අතර එහිදී නීතිවිරෝධී ආහාර දවටන ටොන් 19.2 ක් සොයාගෙන ඇත. වැඩිම වරදකරුවන් පිරිසක් බස්නාහිර, නැගෙනහිර හා දකුණු පළාතෙන් වාර්තා විය.

2020 වසරේ ජනාධිපති පරිසර සම්මාන උළෙලේ දී සම්මානයට පාත්‍ර වූ හොඳම ගීත තුන ප්‍රචීන ගායන ශිල්පීන් ලවා ගායනා කරවා එහි ඇතුලත් පණිවුඩය ජනතාව අතරට ගෙනයාමට හැකිවන ආකාරයෙන් වීඩියෝ බවට පත්කර බහුවිධ මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීමට කටයුතු සිදුකර ඇත.

පරිසර සංවේදී පරපුරක් බිහිකිරීමේ අදිටනින් සිදුකරනු ලබන පාසල් තුල පුස්තකාල පහසුකම් ස්ථාපිත කිරීම යන වැඩිදියුණු කිරීමේ වැඩසටහන 2021 වසරේ ද අඛන්ඩව ක්‍රියාත්මක කර ඇත.

මීට පෙර ජනතාව තුල තිබූ මැසිවිල්ලක් වන පරිසරය සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීමට ගාස්තු රහිත කෙටි අංකයක් නොමැතිකම මගහරවමින් මෙම වසරේදි 1981 අංක හඳුන්වා දුන් අතර, දවසේ ඕනෑම අවස්ථාවක පැමිණිල්ලක් අප වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව දැන් මහජනතාවට ලැබී ඇත.

මෙම වසර පුරාවටම ලබා දුන් පූර්ණ සහයෝගය සහ දායකත්වය සඳහා අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ කමිටුව ඇතුළු මධ්‍යම පරිසර අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පළ කරමි. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පරිසර සභාවෙ හි සාමාජිකයින් විසින් අධිකාරියේ දියුණුව උදෙසා ලබාදෙන සහාය, උපදෙස් පිළිබඳ මා ඉතා කෘතඥ වෙමි. එමෙන්ම, පරිසර අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම් සහ අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන් විසින් මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් සාර්ථක කර ගැනීමට ලබාදෙන සහයෝගය සහ උපදෙස් සම්බන්ධයෙන් අප අධිකාරියේ සමස්ථ කාර්යය මණ්ඩලය වෙනුවෙන් මාගේ ඉමහත් කෘතඥතාවය පිරිනමමි.

සභාපති

මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

නම	තනතුර	සුදුසුකම්
සිරිපාල අමරසිංහ මහතා (සභාපති)		
පී.බී. හේමන්ත ජයසිංහ මහතා (අධ්‍යක්ෂ ජනරාල්)		
ඉංජී. ජේ.එම්.යූ. ඉන්ද්‍රරත්න මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අපද්‍රව්‍ය කළමනාකරණ)	විද්‍යාවේදී (ඉංජිනේරු) ගෞරව, ශාස්ත්‍රපති, වරලත් ඉංජිනේරු, Grad. IE (Aus.)
එම්.ජේ.ජේ. ප්‍රනාන්දු මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය මෙහෙයුම්)	විද්‍යාවේදී (ව්‍යාපාරික විද්‍යාව), විද්‍යාපති (වන විද්‍යාව), පශ්චාත් ඩිප්ලෝමාව (RS & GIS)
ආචාර්ය ආර්.එම්.එස්.කේ. රත්නායක මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)	විද්‍යාවේදී (විශේෂ), ආචාර්ය උපාධිය, වරලත් රසායනඥ, රසායන විද්‍යා ඩිප්ලෝමාව
කේ.ජී.ටී.එන්. කිරිඇල්ල මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර දූෂණ පාලන)	විද්‍යාවේදී, විද්‍යාපති
ජී.ඒ. වීරසුන්දර මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්)	විද්‍යාවේදී, දර්ශනපති
එන්.එස්.ගමගේ මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිසර කළමනාකරණ හා ඇගයීම්)	විද්‍යාවේදී, දර්ශනපති
එම්.එස්.ඒ.ඊ. තිස්මල්පොල මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)	නීතීඥ, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා
මනූජා විමලසේන මිය	අධ්‍යක්ෂිකා (නීති)	නීතීඥ, නීතිවේදී උපාධිය (ශ්‍රී ලංකා), ප්‍රසිද්ධ නොතාරිස් (සිංහල / ඉංග්‍රීසි), දිවුරුම් කොමසාරිස් සහ සමාගම් ලේකම්
වසන්තා විජේසිංහ මිය	අධ්‍යක්ෂිකා (රසායනාගාර සේවා)	විද්‍යාවේදී (රසායන විද්‍යාව) ගෞරව, විද්‍යාපති (විශ්ලේෂණ රසායන විද්‍යාව), M.I.chem., වරලත් රසායනඥ
ආචාර්ය ආර්.ඒ.සී.එච්. විජයසිංහ මහත්මිය	අධ්‍යක්ෂ (සැලසුම්)	ආචාර්ය උපාධිය (ව්‍යාපාර පරිපාලන), ශාස්ත්‍රපති (ව්‍යාපාර පරිපාලන), විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) විශේෂ
දේවිකා විතානගේ මහත්මිය	අධ්‍යක්ෂිකා (අනුකූලතා පසු විපරම්)	විද්‍යාවේදී, විද්‍යාපති(පරිසර විද්‍යාව), පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව)
එම්. සිවකුමාර් මහතා	අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)	විද්‍යාවේදී (කෘෂිකර්ම විද්‍යාව) ගෞරව, පරිසර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, විද්‍යාපති (ස්වභාවික සම්පත් කළමනාකරණය), වරලත් පරිසරවේදී
කේ.ඒ.පී. වැලිකන්නගේ මහතා	අධ්‍යක්ෂ (මධ්‍යම පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති, ශාස්ත්‍රපති, පශ්චාත් ඩිප්ලෝමාව (පරිසර විද්‍යාව), මානව සම්පත්

නම	තනතුර	සුදුසුකම්
		කළමනාකරණය හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව
එච්.එස්.ප්‍රේමචන්ද්‍ර මහතා	අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)	විද්‍යාවේදී (විශේෂ) ගෞරව, විද්‍යාපති, වරලත් පරිසරවේදී, **M.I.Biol, MIEPSL, MPMI (US)**
සුසන්ත වෙදගේ මහතා	අධ්‍යක්ෂ (දකුණු පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති
චතුර මල්වාන මහතා	අධ්‍යක්ෂ (ගම්පහ දිස්ත්‍රික්කය)	විද්‍යාවේදී (ජීවවිද්‍යාව), විද්‍යාපති (පරිසරවිද්‍යාව)
එම්.ඒ.සී. නජීබ් මහතා	අධ්‍යක්ෂ (ඌව පළාත)	විද්‍යාවේදී (ජීවවිද්‍යාව), විද්‍යාපති (වනවිද්‍යාව)
එන්.ජී. සෙනවිරත්න මහත්මිය	අධ්‍යක්ෂ (වයඹ පළාත)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර විද්‍යාව)
එස්.එම්.ඒ. සේනානායක මහතා	අධ්‍යක්ෂ (සබරගමුව පළාත)	විද්‍යාවේදී (භෞතික විද්‍යා), විද්‍යාපති (පරිසර විද්‍යා), පශ්චාත්උපාධි ඩිප්ලෝමා
එච්.පී.එස්. ජයසේකර මහත්මිය	අධ්‍යක්ෂ (ඝන අපද්‍රව්‍ය කළමනාකරණ)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර ඉංජිනේරු හා කළමනාකරණ)
ප්‍රියන්ගනී ගුණතිලක මහත්මිය	අධ්‍යක්ෂ (ස්වභාවික සම්පත් කළමනාකරණ)	විද්‍යාවේදී (ජීව විද්‍යාව), විද්‍යාපති (වන විද්‍යාව හා පරිසර කළමනාකරණය), පස්චාත් උපාධි ඩිප්ලෝමා
ඒ.සී.පී. දාබරේ මිය	අධ්‍යක්ෂිකා (තොරතුරු)	ශාස්ත්‍රවේදී, විද්‍යාපති, **ALA,** වරලත් පුස්තකාලයාධිපති
කේ.ජී.එස්. ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ(උපාය මාර්ගික පාරිසරික ඇගයීම්)	විද්‍යාවේදී (ජීව විද්‍යාව), විද්‍යාපති (පරිසර ඉංජිනේරු හා කළමනාකරණ)
එස්.පී. පෙරියප්පෙරුම මහත්මිය	අධ්‍යක්ෂ (පරිසර ප්‍රවර්ධන)	විද්‍යාවේදී, විද්‍යාපති (පරිසර හා වන විද්‍යාව), පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ප්‍රදීප් වක්වැල්ල මහතා	අධ්‍යක්ෂ (මුදල්)	ACA, B.Sc. (Applied Accounting)
ආචාර්ය අජිත් රෝහණ ගුණවර්ධන මහතා	වැ.බ. අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	ආචාර්ය උපාධිය (දුරස්ථ සංවර්ධනය හා වන විද්‍යාව), විද්‍යාපති (කෘෂි වන විද්‍යාව), විද්‍යාවේදී (කෘෂි විද්‍යාව) විශේෂ, වරලත් පරිසරවේදී
ජී. යූ. විතානාරච්චි මිය	අභ්‍යන්තර විගණක	විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන), ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජික, වරලත් ගණකාධිකරණ ආයතනයේ ආවසරික, **HDM**

පටුන

පෙරවදන ii
මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය i
පටුන iii
වගු ලැයිස්තුව iv
රූප ලැයිස්තුව iv
Chapter 1 : මධ්‍යම පරිසර අධිකාරිය 1
1.1. හැඳින්වීම 1
1.2. අරමුණු 1
1.3. බලතල, කාර්ය සහ රාජකාරී 1
1.4. පරිසර සභාව 2
1.6 ආයතන ව්‍යුහ 5
Chapter 2 : පරිසර දූෂණ පාලන අංශය 6
Chapter 3 : අපද්‍රව්‍ය කළමණාකරන අංශය 23
Chapter 4 **: පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය** 34
4.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය 56
Chapter 5 **: පර්යේෂණ හා සංවර්ධන ඒකකය** 62
Chapter 6 : නීති ඒකකය 67
Chapter 7 : පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය 70
Chapter 8 : සැලසුම් හා පසුවිපම් ඒකකය 73
Chapter 9 **: පැමිණිලි ඒකකය**මධ්‍යම පරිසර අධිකාරිය වෙත මහජන 75
Chapter 10 : අභ්‍යන්තර විගණන ඒකකය 79
Chapter 11 **: අනුකූලතා පසුවිපරම් ඒකකය** 80
Chapter 12 : විමර්ශණ ඒකකය 82
Chapter 13 : තොරතුරු තාක්ෂණ ඒකකය 89
Chapter 14 : මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල 91
14.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම 91
14.3 දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC) 91
Chapter 15 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල 93
15.1. හැඳින්වීම 93
15.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 95
Chapter 16 **: ප්‍රාදේශීය මෙහෙයුම් අංශය** 100
Chapter 17 **: පළාත් කාර්යාල වල සාර්ථක වැඩසටහන්** 106
Chapter 18 : මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරණු ලබන විශේෂ ව්‍යාපෘත 110
18.1 "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන 110
18.2 පාසල් පරිසර නියමු වැඩසටහන 121
18.3 පාරිසරික අධ්‍යාපන, දැනුවත්කිරීම් සහ ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන. 126
18.4 ශ්‍රී ලංකාවේ ගෘහස්ත වාතය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය 132
Chapter 19 : මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මූල්‍ය අංශය 133
19.1 මානව සම්පත් සංවර්ධන ඒකකය 133
19.2 මානව සම්පත් කළමණාකරන ඒකකය 133
19.3 මුදල් ඒකකය 135
Chapter 20 : විගණකාධිපති වාර්ථාව 158

වගු ලැයිස්තුව

වගුව 1: පරිසර සභාවේ සාමාජිකයින් 2
වගුව 2 : අනෙකුත් සාමාකයින් 3
වගුව 3 : 2021 (ජනවාරි සිට මැයි දක්වා) බත්තරමුල්ල AAQMS හි නියාමනය කරන ලද දූෂක සඳහා මාසික සාමාන්‍ය ... 10
වගුව 4 : : 2021 දී මහනුවර AAQMS හි නියාමනය කරන ලද දූෂක සඳහා මාසික සාමාන්‍ය (ජනවාරි සිට මැයි දක්වා) 10
වගුව 5 : කොළඹ කොටුව AAQMS හි නියාමනය කරන ලද දූෂක සඳහා වාර්ෂික සාමාන්‍ය 10
වගුව 6 : තාක්ෂණික උපදේශන / සහය සේවා සැපයීම 11
වගුව 7 : මිනුම් සේවා සැපයීම 11
වගුව 8 : අනෙකුත් ආයතන / අංශ සමග සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම් 21
වගුව 9 : පුනරාවර්තන වියදම්, මිලියන 05ක මුදල වැය සංකේත 407 යටතේ වියදම් කර ඇති මුදල් ප්‍රමාණ 22
වගුව 10 : 2021 දී අපද්‍රව්‍ය කළමනාකරණය 30
වගුව 11: පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් 2021 වසර සඳහා අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති ලැයිස්තුව. 34
වගුව 12 : පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැතිව 2021 වසරේදී පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 35
වගුව 13 : අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් ඇති ප.බ.ඇ./ මූ.පා.ප. ව්‍යාපෘතිය ලැයිස්තුව 36
වගුව 14 : 2021 දී අනෙකුත් අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල/ වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 41
වගුව 15 : 2021 දී පාරිසරික නිර්දේශය (ER) සඳහා වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව 42
වගුව 16 : අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය / එකඟතාව ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව 43
වගුව 17 : 2021 වසර තුල දී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ පාරිසරික උපදේශන කමිටු රැස්වීම් ලැයිස්තු ... 47
වගුව 18 : 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ ව්‍යාපෘති කමිටු ලැයිස්තුව 48
වගුව 19 : 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නියාමන කමිටු ලැයිස්තුව 49
වගුව 20 : 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ වෙනත් විවිධ රැස්වීම් ලැයිස්තුව 49
වගුව 21 : 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නීති උපදේශන සැසි ලැයිස්තුව 50
වගුව 22 : 2021 වසර තුළදී පසු විපරම් කරන ලද ව්‍යාපෘති 51
වගුව 23 : 2021 වසර තුළදී පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන් . 53
වගුව 24: 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ පුහුණු වැඩමුළු 53
වගුව 25 : 2021 වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ වැඩසටහන් 53
වගුව 26 : 2021 වර්ෂය තුළ පාරිසරික බලපෑම් ඇගයීම් අංශය පැමිණිලි සඳහා මැදිහත් වූ ව්‍යාපෘති 54
වගුව 27 : සහභාගී වූ වැඩමුළු/ රැස්වීම් ගණන 56
වගුව 28 : පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු රැස්වීම් 57
වගුව 29 : ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව පැමිණිලි 57
වගුව 30 : සිදු කරන ලද පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන 59
වගුව 31 : පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය 67
වගුව 32 : දිස්ත්‍රික් අතර පැමිණිලි ව්‍යාප්තිය 75
වගුව 33 : “ඒ” කාණ්ඩයට අදාළව යොමු වූ පැමිණිලි කළමනාකරණ ප්‍රගතිය- 2021 77
වගුව 34 : : 2021 වර්ෂයේදී අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් සිදු කරන ලද කර්මාන්ත පසුවිපරම් කටයුතු 80
වගුව 35 : : 2021 වර්ෂයේදී පළාත්/ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කල අනුකූලතා පසුවිපරම් කටයුතු 81
වගුව 36 : පොලිතින් ආහාර දවටන නිෂ්පාදන සමාගම්වලට අදාළ වැටලීම් කටයුතු පිළිබඳ විස්තර 84
වගුව 37 : පොලිතින් ආහාර දවටන තොග වෙළෙඳුන් සම්බන්ධ වැටලීම් කටයුතු පිළිබඳ විස්තර 88
වගුව 38 : තීරණාත්මක පාරිසරික ගැටළු විමර්ශනය පිළිබඳ විස්තර 94
වගුව 39 : පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම. 95
වගුව 40 : නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම 97
වගුව 41 : මූලික පාරිසරික පරීක්ෂණ (IEE) / පරිසර බලපෑම් ඇගයීම (EIA) නියමයන්ට අනුකූලව 2021 වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව. 98
වගුව 42 : 2021 වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව 112
වගුව 43 : “සුරකිමු ගංගා" පළාත් සමාරම්භක උත්සව 116
වගුව 44 : 2021 වසර තුළ ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා 50 ක් ‘‘සුරකිමු ගංගා’’ ව්‍යාපෘති ඇගයීම් කමිටුව මඟින් අනුමත කරන ලදුව ප්‍රතිපාදන නිදහස් කර ඇත. 120
වගුව 45 : “සුරකිමු ගංගා’’ ජාතික පාරිසරික වැඩසටහනේ පොදු කර්තව්‍යන්ගේ ප්‍රගතිය 120
වගුව 46 : "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය 122
වගුව 47 : 2021 වසරේ දී පරිසර ළමා සමාජ වැඩසටහන සඳහා නිෂ්පාදිත ද්‍රව්‍ය 122
වගුව 48 : 2021 වසරේ දී පරිසර නියමු වැඩසටහන සඳහා නිෂ්පාදිත ද්‍රව්‍ය 122

වගුව 49 : 2021 වර්ෂයේ සේවයට බඳවා ගැනීම්, උසස්වීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය හැර යාම සහ විශ්‍රාම ගැනීම. 134
වගුව 50 : 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන 139
වගුව 51 : මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 139
වගුව 52 : මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 140
වගුව 53 : මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 142
වගුව 54 : හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය 143
වගුව 55 : සටහන 4 ම.ප.අ. ආදායම 144
වගුව 56 : සටහන 4 - වෙනත් පුනරාවර්තන ප්‍රදාන 145
වගුව 57 : සටහන 5 - පුද්ගල පඩිනඩි 147
වගුව 58 : සටහන 6 - ගමන් වියදම් 147
වගුව 59 : සටහන 7 - සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම 147
වගුව 60 : සටහන 8 – නඩත්තු 147
වගුව 61 : සටහන 9 - ගිවිසුම්ගත සේවා 148
වගුව 62 : සටහන 10 - පර්යේෂණ සහ සංවර්ධන 148
වගුව 63 : සටහන 11 - අගය ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය 148
වගුව 64 : සටහන 12 - වෙනත් මෙහෙයුම් වියදම් 149
වගුව 65 : සටහන 13 - වැඩසටහන් ක්‍රියාකාරකම් 149
වගුව 66 : සටහන 15 – ආයෝජන 150
වගුව 67 : සටහන 16 - මාර්ගස්ථ බඩු සහ සිදු කරමින් පවත්න වැඩ 151
වගුව 68 : සටහන 17 – තොග 151
වගුව 69 : සටහන 18 – අය විය යුතු මුදල් 151
වගුව 70 : සටහන 19 – පූර්ව ගෙවීම් 152
වගුව 71 : සටහන 20 - මුදල් සහ මුදල් සමාන දෑ 152
වගුව 72 : සටහන 21 – ගෙවිය යුතු 152
වගුව 73 : සටහන 22 - උපචිත වියදම් 153
වගුව 74 : සටහන 23 - පුනරාවර්තන ප්‍රදාන 154
වගුව 75 : සටහන 24 - පාරිතෝෂික සඳහා වෙන් කිරීම 155
වගුව 76 : : සටහන 25 - ප්‍රාග්ධන ප්‍රදාන 155

රූප ලැයිස්තුව

රූපය 1 : පරිසර සභාවේ සාමාජිකයින් පත්කිරී 4
රූපය 2 : ආයතන ව්‍යුහය 5
රූපය 3 : සේවා සැපයීම මඟින් ලැබූ ආදායම් 12
රූපය 4 : සංසරණ වායු තත්වයේ ප්‍රතිඵල 12
රූපය 5 : වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය - බත්තරමුල්ල 13
රූපය 6 : වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය - මහනුවර 14
රූපය 7 : කොළඹ කොටුව පිරික්සුම් මධ්‍යස්ථානයේ PM 10 දත්ත 14
රූපය 8 : කොළඹ කොටුව පිරික්සුම් මධ්‍යස්ථානයේ NOX දත්ත 15
රූපය 9 : කොළඹ කොටුව පිරික්සුම් මධ්‍යස්ථානයේ SO2 දත්ත 15
රූපය 10 : සාම්පල ලබා ගැනීමේ සාරාංශය 16
රූපය 11 : නව ක්ෂුද්‍ර ජීවී විශ්ලේෂණ රසායනාගාරය 17
රූපය 12 : ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණ රසායනාගාරය 17
රූපය 13 : ප්‍රාදේශීය රසායනාගාර සඳහා ජල තත්ව මාපක බෙදා දීමේ අවස්ථා වැඩසටහන 18
රූපය 14 : නැගෙනහිර පලාත් රසායනාගාරය වෙත ලබා දුන් කන්ටේනර් රසායනාගාරය 19
රූපය 15 : මධ්‍යම පළාත් පලාත් රසායනාගාරය ස්ථාපිත දුම් අවශෝෂක කුළුණ 19
රූපය 16 : තිරසර අපජල කළමනාකරණ සැලැස්මේ සමාරම්භක අවස්ථාව 19
රූපය 17 : රසායනාගාර පරිශ්‍රය තුල ස්ථානගත කර ඇති අපජලය බැහැරලීමේ පද්ධතිය 20
රූපය 18 : මඟින් 2021 වර්ෂය තුල රැස් කරන ලද වාණිජ ජල සාම්පල සහ මුළු ජල සාම්පල ප්‍රමාණ පිළිබඳ දත්ත 20
රූපය 19: ප්‍රධාන රසායනාගාරය හා පළාත් රසායනාගාර මඟින් 2021 වර්ෂය තුල උත්පාදනය කරන ලද ආදායම 21
රූපය 20 : බස්නාහිර පළාතේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන 24
රූපය 21 : පුහුණු අත්පොත සභාපතිවරයා වෙත භාරදීම. 27
රූපය 22 : කඩදාසි මල්මාලා සැදීම පිළිබඳව පුහුණුව 27
රූපය 23 : සම්පූර්ණ දිරාපත් වන අපද්‍රව්‍ය හැසිරවීම සහ සනීපාරක්ෂක කසළ ගොඩකිරීමේ අපද්‍රව්‍ය බැහැර කිරීම 30
රූපය 24 : කොම්පෝස්ට් නිෂ්පාදනය 31
රූපය 25 : අපද්‍රව්‍ය බැහැරලීමෙන් උපයන මුළු ආදායම 32
රූපය 26 : කොටු 6න් 3 වන කොටුවෙන් 3/6ක් දක්වා පුරවා ඇත. 32
රූපය 27 : පෙතියකන්ද ගොවි පුහුණු වැඩසටහන 33
රූපය 28 : පනසලාතැන්න පාරිසරික ආරක්ෂක ප්‍රදේශයහි මායිම් කණු සවි කිරීම 58
රූපය 29 : බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයහි සවි කරන ලද දැනුවත් කිරීමේ පුවරු 58
රූපය 30 : හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය අයත් ග්‍රාම නිළධාරී වසම් වල සිතියම් 58
රූපය 31 : අධ්‍යයන වාර්තාව 59
රූපය 32 : තෙත්බිම් ශ්‍රී ලංකා සඟරාව 60
රූපය 33 : කඹරව ගංඟා උපදිය බස්නාවේ පරිසර පද්ධති සේවාවන් ඇගයීමේදී යොදාගත් පරාමිතීන් සඳහා සමභාරයක් දී නිර්මාණය කරන ලද සිතියම 62
රූපය 34 : පර්යේෂණ ප්‍රවෘත්ති පත්‍රිකාව 63
රූපය 35 : කුරුණෑගලදි.ව/ම/ම/කරඹෙ 70
රූපය 36 : මුලතිව් දි.මු/ පාලිනගර් මහා විද්‍යාලය, නැගෙනහිර මාන්තෙයි 70
රූපය 37 : බදුල්ල දි.බ/ ඇත්තල ගෙදර තක්ෂිලා මහා විද්‍යාලය, මලිත්ත 71
රූපය 38 : මාතර දි.මාර/ කඹුරුගමුව මහා විද්‍යාලය, කඹුරුගමුව 71
රූපය 39 : මාතලේදි.මප/මා/ග/තොලඹුගොල්ල මහා විද්‍යාලය, ගලේවල 71
රූපය 40 : දකුණු පළාත් කාර්යාලය 71
රූපය 41 : මධ්‍යම පළාත් කාර්යාලය 72

රූපය 42 : අම්පාර දිස්ත්‍රික් කාර්යාලය 72
රූපය 43 : ආයතනික සැලසුම් වැඩමුළුව 2021.12.16 දින පැවැත්විණි 73
රූපය 44 : පැමිණිලි වර්ගීකරණයට අනුව ව්‍යාප්තිය 76
රූපය 45 : දිස්ත්‍රික් මට්ටමින් වැටලීම් වැඩසටහන 83
රූපය 46 : තහනම් නිෂ්පාදන අයිතම අනුව වැටලීම් ප්‍රතිශතය 83
රූපය 47 : වැටලීම් සංඛ්‍යාවට එදිරිව උල්ලංඝනය කිරීමේ ප්‍රතිශතයේ ව වාර්ෂික ප්‍රවණතාවය 84
රූපය 48 : හෝමාගම සමාගමක පොලිතින් ලන්ච් ෂීට් වැටලීම 85
රූපය 49 : දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය තුල පොලිතින් ආහාර දවටන තොග විනාශ කිරීම 86
රූපය 50 : සැඟේ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක සිදු කරන ලද වැටලීමක් පිළිබඳ පළවූ පුවත්පත් වාර්තාවක් 87
රූපය 51 : ඩිජිටල් පරාවර්තනයේ දළ සැලැස්ම 90
රූපය 52 : සුරකිමු ගංගා වැඩසටහනෙහි බස්නාහිර පලාතේ පලාත් සමාරම්භක උත්සවය 102
රූපය 53 : සුරකිමු ගංගා වැඩසටහනෙහි මධ්‍යම පලාතේ පලාත් සමාරම්භක උත්සවය 102
රූපය 54 : සුරකිමු ගංගා වැඩසටහනෙහි දකුණුපලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 55 : සුරකිමු ගංගා වැඩසටහනෙහි සබරගමුව පලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 56 : සුරකිමු ගංගා වැඩසටහනෙහි වයඹ පලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 57 : සුරකිමු ගංගා වැඩසටහනෙහි සබරගමුව පලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 58 : සුරකිමු ගංගා වැඩසටහනෙහි නැගෙනහිර පලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 59 : සුරකිමු ගංගා වැඩසටහනෙහි උතුරුපලාතේ පලාත් සමාරම්භක උත්සවය 103
රූපය 60 : කිරිගොවිපල සඳහා යෝජිත ඉඩම් සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුවේ පරීක්ෂණ චාරිකාව-
ලුණුගම්වෙහෙර 13.03.2021 105
රූපය 61 : කිරිගොවිපල සඳහා යෝජිත ඉඩම් සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුවේ පරීක්ෂණ චාරිකාව-
තෙලහැර, නිකවැරටිය 23.03.2021 105
රූපය 62 : බස්නාහිර පළාත් සමාරම්භක උත්සවය 113
රූපය 63 : සබරගමු පළාත් සමාරම්භක උත්සවය 113
රූපය 64 : නැගෙනහිර පළාත් සමාරම්භක උත්සවය 113
රූපය 65 : වයඹ පළාත් සමාරම්භක උත්සවය 114
රූපය 66 : උතුරු පළාත් සමාරම්භක උත්සවය 114
රූපය 67 : උතුරු මැද පළාත් සමාරම්භක උත්සවය 114
රූපය 68 : දකුණු පළාත් සමාරම්භක උත්සවය 114
රූපය 69 : මධ්‍යම පළාත් සමාරම්භක උත්සවය 115
රූපය 70 : අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක වන ස්ථාන සහිත ශ්‍රී ලංකා සිතියම 116
රූපය 71 : 1. "පරිසරය පිළිබඳ සර්ව ආගමික ඉගැන්වීම්" ග්‍රන්ථය 123
රූපය 72 : PET සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පෝස්ටර් සහ ගුරු පුහුණු අත්පොත 126
රූපය 73 : පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳ වාර්තා චිත්‍රපට 127
රූපය 74 : සම්මානලාභී ගීතවල වීඩියෝ දර්ශන 127
රූපය 75 : ජලගෝලය පිළිබඳ අධ්‍යාපනික වාර්තා චිත්‍රපටිය 127
රූපය 76 : ලෝක ළමා දින වැඩසටහනේ විශේෂ අවස්ථා 128
රූපය 77 : වෙබිනා වැඩසටහන්වල ප්‍රචාරක 129
රූපය 78 : කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ රුක් රෝපණ වැඩසටහනේ විශේෂ අවස්ථා 130
රූපය 79 : :"හුස්ම දෙන තුරු" රුක් රෝපණ වැඩසටහන්වල විශේෂ අවස්ථා 130
රූපය 80 : පාරිසරික පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ විශේෂ අවස්ථා 131
රූපය 81 : පරිසර සභාවේ විශේෂ අවස්ථා 132
රූපය 82 : පාරිසරික පුවත් හසුන 133
රූපය 83 : සොබාකෙත සඟරාව 133
රූපය 84 : සොබාකෙත සඟරා එළිදැක්වීම 133

CHAPTER 1 : මධ්‍යම පරිසර අධිකාරිය

1.1. හැඳින්වීම

1980අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 1981 ස්ථාපිත කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරිය 2021 වන විට වසර 40 ක් සම්පූර්ණ කරයි .පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය මඟින් ඇති කරනු ලැබූ පරිසර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ආයතන වලින් එකකි .2021 වාර්ෂික වාරතාව මඟින් 2021 වසර තුල මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය සාධනය හා මහා භාණ්ඩාගාරයේ අරමුදල් හා විදේශ මූල්‍යාධාර යොදවමින් පළාත් කාර්යාල 09, දිස්ත්‍රික් කාර්යාල 15 හා එක් සම්බන්ධීකරණ කාර්යාලයෙහි ක්‍රියාකාරකම් සහ 2020 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ගේ ළඟා කරගත් කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සපයනු පිණිස එම වර්ෂය තුල සාක්ෂාත් කරගත් සාර්ථකත්වය මෙන්ම අසාර්ථකත්වය පිළිබඳ තක්සේරුවක් ද පෙන්නුම් කරයි.

1.2. අරමුණු

මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය මත 1980 අංක 47 දරන පාරිසරික පනත පිළිවෙලින් 1988 අංක 56 දරන පාරිසරික පනත යටතේ සහ 2000 අංක 53 දරන පනත යටතේ සංශෝධනය කරන ලදි 1980 .ජාතික පාරිසරික පනත පහත සඳහන් ප්‍රධාන බලතල වලින් සමන්විත වේ .

ජාතික පාරිසරික පනත යටතේ පාරිසරික ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පරිසරයේ අනතුරුදායක මෙන්ම, අනතුරුදායක වීමට ඉඩ තිබෙන අපද්‍රව්‍ය මුදා හැරීම, තැන්පත් කිරීම හෝ වෙනත් දූෂණ මාර්ග වල ස්වභාවය, ප්‍රමාණය, අන්තර්ග්‍රහණය සහ බලපෑම් විධිමත් කිරීම, පවත්වාගෙන යාම හා පාලනය කිරීම

පාරිසරික බලපෑම් ඇගයීම් උපයෝගී කරගෙන, ක්‍රමවත්ව ඇගයීමට ලක් කරන ලද පාරිසරික ගැටළු මඟින් පරිසරයට හිතකාමී සංවර්ධනයන් තහවුරු කරමින් රටේ ස්වභාවික සම්පත් පද්ධතිය ආරක්ෂා කිරීම

පරිසරය ආරක්ෂා කිරීමෙහිලා මහජන සහයෝගය සහ සහභාගීත්වය ලබාගැනීම .විශේෂයෙන් පාසල් ළමුන්ගේ සහයෝගය ලබාගැනීම අරමුණු කොට දේශීය, ජාතික මෙන්ම භූගෝලීය පරිසර ගැටළු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම

පරිසරය කෙරෙහි අහිතකර බලපෑම් ප්‍රබල ලෙස ඇති වන්නා වූ යම් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති අනුග්‍රාහක පිරිස් වැඩි දෙනෙකුට සේවය සලසමින් පරිසර ආශ්‍රිත තොරතුරු සහ දත්ත සපයන මධ්‍යම මධ්‍යස්ථානයක් සේ ක්‍රියා කිරීම

1.3. බලතල, කාර්ය සහ රාජකාරී

1980අංක 47 දරන ජාතික පාරිසරික පනතෙහි සඳහන් බලතල, කාර්ය හා රාජකාරී වලින් මධ්‍යම පරිසර අධිකාරියේ දැනටතම අවධානය පහත සඳහන් ප්‍රධානතම බලතල, කාර්ය සහ රාජකාරී වලට යොමු කරයි.

ජාතික පාරිසරික පනතේ විධිවිධාන හා ඒ යටතේ සාදන ලද නියෝග හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

දූෂණ ඇතිවීමේ හේතූන්, එහි ස්වභාවය, ප්‍රමාණය සහ එය වැලැක්වීමෙහිලා සමීක්ෂණ හා විමර්ශන පැවැත්වීම සහ ඊට සමාන සමීක්ෂණ සහ විමර්ශන පවත්වන්නා වූ වෙනත් තැනැත්තන්ට හෝ ආයතනවලට සහාය වීම සහ සහයෝගය දීම

පාරිසරික පරිහානියේ යම් අංශයකට අදාලව පරීක්ෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම හෝ එවැනි පරිහානි වැලැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීමට ද, වැඩි දියුණු කිරීමට ද උපමානයන් වර්ධනය කිරීම.

පරිසරය වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා ද, එහි තත්වය පවත්වාගෙන යාම සඳහා ද ප්‍රමිති, න්‍යායන් සහ උපමානයන් නිශ්චය කිරීම

පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය සම්බන්ධයෙන් වූ යම් අංශ පිළිබඳව වාර්තා සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

පරිසරය ආරක්ෂා කිරීම හා වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම හා අධ්‍යාපනය ලබාදීම

1988හා 2000 වර්ෂ වලදී ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරියට බලතල පැවරිනි .අනෙකුත් දේ අතර, මෙම සංශෝධනය මඟින් මධ්‍යම පරිසර අධිකාරියට පැවරෙන ප්‍රධාන බලතල පහත දැක්වේ .

පරිසරයට දූෂ කාරකයන් පිට කිරීම සිදු වන අවස්ථා වලදී එම කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිති හා මිනුම් දඬු වලට අනුකූලව නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ එසේ කිරීමට නියම කිරීම

ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ඒවා විසින් පාරිසරික බලපෑම් ඇගයීම් කළ යුතු යැයි නියම කිරීම

නිශ්චිත කටයුතු ලෙස පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින, තැන්පත් කරන හෝ පිටකරන කටයුතු ගැසට් කිරීමට සහ මෙම පනතේ සඳහන් උපමාන සහ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමටත්, අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍ර නොමැතිව කිසිම පුද්ගලයෙකු කිසිම නිශ්චිත කටයුත්තක් නොකිරීම තහවුරු කිරීම.

1.4. පරිසර සභාව

හැඳින්වීම.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර සභාව 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතින් බලගැන්වී ක්‍රියාත්මක වේ.

මෙහි ප්‍රධාන කාර්ය

1. අධිකාරියේ වගකීම, බලතල, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳව අධිකාරියට සාමාන්‍යයෙන් උපදෙස් දීම.
2. අධිකාරිය විසින් සභාවට යොමු කරන ලද යම් කාරණා පිළිබඳව අධිකාරියට උපදෙස් දීම.

14 වන සැසිවාරය

පරිසර සභාවේ 3 වන සැසිවාරය, 2020 දෙසැම්බර් මස 17 වන දිනෙන් අවසන් විය. 14 වන සැසිවාරය සඳහා පරිසර පනතේ සඳහන් අමාත්‍යාංශ හා අනෙකුත් නව අමාත්‍යාංශ නියෝජනය වන පරිදි සාමාජික මහත්ම මහත්මීන් තෝරා පත්කිරීම සඳහා නාමයෝජනා කැඳවීම පරිසර අමාත්‍යාංශය මඟින් සිදුකරන ලදී. ඒ අනුව සමාරම්භක රැස්වීම 2021/11/29 දින මධ්‍යම පරිසර අධිකාරියේ දී සිදුකරන ලද අතර එහිදී පහත නම් සඳහන් ආයතන නියෝජනය කරමින් සාමාජික මහත්ම මහත්මීන් සහභාගී වන ලදී.

වගුව **1:** පරිසර සභාවේ සාමාජිකයින්

1.	ශ්‍රී ලංකා වැදිජනතාවගේ නායක, ඌරුවරිගේ වන්නියලැත්තෝ	
2.	පි බි හේමන්ත ජයසිංහ මහතා	අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය (ලේකම් - පරිසර සභාව)
3.	ආර්. ඩී. එස්. ජයතුංග මහතා	අතිරේක ලේකම් (පරිසර සංවර්ධන), පරිසර අමාත්‍යාංශය
4.	සූජීවා එස්. ගුරුගේ මහත්මිය	අතිරේක ලේකම් (පාලන), ඉඩම් අමාත්‍යාංශය
5.	එච්. නිලක්ෂි එන්. ගුණසේකර මහත්මිය	අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත් සංවර්ධන)කෘෂිකර්ම අමාත්‍යාංශය
6.	ඩබ්. බී. පලුගස්වැව මහතා	අතිරේක ලේකම් (ඉංජිනේරු), මහාමාර්ග අමාත්‍යාංශය
7.	බී. නන්දනී සමරවික්‍රම මිය	අතිරේක ලේකම්, බනික්, අත්‍යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
8.	ආචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්ව විද්‍යාලය
9.	ආචාර්ය නීතිඥ ජගත් ගුණවර්ධන මහතා	පරිසරවේදී
10.	එන්. වී. එන්. ඩී. ජයවර්ධන මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන පාලන), ප්‍රවාහන අමාත්‍යාංශය
11.	දිපාල් චන්ද්‍රරත්න මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන), කම්කරු අමාත්‍යාංශය

12.	සුරංගා ප්‍රේමනී විතානගේ මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), සංචාරක අමාත්‍යාංශය
13.	රේණුකා එම්. වීරකෝන් මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (ආයෝජන අංශය) ජනාධිපති කාර්යාලය
14.	ආර්. ඩී. එස්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ), ධීවර අමාත්‍යාංශය
15.	එන්. ආර්. අනීස් මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) විදුලි බල මණ්ඩලය
16.	ආර්. එම්. සිරිනාම මහත්මිය	අධ්‍යක්ෂ (සංවර්ධන), වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය
17.	පුඛුදු වීරරත්න මහතා	සභාපති, ජෛව සංරක්ෂණ මධ්‍යස්ථානය
18.	නිලංග නදිර පොල්වත්තගේ මහතා	-
19.	ලසන්ත සංජය සෙනරත්ආරච්චි මහතා	-
20.	ජේ. එම්. බුද්ධි මංගල මහතා	-

මීට අමතරව පහත ආයතන නියෝජනය කරමින්, පහත නම් සඳහන් නිලධාරීන් ද සාමාජිකත්වය දරණ බව දන්වමි.

වගුව **2 :** අනෙකුත් සාමාකයින්

01.	අයි.එස්.එච්.ජයසේන ඉලුක්පිටිය මහතා	අතිරේක ලේකම් (සංවර්ධන) වැවිලි අමාත්‍යාංශය
02.	අයි. සී. පතිරාජ මහතා	අතිරේක ලේකම් (කර්මාන්ත හා කර්මාන්තපුර සංවර්ධන) කර්මාන්ත අමාත්‍යාංශය
03.	වෛද්‍ය ලක්ෂ්මී සී. සෝමතුංග මිය	අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) සෞඛ්‍ය අමාත්‍යාංශය
04.	හසන්ති උරුගොඩවත්ත දිසානායක මිය	අතිරේක ලේකම් (වැ/බ) සමුද්‍ර කටයුතු, පරිසර හා දේශගුණ විපර්යාස, විදේශ අමාත්‍යාංශය
05.	කුමුදු මීගහගේ මහතා	අධ්‍යක්ෂ (සංවර්ධන) වෙළෙඳ අමාත්‍යාංශය
06.	ජී. ඒ . සුනිල් මහතා	විදුහල්පති

ක්‍රියාකාරිත්වය

ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා විසින් පරිසර සභාවේ සභාපති ලෙස පරිසරවේදී, නීතීඥ ආචාර්ය ජගත් ගුණවර්ධන මහතා පත්කරන ලදී. එමෙන්ම පරිසර සංරක්ෂණයෙහිලා කැපවී කටයුතු කිරීමටත්, අඛණ්ඩව පැමිණීම හා සක්‍රීයව දායකත්වය ලබාදීම තුළින් මධ්‍යම පරිසර අධිකාරියේ උන්නතිය උදෙසා කැපවන ලෙසත්, පැමිණ සිටි සියලු සාමාජික මහත්ම මහත්මීන්ගෙන්, ගරු අමාත්‍යතුමා මෙන්ම පරිසර සභාවේ සභාපතිතුමන් ද, ඉල්ලා සිටින ලදී.

පරිසර සභාවේ ලේකම් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයසිංහ මහතා විසින් සාමාරම්භක උත්සවයේදී මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යභාරය හා පරිසර සභාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් (presentation) සිදුකරන ලදී.

මෙම අවස්ථාව සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම් ගරු අනිල් ජාසිංහ මැතිතුමන් ප්‍රමුඛ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය ද සහභාගී විය.





රූපය **1 :** පරිසර සභාවේ සාමාජිකයින් පත්කිරී

1.6 ආයතන ව්‍යුහය



රූපය 2 : ආයතන ව්‍යුහය

Chapter 2 : පරිසර දූෂණ පාලන අංශය

මෙම අංශය යටතේ ඒකක දෙකක් ස්ථාපිත කර ඇති අතර ඒවායේ ක්‍රියාකාරකම් පහතින් විස්තර කොට ඇත.

2.0 පරිසර දූෂණ පාලන ඒකකය

නීතිමය සහ පරිපාලනමය මෙවලම් උපයෝගී කර ගනිමින් පරිසර දූෂණ පාලනය සහ ඒ පිළිබඳව නිරන්තර පසු විපරම් සිදු කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන වගකීම මෙන්ම කාර්යභාරය වේ. රටක කාර්මික සංවර්ධනය හා නාගරීකරණයත් සමඟ ඇතිවන පරිසර දූෂණය පාලනය හා පරිසර කළමනාකරණය පහසු කාර්යයක් නොවේ. එබැවින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්ත ක්‍රියාකාරකම් මඟින් සිදුවන පරිසර දූෂණය පාලනය කිරීම සඳහා නීතිමය මෙවලම් ඇතුළත් උපාය මාර්ග ක්‍රියාත්මක කරයි. මේ සඳහා ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන අනුව නිෂ්පාදන ක්‍රියාවලියේදී දූෂකාරක විමෝචනය කරනු ලබන ක්‍රියාකාරකම් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු නියමිත ක්‍රියාකාරකම් ලෙස අංක 1533/16 හා 2008.01.25 දිනැති ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, මෙම ක්‍රියාකාරකම් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිති හා උපමාන සමඟ අනුකූල විය යුතු වේ. ශ්‍රී ලංකාව තුල පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය ක්‍රමවත්ව පවත්වා ගනිමින් පරිසර දූෂණය පාලනය උදෙසා මනා සම්බන්ධීකරණය සහ අවශ්‍ය පහසුකම් සැලසීමට විවිධ උපායමාර්ගික වැඩසටහන් මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියාත්මක කරනු ලබයි.

කර්මාන්ත ක්‍රියාකාරීත්වයන් ආරම්භ කිරීමට ප්‍රථම කර්මාන්ත ස්ථානගත කිරීම මඟින් ඇතිවිය හැකි පරිසර දූෂණය මූලික අවස්ථාවේදීම හඳුනාගෙන ඒවා පාලනය කිරීම සඳහා පාරිසරික නිර්දේශ ලබා දීමේ ක්‍රියාවලිය වැදගත් උපාය මාර්ගයක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම ක්‍රියාවලිය පරිසරයට මෙන්ම ව්‍යවසායකයාටද වැදගත් වන අතර, 2021 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික නිර්දේශ 1046 ක් නිකුත් කිරීම හරහා මාර්ගෝපදේශ සපයමින් නව කර්මාන්ත ස්ථාන ගත කිරීම් මඟින් ඇතිවිය හැකි වායු විමෝචන සහ අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය සඳහා පියවර ගෙන කර ඇත.

කර්මාන්ත ක්‍රියාකාරීත්වයන් මඟින් සිදුවන විමෝචන සහ අපද්‍රව්‍ය මුදාහැරීම් පාලනය පාරිසරික ප්‍රමිති හා උපමාන සමඟ අනුගත වීම හරහා සිදු කර ගත හැකිය. මෙම අරමුණු ඉටු කර ගනිමින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2021 වර්ෂයේදී මහා පරිමාන දූෂකාරක කර්මාන්ත 10414 ක් හා මධ්‍ය පරිමාන දූෂකාරක කර්මාන්ත 7772 කටත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී ඇති අතර එම ප්‍රමාණය පිළිවෙළින් මුළු කර්මාන්ත සංඛ්‍යාවෙන් 70% සහ 75% වේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 කොටස යටතේ ලියාපදිංචි වී ඇති කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදුකරයි. 2021 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය මත කර්මාන්ත ක්‍රියාකාරකම් 1118 ක පරිසර දූෂණය පාලනය කිරීමට අදාලව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

දිවයින පුරා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් පාලනය වන ආයෝජන ප්‍රවර්ධන කලාප 12 ක් ඇති අතර, මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම කලාප වල පරිසර දූෂණය පාලනය කර මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද ප්‍රමිති හා උපමාන සමඟ අනුකූල වීම සඳහා අවශ්‍ය පරිසර දූෂණ පාලන ක්‍රියා මාර්ග වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපදෙස් හා සහය ආයෝජන ප්‍රවර්ධන කලාප වල කළමනාකාරීත්වය වෙත ලබා දෙයි. ඒ අනුව, 2021 වසරේදී ආයෝජන ප්‍රවර්ධන කලාප 05 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දී ඇති අතර, පාරිසරික ප්‍රමිති හා උපමාන වලට අනුකූල නොවන පරිදි පවත්වාගෙන යන ලද සීතාවක ආයෝජන ප්‍රවර්ධන කලාපය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

අංක 1533/16 හා 2008.01.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමට පළාත් පාලන ආයතන වෙත බලතල පවරා ඇත. එසේම මෙම කුඩා පරිමාන දූෂකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කරවීම සඳහා පළාත් පාලන ආයතන වල නිලධාරීන් දැනුවත් කිරීමට 2021 වසර තුළ මාර්ගගත වැඩසටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදී. එසේම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති මාර්ගෝපදේශ සංග්‍රහය නිලධාරීන්ගේ පහසු පරිශීලනය සඳහා නැවත සකස් කර මුද්‍රණය කර ඇත.

පරිසරයට විශිෂ්ඨ දායකත්වයක් සිදුකරන කර්මාන්ත සඳහා ඇගයීමක් හා දිරිගැන්වීමක් කිරීම අවශ්‍ය වේ. සමාන කර්මාන්ත කාණ්ඩ අතර තරඟකාරීත්වයක් ඇති කිරීම හරහා ඔවුන් තවදුරටත් පරිසර හිතකාමී කාර්යයන් සඳහා නැඹුරු

කරවීම මඟින් පරිසරයට බැහැර කරනු ලබන දූෂකාරක ප්‍රමාණය අවම කර ගැනීමට හැකිවේ. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන හඳුන්වා දී ඇති අතර, මෙමඟින් ධරණීය සංවර්ධනය උදෙසා පාරිසරික තත්ත්ව වැඩිදියුණු කිරීමට උරදුන් කර්මාන්ත ඇගයීම සිදුකරයි. මේ යටතේ 2021 කර්මාන්ත අංශය යටතේ ඉල්ලුම් පත්‍ර 72 ක් ලැබී ඇති අතර, 2022 වර්ෂයේදී එම කර්මාන්ත ඇගයීමට නියමිතය.

කාර්මික අපද්‍රව්‍ය මුදාහැරීම මඟින් කැලණි ගඟ ආරක්ෂා කිරීම සඳහා කැලණි ගංඟා ද්‍රෝණියේ සංවේදී ප්‍රදේශ වල මහා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ස්ථානගත කිරීම සීමා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඊට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය විසින් තාක්ෂණික විශේෂඥ කමිටුවක් ස්ථාපිත කර ඇති අතර, එමඟින් නව කර්මාන්ත ස්ථානගත කිරීමට අදාලව නිර්දේශ නිකුත් කරනු ලබයි. මෙහි සමාජිකයින් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, කාර්මික තාක්ෂණික ආයතනය සහ මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරයි. 2021 වර්ෂයේදී තාක්ෂණික ඇගයීම් කමිටු 8 ක් පවත්වා ව්‍යාපෘති 55 ක් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ලබාදී ප්‍රධාන වශයෙන් කැලණි ගඟ ඇතුළු පරිසර පද්ධති වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම් පාලනය කර ඇත.

ඕනෑම ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේදී එමඟින් සිදුවිය හැකි පාරිසරික බලපෑම සැලකිල්ලට භාජනය කිරීම අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය හරහා පරිසර දූෂණය පාලනය කර සංවර්ධන ව්‍යාපෘති මඟින් පරිසරයට සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට උපකාරී වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන නීතිමය මෙවලම ලෙස පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හඳුන්වා දිය හැකිය. 2021 වර්ෂයේ දී වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති 18 ක් සහ නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති 43 ක් සඳහා තාක්ෂණික උපදෙස් ලබා දීම හරහා පරිසර දූෂණය පාලනය කිරීමට පියවර ගෙන ඇත. තවද මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථය යටතට ගැනෙන විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති 73 ක් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සපයමින් පරිසර දූෂණ පාලනය සඳහා දායකත්වය සපයා ඇත.

ගලිබවුසර් මඟින් ප්‍රවාහනය කරනු ලබන කාර්මික අප ජලය ආරක්ෂිත ලෙස බැහැරලීම් සිදුකිරීම් විධිමත් කිරීම පරිසර දූෂණ පාලනයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව අංක 1533/16 හා 2008.01.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් කර්මාන්ත ක්‍රියාකාරකම් මඟින් ජනනය වන අපජලය ප්‍රවාහනය කරනු ලබන ගලිබවුසර් සේවා ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය ආරම්භ කරන ලදී. මෙමඟින් 2021 වර්ෂයේදී ගලිබවුසර් සේවා සපයන ආයතන 27 ක් ලියාපදිංචි කරන ලදී. මේ යටතේ ගලිබවුසර් සේවා සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ එක් (01) වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම ට අදාලව ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යන්ගෙන් එකකි. 2019 වර්ෂයේ දී මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සිංහල මාධ්‍ය පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අත්පොත සකස් කර මුද්‍රණය කර මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් වෙත ලබා දෙන ලදී. 2021 වර්ෂයේදී එම මාර්ගෝපදේශය ද ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවට පරිවර්ථනය කර මුද්‍රණය කර ඇත.

පරිසරයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සඳහා තාක්ෂණික උපදෙස් සැපයීම සහ පසුවිපරම් කිරීම ඉතා වැදගත් වන නමුත් ප්‍රතිග්‍රාහක පරිසරය තුළ විශාල කර්මාන්ත සංඛ්‍යාක් ඇති බැවින්, පසුවිපරම් රසායනාගාර පරීක්ෂණ මධ්‍යම පරිසර අධිකාරියට පමණක් ඉටු කිරීමට අපහසු වී ඇත. ඒ සඳහා වඩා හොඳ සේවාවක් සපයමින් කර්මාන්ත සඳහා තාක්ෂණික උපදේශනය හා රසායනාගාර සේවය වගකීමෙන් සලසන විශේෂඥ උපදේශන ආයතන 73 ක් සහ රසායනාගාර 37 ක් මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇත.

එම රසායනාගාර සේවා විධිමත් කිරීම සඳහා රසායනාගාරය තුළ ISO 17025 ප්‍රතිපත්ති මාලාව ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ මාර්ගගත වැඩමුළුවක් 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

මේ වනවිට විශ්ලේෂණය කර කෙටුම්පත් කර ඇති නව රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. මේ යටතේ පස තුලින් ජලය කාන්දුවීමේ ධාරිතාව මැනීමට අදාලව පුහුණු වැඩසටහනක් මාර්ගගතව සංවිධානය කර පවත්වන ලදී. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් හා රසායනාගාර නිලධාරීන් සහභාගී විය.

ජාතික පාරිසරික පනත සහ එහි ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමේදී නිලධාරීන්ගේ වෘත්තීමය වශයෙන් වැඩිදියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ . ඒ අනුව ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය මඟින් මෙහෙයවනු ලැබූ පුහුණු වැඩසටහන් 03 ක් සඳහා නිලධාරීන් 05 දෙනෙකු සහභාගී වූ අතර, අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් හා පුහුණුවක් ඒ තුලින් උකහා ගන්නා ලදී.

2.2. රසායනාගාර සේවා ඒකකය

රසායනාගාර සේවා අංශය උප ඒකක දෙකකින් සමන්විත වේ .ඒයා මගින් පහත ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි .

- මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා අවශ්‍ය විශ්ලේෂණ සේවා සැපයීම
- පාරිසරික තත්ව / ප්‍රමිති පසුවිපරම් කිරීම
- තෝරාගත් ස්ථාන වල ජල හා වායු තත්ව පසුවිපරම් කිරීම
- වායු, ශබ්ද, කම්පන හා ජල තත්ව පිළිබඳ පාරිසරික පර්යේෂණ හා සමීක්ෂණ කටයුතු සිදු කිරීම
- ශබ්දය, වායු තත්ව සහ ජල තත්ව පිළිබඳ රෙගුලාසි සකස් කිරීම

2.2.1 වායු සම්පත් කළමනාකරණ සහ පසු විපරම් ඒකකය

A. හැඳින්වීම

වායු සම්පත් කළමනාකරණ සහ පසු විපරම් ඒකකය රසායනාගාර සේවා ඒකකයේ එක් අංශයක් වන අතර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර දූෂණ පාලන අංශය යටතේ ක්‍රියාත්මක වෙයි. මෙම ඒකකය 2021 වර්ෂයේ ඉටු කරන ලද කාර්යයන් වල සාරාංශය පහත දක්වා ඇත.

B. නීති/ නියෝග සකස් කිරීමට අදාළ කාර්යයන් - නියෝග සැකසීම, පවතින නියෝග සංශෝධනය කිරීම හා නියෝග පරිපාලනය

පරිසරය ආරක්ෂා කිරීමට ජාතික පාරිසරික පනත මගින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත බලතල පැවරී ඇති අතරම ,එය නියමිත කටයුතු මගින් සිදුවන පරිසර දූෂණය නියාමනය කිරීම සඳහා වන කේන්ද්‍රීය ආයතනය වේ.

B.1 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග සංශෝධනය කිරීම.

2019 නොවැම්බර් පළමු වන දිනැති අංක 394/4599/19 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ඝෝෂා පාලන) නියෝග සංශෝධන සඳහා අනුමැතිය ලබා දී ඇත. වර්තමානයේ රට තුල පවතින ඉහත රෙගුලාසිය මගින් ආවරණය නොවන ශබ්දය සම්බන්ධයෙන් පවතින නව ගැටළු හඳුනාගෙන නිවැරදි කිරීම මෙහි අරමුණ වේ.

ඒ අනුව ඉහත රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලත් උපදේශකවරයෙකු තෝරා පත් කර ගැනීමට අදාල කටයුතු සිදු කළ අතර 2021.04.05 දිනැතිව සුදුසුකම් ලත් උපදේශකවරයෙකු තෝරා පත් කර ගන්නා ලදි. ඉන් අනතුරුව මෙම කරුණ සම්බන්ධයෙන් පළමු තාක්ෂණික රැස්වීම 2021.04.24 දිනැතිව මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද අතර 2021.06.06 දිනැතිව තෝරා ගත් උපදේශක විසින් කෙටුම්පත් කරන ලද නව ජාතික පාරිසරික ඝෝෂා පාලන නියෝග වල ප්‍රථම කෙටුම්පත මෙම අධිකාරියට ඉදිරිපත් කර ඇත. වර්තමානයේ මෙම රෙගුලාසි සම්බන්ධ අවසන් කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර පවතින අතර 2021.12.22 දිනැතිව මෙම රෙගුලාසි හා සම්බන්ධ පාර්ශවකරුවන් (stakeholders) එම රැස්වීමක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වා ඇත.

B.2 වායු විමෝචන, ඉන්ධන සහ රථ වාහන ආනයන ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඒකාබද්ධ ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් මේ දක්වා යුරෝ 4 සහ ඒ හා සමාන අනෙකුත් ප්‍රමිතීන් පිළිබඳ පවතින ගැසට් වලට අමතරව වායු විමෝචන ඉන්ධන සහ රථ වාහන ආනයන ප්‍රමිතීන් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් ගැසට් පත්‍ර 04 ක් (2003,2008,2014 සහ 2018) ප්‍රකාශයට පත් කර ඇත.

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද උපදෙස්වලට අනුකූලව මෙම ගැසට් පත්‍රයන් හතර ඒකාබද්ධ කර තනි ගැසට් පත්‍රයක් සකස් කිරීමේ මූලික ක්‍රියාවලිය මධ්‍යම පරිසර අධිකාරිය සහ පරිසර අමාත්‍යාංශය ඒකාබද්ධව ආරම්භ කරන ලදි.

රැස්වීම් වාර කිහිපයකින් අනතුරුව මෙම ඒකාබද්ධ ගැසට් පත්‍රයේ පළමු අවසන් කෙටුම්පත මේ වන විට සකස් කර ඇති අතර අවශ්‍ය සංශෝධන කිරීමෙන් අනතුරුව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.

B.3 වාහන නලා, එන්ජින්, සයිලන්සර් සහ ශබ්ද විකාශන යන්ත්‍ර වලින් සිදුවන ශබ්ද දූෂණය පාලනය කිරීම සඳහා අවශ්‍ය නව රෙගුලාසි සකස් කිරීම.

2011.12.29 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අංක 1738/37 දරන ජාතික පාරිසරික (රථ වාහන නලා හැසිරවීමේ) රෙගුලාසි මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

මෙම රෙගුලාසි වලට අමතරව පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් වාහන නලා,

එන්ජින්, සයිලන්සර් ඇතුළු වෙනත් වාහන ආශ්‍රිත සෝෂා පාලනය කිරීම සඳහා නව ප්‍රමිතීන් සකස් කරන ලෙසට ඉල්ලීමක් මෙම අධිකාරිය වෙත යොමු කර ඇත.

ඒ අනුව 2021.11.16 දිනැතිව ඉහත සෝෂාවන් පාලනය කිරීමට අදාල ප්‍රමිතීන් සකස් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික කමිටුව පත් කිරීමේ ක්‍රියාවලිය සිදු කර ඇත. තවද පොලිස් දෙපාර්තමේන්තුව විසින් රථ වාහන නලා හැසිරවීමේ රෙගුලාසිය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ශබ්ද මට්ටම් පරීක්ෂා කිරීමේ මීටර මිලදී ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති අතර මේ සම්බන්ධව තාක්ෂණික කමිටු රැස්වීම් වාර කිහිපයක් මධ්‍යම පරිසර අධිකාරියේ දායකත්වය ඇතිව පැවැත්වීමට කටයුතු සිදු කර ඇත.

B.4 ස්ථානීය ප්‍රභව විමෝචන පාලන රෙගුලාසි ප්‍රතිසංශෝධනය කිරීම සඳහා සලකා බැලීම.

ස්ථානීය ප්‍රභව විමෝචන පාලන රෙගුලාසි මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2019.06.05 දිනැතිව ප්‍රකාශයට පත් කර ඇත. අපද්‍රව්‍ය මගින් බලශක්තිය (Waste to energy) නිපදවීම සඳහා වූ ව්‍යාපෘතියක් සඳහා වන පාරිසරික ඇගයීම් ක්‍රියාවලියේදී අදාල ව්‍යාපෘති යෝජක පාර්ශවය විසින් ඉහත රෙගුලාසි වලට අනුකූල වන පරිදි ඊයම් හා රසදිය සඳහා වන ධාරණ සීමාවන්ට අනුගත වීමේ අපහසුතාවය පිළිබඳව මෙම අධිකාරිය දැනුවත් කළ අතර එම ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන් ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (SLEMA) ආයතනය වෙත මෙම රෙගුලාසි සම්බන්ධයෙන් 2009 වසරේ සිදු කරන ලද අධ්‍යයනයක් හා 2019 රෙගුලාසි සකස් කිරීමට පෙර දැක්වූ දායකත්වයද සැලකිල්ලට ගෙන ස්ථානීය විමෝචන රෙගුලාසිය ප්‍රතිසංශෝධනය කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. මේ සඳහා 2018.11.29 දින SLEMA ආයතනය සහ මධ්‍යම පරිසර අධිකරිය අතර ගිවිසුමක් ඇතිකර ගත් අතර එම ගිවිසුමට අනුව කාර්යයන් 03 ක් සඳහා එකඟතාවයක් ඇති කර ගන්නා ලදි.ඒ අනුව,

i ස්ථානීය ප්‍රභව සඳහා වන විමෝචන ප්‍රමිතීන් ප්‍රතිසංශෝධනය කර අවසාන වාර්තාව සකස් කිරීම.

ii ඉහත අංක 1 හි සඳහන් කරන ලද ප්‍රතිසංශෝධිත විමෝචන ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදය පැහැදිලි කිරීමේ ලිඛිත මාර්ගෝපදේශනය සම්පාදනය

iii ස්ථානීය ප්‍රභව විමෝචන ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා වන පුහුණු අත්පොත සම්පාදනය සහ අවශ්‍ය පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම.

ඉහත ගිවිසුමේ කාල රාමුවට අනුව මෙම ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා ලබා දී ඇති නියමිත කාලය 2019.07.31 දිනට අවසන් වූ අතර SLEMA ආයතනය මෙම කාල සීමාව ඇතුලතදී අදාල කාර්යයන් සම්පූර්ණ කිරීමට අපොහොසත් විය. නැවත 2021.12.06 දින පැවති රැස්වීමක් මගින් ගිවිසුම පාර්ශවකරුවන් මධ්‍යම පරිසර අධිකාරිය හා SLEMA ආයතනය අතර විසින් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම පිළිබඳ සලකා බැලූ අතර කොන්ත්‍රාත්තුව නැවත පිහිටුවීමටත් නව කාලරාමුවකටනැවත ඉහත කරුණු ඉටු කිරීමට එකඟතාවයක් ඇතිකර ගන්නා ලදි.

ඒ අනුව, SLEMA ආයතනය විසින් නැවත ඇතිකරගත් එකඟතාවයට අනුව ගිවිසුමේ අරමුණු සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්තුවේ නැවත පිහිටුවීමට අවශ්‍ය නීතිමය අවසරය සලකා බැලීම සඳහා නීති අංශය වෙත යොමු කර ඇත.

C. ජාතික පාරිසරික සංසරණ වායු තත්ත්වයේ ගුණාත්මකභාවය පසු විපරම් කිරීමේ වැඩසටහන

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සංසරණ වායු තත්ත්වයේ ගුණාත්මකභාවය මිනුම් කිරීමට බත්තරමුල්ල හා මහනුවර නගර වල තත්‍ය කාලීන ස්වයංක්‍රීය පරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් සහ කොළඹ කොටුව පරීක්ෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි ස්වයංක්‍රීය පරීක්ෂණ මධ්‍යස්ථාන දෙකක් සහ කොළඹ කොටුව පරීක්ෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. බත්තරමුල්ල සහ මහනුවර පවතින තත්‍යකාලීන ස්වයංක්‍රීය මධ්‍යස්ථාන දෙක වාහන වායු විමෝචන භාරකාර අරමුදල (VET Fund) මඟින් 2018 දෙසැම්බර් මස මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇත.

මෙම ස්වයංක්‍රීය පසු විපරම් මධ්‍යස්ථාන මඟින් වායු ගතික විෂ්කම්භය මයික්‍රෝ මීටර 10 ට අඩු ක්ෂුද්‍ර අංශූන් (PM10), වායු ගතික විෂ්කම්භය මයික්‍රෝ මීටර 2.5 ට අඩු ක්ෂුද්‍ර අංශූන් (PM2.5), නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO2), සල්ෆර් ඩයොක්සයිඩ් (SO2), කාබන් මොනොක්සයිඩ් (CO), සහ ඕසෝන් (O3) මැනීමේ හැකියාව ඇත. එමෙන්ම එම දත්ත විශ්ලේෂණය කිරීමට අවශ්‍ය කාළගුණික විද්‍යාත්මක පරාමිතීන් මැනීමේ හැකියාව ඇත. එමෙන්ම එම දත්ත විෂ්ලේශණය කිරීමට අවශ්‍ය කාළගුණික විද්‍යාත්මක පරාමිතීන් මැනීමේ හැකියාවද මෙමගින් නිර්ණය කරනු ලැබේ.

මෙම ස්වයංක්‍රීය පරීක්ෂණ මධ්‍යස්ථාන දෙකෙහි නඩත්තුව සඳහා අවශ්‍ය අමතර කොටස් හා සේවා සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2021 ජුනි මස සිට මෙම මධ්‍යස්ථාන දෙක තාවකාලිකව වසා දමන ලද බැවින් මෙම වර්ෂයේ ප්‍රථම මාස 05 ක කාලය සඳහා පමණක් ඉහත සඳහන් දත්ත ලබා ගෙන ඇත. මේ වන විට අමතර කොටස් හා අදාල සේවා කටයුතු සිදුකර ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු අප ආයතනය මගින් සිදු වෙමින් පවතී.

කොළඹ කොටුව දුම්රිය ස්ථානය අසළ පිහිටා ඇති පරීක්ෂණ මධ්‍යස්ථානය මගින් සල්ෆර් ඩයොක්සයිඩ් (SO2) නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO2) යන වායු දූෂක සාන්ද්‍රණය තෙත් රසායනික ක්‍රම භාවිතා කරමින් මාසිකව විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබයි. (සංසරණ වායු තත්වයේ ප්‍රථිපල - ඇමුණුම 1)

වගුව **3 : 2021 (**ජනවාරි සිට මැයි දක්වා) බත්තරමුල්ල **AAQMS** හි නියාමනය කරන ලද දූෂක සඳහා මාසික සාමාන්‍ය

මාසය	සාමාන්‍ය O_3 සාන්ද්‍රණය	සාමාන්‍ය CO සාන්ද්‍රණය	සාමාන්‍ය NO2 සාන්ද්‍රණය	සාමාන්‍ය SO2 සාන්ද්‍රණය	සාමාන්‍ය $PM_{2.5}$ සාන්ද්‍රණය	සාමාන්‍ය PM_{10} සාන්ද්‍රණය
ජනවාරි	15.64	527	23.49		28.85	42.42
පෙබරවාරි	23.70	463	24.07		35.74	53.96
මාර්තු	17.47	679	23.42	4.49	33.06	46.61
අප්‍රේල්	14.36	431	17.90	4.07	22.71	40.78
මැයි	8.06	417	16.62	4.30	13.87	27.55
මුළු එකතුව	15.95	479	21.25	4.24	27.26	42.43

වගුව **4 : : 2021** දී මහනුවර **AAQMS** හි නියාමනය කරන ලද දූෂක සඳහා මාසික සාමාන්‍ය (ජනවාරි සිට මැයි දක්වා)

මාසය	සාමාන්‍ය O_3 සාන්ද්‍රණය	සාමාන්‍ය CO සාන්ද්‍රණය	සාමාන්‍ය NO2 සාන්ද්‍රණය	සාමාන්‍ය SO2 සාන්ද්‍රණය	සාමාන්‍ය $PM_{2.5}$ සාන්ද්‍රණය	සාමාන්‍ය PM_{10} සාන්ද්‍රණය
ජනවාරි	14.75	573.85	10.79	1.24	11.37	30.96
පෙබරවාරි	30.50	1032.47	10.27	0.00	21.01	45.13
මාර්තු	11.93	751.79	20.87	1.69	18.74	0.00
අප්‍රේල්	17.63	483.93	16.98	1.16	24.09	51.39
මැයි	13.54	245.47	7.91	0.44	7.34	26.70
මුළු එකතුව	17.12	488.23	11.92	0.88	14.94	37.52

වගුව **5 :** කොළඹ කොටුව **AAQMS** හි නියාමනය කරන ලද දූෂක සඳහා වාර්ෂික සාමාන්‍ය

දූෂක වර්ගය	වාර්ෂික සාමාන්‍ය අගය
PM_{10} ($\mu g/m^3$)	57
NO_2 (ppm)	8.5282E-09
SO_2 (ppm)	4.84E-09

D. 2021 තුළ තාක්ෂණික උපදේශන/සහාය කාර්යය

වගුව **6 :** තාක්ෂණික උපදේශන / සහය සේවා සැපයීම

අංකය	සපයනු ලබන තාක්ෂණික උපදේශන/සහාය කාර්යයේ වර්ගය	සපයන ලද සේවාවන් ගණන
4.1	වෙනත් සංවිධාන විසින් පත් කරන ලද තාක්ෂණික කමිටුවල සේවය කිරීම	02
4.2	කර්මාන්ත, ව්‍යාපෘති යෝජකයින්, වෙනත් ආයතන විසින් ලැබුණු තාක්ෂණික යෝජනා ඇගයීම	07
4.3	EPL පටිපාටිය හැසිරවීම සඳහා තාක්ෂණික සහාය ලබා දීම	05
4.4	තාක්ෂණික රැස්වීම් සහ සංසද	08
4.5	කෙටි කාලීන සීමාවාසික වැඩසටහන සහ විද්වතුන් සඳහා පුහුණුව	02
4.6	උසාවි /HRC හි පාරිසරික නීති සම්පාදනය පිළිබඳ විශේෂඥ සාක්ෂි සපයන්න	03

E. කර්මාන්ත සම්බන්ධව තාක්ෂණික මග පෙන්වීම සහ පැමිණිලි විමර්ශනය සහ එහි අනුකූලතාවය පිළිබඳව සහාය ලබාදීම.

වායු තත්ත්ව කළමනාකරණ හා පසු විපරම් ඒකකය මඟින් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, පැමිණිලි විමර්ශනය හා නීතිමය කටයුතු සඳහා මෙන්ම වානිජ මට්ටමින්ද පහත සේවාවන් සපයනු ලැබේ.

වගුව **7 :** මිනුම් සේවා සැපයීම

අංකය	මිනුම් සේවා සැපයීම		සේවා කටයුතු සංඛ්‍යාව
5.1	ශබ්ද මට්ටම් මිනුම් කිරීම	දිවා කාලය	48
5.2		රාත්‍රී කාලය	39
5.3	සම්පූර්ණ අවලම්භිත අංශුමය ද්‍රව්‍ය		21
5.4	ඇස්බැස්ටස් ෆයිබර් මිනුම් කිරීම.		05
5.5	වායු ගතික විශ්කම්භය මයික්‍රෝමීටර 10 ට අඩු ක්ෂුද්‍ර අංශු (PM_{10}) මිනුම් කිරීම.		2
5.6	මීතේන් නොවන කාබනික ද්‍රව්‍ය මිනුම් කිරීම.		11
5.7	SOx andand xON		03
5.8	වෙනත් මිනුම් කිරීම.Non specified Measurements (Elephant Explosives 02, Independence day 01		03

F. පාරිසරික මිනුම් කිරීම් සහ සේවා සැපයීම මඟින් ආදායම් උපයා ගැනීම.

වායු සම්පත් කළමනාකරණ හා පසු විපරම් ඒකකය 2021 වර්ෂය තුලදී රු. 2,729,488.52 ක ආදායමක් මිනුම් කටයුතු මගින් උපයා ගෙන ඇති අතර නියාමන අරමුණු සඳහා කරන ලද මිනුම් මුදල් අයකිරීමකින් තොරව සිදු කර ඇත.



රූපය **3 :** සේවා සැපයීම මඟින් ලැබූ ආදායම්



රූපය **4 :** සංසරණ වායු තත්වයේ ප්‍රථිපල

1. බත්තරමුල්ල පිහිටි තත්ය කාලීන ස්වයංක්‍රීය පරීක්ෂණ සංසරණ වායු තත්ත්ව පසු විපරම් මධ්‍යස්ථානයේ වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය











රූපය **5 :** වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය - බත්තරමුල්ල

2. මහනුවර පිහිටි තත්‍ය කාලීන ස්වයංක්‍රීය පරීක්ෂණ සංසරණ වායු තත්ත්ව පසු විපරම් මධ්‍යස්ථානයේ වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය











රූපය **6 :** වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය - මහනුවර

3. කොළඹ කොටුව පිහිටි සංසරණ වායු තත්ත්ව පසු විපරම් මධ්‍යස්ථානයේ වායු තත්ත්ව මධ්‍යනය සාන්ද්‍රණවල මාසික විචලනය



රූපය **7 :** කොළඹ කොටුව පිරික්සුම් මධ්‍යස්ථානයේ **PM 10** දත්ත



රූපය **8 :** කොළඹ කොටුව පිරික්ෂුම් මධ්‍යස්ථානයේ **NOX** දත්ත



රූපය **9 :** කොළඹ කොටුව පිරික්ෂුම් මධ්‍යස්ථානයේ **SO2** දත්ත

2.2.2 ජල තත්ව පසු විපරම් ඒකකය

A. හැදින්වීම :

ජාතික පාරිසරික පනත 4 බී කොටසට අනුකූලව ජාතික පාරිසරික බලපත්‍රය ලබා ගත යුතු කර්මාන්ත ක්‍රියාවලින් සඳහා අවශ්‍ය විශ්ලේෂණ වාර්තා ලබා දීම ජල තත්ව රසායනාගාරයේ මූලික කාර්යය භාරය වේ.

මේ අනුව බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කර්මාන්ත වල පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය සඳහා ද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීම, අලුත් කිරීම, නීතිමය ගැටළු හා පසු විපරම් කටයුතු සඳහා ද විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලබයි.

මීට අමතරව පළාත් රසායනාගාර මගින් රැස්කරනු ලබන ජල සාම්පල වල එම රසායනාගාරයන්හි සිදු කිරීමට නොහැකි විශ්ලේෂණ ජලයෙහි තත්වය පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි. තවද ජලජ පරිසරය සංරක්ෂණය හා කළමනාකරණය සිදු කිරීම උදෙසා රට තුල ඇති මතුපිට ජලාශ වල එම ජලයේ තත්වය පසුවිපරම් කිරීමද සිදුකරනු ලබයි.

මීට අමතරව ප්‍රධාන රසායනාගාරයේ සම්බන්ධීකරණය යටතේ පවතින පළාත් රසායනාගාර 08ක සහ දිස්ත්‍රික් රසායනාගාර 01ක සියළුම අවශ්‍යතාවල කටයුතු සම්බන්ධීකරණ කිරීම සිදු කරනු ලබයි.

B. කාර්මික අපසන්දන හා රට අභ්‍යන්තර ජලාශ වල ජල තත්ව විශ්ලේෂණ වාර්තා ලබාදීම

2021 වර්ෂය තුල තෝරාගන්නා ලද ජල දේහ 03ක් එනම් කැළණි ගඟ, මා ඔය සහ දියවන්නා ඔය වාර්ෂික සැලැස්මක් යටතේ පසු විපරම් සිදු කර ඇත. කැළණි ගඟෙහි ස්ථාන 17ක් ද , මා ඔය සඳහා ස්ථාන 8ක් සහ දියවන්නා ඔය සඳහා ස්ථාන 8ක සඳහා මතුපිට ජලයේ තත්වය පරීක්ෂා කිරීම සිදු කර ඇත.

2021 වර්ෂය තුල එලෙස රැස් කරන ලද මුළු සාම්පල ගණන සහ කර්මාන්ත වලට අදාලව ලබා දුන් විශ්ලේෂණ වාර්තා පිළිබඳව පහත වගුවෙන් දක්වා තිබේ. (ප්‍රස්ථාර අංක 1)



රූපය **10 :** සාම්පල ලබා ගැනීමේ සාරංශය

රට තුල පැවති කොවිඩ් 19 ව්‍යසන තත්වය මත සාම්පල රැස් කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු මට්ටමකට ඉහළ නැංවීමට අපොහොසත් වී ඇත.

C. දියවන්නා ඔයෙහි ඇතිවූ ඇල්ගී තත්වය පරීක්ෂා කිරීම

2021 වර්ෂය තුල දියවන්නා ඔයෙහි ඇතිවූ ඇල්ගී තත්වය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරය පරිසර දූෂණ පාලන අංශය සමඟ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ අධිකාරිය හා එක්ව දියවන්නා ඔයෙහි කඩුවෙල ජල පෝෂක කලාපය තුල හඳුනාගත හැකි හා හඳුනාගත නොහැකි ප්‍රභවයන් අධීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධව කටයුතු කරන ලදි. මේ සඳහා දියවන්නා ඔයට ජලය විමෝචනය කරනු ලබන සියළුම ආයතන වලින් බැහැර කරනු ලබන ආයතන පරීක්ෂා කිරීම හා එම ජලය විශ්ලේෂණය කිරීම සඳහා දියවන්නා ඔයෙහි ජලයේ තත්වය ආරක්ෂා කරමින් ව්‍යාපෘති සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදි. මේ යටතේ එවැනි ආයතන 42ක් පරීක්ෂා කිරීම හා ජල සාම්පල විශ්ලේෂණ සිදු කිරීම සිදුකරන ලදි.

D. ISO17025:2017 ජාත්‍යන්තර ප්‍රමිති තත්ව පවත්වා ගැනීමට අදාලව කටයුතු සිදු කිරීම.

2017 සංශෝධිත ISO/IEC ප්‍රමිතින්ට අනුකූලව 2021 වසරේදී විගණන පරීක්ෂණයකට පෙනී සිටීමෙන් අනතුරුව අඛණ්ඩව ලබා ගත් ප්‍රමිති තත්ව සහතිකය වර්ෂ 03ක් දක්වා ඉදිරියට එනම් වර්ෂ

2023 දක්වා දීර්ඝ කරන ලදී. 2021 වසරේදී සංශෝධිතයන්ට අනුකූලව ලබා ගන්නා ලද ප්‍රමිති තත්වය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික කටයුතු සිදුකිරීම් 2021 වසර පුරාම සිදු කරන ලදී. අදාළ වසර තුලදී නයිට්‍රේට (Nitrate), මුළු පොස්පේට් ප්‍රමාණය (Total Phosphate), මුළු අවලම්බිත අංශු ප්‍රමාණය (TSS) සහ දියවූ ඝනද්‍රව්‍ය ප්‍රමාණය (TDS) යන නව පරාමිතින් 4 ක් සඳහා ප්‍රමිති තත්වය ලබා ගැනීමට වූ සියලු තාක්ෂණික කටයුතු සිදු කරන ලදි.

ඒ අනුව දැනට ජාත්‍යන්තර ප්‍රමිති තත්වය ලබා ගෙන ඇති පරාමිතින් සහ නව පරාමිතින් 04ක් සඳහා ISO/IEC 17025:2017 ප්‍රමිති තත්වය යටතේ ප්‍රතිතන තත්වය ලබා ගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලැබූ පරීක්ෂණ විශ්ලේෂණ ඇගයීමකට (Proficiency Testing) 2021 වසර තුලදී සහභාගි වූ අතර එලෙස සහභාගී වූ සියලුම පරාමිතීන් ඉහල මට්ටමේ ඇගයීමක් ලබාගෙන ඇත.

මෙම වර්ෂය තුල පරීක්ෂණ විගණනයට සියල්ල සුදානම්ව තිබියදි වර්තමාන කොවිඩ් ව්‍යසන තත්වය මත එම පරීක්ෂණය 2022 වර්ෂයේ ජනවාරි මස 20, 21 දිනට කල්යාම නිසා එම තත්වය මෙම වර්ෂය තුල ලගා කර ගැනිම ප්‍රමාද විය. මෙම ප්‍රතිතනකරණ ක්‍රියාවලිය ප්‍රාදේශිය රසායනාගාර වලට හඳුන්වා දිමේ මූලික කටයුතු මෙම වසර තුල ක්‍රියාත්මක කල ප්‍රධාන කර්තව්‍යක් වේ.

E. ප්‍රධාන රසායනාගාරයේ විශ්ලේෂණ කටයුතු පුළුල් කිරීම සහ ඉහල නැංවීම

E.1 නව ක්ෂුද්‍ර ජීව් විශ්ලේෂණ විධිමත් කිරීම.

ක්ෂුද්‍ර ජීව් විශ්ලේෂණ සඳහා ප්‍රතිතිතන තත්වය ලබා ගැනීමට සඳහා විශ්ලේෂණ කටයුතු විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා අවශ්‍ය මූලික යටිතල පහසුකම් සහිතව නවීකරණය කිරීම 2021 වර්ෂය තුල සිදු කරන ලදී . ඒ සඳහා අවශ්‍ය නවීන ගෘහ භාණ්ඩ ස්ථානගත කර ක්ෂුද්‍රජීව් විශ්ලේෂණ කටයුතු සිදු කිරීමට රසායනාගාර නිලධාරීන් සඳහා අවශ්‍ය පුහුණු විම් ලබා දීම සිදු කරන ලදී.



රූපය **11 :** නව ක්ෂුද්‍ර ජීව් විශ්ලේෂණ රසායනාගාරය

E.2 ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණ (Micro Plastic) රසායනාගාරයක් ආරම්භ කිරීම සඳහා මූලික පියවර ගැනීම.

එක්සත් රාජධානියේ පාරිසරික ධිවර හා විද්‍යා ආයතනය මගින් 2021 වර්ෂය තුලදී (Centre for Environmental Fisheries and Science) රු.මිලියන 1.34 ක් වටිනා ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණයට අදාල රසායනාගාර උපකරණ නොමිලයේ ලබා දෙන ලදී. ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණයට අදාල උපකරණ ස්ථානගත කර විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමට සකස් කිරීම සහ ඉදිරියේ දි මතුපිට ජලාශ වල ජල නියැදි එක් රැස් කර එහි ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.



රූපය **12 :** ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණ රසායනාගාරය

E.3 ප්‍රධාන රසායනාගාරයේ විශ්ලේෂණ රසායනාගාරය තුල නව විදුලි පහන් සවි කිරීම හා වායු සමන යන්ත්‍ර සවි කිරීම.

ප්‍රතිතන තත්වය පවත්වා ගැනීම සඳහා රසායනාගාරයේ පාරිසරික තත්වය පාලන කිරීම හා ආලෝක තත්වය මනා පරිදි තබා ගැනීම ඉතා අත්‍යවශ්‍ය වේ. මේ සඳහා රු. මිලියන 0.445 වැය කොට රසායනාගාර තුල පැවති පැරණි විදුලි පහන් ඉවත් කර නව විදුලි පහන් සවිකිරීම සහ වායු සමන යන්ත්‍ර 03ක් සවිකර විශ්ලේෂණ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම 2021 වර්ෂය තුල සිදු කරන ලදී.





F. ජල තත්ව රසායනාගාරය 2021 වර්ෂය තුල ප්‍රාදේශීය රසායනාගාර වල තත්වය ඉහල නැංවීම සඳහා කරන ලද විශේෂ ක්‍රියාකාරකම්

F.1. ජල තත්ව මාපක (Water quality Checkers) ලබා දීම.

රසායනාගාර සාම්පල විශ්ලේෂණ ක්‍රියාවලියේ දී වැදගත්ම උපකරණයක් වන ජල තත්ව මාපක (ජලයේ pH, විද්‍යුත් සන්නායකතාව, අවිලතාවය සහ උෂ්ණත්වය මැනීමට භාවිතා වන උපකරණය) 15ක් මිල දී ගෙන රසායනාගාර 10 සඳහා ලබා දීම හා එහි ක්‍රියාකාරිත්වයට අවශ්‍ය පුහුණු විම් ලබා දීමට කටයුතු කර ඇත. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 1.34 මුදලක් වැය කරන ලදී.



රූපය **13 :** ප්‍රාදේශීය රසායනාගාර සඳහා ජල තත්ව මාපක බෙදා දීමේ අවස්ථා වැඩසටහන

F.2 ප්‍රාදේශීය මට්ටමේ ජලාශ වල ජල තත්වය නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය මගින් කරන ලද මිලදී ගැනීම්.

මෙයට අමතරව රසායනාගාර බලගැන්වීමේ ව්‍යාපෘතිය මගින් ප්‍රධාන රසායනාගාරය ඇතුළු ප්‍රාදේශීය රසායනාගාර වලට රු. මිලියන 6.68 මුදලක් වැය කොට ජල නියැදි ගබඩා කිරීමට ශීතකරණ 3 ක් (Sample Refrigerator) බහුවිධ පෙරන 10 ක් (Multi filtration apparatus) රසායනාගාර මිනුම් පඩි කට්ටල 6 ක් (Sets of weights) රසායනාගාර තුලා (Analytical Balance) 09 ක් හා ක්ෂුද්‍ර පිපෙට්ටු 6ක් මිලදී ගන්නා ලදී. තවද සියලු රසායනාගාර වල ඇති රසායනාගාර උපකරණ සත්‍යාපනය (Third party Calibration) කිරීමට සහ එදිනෙදා විශ්ලේෂණ කටයුතු වලට අවශ්‍ය රසායන ද්‍රව්‍ය (Chemicals) වීදුරු උපකරණ (Glassware) හා පෞද්ගලික ආරක්ෂක උපකරණ (Personnel Safety Equipment's) කාර්යාලීය උපකරණ මිලදි ගැනීම මිලදී ගැනීමට කටයුතු කරන ලදී.

F.3 ප්‍රාදේශීය රසායනාගාර වල මූලික යටිතල පහසුකම් ලබා දීම.

F.3.a ප්‍රාදේශීය රසායනාගාර 02ක් සඳහා කන්ටේනර් රසායනාගාර (Container Laboratory) 02ක් ලබා දීම හා දුම් අවශෝෂක කුළුණු ලබා දීම

ප්‍රාදේශීය රසායනාගාර වල පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන හෙයින් ඒ සඳහා විකල්පයක් ලෙස කන්ටේනර් තුල අංග සම්පූර්ණ යටිතල පහසුකම් සහිත රසායනාගාර 02ක් නැගෙනහිර පලාත් රසායනාගාරයට සහ උතුරු මැද පලාත් රසායනාගාරය වෙත ලබා දෙන ලදී. රසායනාගාර

විශ්ලේෂණ කටයුතු වලදි මුක්ත වන වාෂ්පශීලි ද්‍රව්‍ය රසායනාගාර නිලධාරින්ගේ සෞඛ්‍යාරක්ෂාවට හානියක් නොවන අයුරින් විමෝචනය සඳහා ගම්පහ දිස්ත්‍රික් කාර්යාලීය සහ මධ්‍යම පළාත් කාර්යාලීය රසායනාගාර 2 සඳහා දුම් අවශෝෂක කුළුණු (Fume Hoods) ස්ථාපිත කරන ලදී.



රූපය **14 :** නැගෙනහිර පලාත් රසායනාගාරය වෙත ලබා දුන් කන්ටේනර් රසායනාගාරය



රූපය **15 :** මධ්‍යම පළාත් පලාත් රසායනාගාරය ස්ථාපිත දුම් අවශෝෂක කුළුණ

G. රසායනාගාර තුලින් බැහැරලන අපජලය සඳහා තිරසර ක්‍රමවේදයක් හඳුන්වා දීම.

ඉන්සි ඉකෝසයිකල් පුද්ගලික සමාගම සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට රසායනික අපජලය පරිසරයට බැහැර කිරීම වැලැක්වීමේ පරිසර හිතකාමී ක්‍රමවේදයක් හඳුන්වා දී ප්‍රධාන රසායනාගාරය 2021 වර්ෂය තුලදී කටයුතු කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ සියළු රසායනාගාර ඒවා මගින් බැහැර කරන සියලු ඝන හා දියරමය අපද්‍රව්‍ය පරිසර හිතකාමී පාංශු දූෂණය, මතුපිට , භූගත ජල දූෂණය හා ජලජ ජීවීන්ට බලපෑමක් නොවන අයුරින්

තිරසාර ලෙස බැහැර කිරීමට බලාපොරොත්තු වේ



රූපය **16 :** තිරසර අපජල කළමනාකරණ සැලැස්මේ සමාරම්භක අවස්ථාව



රූපය **17 :** රසායනාගාර පරිශ්‍රය තුල ස්ථානගත කර ඇති අපජලය බැහැරලීමේ පද්ධතිය

H. පළාත්/දිස්ත්‍රික් රසායනාගාර සම්බන්ධීකරණ කටයුතු සහ ප්‍රගතිය.

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන රසායනාගාරයට සමගාමීව පළාත් 09 තුල පළාත් රසායනාගාර 08ක් සහ එක් දිස්ත්‍රික් රසායනාගාරයක් සක්‍රියව ක්‍රියාත්මක වේ. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන රසායනාගාරය හා පළාත් රසායනාගාර මගින් ද මතුපිට ජලයේ ගුණාත්මක තත්වයන් ක්‍රමානුකූලව පසු විපරම් කිරීම, කර්මාන්ත වල අපජල විශ්ලේෂණය සම්බන්ධ කටයුතු කිරීම සහ ඒ ඒ ප්‍රදේශ වල පවතින කර්මාන්ත වල පාරිසරික ගැටළු මෙන්ම පාරිසරික බලපත්‍ර ක්‍රියාවලියේ දී පසු විපරම් කටයුතු ද සිදු කරනු ලබයි.

ප්‍රධාන රසායනාගාරය ඇතුළු පළාත් රසායනාගාර මගින් 2021 වර්ෂය තුල රැස් කරන ලද වාණිජ ජල සාම්පල සහ මුළු ජල සාම්පල ප්‍රමාණ පිළිබඳ දත්ත පහත ප්‍රස්ථාර අංක II මගින් පෙන්නුම් කරයි.



රූපය **18 :** මගින් 2021 වර්ෂය තුල රැස් කරන ලද වාණිජ ජල සාම්පල සහ මුළු ජල සාම්පල ප්‍රමාණ පිළිබඳ දත්ත

I. ප්‍රධාන රසායනාගාරය හා පළාත් රසායනාගාර මඟින් 2021 වර්ෂය තුල උත්පාදනය කරන ලද අදායම් පහත රූප සටහන මඟින් දක්වා ඇත



රූපය **19:** ප්‍රධාන රසායනාගාරය හා පළාත් රසායනාගාර මගින් 2021 වර්ෂය තුල උත්පාදනය කරන ලද ආදායම

J. අනෙකුත් ආයතන / අංශ සමග සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම්

වගුව **8 :** අනෙකුත් ආයතන / අංශ සමග සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම්

අ.අ	වැඩසටහනේ ස්වභාවය	වැඩසටහන් ගණන
01	තාක්ෂණික කමිටු/ පාරිසරික බලපෑම් ඇගයීම්/මූලික පාරිසරික බලපෑම් ඇගයීම්/ රැස්වීම්	48
02	පුහුණු වැඩමුළු	21
03	දැනුවත් කිරීමේ වැඩසටහන් සහභාගිත්වය	08
04	ක්ෂේත්‍ර අධ්‍යයන වලට සහභාගි වීම	06
05	මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර පසු විපරම් කිරීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ	18
06	අබතලේ ස්වංයක්‍රීය ජලතත්ව පසුවිපරම් කිරීමේ කටයුතු පරීක්ෂා කිරීම	26
07	හදිසි/ අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ	06
08	වෙනත්	04

K. විශ්ව විද්‍යාල සිසුන් පුහුණු කිරීම

2021 වර්ෂය තුල කොවිඩ් ව්‍යසන තත්වය පැවතියද ලංකාවේ විවිධ විශ්ව විද්‍යාල වලින් පැමිණි උපාධි අපේක්ෂිත සිසුන් 07කට සහ උපාධිධාරී පුහුණු සිසුවකුටද රසායනාගාරය තුල පුහුණු වීම් කටයුතු සිදු කර ඇත. මෙම සිසුන් සඳහා රසායනාගාර විශ්ලේෂණ කටයුතු, රසායනාගාර උපකරණ භාවිතා කිරීම හා රසායනාගාර තත්ව පාලන කටයුතු පිළිබඳ මනා පුහුණුවක් ලබා දීමට ජල තත්ව රසායනාගාරය කටයුතු කරන ලදි.

L. පුනරාවර්තන වියදම් යටතේ සිදු කල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

ප්‍රධාන රසායනාගාරය මගින් පළාත් 09 පළාත් රසායනාගාර 08ක සහ දිස්ත්‍රික් රසායනාගාර 01ක සියළුම රසායන ද්‍රව්‍ය, රසායනාගාර උපකරණ අළුත්වැඩියා කටයුතු, ප්‍රධාන රසායනාගාරයේ

උපකරණ ක්‍රමාංකනය කිරීම් ඇතුළු සියළුම කාර්යයන් ඉටු කිරීම් හා සම්බන්ධීකරණය ද වසර පුරාම සිදු කරන ලදි.

පුනරාවර්තන වියදම්, මිලියන 05ක මුදල වැය සංකේත 407 යටතේ වියදම් කර ඇති මුදල් ප්‍රමාණ පහත පරිදි විස්තර වේ. (ජල තත්ව හා පසු විපරම් ඒකකය සඳහා).

වගුව **9 :** පුනරාවර්තන වියදම්, මිලියන 05ක මුදල වැය සංකේත 407 යටතේ වියදම් කර ඇති මුදල් ප්‍රමාණ

වැය සංකේත	යෝජිත ක්‍රියාකාරකම	වියදම් වූ මුදල
407-1.6.1	උපකරණ ක්‍රමාංකනය කිරීම (ප්‍රධාන රසායනාගාරය) නඩත්තු කිරීම (ප්‍රධාන රසායනාගාරය හා ප්‍රාදේශීය රසායනාගාර)	රු.479,663.00
407-1.6.2	රසායනික ද්‍රව්‍ය උපකරණ මිලදි ගැනීම් සහ රසායනාගාර අවශ්‍යතා වියදම්	රු.1,782,743.80
407-1.6.3	ප්‍රතීතකරණ ක්‍රියාවලිය සහ රසායනාගාර තත්ව පාලන කටයුතු සඳහා	රු.175,010.00
407-1.6.4	රසායනාගාර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ලබා දීම.	රු.166,336.00
407-1.6.5	අභ්‍යන්තර රැස්වීම් සඳහා	රු.1,400.00
407-1.6.6	ජල තත්ව පසුවිපරම් කටයුතු සඳහා	රු.7,992.00
407-1.6.7	අපජල පිරිපහදු පද්ධතිය සඳහා වියදම්	රු.118,497.72
	එකතුව	**රු.2,731,642.52**

මේ වනවිට ආරම්භ කරන ලද රසායනාගාර කටයුතු සඳහා ඉතිරි මුදල්ප්‍රතිපදන භාවිතා කිරීමට බලාපොරොත්තු වේ.

Chapter 3 : අපද්‍රව්‍ය කළමණාකරන අංශය

මෙම ඒකකය මධ්‍යම පරිසර අධිකාරියට අළුතින් එක්වූ අංශයක් වන අතර ඒ යටතේ ඒකක දෙකක් ස්ථාපිත කොට ඇත.

3.1 රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය

2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රසායනික ද්‍රව්‍ය හා උපද්‍රවකාරී අපද්‍රව්‍යකළමනාකරණ ඒකකය මඟින් ඉටු කරන ලද ක්‍රියාකාරකම්

(අ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

(ආ) අන්තර්ජාතික සම්මුතීන්ට අදාළ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

(ඇ) රසායනික ද්‍රව්‍ය කළමනාකරණයට අදාළ කටයුතු ඉටු කිරීම

(ඉ) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම යන මූලික කාර්යයන් ඉටුකිරීමට කටයුතු සිදු කර ඇත.

ඒ අනුව 2021 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රතිපාදන මඟින් වෙන් කරන ලද රු.,1,000,000.00 ක මුදලින් රු. 991,803.00 ක මුදලක් ඉතා ප්‍රයෝජනවත් ආකාරයට යොදවා 99.18% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. මීට අමතරව ඒකකය මඟින් 12,763,263.00 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත උපයා දී ඇත.

1. ශ්‍රී ලංකාව තුළ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී කළමනාකරණ රෙගුලාසි (අංක1534/18 දරණ 2008 පෙබරවාරි 01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය) ක්‍රියාත්මක කිරීමේ එක් කොටසක් ලෙස 2021 වසර තුළ උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර 329 නිකුත් කර ආදායම ලෙස 1,925,513.00 (දහනව ලක්ෂ විසිපන්දහස් පන්සිය දහතුන) ආදායමක් උපයා ඇත.

2. අන්තර්ජාතික සම්මුතින්ට අදාළ කටයුතු

I. බාසල් සම්මුතිය

ශ්‍රී ලංකාව 1992.08.28 දින සිට දේශසීමා අතර උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය හා අපහරණය සඳහා වූ බාසල් සම්මුතියට එළඹ ඇති අතර එතැන් පටන් මධ්‍යම පරිසර අධිකාරිය ශ්‍රී ලංකාව තුළ මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස කටයුතු කරයි. මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සම්බන්ධීකරණ කමිටුව මෙරට උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික කරුණු වලට අදාළ නිසි තීරණ ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය අවශ්‍ය සහාය ලබාදීම සඳහා තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කොට ඇත. බාසල් සම්මුතිය ක්‍රියාත්ම කිරීමට අදාලව 2021 වර්ෂය තුල ආනයන අවස්ථාවන් 258ක් නිකුත් කල අතර ඉන් ලද මුළු ආදායම රු. 4,270,350.00 ක් වේ. වර්ෂය තුල බාසල් තාක්ෂනික රැස්වීම් 04 ක් පැවැත්වූ අතර ඒ සඳහා රු. 168,298.00 ක් වැය විය. එහිදි කරුණු 42 කට අදාලව ආනයන ගැටළු සාකච්ඡා කරන ලද අතර ඉන් ලද ආදායම රු. 460,000.00 ක් වේ.

දේශාන්තර (දේශසීමා හරහා) උපද්‍රවකාරී අපද්‍රව්‍ය ප්‍රවාහනය

බාසල් සම්මුතියේ A ලැයිස්තුගත අපද්‍රව්‍ය මෙරට දේශසීමා හරහා ප්‍රවාහනයට අනුමැතීන් 53 ක්ද මෙරටින් ආනයනය සඳහා අනුමැතීන් 19 ක්ද ලබා දී ඇත.

ශ්‍රී ලංකාව තුළ බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ බලයලත් ආයතනය ලෙස මධ්‍යම පරිසර අධිකාරිය 2021 වර්ෂය තුළදී බාසල් හි "A" සහ "B" ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති අපද්‍රව්‍ය රට හරහා සංක්‍රමණ කිරීම් (Transboundary movement) 53 ක් සහ අපනයන 18 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. සම්මුතිය සහ රු. 224,000.00 අපනයන අනුමැතීන් නිකුත් කිරීමෙන් උපයා ඇත.

II. රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම

උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හා කෘමිනාශක වර්ග සඳහා ආනයනයේදී හෝ අපනයනයේදී පූර්ව අවසරයක් ලබා ගැනීමේ අන්තර්ජාතික වෙළඳ සම්මුතිය වන රොටර්ඩෑම් සම්මුතියට 2006 වසරේදී ශ්‍රී ලංකාව එළඹෙන ලදි. එම සම්මුතිය ක්‍රියාත්මක කිරීමේදී බලයලත් ආයතනය වනුයේ මධ්‍යම පරිසර අධිකාරිය වන අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් සඳහා අප ඒකකය සෘජුවම දායකවේ.

රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද තාක්ෂණික ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කමිටුවක් පත්කොට ඇති අතර 2021 වසර සඳහා තාක්ෂණික කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු. 87,920.00 ක පිරිවැයක් දරා ඇත. එම තාක්ෂණික උපදේශන කමිටු රැස්වීම් මඟින් ගත් තීරණ අනුව ඇස්බැස්ටෝස් අමුද්‍රව්‍ය ආනයන අවස්ථා 109ක් වෙත අනුමැතිය ලබාදී ඇත. ඉන් උපයන ලද ආදායම රු. 1,357,050.00ක් වේ.

3. රසායනික ද්‍රව්‍ය කළමනාකරණය

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණයට අමතරව රසායනික ද්‍රව්‍ය කළමනාකරණයද මධ්‍යම පරිසර අධිකාරිය ඉහල කළමනාකාරීත්වය විසින් 2019 වසරේ සිට අප ඒකකයට පවරන ලදි.

මේ වන විට රසායනික ද්‍රව්‍ය කළමනාකරණය අප ඒකකය මඟින් සිදු කරනු ලබන අතර රසායනික ද්‍රව්‍ය මඟින් සිදුවිය හැකි අනතුරු අවම කිරීමේ මූලික පියවරක් ලෙස රසායනික ද්‍රව්‍ය ගබඩා සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ.මේ වසරේ දී එවැනි පාරිසරික නිර්දේශ 55 ක් නිකුත් කර ඇති අතර රසායනික ද්‍රව්‍ය ආනයන අනුමැතීන් 413 ක් නිකුත් කර ඇත. ඉන් රු. 5,883,300.00ක මුලු මුදලක් අප ඒකකය උපයා ඇත.

4. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සලකා බැලීමේදී විධිමත් සහ අවිධිමත් යන දෙයාකාරයට පරිසරය සැකසී පවතී. එසේම විධිමත් ආකාරයෙන් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ කොටස් කිරීම සැලකිය යුතු ප්‍රමාණයකින් පවතින අතර මේ ක්‍රියාවන් විශාල පාරිසරික සහ සෞඛ්‍යමය බලපෑම් ඇති කරයි.

මධ්‍යම පරිසර අධිකාරියේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික කළමනාකරණ ඒකකය, බස්නාහිර පළාත් කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල එක්ව බලපත්‍රලාභී ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ කර්මාන්ත 11ක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ නිවාස මට්ටමින් ජනනය වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා බස්නාහිර පළාතේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් පවත්වන ලදී. එහිදී එකතු කරන ලද ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 4.27 ක් පමණ වන අතර, රු. 429,585.00 මුදලක් වැය කරන ලදී.



රූපය **20 :** බස්නාහිර පළාතේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන

5. දැනුවත් කිරීමේ අත්පත්‍රිකා හා පොත් පිළියෙල කිරීම

- බාසල් මාර්ගෝපදේශයේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් 1,000 මුද්‍රණය කිරීම.
- සායනික අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශයේ ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් 1,000ක් මුද්‍රණය කිරීම.
- බස්නාහිර පළාත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන - 2021 සඳහා බැනර් 150ක් සකස් කිරීම.
- බස්නාහිර පළාත් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන - 2021 සඳහා පසුබිම (backdrop) සකස් කිරීම.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික කළමනාකරණ ඒකකය වෙත වෙන් කර ඇති මුළු මුදලින් රු. 306,000.00ක බාසල් මාර්ගෝපදේශය සහ සායනික අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශයේ ඉංග්‍රීසි පරිවර්තනය සඳහා වැය කරන ලදී.



3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය

පිවිතුරු නිරෝගීමත් පරිසරයක් රට තුළ ඇති

	ප්‍රතිචක්‍රීකණ ද්‍රව්‍ය එකතු කිරීම (ප්‍රමාණය ටොන්**)**	
	2020	**2021**
ලියාපදංචි ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය එකතු කරන්නන්ගේ දත්ත මඟින්.	18,610	20,010
ආයෝජන මණ්ඩලයේ කර්මාන්තශාලා මඟින්.	235	318
නැව් මඟින් එකතු කරන කසළ	40	27

කිරීමේ දැක්මක් උදෙසා ප්‍රතිපත්ති සැකසීම, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම හා ඉලක්ක කණ්ඩායම් අතර දැනුවත් කිරීම ඇති කිරීම මඟින් රට තුළ නිවැරදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම යන මෙහෙවර ප්‍රකාශය යටතේ අපද්‍රව්‍ය කළමනාකරණ අංශය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය පිහිටුවන ලදි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ප්‍රධාන අංශ තුනක් යටතේ එහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලබයි.

01. ප්‍රතිපත්ති හා තාක්ෂණික මැදිහත්වීම්.

02. නීති හා රෙගුලාසි බලාත්මක කිරීම.

03. විශේෂ ව්‍යාපෘති.

1.1 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ප්‍රතිපත්ති හා තාක්ෂණික මැදිහත්වීම්.**

ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය ප්‍රතිපත්ති, උපාය මාර්ග, මාර්ගෝපදේශ හා සැලසුම් සැකසීම මේ යටතේ සිදු කරනු ලබයි.

1.1.1 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ 3R සංකල්පය ක්‍රියාත්මක කිරීම.**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ 3R සංකල්පය ප්‍රගුණ කිරීම සඳහා 2021 වසරේදී පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය පිළිබඳ දත්ත, ආකාර තුනක් යටතේ රැස්කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන ලද අතර 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම පහත පරිදි වේ.

ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය එකතුකරන්නන්ගේ දත්ත ගබඩාව.

- දිවයින පුරා ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන්ගේ දත්ත පද්ධතිය යාවත් කාලීන කර මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය හරහා ප්‍රචාරය කර ඇත.

- පරිසර හිතකාමීව ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එකතු කරන බවට ලබාගත් ක්ෂේත්‍ර පරීක්ෂණ නිරීක්ෂණය මත 2021 දෙසැම්බර් දක්වා උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය එකතු කරන්නන් 317 දෙනෙකු මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇත. ඒ අනුව ලියාපදිංචි කරුවන්ගෙන් ලබාගත් දත්ත අනුව, කඩදාසි ටෙන් 4484, ප්ලාස්ටික් ටොන් 3809, වීදුරු ටොන් 2876 ක්, කාඩ්බෝර්ඩ් ටොන් 2979 ක් , ලෝහ ටොන් 3426 ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා මාසිකව එක්රැස් කර ඇත.

ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ශාලා මඟින් ප්‍රතිචක්‍රීකරණ අපද්‍රව්‍ය එකතු කිරීම.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ශාලා මඟින් ප්ලාස්ටික් /පොලිතින් අපද්‍රව්‍ය ඉවත් කර ප්‍රතිචක්‍රීකරණය සඳහා එකතු කරන්නන් සඳහා ඝන අපද්‍රව්‍ය කලමනාකරණ ඒකකය එකඟතා ලිපි නිකුත් කරනු ලැබේ.එකඟතා ලිපි ලබා දීම හරහා ලැබුණු දත්ත අනුව 2021 වසර තුල ආයෝජන මණ්ඩලයේ කර්මාන්ත ශාලා මඟින් ප්ලාස්ටික් ටොන් 318 ක් ඉවත්කර ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කර ඇත.

නැව් මඟින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල එකතු කිරීම.

- නැව් මඟින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රවය එකතුකරන්නන් සඳහා පරිසර නිර්දේශ නිකුත් කිරීම සහ නැව් මඟින් කසල එකතු කරන්නන් 17 දෙනෙකු සඳහා පරිසර නිර්දේශ නිකුත් කිරීම 2021 වසරේදී ආරම්භ කරන ලදි. එමඟින් උපද්‍රවකාරී නොවන හා විෂ රසායන ද්‍රව්‍ය වලින් තොර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතුකරන්නන් 11 දෙනෙකු 2021 වර්ෂය සඳහා පරිසර නිර්දේශ නැවත අලුත් කිරීමට අයදුම් කර ඇත.

- මෙම ලියාපදිංචි කසළ එකතු කරන්නන් ගෙන් ලබා ගත් දත්ත අනුව ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 3.5, පොලිතීන් අපද්‍රව්‍ය ටොන් 1.5, ලෝහ අපද්‍රව්‍ය ටොන් 12, වීදුරු අපද්‍රව්‍ය ටොන් 0.5 සහ කඩදාසි අපද්‍රව්‍ය ටොන්2.4 ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා මාසිකව එකතු කර ඇත. 2021 වර්ෂය සඳහා නැවි මඟින් එකතු කරන ලද මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 26.6 ක් වේ.

ප්ලාස්ටික් කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

- පරිසර අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේදී ප්‍රකාශයට පත් කල ප්ලාස්ටික් කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම සඳහා වූ තාක්ෂණික යෙදවුම් ලබා දීම සහ එය පිළියෙළ කිරීමට ක්‍රියාකාරීව දායක වීම.

- ලංකා වාණිජ මණ්ඩලය සහ සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් සමඟ එක්ව,-ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා "3R" පුහුණු අත්පොත සකස්කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් පුහුණු කිරීම 2022 දී සිදු කෙරේ.



රූපය **21 :** පුහුණු අත්පොත සභාපතිවරයා වෙත භාරදීම.

ප්ලාස්ටික් / පොලිතීන් මාලා වෙනුවට කඩදාසි මල්මාලා.

- කතරගම දෙවොල වැනි පුජනීය ස්ථානවල බහුලව භාවිතා වන තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍යයක් ලෙස ප්ලාස්ටික් මාල හඳුනාගෙන ඇත. එබැවින්, ජාතික ශිල්ප සභාවේ අනුග්‍රහය ඇතිව , ප්ලාස්ටික් වෙනුවට කඩදාසි සහ ස්වාභාවික මල්මාලා නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රදේශයේ ප්ලාස්ටික් මාලා නිෂ්පාදකයින් 100 කට අධික සංඛ්‍යාවක් පුහුණු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල වල සහයෝගීතාවයෙන් ගෙයින් ගෙට ගොස් පුළුල් දැනුවත් කිරීම් සිදු කරන ලදී. ධනාත්මක ප්‍රතිචාර සමඟින්, මෙම අයිතමය යෝජිත තහනම් තනි භාවිත ප්ලාස්ටික් ලැයිස්තුවට ඇතුළත් කර ඇත.





රූපය **22 :** කඩදාසි මල්මාලා සැදීම පිළිබඳව පුහුණුව

1.1.2 **කසළ**

ප්‍රතිකර්ම හා අවසන් බැහැර කිරීම

පළාත් පාලන ආයතනයන්හි කසළ කළමනාකරණයෙහි ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් නිෂ්පාදනය, ශක්ති ජනනය සඳහාමෙන්ම අවසන් බැහැර කිරීම වැනි ප්‍රතිකර්ම සඳහා තාක්ෂණික මැදිහත්වීම සන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව 2021වසරේදී පහත අයුරින් පළාත් පාලන ආයතන සඳහා තාක්ෂණික සහයෝගය ලබාදෙන ලදී.

- මාතර මහ නගර සභාවේ දිරන කසළ සඳහා විසඳුමක් ලබා දීම සඳහා මාතර කොටවිල

කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. 2021 වසරේදී මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වමින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට කටයුතු කරමින් පවතී.

- පළාත් පාලන ආයතනයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමේ අරමුණින්පිළිසරු ජාතික ඝන අපද්‍රව්‍ය හා කළමනාකරණ ව්‍යාපෘතිය 2008 වසරේදී ආරම්භ කරන ලදි.පළාත් ආයතන වල ඉල්ලීම් මත පදනම්ව පහසුකම් සැලසීම සහ ගැටළු විසඳීම සිදු කෙරෙමින් පවතී.
- ‘‘ගෘහස්ථ මට්ටමින් භාවිතා කරන ලද මුහුණු ආවරණ සුරක්ෂිත ලෙස බැහැර කිරීම සඳහා වූ අතුරු මාර්ගෝපදේශය සැකසීමේදී’’ සක්‍රීය දායකත්වයක් ලබා දීම.
- තාක්ෂණික කණ්ඩායම් සාමාජිකයෙකු ලෙස බස්නාහිර පළාත සඳහා ඝන අපද්‍රව්‍ය ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේදී තාක්ෂණික යෙදවුම් සැපයීම සිදු කරන ලදී.

1.2 රෙගුලාසි හා නීති බලාත්මක කිරීම.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ නීති කෙටුම්පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම රෙගුලාසි හා නීති බලාත්මක කිරීම යටතේ සිදුවේ.

අනවශ්‍ය ප්ලාස්ටික් භාවිතය අවම කිරීම අරමුණු කරගනිමින් තනි භාවිත ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා වූ 2211/51 රෙගුලාසිය 2021.01.21 දින ප්‍රකාශයට පත් කරන ලදී. එමඟින් පහත අයිතම භාවිතය තහනම් කරන ලදී.

(a) යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා කෘෂි රසායන ඇසුරුම් කිරීම සඳහා භාවිතා කරන පොලිඑතිලීන් ටෙරප්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC)ද්‍රව්‍ය සහ

(b) යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා භාවිතා කරන මෙහි නිශ්චිතව දක්වා ඇති ප්ලාස්ටික් අයිතම :-

i.ශුද්ධ පරිමාව මී.ලි. 20 / ශුද්ධ බර ග්‍රෑම් 20 ට අඩු හෝ ඊට සමාන **Sachet** (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිතා කිරීම හැර).

ii.හුළං වලින් පිරිවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල , දිය මත පාවෙන / පිහිනුම් තටාකවලදී භාවිතා කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර)

iii.ප්ලාස්ටික් කූර සහිත කොටන් බඩ්ස් (වෛද්‍ය / සායනික ප්‍රතිකාර සඳහා භාවිතා කරන ප්ලාස්ටික් කොටන් බඩ්ස් හැර)

ප්ලාස්ටික් වර්ග 07 ක් අංක 01 සිට 07 දක්වා කේත කාණ්ඩ යටතේ වර්ග කර ඇත. කේතකරණයකින් තොරව එකතුකරන්නන් සහ ප්‍රතිචක්‍රීකරණය කරන්නන් හට ප්ලාස්ටික් වර්ගය හඳුනාගැනීම අභියෝගාත්මක විය. එබැවින් ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා, ප්ලාස්ටික් කේතීකරණ රෙගුලාසි අංක 2211/50 2021 ජනවාරි 21 දින ප්‍රකාශයට පත්තරන ලදී. ඒ, අනුව ඕනෑම නිෂ්පාදිත ප්ලාස්ටික් අයිතමයක් ගැසට් පත්‍රයේ උපලේඛන ගතව දක්වා ඇති ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ ප්‍රමිතීන්ට අනුකූලව පැහැදිලිව සලකුණු කළ යුතුය.

- අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , නියාමනය කළ යුතු තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍යවල 3 වැනි ලැයිස්තුව පහත පරිදි සකස් කරන ලදී.

i.බීම බට හා කලතන

ii.ප්ලාස්ටික් කෝප්ප, පිඟන්, හැඳි, ගෑරුප්පු සහ පිහි

iii.ප්ලාස්ටික් ඉදිආප්ප සකස් කිරීමේ තට්ටු

iv.ප්ලාස්ටික් තණ පැදුරු (ගෘහස්ත ක්‍රීඩා සහ පිටිටනි වල භාවිතා කිරීම සඳහා හැර)

v.ප්ලාස්ටික් මල්මාලා

vi.හඳුන්කුරු සහ පහන්තිර අසුරන ඕනෑම ප්ලාස්ටින් ද්‍රව්‍යයක්

vii.අඟල් 12*10 ට අඩු (හැඬලය රහිත) සහ හැඬල සහිත අඟල් 16*10*5 අඩු ප්ලාස්ටික් බෑග්

විශේෂඥ තීරණවලට අනුකූලව ඉහත ලැයිස්තුව නියාමනය කිරීමට අනුමැතිය සඳහා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන ලදී.

1.2.1 පොලිතීන් කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

- 2017 දී පොලිතීන් ලන්ච්ෂීට් තහනම් කිරීමේ රෙගුලාසි ප්‍රකාශයට පත්කරන ලද අතර පොලිතීන් ලන්ච්ෂීට් සඳහා විකල්පයක් ලෙස පෙව භායනය වන ලන්ච්ෂීට් හඳුන්වා දෙන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ පෙව භායනයට ලක්විය හැකි ලන්ච්ෂීට් නිෂ්පාදනය කරන්නන් 08 දෙනෙකු ලියාපදිංචිය අලුත් කරමධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියේ දත්ත ගබඩාව යාවත්කාලීන කරන ලදී. එම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, දිරාපත් වන ලන්ච් ෂීට් සඳහා ප්‍රමිතීන්

සකස් කරන ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලා සිටියේය. ඒ අනුව 2021 දී කොම්පෝස්ට් කළ හැකි ලන්ච් ෂීට් ප්‍රමිතිය සකස් කරන ලදී.

- Center for Environmental Fisheries and Aquatic Science (CEFAS) මධ්‍යස්ථානය සහ පාරිසරික ප්‍රවර්ධන ඒකකයේ සහයෝගීතාවයෙන්, තනි භාවිත ප්ලාස්ටික් තහනම් කිරීම පිළිබඳ ප්‍රවර්ධන කටයුතු ප්‍රමුඛ රූපවාහිනී නාලිකා හරහා ප්‍රකාශයට පත් කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් 100 කට වැඩි පිරිසකට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ පිරිසිදු කිරීමේ වැඩසටහන් ඇගයීම පිළිබඳව CEFAS සමඟ එක්ව පුහුණු කරන ලද අතර ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණය කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරයේ ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය උපකරණ මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය වෙත ලබා දීමට සහාය විය.
- දිනමිණ, තිනකරන් සහ ඩේලි නිව්ස් යන පුවත්පත් හරහා ලිපි පල කරමින් 2021 රෙගුලාසි පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී.
- 2021 ප්ලාස්ටික් කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමත් සමඟ කර්මාන්ත අංශය මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දුන් අතර පාර්ශ්වකරුවන්ගේ උපදේශන ගණනාවක් ද පවත්වන ලදී.

තනි භාවිත ප්ලාස්ටික් නිෂ්පාදන සඳහා විකල්ප ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකා රජය විසින් රට තුළ තනි භාවිත ප්ලාස්ටික් (ප්ලාස්ටික් හැඳි ගෑරුප්පු, කොටන් බඩ්ස්- ප්ලාස්ටික් බීම බට,ශොපින් බෑග් ආදිය) පාලනය/තහනම් කිරීමට තීරණය කර ඇත්තේ, පසු භාවිත ප්ලාස්ටික් ක්‍රමවත්ව බැහැර කිරීම තුළින් ඇති වන පාරිසරික හා සෞඛ්‍ය ගැටලු අවම කර ගැනීම සඳහා ය.

ඉහත තීරණය හේතුවෙන් සිදුවන සමාජීය බලපෑම් අවම කර ගැනීම සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය සඳහා විකල්ප ලියාපදිංචි කර ප්‍රවර්ධනය කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව පරිසර හිතකාමී විකල්ප නිෂ්පාදන නිපදවන සියලුම නිෂ්පාදකයින්ට මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වන ලෙස ආරාධනා කෙරේ. ඒ අනුව විකල්ප නිෂ්පාදකයින් 18ක් සිය විස්තර ඉදිරිපත් කර ඇත.

1.3 විශේෂ ව්‍යාපෘති

දොම්පේ ඝනීපාරක්ෂක කසළ රඳවනයේ මෙහෙයුම් නඩත්තු හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඇතුළු ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ විශේෂ ව්‍යාපෘති සහ ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය විශේෂ ව්‍යාපෘති යටතේ සිදු කෙරේ.

මෙයට අමතරව සුරකිමු ගංඟා ව්‍යාපෘති යටතේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක වන කොම්පෝස්ට් අංගන වැඩිදියුණු කිරීම, මැනික් ගඟ හරහා අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්ලාස්ටික් මල්මාලා වෙනුවට ස්වාභාවික/කඩදාසි ද්‍රව්‍ය මගින් නිපදවීම දියත් කිරීම වැනි අවස්ථාවලට දායක විය.

1.3.1 දොම්පේ ඝනීපාරක්ෂක කසළ රඳවනය - Green Park ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය

දොම්පේ කිරිඳිවැල ප්‍රදේශයේ පිහිටි ග්‍රීන් පාක් ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මධ්‍යම පරිසර අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ ඝනීපාරක්ෂක බිම් පිරවුම් කිරීමේ ස්ථානය වේ. මෙම මධ්‍යස්ථානය ඝනීපාරක්ෂක කසළ රඳවන ස්ථානය, කොම්පෝස්ට් කරන ස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානයකින් සමන්විත වේ.

කොරියානු සහයෝගිතා නියෝජිතායතනය (KOICA) විසින් ඔවුන්ගේ මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව ගොඩකිරීමේ ස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානය ඉදිකරන ලදී. සමස්ත ඇස්තමේන්තුගත ආයෝජනය පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 6 ක්,

කොරියානු රජය විසින් මිලියන 4.5 ක් සහ CEA විසින් මිලියන 1.5 ක් පමණ ව්‍යාපෘතියක් ලබා දී ඇත.

මෙම ඝනීපාරක්ෂක කසළ රඳවන ස්ථානයේ බැහැර කිරීමේ ධාරිතාව දිනකට ටොන් 90ක් පමණ වන අතර මුලදී මෙම කසළ රඳවනය දිනකට අපද්‍රව්‍ය ටොන් 10ක් කළමනාකරණය කිරීමේ අරමුණින් දොම්පේ ප්‍රාදේශීය සභාවේ අවසාන ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය ලෙස ක්‍රියා කිරීමට සැලසුම් කර ඇත. නමුත් ස්ථානයේ පහසුකම් සහ ධාරිතාව සම්බන්ධයෙන්, දැනට දොම්පේ ප්‍රාදේශීය සභාවේ පිහිටා ඇති සමහර තෝරාගත් කර්මාන්තවල උපද්‍රවකාරී නොවන අපද්‍රව්‍ය බැහැර කිරීමට මෙහිදී ඉඩ ලබාදෙමින්, බැහැර කිරීම සඳහා ටොන් එකකට රුපියල් 5000/= ක ගාස්තුවක් අය කෙරේ. එබැවින් ලැබුණු අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ආදායම 2019 වසරට සාපේක්ෂව විශාල ලෙස පහත වැටී ඇත.

ඝනීපාරක්ෂක බිම් පිරවුම් මධ්‍යස්ථානය ගොඩකිරීමේ පහසුකම, රැගෙන එන අපද්‍රව්‍ය කිරුම්, පටිගත කිරීමේ පහසුකම, අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම, ලීචේට් එකතු කිරීමේ පහසුකම, ලීචේට් පවිත්‍ර කිරීමේ පහසුකම, ගෑස් පිරිපහදු කිරීමේ පහසුකම, ජල දූෂණය වැළැක්වීමේ ලයිනර් පහසුකම, භූගත ජල අධීක්ෂණ ළිං, ආවරණ පාංශු

තොග, ගොඩකිරීමේ උපකරණ (ඩෝසර්, කැණීම් යන්ත්‍රය, ටිපර්ආදිය)පරිපාලන සහ කළමනාකරණ පහසුකම් සහ CCTV ආරක්ෂක පද්ධති වලින් සමන්විත වේ.

වගුව **10 : 2021** දී අපද්‍රව්‍ය කළමනාකරණය

ආයතනය	රැගෙන එන අපද්‍රව්‍ය ප්‍රමාණය (kg)	ආදායම (රු.)
දොම්පේ ප්‍රාදේශීය සභාව /බිම් පිරවුම් අපද්‍රව්‍ය	817530	-
දොම්පේ ප්‍රාදේශීය සභාව (වියෝජනය වන / කොම්පොස්ට්කරණය කළ හැකි)	62780	-
දොම්පේ ප්‍රාදේශීය සභාව - කර්මාන්ත	773380	2706830.00
අපද්‍රව්‍ය - වෙනත් කර්මාන්ත	953770	5452930.00
වීදුරු ලොම්	74200	2221490.00
එකතුව	2681660	10381250.00

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 තත්ත්වය තුළ කොම්පෝස්ට් නිෂ්පාදනයේ අඩුවීමක් සිදු වූ අතර, අවසානයේ පහත ප්‍රස්ථාරවල (ප්‍රස්ථාර 1 සහ ප්‍රස්තාරය 2) පෙර වසරවලට සාපේක්ෂව ආදායමක් උපයා ඇත.



YEAR	2015	2016	2017	2018	2019	2020	2021
LAND FILL WASTE Ton	1360.50	3218.84	3367.99	7959.53	1437.45	2677.36	2618.88
COMPOST RAW MATTERIAL Ton	0.00	437.73	566.08	708.50	842.46	238.01	62.78

රූපය **23 :** සම්පූර්ණ දිරාපත් වන අපද්‍රව්‍ය හැසිරවීම සහ සනීපාරක්ෂක කසළ ගොඩකිරීමේ අපද්‍රව්‍ය බැහැර කිරීම

සනීපාරක්ෂක කසළ රඳවන මෙහෙයුමට අමතරව, දිරාපත් වන අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීමේ පහසුකම ද මෙහි පවතින අතර, දැනට කොම්පෝස්ට් අංගනය දොම්පේ ප්‍රාදේශීය සභාවේ දිරාපත් වන අපද්‍රව්‍ය ලබා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය දිගටම සිදු කෙරේ. කොම්පෝස්ට් අංගනයේදී, වෙන් කරන ලද කෙටි කාලීන දිරාපත් වන කාබනික අපද්‍රව්‍ය පාංශු තත්වකාරක බවට පත් කෙරේ. දිනකට දිරාපත් වන අපද්‍රව්‍ය ටොන් පහක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානයේ කොම්පොස්ට් කිරීමේ හැකියාව ඇත. නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් ගොවීන් සඳහා කිලෝග්‍රෑමයක් රුපියල් 10 බැගින් අලෙවි කෙරේ.

පවතින උසස් තත්ත්වයේ සහ අඩු මිල හේතුවෙන් Green Park මගින් නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් සඳහා සෑම විටම ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාවට ඇති වූ

කෝවිඩ් තත්ත්වය හේතුවෙන් 2020 වසරේ දී මෙන්ම දොම්පේ ප්‍රාදේශීය සභාවේ දිරාපත් වන අපද්‍රව්‍ය එකතු නොවීම හේතුවෙන් මෙම අඩුවීමක් දක්නට ලැබුණු ආකාරයටම තවදුරටත් කොම්පෝස්ට් නිෂ්පාදනයට බලපෑම් එල්ල විය.



රූපය **24 :** කොම්පෝසට් නිෂ්පාදනය



YEAR	2015	2016	2018	2019	2020	2021
LANDFILL CASH Rs.	0.00	1933951.50	16646327.50	3767169.00	7800232.50	10381250.00
COMPOST CASH Rs.	0.00	185354.00	313780.00	377480.00	202710.00	63480.00

රූපය **25 :** අපද්‍රව්‍ය බැහැරලීමෙන් උපයන මුළු ආදායම

2021 අවසන් වනවිට බිම් පිරවුමේ කොටස් 06 න්, තුන්වන පිරවුම් කර ඇති අතර 4 වන බිම් පිරවුම පිරවීම ආරම්භ කර ඇත.



රූපය **26 :** කොටු **6**න් **3** වන කොටුවෙන් **3/6**ක් දක්වා පුරවා ඇත.

ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ලබා දී ඇත. මුළු ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 989 කි. ව්‍යාපෘති යෝජනාව පළාත් පාලන ආයතන 09 කට ඔවුන්ගේ නාගරික සහ කාර්මික අපද්‍රව්‍ය

කෙසේ වෙතත්, 2015 මැයි මාසයේ සිට බිම් පිරවුමේ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලද අතර, 2021 අවසානය දක්වා, අපද්‍රව්‍ය ටොන් 22640.53 ක් බැහැර කර ඇති අතර, සම්පූර්ණ කොම්පෝස්ට් නිෂ්පාදනය ටොන් 158 ක් පමණ විය.

1.2.2 ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය

ගම්පහ දිස්ත්‍රික්කයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය සඳහා සාර්ථක විසඳුමක් ලබාදීම සඳහා ගම්පහ දිස්ත්‍රික්ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ගම්පහ පෙතියකන්ද ප්‍රදේශයෙන් හෙක්ටයාර් 9.49ක භූමි ප්‍රමාණයක් ඉඩම්



කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා පහත සඳහන් ප්‍රධාන කොටස් වලින් සමන්විත වේ.

1. කොම්පෝස්ට් අංගනය.

2. අපද්‍රව්‍ය ප්ලාස්ටික් Pyrolysis බලාගාරය.

3. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථානය

4. සනීපාරක්ෂක ගොඩකිරීම.

5. පුහුණුව සහ දැනුවත් කිරීම

කොම්පෝස්ට් අංගන, අපද්‍රව්‍ය ප්ලාස්ටික් පයිරොලිසිස් යන්ත්‍ර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන නිම කරන ලදී. නමුත් මහජන විරෝධය නිසා මෙහෙයුම් ආරම්භ කිරීමට නොහැකි විය.

2021 වර්ෂයේදී, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත), පෙතියාකන්ද, 'මිහිසරු' නමින් ගම්වාසීන්ගේ සහභාගීත්වයෙන් පහත සඳහන් අංශ යටතේ උපායශීලීව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට උත්සාහ කරන ලදී.

1. විද්‍යාත්මක පදනමකින් කොම්පෝස්ට් සඳහා අගය එකතු කිරීම.

2. දියර පොහොර නිෂ්පාදනය.

3. පණු කොම්පෝස්ට් නිෂ්පාදනය.





රූපය **27 :** පෙතියකන්ද ගොවි පුහුණු වැඩසටහන

CHAPTER 4 : පරිසර කළමනාකරණ හා ඇගයීම් අංශය

1.1 පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

1.1 නියමිත ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම

පරිසර බලපෑම් ඇගයීම් (ප.බ.ඇ.) ඒකකයේ ප්‍රධාන නියාමන කාර්යභාරය වනුයේ පාරිසරික බලපෑම් අවම කිරීමේ අදහසින් සියලුම 'නියමිත ව්‍යාපෘති' සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ පරිපාලන ක්‍රියාදාමය පවත්වාගෙන යාමයි. මෙම කාර්යභාරයට විෂය ප්‍රමාණය කිරීමේ රැස්වීම් හා තාක්ෂණික, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සඳහා නිර්ණේය විෂයයන් සැකසීම, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ඇගයීම, ඇගයීම් කමිටු රැස්වීම් කැඳවීම, මහජන සහභාගීත්වය සඳහා අවකාශ ලබාදීම හා ඉන් අනතුරුව ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම හා අනුමත කරන ලද ව්‍යාපෘති පසුවිපරම් කිරීම යන කරුණු ඇතුලත් වේ.

2021 වසර තුල දී ජාතික පාරිසරික පනතේ IV (ඇ) වගන්තිය යටතේ අනුමැතිය ලබාගත යුතු ව්‍යාපෘති 64 ක් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ඔස්සේ සලකා බැලීමට පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් කටයුතු කර ඇත. ඒ අනුව ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබා දී ඇති අතර එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු වගු අංක 1හි සඳහන් වේ. එසේම, පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති ව්‍යාපෘති 06 ක පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කර ඇති අතර එම තොරතුරු වගු අංක 2හි සඳහන් වේ. 2021 වසරේදී කිසිදු ව්‍යාපෘතියක් සඳහා පරිසර අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප වී නොමැත.

වගුව **11:** පරිසර බලපෑම් ඇගයීම් නියෝග යටතේ**,** පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් **2021** වසර සඳහා අනුමැතිය ලබාදුන් ව්‍යාපෘති ලැයිස්තුව.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.පා.ප/ අ.මූ.පා.ප
01	පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය	ප.බ.ඇ.
02	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (කහතුඩුව සිට ඉංගිරිය දක්වා) ව්‍යා. යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය	ප.බ.ඇ.
03	සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- ජාතික විදුලිබල මණ්ඩලය	ප.බ.ඇ.
04	කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ප.බ.ඇ.
05	ඇඹිලිපිටිය කඩදාසි නිෂ්පාදන කර්මාන්ත ශාලාව පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යා. යෝ.- කොරියන් ස්පා පැකේජින් (පුද්) සමාගම	ප.බ.ඇ.
06	යෝජිත ඖෂධ නිෂ්පාදන කලාපය, ආරබොක්ක, හම්බන්තොට ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ප.බ.ඇ.
07	රෙදි පිරියම් කිරීමේ කර්මාන්තපුරය පුන්නයිකුඩා, එරාවුර්, මඩකලපුව ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ප.බ.ඇ.
08	යෝජිත සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම කැලියපුර, හම්බන්තොට ව්‍යා. යෝ.- ජී.එෆ්. සී. අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්) සමාගම	මූ.පා.ප
09	දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ තංගල්ල වීරකැටිය මාර්ගය සම්බන්ධ කිරීම සඳහා යෝජිත බැදිගම නව අන්තර් හුවමාරුව ව්‍යා. යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය	මූ.පා.ප

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.පා.ප/ අ.මූ.පා.ප
	ටයර් නිශ්පාදන ව්‍යාපෘතිය, හම්බන්තොට වරාය ආශ්‍රිත කාර්මික කලාපය ව්‍යා. යෝ.- හම්බන්තොට ජාත්‍යාන්තර වරාය සමූහ සමාගම	මූ.පා.ප
11	ඖෂධ නිෂ්පාදන කලාපය, ඔයාමඩුව, අනුරාධපුරය ව්‍යා. යෝ.- ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	මූ.පා.ප
12	ඉවතලන කැතෝඩ කිරණ ටියුබ් වීදුරු භාවිතා කරමින් උළු නිෂ්පාදනය කිරීම ව්‍යා. යෝ.- සිලෝන් වේස්ට් මැනේජ්මන්ට් (පුද්) සමාගම	මූ.පා.ප
13	ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය, පිටිපන, හෝමාගම ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය	මූ.පා.ප
14	අපනයන සැකසුම් කලාපය තුළ සිමෙන්ති කම්හලේ යෝජිත ගල් අඟුරු භාවිතයෙන් උණුසුම් වායු උත්පාදන පද්ධතිය. ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	අ.මූ.පා.ප
15	IIHS බහුකාර්ය මධ්‍යස්ථානය, අංක 312/15 සහ 312/19, කෙරවලපිටිය පාර, හැඳල, වත්තල ව්‍යා. යෝ.- ජාත්‍යයන්තර සෞඛ්‍ය විද්‍යා ආයතනය	මූ.පා.ප

ප.බ.ඇ. - පරිසර බලපෑම් ඇගයීම
මූ.පා.ප. - මූලික පාරිසරික පරීක්ෂණය
අ.මූ.පා.ප. - අතිරේක මූලික පාරිසරික පරීක්ෂණය
ව්‍ය.යෝ. - ව්‍යාපෘති යෝජක

වගුව **12 :** පරිසර අනුමැතිය ලබා දී ඇති එහෙත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැතිව **2021** වසරේදී පරිසර අනුමැතියෙහි වලංගු කාලය දීර්ඝ කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ/ මූ.පා.ප.
01	කළු ගඟ ජලාශ හා කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ප.බ.ඇ.
02	ඉදිකිරීම් කර්මාන්තය සඳහා කෙරවලපිටිය අක්වෙරළ මුහුදු වැලි කැණීමේ ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	ප.බ.ඇ.
03	උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය - උමා ඔය ද්‍රෝණිය සංවර්ධනය කිරීම ව්‍යා. යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය	ප.බ.ඇ.
04	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	ප.බ.ඇ.
05	වේයන්ගොඩ සිට තුල්හිරිය දක්වා යෝජිත 220kV අධිබලැති විදුලි සම්ප්‍රේෂණ මාර්ගය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප.
06	කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණ දක්වා දුම්රිය මාර්ග දිගුව ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ප්‍රවාහන අමාත්‍යාංශය	ප.බ.ඇ.

2021 වර්ෂය තුළ ප.බ.ඇ. හෝ මූ.පා.ප. අපේක්ෂා කරන අයදුම්පත් (BIQs) 87ක් ලැබී ඇත. ඒ අනුව, පරිසර බලපෑම් ඇගයීම සහ අතිරේක පරිසර බලපෑම් ඇගයීම (විෂයගත රැස්වීම් 13ක් සහ විෂයගත ක්ෂේත්‍ර පරීක්ෂණ 5ක්) ක්‍රියාවලියට ලක් කරන ලද ව්‍යාපෘති 15ක් සම්බන්ධයෙන් විෂයගත රැස්වීම් / විෂයගත ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී. එසේම, **මූ.පා.ප.** සඳහා යොමු කරන ලද ව්‍යාපෘති 17ක් සඳහා විෂයගත රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී.

පරිසර අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් පවතින ව්‍යාපෘති 44 (2020 වසරේ සිට පැවත ආ ව්‍යාපෘති 15ක් ද ඇතුළුව) පිළිබඳ තොරතුරු වගු අංක 3හි සඳහන් වේ.

වගුව **13 :** අනුමැතිය ලබාදීම සලකා බැලීම සිදුකරමින් ඇති ප.බ.ඇ./ මූ.පා.ප. ව්‍යාපෘතිය ලැයිස්තුව

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.ප.ප.	තත්ත්වය
	ප්‍රවාහන		
01	බස්නාහිර කලාපීය සැහැල්ලු දුම්රිය ප්‍රවාහන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
02	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 2 සහ 3 (ඉංගිරියේ සිට රත්නපුර දක්වා සහ රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා) ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
03	රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා අධිවේගී මාර්ගය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
04	කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ව්‍යා. යෝ. -ප්‍රවාහන අමාත්‍යාංශය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
	කර්මාන්ත		
05	හම්බන්තොට, අරබොක්ක ප්‍රදේශයේ අක්කර 600 ක භූමි ප්‍රමාණයක යෝජිත කර්මාන්ත කලාපය ව්‍යා. යෝ. -ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	**ප.බ.ඇ./මූ .ප.ප.**	විෂයගත රැස්වීම පවත්වන ලද අතර ව්‍යාපෘති යෝජක විසින් වැඩිදුර තොරතුරු ලබාදිය යුතුව ඇත.
06	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් පරිශ්‍රය තුළ සයික්ලොට්‍රෝන් පාදක විකිරණශීලී ඖෂධ නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීම ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	මූ.පා.ප	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
07	ද්‍රවීකෘත ස්වභාවික වායු පහසුකම සංවර්ධනය FSRU පද්ධතිය හා නල මාර්ගය ස්ථාපිත කිරීම ව්‍යා. යෝ. -නිව් ෆෝට්‍රස් එනර්ජි පුද්ගලික සමාගම	**ප.බ.ඇ**	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය (ToR) නිකුත් කල යුතුව ඇත.

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.ප.ප.	තත්ත්වය
08	ලංවා සංස්ථා වානේ (පුද්) සමාගම විසින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය තුළ යෝජිත වානේ කර්මාන්ත ශාලාව ව්‍යා.යෝ.- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු විසින් **ප.බ.ඇ** වාර්තාව ඇගයීමට ලක් කර ඇති ව්‍යාපෘති යෝජක විසින් සංශෝධිත **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
09	කටුනායක කර්මාන්ත කලාපය ව්‍ය.යෝ.- කර්මාන්ත අමාත්‍යාංශය	මූ.පා.ප	විෂයගත රැස්වීම පවත්වන ලද අතර නිර්ණේය විෂය (ToR) නිකුත් කල යුතුව ඇත.
10	මෙල්වයර් රෝලින් (පුද්) සමාගම විසින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය තුළ යෝජිත වානේ කර්මාන්තශාලාව ව්‍යා. යෝ. -ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	**ප.බ.ඇ**	ව්‍යාපෘති යෝජක විසින් වායු තත්වයේ සමුච්චිත බලපෑම් අධ්‍යයන කර එම වාර්තාව ඉදිරිපත්කල යුතුව ඇත
11	MAS ෆැබ්රික් උද්‍යානයේ දැනට පවතින මධ්‍යගත අපජල පිරිපහදු පද්ධතියේ ධාරිතාවය දිනකට ඝන මීටර 2500දක්වා වැඩි කිරීම ව්‍යා. යෝ. - MAS ෆැබ්රික්(පුද්) සමාගම	අ මූ.පා.ප	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් අ මූ.පා.ප වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
12	ද්‍රවීකෘත ස්වභාවික වායු ගබඩා කිරීමේ පහසුකම ව්‍යා. යෝ. - එල් එන් ජී(පුද්) සමාගම	**ප.බ.ඇ./මූ .ප.ප.**	ව්‍යාපෘතියට අදාලව වැඩිමනත් තොරතුරු ඉදිරිපත්කල යුතුව ඇත
	අපද්‍රව්‍ය කළමනාකරණය		
13	යෝජිත සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම ව්‍යා.යෝ. - GFC අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්) සමාගම, නාගොඩ, කළුතර	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
14	යෝජිත 'එන්ඩෙවර්'- අපද්‍රව්‍ය මගින් බලශක්තිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය කටුනායක කර්මාන්තපුරය ව්‍යා.යෝ.- එන්ඩෙවර් එනර්ජී ලිමිටඩ්	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
15	යෝජිත භෂ්මීකරණ දාහකය වෛද්‍ය පීඨය කැළණිය විශ්ව විද්‍යාලය ව්‍යා.යෝ.- කැළණිය විශ්ව විද්‍යාලය	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
16	CGL අපද්‍රව්‍ය මගින් බලශක්තිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය - ත්‍රිකුණාමලය ව්‍යා.යෝ.- සිලෝන් ජර්මන් ලොජිස්ටික් ඉන්ටර්නැෂනල් ඉකෝ (පුද්) සමගම	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
17	යෝජිත සනීපාරක්ෂක කසළ රැඳවුම, පෙතියකන්ද ව්‍ය.යෝ.- කසළ කළමනාකරණ අධිකාරිය	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
18	ආසිරි ශල්‍ය රෝහල් පරිශ්‍රය තුල යෝජිත භෂ්මීකරණ දාහකය ආසිරි ශල්‍ය රෝහල (පුද්) සමගම	**ප.බ.ඇ./මූ .ප.ප.**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.ප.ප.	තත්ත්වය
			විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	වාරිමාර්ග		
19	වයඹ පළාත් ඇළ ව්‍යාපෘතිය යටතේ, බෝවතැන්න ජලාශයේ සිට වැමැඩිල්ල ජලාශය දක්වා ඉදිවන II උමං මාර්ගය ඉදිකිරීම සහ වැමැඩිල්ල ජලාශයේ දකුණු ඉවුරු ඇළ වැඩිදියුණු කිරීම ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	අ **ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් අ. **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
20	කැලණි ගඟේ අඹතලේ ලවණතා බාධකයට යෝජිත වෙනස්කම් ව්‍ය.යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත.
21	යෝජිත මුන්දේනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- වාරිමාර්ග දෙපාර්තමේන්තුව	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	හෝටල්/ විනෝද කටයුතු		
22	නානුඔය සිට නුවරඑළිය දක්වා කේබල් කාර් ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- අවුට්ඩෝර් ඉන්ජිනේරින් ලංකා (පුද්) සමගම	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	'එලිෆන්ට් නේචර් රිසෝට්' හෝටල් ව්‍යාපෘතිය, සීගිරිය, පලාහේන, ගෙඩිගස්වලාන ව්‍ය.යෝ. - ග්‍රීන් ප්ලැනට් (පුද්) සමාගම	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් සංශෝධිත **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	නාගරික සංවර්ධන		
24	හොරණ මිල්ලෑව බන්ධනාගාරය නැවත ස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- නාගරික සංවර්ධන අධිකාරිය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුවේ හා මහජන ප්‍රතිචාර සඳහා පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව විවෘතව ඇත.
25	යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 64, බුත්ගමුව පාර, රාජගිරිය ව්‍ය-.යෝ. බාලි ඉන්වෙස්ට්මන්ට් ලංකා (පුද්) සමාගම	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. ව්‍යාපෘති යෝජක විසින් සංශෝධිත මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	කැණීම්		
26	යෝජිත ඛනිජ වැලි කැණීමේ ව්‍යාපෘතිය (වැලි සහිත ඉඩම තුළ), පොඩුවකට්ටු, ත්‍රිකුණාමලය ව්‍ය.යෝ.- ලංකා මිනරල් වැලි (පුද්) සමාගම	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ.** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.ප.ප.	තත්ත්වය
27	යෝජිත ගුණුගල් කැණීම් ව්‍යාපෘතිය අරුවක්කාලු, එළුවන්කුලම් ව්‍ය.යෝ.- සියැන් සිටි (පුද්) සමාගම	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
28	යෝජිත කොළඹ වරාය පුලුල් කිරීම සඳහා කෙරවලපිටිය වරාය අධිකාරියේ අක්වෙරළ මුහුදු කලාපයෙන් වැලි කැණීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	මූ.පා.ප.	විෂයගත රැස්වීම පවත්වා නිර්ණේය විෂය (ToR) නිකුත් කරන ලදී. ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරීම හේතුවෙන්, ව්‍යාපෘතිය නවත්වන ලද බව ව්‍යාපෘති යෝජක විසින් දැනුම් දෙන ලදී.
29	යෝජිත කොළඹ වරාය පුලුල් කිරීම සඳහා කෙරවලපිටිය වරාය අධිකාරියේ අක්වෙරළ මුහුදු කලාපයෙන් වැලි කැණීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා වරාය අධිකාරිය	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. ව්‍යාපෘති යෝජක විසින් සංශෝධිත මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
30	ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මුතුරාජවෙල ඉඩම සංවර්ධනය කිරීම ව්‍යා.යෝ. - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. අදාල භූමියේ නිරවුල්බව පිලිබඳව තහවුරු කල යුතුව ඇත
	අපජලය පිරිපහදු කිරීම්		
31	මීගමුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා යෝජිත අපජල බැහැර කිරීමේ පහසුකම ව්‍යා.යෝ. - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. සංශෝධිත **ප.බ.ඇ** . වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
32	ජා-ඇල/ඒකල මලාපවහන නළ ආවරණය පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ව්‍යා.යෝ. - ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	**ප.බ.ඇ**	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. සංශෝධිත **ප.බ.ඇ** . වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	විදුලිබලය හා බලශක්ති		
33	යෝජිත මෙගාවොට් 100 ක සුළං බල ව්‍යාපෘතිය (අදියර II), මන්නාරම ව්‍යා.යෝ. -ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති ආයතනය	**ප.බ.ඇ**	විෂයගත රැස්වීම පවත්වන ලද අතර වනජීවී දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබිය යුතුව ඇත.
34	යෝජිත මෙගාවොට් 100ක සුළං බලාගාර ව්‍යාපෘතිය, මන්නාරම සුළං බල ව්‍යාපෘතිය (අදියර III) ව්‍යා.යෝ. -ලංකා විදුලිබල මණ්ඩලය	**ප.බ.ඇ**	විෂයගත රැස්වීම පවත්වන ලද අතර වනජීවී දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබිය යුතුව ඇත.
35	යෝජිත සුළං බල ව්‍යාපෘතිය- මන්නාරම (අදියර I දිගුව) ව්‍යා.යෝ. -ලංකා විදුලිබල මණ්ඩලය	**ප.බ.ඇ**	විෂයගත රැස්වීම පවත්වන ලද අතර වනජීවී දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබිය යුතුව ඇත.
36	යෝජිත කි.වො. 220 නව හබරණ සිට නව අනුරාධපුර දක්වා දිවෙන අධිබල සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක

අනු අංක	ව්‍යාපෘතියේ නම	ප.බ.ඇ./ මූ.ප.ප.	තත්ත්වය
	ව්‍යා.යෝ.-ජාතික විදුලිබල මණ්ඩලය		විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
37	යෝජිත, ඉදිකිරීම-අයිතිය-ක්‍රියාත්මක කිරීම සහ පැවරීමේ (BOOT) පදනම මත කෙරවලපිටිය ප්‍රදේශයේ මෙගාවොට් 350 ක සංයුක්ත චක්‍ර RLNG විදුලි බලාගාරයක් ඉදිකිරීම ව්‍යා.යෝ.- ලක්දනවි (පුද්) සමාගම	**ප.බ.ඇ**	ප.බ.ඇ වාර්තාව තාක්ෂණික කමිටු ඇගයීම හා මහජන පරීක්ෂාව අවසන්කර තීරණය ලබාදීමට නියමිතය.
38	යෝජිත මෙගාවොට් 10 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හම්බන්තොට ව්‍යා.යෝ.-ඩුඩු අන්තර්ජාතික පුද්ගලික සමාගම	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
39	යෝජිත මෙගාවොට් 10 ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හම්බන්තොට ව්‍යා.යෝ.-නිදන්යා අන්තර්ජාතික පුද්ගලික සමාගම	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
40	යෝජිත කි.වො. 132 මැදගම සිට අම්පාර දක්වා අධිබල සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය ව්‍යා.යෝ.- ලංකා විදුලිබල මණ්ඩලය	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	කෘෂිකර්මය		
41	හැළඹවැව ප්‍රදේශයේ ආයෝජන ව්‍යාපෘති සිදු කිරීම මහවැලි L කලාපය ව්‍යා.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප.	තාක්ෂණික ඇගයීම් කමිටු ඇගයීමට ලක් කරමින් ඇත. ව්‍යාපෘති යෝජක විසින් අවසන් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
42	යෝජිත දුරියන් සහ කොස් වගා ව්‍යාපෘතිය-නාගස්තැන්න වතුයාය, යටියන්තොට ව්‍යා.යෝ.- නෙලනා ඇග්‍රී (පුද්) සමාගම	**ප.බ.ඇ**	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් **ප.බ.ඇ** වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
43	යෝජිත මුතුවැල්ල කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය - මහවැලි B කලාපය ව්‍යා.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.
	ජලජීවී වගාව		
44	යෝජිත ඉස්සන් වගා කිරීමේ ව්‍යාපෘතිය, පූනකරි කිලිනොච්චිය ව්‍යා.යෝ.- සෙන්ක්වා(පුද්) සමාගම	මූ.පා.ප.	නිර්ණේය විෂය (ToR) නිකුත් කර ඇත. ව්‍යාපෘති යෝජක විසින් මූ.පා.ප. වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇත.

1.2 ප.බ.ඇ./මූ.පා.ප. ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත යොමු කිරීම.

ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන පරිදි , ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන මඟින් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදුකරනු ලබයි. ඒ අනුව, 2021 වර්ෂයේදී තුලදී ලද

අයදුම්පත් 10ක් (වගුව 4 හි “අ” කොටස යටතේ නිරූපණය කර ඇති පරිදි) පිරික්සිමෙන්(screening) අනතුරුව වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත යොමුකර ඇත.

පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාලය වෙත බලය පවරා ඇත.ඒ අනුව, මෙම ඒකකය වෙතින් ව්‍යාපෘති 15 ක් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමුකර ඇත. ඒසේ 2021 දී ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද ඉහත සඳහන් කළ ව්‍යාපෘති ලැයිස්තුව වගුව 4.1 හි "ආ කොටස" හි දක්වා ඇත.

මීට අමතරව සංකීර්ණ පාරිසරික ගැටලු රහිත ‘නියමිත ව්‍යාපෘති’ වලින් කොටසක් සඳහා මූලික වගුව **14 : 2021** දී අනෙකුත් අනුයෝජිත ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල/ වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව

අ. අනෙකුත් අනුයෝජිත ආයතන වෙත යොමු කරන ලද ව්‍යාපෘතීන්		
අනු අංකය	**ව්‍යාපෘතියේ නම**	**ව්‍යාපෘති අනුමත කළ ආයතනය**
01	විශ්‍රාම ශාලාව, 780 R, ඩික්සන් පාර, දුම්රිය නගරය, අනුරාධපුර ව්‍ය.යෝ.- සමන්ත අමරසිංහ මහතා	වනජීවී.සං.දෙ
02	ශ්‍රී ලංකාවේ ශාක නිරෝධායන සේවාව නවීකරණය කිරීම සඳහා ඉදිකිරීම් සහ ප්‍රසම්පාදන සහාය ව්‍ය.යෝ.- ශාක නිරෝධායන ස්ථානය, මුහුදු වරාය, කොළඹ	වෙ. සං. හා වෙ.ස.ක.දෙ.
03	රෝග නිවාරණ මධ්‍යස්ථානය - මිහින්තලේ ව්‍ය.යෝ.- සෞඛ්‍ය අමාත්‍යාංශය	ව.සං.දෙ.
04	කන්දකාඩුව කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යා.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	වනජීවී.සං.දෙ
05	වාරි සෞභාග්‍ය වාරි වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ සහ කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යා.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ව.සං.දෙ.
06	අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මීගහකිවුල ප්‍රාදේශීය සභාව	ව.සං.දෙ.
07	මඩු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සින්නකුංචිකුලම් එල්ලංගා හා වැව් පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය.යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය	ව.සං.දෙ.
08	අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන රත්මලේ කඳුරැල්ල සහ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ අලුත්හල්මිල්ලෑව ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය.යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය	ව.සං.දෙ.
09	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා අනුබද්ධව සිදුකරන මහා පරිමාණ කිරි ගොවිපල පිහිටුවීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ඇක්සස් ඇග්‍රෝ පුද් සමාගම.	ව/ප ප.අ
10	පලුගස්වැව ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ජල පවිත්‍රාගාරයක් පිහිටුවීම ව්‍ය.යෝ.- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	ව.සං.දෙ.
ආ . මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කර ලද ව්‍යාපෘතීන්		
අනු අංකය	**ව්‍යාපෘතියේ නම**	**ව්‍යාපෘති අනුමත කළ ආයතනය**
01	කළු ගල් කැඩීමේ ව්‍යාපෘතිය, කිතලාවල, මීරිගම ව්‍ය.යෝ.- ඔරුමික්ස් පුද් සමාගම	ගම්පහ දිස්ත්‍රික් කාර්යයාලය

02	ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘතිය පානදුර ව්‍යා.යෝ. - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	බස්නාහිර පළාත් කාර්යයාලය
03	මහල් නිවාස ව්‍යාපෘතිය, පරිශ්‍ර අංක 8 සහ 8/1/1, හේම්ස් මාවත, කොළඹ 06 ව්‍ය.යෝ.- එම් සිවඥානසුන්දරම් සහ ආර් සිවඥානසුන්දරම් මහතා	බස්නාහිර පළාත් කාර්යයාලය
04	වක්වැල්ල පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය	දකුණු පළාත් කාර්යයාලය
05	මීගමුව-ගිරිඋල්ල මාර්ගයේ (B322) අංක 3/1 දරණ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය-.යෝ. මාර්ග සංවර්ධන අධිකාරිය	ගම්පහ දිස්ත්‍රික් කාර්යයාලය
06	බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතිය (අදියර II) දීර්ඝ කිරීම (කිරුළපන හන්දියේ සිට බර්නාඩ් හන්දිය දක්වා) ව්‍ය-.යෝ. මාර්ග සංවර්ධන අධිකාරිය	බස්නාහිර පළාත් කාර්යයාලය
07	කොළඹ - හොරණ මාර්ගයේ (B084) අංක 9/2 දරණ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය-.යෝ. මාර්ග සංවර්ධන අධිකාරිය	බස්නාහිර පළාත් කාර්යයාලය
08	අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	බස්නාහිර පළාත් කාර්යයාලය
09	හම්බන්තොට බෝට්ටු/ යාත්‍රා තැනීමේ සහ එකලස් කිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- හම්බන්තොට ජාත්‍යාන්තර වරාය සමූහ සමාගම	දකුණු පළාත් කාර්යයාලය
10	සිංහරාජ ඉකෝ කබානාස්, වාරුකන්දෙණිය, ලංකාගම, නෙළුව ව්‍ය.යෝ.- ගුණපාල බමුණුසිංහ ලියනගේ මහතා, 'සමාධි', කොස්වත්ත, නෙළුව	සබරගමුව පළාත් කාර්යයාලය
11	මුදුන් ඇළ වැසි ජල අපවහන වැඩිදියුණු කිරීම සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව	බස්නාහිර පළාත් කාර්යයාලය
12	මෙ.වො. 5 - සූර්ය බල ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - එශියා සන් ෆ්ලවර් (පුද්) සමාගම	දකුණු පළාත් කාර්යයාලය
13	මෙ.වො. 5 - සූර්ය බල ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - එශියා ඇක්ටිව් සොලර් (පුද්) සමාගම	දකුණු පළාත් කාර්යයාලය
14	මෙ.වො. 5 - සූර්ය බල ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - එශියා සන් එඩිෂන් (පුද්) සමාගම	දකුණු පළාත් කාර්යයාලය
15	මෙ.වො. 5 - සූර්ය බල ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - එශියා සොලර් කන්සෙප්ට් (පුද්) සමාගම	දකුණු පළාත් කාර්යයාලය

ඉහත සඳහන් කල ව්‍යාපෘතිවලට අමතරව, පහත 4.2 වගුවේ දක්වා ඇති පරිදි මෙම ඒකකය වෙත ලද අයදුම්පතක් පාරිසරික නිර්දේශය (ER) සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ආරක්ෂණ අංශය වෙත යොමු කරන ලදී.

වගුව **15 : 2021** දී පාරිසරික නිර්දේශය **(ER)** සඳහා වෙනත් ඒකක වෙත යොමු කරන ලද ව්‍යාපෘති ලැයිස්තුව

අනු අංකය	**ව්‍යාපෘතියේ නම**	**යොමුකරන ලද ඒකකය**
01	සීතාවක අපනයන කලාපයේ රෙදිපිළි නිෂ්පාදනයේ දී නිපදවන අපජලය පිරිපහදු කිරීමේ දී ජනිතවන මඩිති කළමනාකරණයේ යෝජනාව ව්‍යා. යෝ. - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	පරිසර ආරක්ෂණ අංශය

ව.සං.දෙ.	-	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වනජීවී.සං.දෙ.	-	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වෙ. සං. හා වෙ.ස.ක.දෙ.	-	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
ව/ප ප.අ	-	වයඹ පළාත් පරිසර අධිකාරිය

1.3 ප.බ.ඇ./මූ.පා.ප. ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදීම.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදුකිරීම සඳහා නම් කරනු ලබන ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත තාක්ෂණික සහය ලබාදෙනු ලැබේ.

එනම් නිර්ණේය විෂය (ToR) කෙටුම්පත් කිරීම, තාක්ෂණික කමිටුව නියෝජනය කිරීම, ප.බ.ඇ./මූ.පා.ප. වාර්තා සඳහා අදහස්/නිරීක්ෂණ ලබාදීම සහ තාක්ෂණික ඇගයීම් ක්‍රියාවලියට සහය වීම ආදිය සිදු කරයි. එසේ එකී අනුයෝජිත ආයතනවල ඉල්ලීම පරිදි ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත යොමු කර තිබූ ව්‍යාපෘතීන් 51ක් සඳහා තාක්ෂණික සහාය ලබා දී ඇත (වගුව 4).

එමෙන්ම ව්‍යාපෘතිවලට අදාළ ව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම උදෙසා අවශ්‍ය සහාය සහ මග පෙන්වීම, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අදාළ ප්‍රාදේශීය කාර්යාලය වෙත ද ලබා දී ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් සිදුකරන ලදී. එසේම, මෙම ආයතන පරිසර අනුමැතිය ලබාදීමට පෙර ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව, එම ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මඟින් එකඟතාවය ලබා දීමේදී අවසන් අනුමැතියට අන්තර්ගත කළ යුතු නිරීක්ෂණ/කොන්දේසි ලබාදෙනු ලබයි.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ද පිළිවෙලින් වෙරළ සංරක්ෂණ පනත සහ වනසත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂණ පනත් වල ප්‍රතිපාදන යටතේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදුකරනු ලබයි. එම ආයතන සඳහා ද පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අවශ්‍ය තාක්ෂණික සහාය එම පනත්වලට අනුකූලව ලබාදී ඇත.

වගුව **16 :** අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය / එකඟතාව ලබා දුන් ව්‍යාපෘති ලැයිස්තුව

අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය ලබා දීම	
අංකය	ව්‍යාපෘතියේ නම **හා ව්‍යාපෘති යෝජක**
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය - නාගරික සංවර්ධන අධිකාරිය - 05	
01	පුත්තලම සඳහා අපජල එකතු කිරීම, පිරිසිදු කිරීම සහ බැහැර කිරීමේ පද්ධතිය ව්‍ය.යෝ.- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
02	කොල්ලුපිටිය ගාලු පාරේ අංක 295/295 A දරන ස්ථානයේ පිහිටුවීමට යෝජිත සොෆියා කලම්බු සිටි හෝටලය ව්‍ය.යෝ.- සොෆියා කලම්බු (පුද්) සමාගම
03	කාමර 646 ක් සහිත (තරු පහේ) පර්ල් සිටි හෝටලය අංක 505, ගාලු පාර, කොළඹ 03 ව්‍ය.යෝ.- පර්ල් සිටි හෝටල(පුද්) සමාගම.
04	හලාවත නගරය සඳහා අපජල බැහැර කිරීමේ පද්ධතිය ව්‍ය.යෝ.- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
05	යෝජිත බහු භාවිත/ඒකාබද්ධ නිවාඩු නිකේතන සංවර්ධන ව්‍යාපෘතිය, අංක 100, 100 ඒ ග්ලෙනි වීදිය සහ අංක 01, 03, සහ 05 ජස්ටිස් අක්බර් මාවත කොළඹ 02 ව්‍ය.යෝ.- වෝටර් ෆ්‍රන්ට්(පුද්) සමාගම

අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය ලබා දීම	
අංකය	ව්‍යාපෘතියේ නම හා ව්‍යාපෘති යෝජක
ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව -09	
01	විලකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
02	100 MW සියඹලාණ්ඩුව සූර්ය බල උද්‍යානය ව්‍යා. යෝ.- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
03	කප්පල්තුරේ සිට 6 සැතපුම් කණුව දක්වා යෝජිත 33 KV සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය ව්‍යා. යෝ.-ලංකා විදුලිබල මණ්ඩලය
04	මහියංගනේ සිට බදුල්ල දක්වා යෝජිත 33 KV සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය ව්‍යා. යෝ.-ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යා. යෝ.-ලංකා විදුලිබල මණ්ඩලය
05	කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය ව්‍යා. යෝ.-වාරිමාර්ග දෙපාර්තමේන්තුව
06	ඉත්තපාන - හොරවල - තොටුපල මාර්ගය සම්බන්ධ කරමින් බෙන්තොට ගඟ හරහා පාලම සහ එහි ප්‍රවේශ මාර්ග ඉදිකිරීම ව්‍යා. යෝ.-මාර්ග සංවර්ධන අධිකාරිය
07	ලූණු ලේවාය පිහිටුවීමේ ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- දුම්දු මහතා
08	යෝජිත පලුගස්වැව ජල සම්පාදන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
09	යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීම් ස්ථාන සඳහා සිදුකරන ලද පාරිසරික බලපෑම් අධ්‍යනය ව්‍යා. යෝ.-වාරිමාර්ග දෙපාර්තමේන්තුව
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කරනු ලබන ව්‍යාපෘති - 16	
01	කිරින්ද වෙරළ තීරයේ ඛනිජ වැලි කැණීම ව්‍යා. යෝ.-පලටුපාන අයි.ඕ.ජී.එස් මිනරල්ස් (පුද්) සමාගම
02	කෝකිලායි - කොක්කුතොඩුවායි වෙරළ තීරයේ බර ඛනිජ වැලි කැණීමේ ව්‍යාපෘතිය සහ මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි හි ඛනිජ වැලි සැකසුම් කම්හලක් පිහිටුවීම ව්‍ය.යෝ.- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
03	අරලිය උණවටුන හෝටල් ව්‍යාපෘතිය සඳහා මුහුදු ජලය පිරිපහදු කිරීමේ පද්ධතිය (රිවර්ස් ඔස්මොසිස්) හා මුහුදු පිටාරය සහ උණවටුන ,ඕලන්ද ඇළෙහි ජලය පිරිපහදු කිරීම සඳහා අජලපිරිපහදු පද්ධතිය ජල පිරිපහදුව සඳහා අපජල පවිත්‍ර කිරීමේ පහසුකම් ව්‍ය.යෝ.- අරලිය උණවටුන බීච් හෝටල් (පුද්) සමාගම
04	කොග්ගල අපනයන කලාපයෙන් යෝජිත නව මුහුදු පිටාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ව්‍යා.යෝ. - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
06	106 කාමර සහිත මහල් නිවාස ව්‍යාපෘතිය, අංක 160, පැලේන පාර වැලිගම ව්‍යා. යෝ.-සවුත් බීච් වැලිගම ප්‍රෝපර්ටිස්(පුද්) සමාගම
07	යෝජිත ඒකක 19 කින් සමන්විත සහාධිපත්‍ය මහල් නිවාස ව්‍යාපෘතිය, අංක 35,39 ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර, කොළඹ 06 ව්‍යා. යෝ.- ද ලක්ස් මෙල්බා රෙසිඩන්ස්(පුද්)සමාගම
08	යෝජිත මහල් 8 කින් හා ඒකක 32කින් සමන්විත නේවාසික සහාධිපත්‍ය මහල් නිවාස ව්‍යාපෘතිය

අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය ලබා දීම	
අංකය	**ව්‍යාපෘතියේ නම හා ව්‍යාපෘති යෝජක**
	ව්‍යා. යෝ.- ස්කයි ලයින් හවුසින්ග්(පුද්)සමාගම
09	යෝජිත කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය ව්‍යා. යෝ.- සී.එච්.ඊ.සී කොළඹ වරාය නගර(පුද්)සමාගම
10	හික්කඩුව ධීවර වරාය නැවත සංවර්ධනය කිරීම ව්‍ය.යෝ.- ධීවර වරාය සංස්ථාව
11	අම්බලන්ගොඩ ධීවර වරාය නැවත සංවර්ධනය කිරීම ව්‍ය.යෝ.- ධීවර වරාය සංස්ථාව
12	මරිනෝ කාමර 652 ක් සහිත සිටි හෝටල් සංකීර්ණය, කොළඹ ව්‍යා. යෝ.- ඩී. ආර්. ලෙෂර් (පුද්)සමාගම
13	අරලිය ගෝල්ඩන් බීච් රිසෝට්, ගණහේන, උණවටුන ව්‍යා. යෝ.- ස්කයි ලයින් හවුසින්ග්(පුද්)සමාගම
14	මන්නාරම, පේසාලේ බටහිර, කට්ටුකරන්කුඩිඉරිප්පු ප්‍රදේශයේ යෝජිත ජලජීවී වගා ව්‍යාපෘතිය ව්‍යා. යෝ.- කේ.එම්.එන් ඇක්වා සර්විස් (පුද්)සමාගම
15	යෝජිත කාර්යාල සංකීර්ණය, කොල්ලුපිටිය පාරේ අංක 426, 428 430, 432, 434, 434/1- 1/1 පරිශ්‍ර, සහ කෝමාරිකා මාවතේ අංක 4, , කොළඹ 03 ව්‍යා. යෝ.- ග්‍රෆියෝ වන් (පුද්)සමාගම
16	වැලිගම, කප්පරතොට බෝට්ටු තැනීමේ කර්මාන්තය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය ව්‍ය.යෝ.- ධීවර වරාය සංස්ථාව
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු කරනු ලබන ව්‍යාපෘති -21	
01	කෘෂිකාර්මික ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ජේ.වී.පී. චමින්ද
02	කන්දකාඩුව කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
03	පිදුරු මගින්ප්ලයිවුඩ් නිෂ්පාදන කම්හල ව්‍ය.යෝ.- වික්ටෝරියා රෙසිඩන්සීස් (පුද්) සමාගම
04	අඩු සහ මධ්‍යම පන්තික ප්‍රතිලාභීන් සඳහා නිවාස යෝජනා ක්‍රමය - කොහොලන්කොල, හම්බන්තොට ව්‍ය.යෝ.- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
05	බිම් කොටස් 40ක නේවාසික විලා ඉදිකිරීම, වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ සුඛෝපභෝගී සඳහා සුවිශේෂී බිම් ව්‍ය.යෝ.- වික්ටෝරියා රෙසිඩන්සීස් (පුද්) සමාගම
06	නිස්සමහාරාම, අකුරුගොඩ ප්‍රදේශයේ යෝජිත කාමර 09 කින් යුත් සංචාරක නිකේතනය ව්‍ය.යෝ.-. ශ්‍යාමලී පටබැදිගේ මහත්මිය
07	මාදම්පාවිල වනජීවී රක්ෂිතයෙන් සංවර්ධන ප්‍රදේශයෙන් බැහැර කිරීම ව්‍ය.යෝ.- ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
08	මාදුව පාලම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
09	නිවාස ව්‍යාපෘතිය, මින්නේරිය, ගිරිතලේ ව්‍ය.යෝ.- ශ්‍රියංගනී සන්ධ්‍යා මෙනවිය

අනුයෝජිත ආයතනය වෙත තාක්ෂණික සහය ලබා දීම	
අංකය	**ව්‍යාපෘතියේ නම හා ව්‍යාපෘති යෝජක**
10	යෝජිත නිවාස ව්‍යාපෘතිය, මහදොර්තලියද්ද ව්‍ය.යෝ.- වික්ටෝරියා රෙසිඩන්සීස් (පුද්) සමාගම
11	හෝටල් ව්‍යාපෘතිය, සීගිරිය ව්‍ය.යෝ.- එච්.පී.ධර්මරත්න මහතා
12	මාවිල්ආරු මුලික වැඩපල ප්‍රතිසංස්කරණය කිරීම ව්‍ය.යෝ.- වාරිමාර්ග අමාත්‍යාංශය
13	පොළොන්නරුවේ සත්ව පාලන හා කෘෂිකර්ම ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- කේ.ජී.පී.ප්‍රදීප් කුමාර මහතා
14	මැදිරිගිරියේ යෝජිත කෘෂිකර්ම ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ඉන්දික උදේශ් රණසිංහ මහතා
15	අපනයන කෘෂි බෝග වගා කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- එස්.ඒ.එම් නෙරංජන ජයවර්ධන මහතා
16	අපනයන කෘෂිකාර්මික භෝග වගා කිරීම සහ පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා යෝජිත ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- කේ.කේ.ප්‍රදීප් නිශාන්ත මහතා
17	අපනයන කෘෂි බෝග වගා කිරීමට යෝජිත ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- නිල්මිණි රේඛා මහත්මිය
18	අයිස් නිෂ්පාදනය සහ අඹ වගාව සඳහා යෝජිත ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- එල් බී පියසිරි මහතා
19	යෝජිත ප්‍රජා මූලික කාබනික ගොවිතැන් ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ඉඕරා ඉකෝ (පුද්) සමාගම
20	යෝජිත නිවාස ව්‍යාපෘතිය, ග්ලෙනෝර්වි වතුයාය, නුවරඑළිය ව්‍ය.යෝ.- කනපති කවිතාසන් මහතා
21	වැලිකන්ද සිංහපුර ප්‍රදේශයේ යෝජිත කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ව.සං.දෙ.	-	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වනජීවී.සං.දෙ.	-	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී.ලං.මහ.අධි	-	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
වෙ. සං. හා වෙ.ස.ක.දෙ.	-	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
නා.සං.අ.	-	නාගරික සංවර්ධන අධිකාරිය
ව/ප පරි.අධි	-	වයඹ පළාත් පරිසර අධිකාරිය

1. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සහ ඒ හා සම්බන්ධ කරුණු/ ගැටලු විසඳීම සඳහා රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණය

2.1 නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාරිසරික උපදේශන කමිටු (ECC) සඳහා සහභාගීත්වය

ප.බ.ඇ./ මූ.පා.ප. යටතේ "නියමිත ව්‍යාපෘති" ලෙස නොගැනෙන, නිවාස සහ වාණිජ ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලබන, කැබිනට් මණ්ඩල අනුමැතියෙන් පත් වූ පාරිසරික උපදේශන කමිටු වෙත පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් තාක්ෂණික සහාය ලබා දෙනු ලබයි. ඒ අනුව, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් වගු අංක 6 හි දක්වා ඇති ව්‍යාපෘතීන් සඳහා පාරිසරික

උපදේශක කමිටු රැස්වීම් වාර 25 ක් සඳහා
සහභාගී වී ඇත.

වගුව **17 : 2021** වසර තුල දී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ පාරිසරික උපදේශන කමිටු රැස්වීම් ලැයිස්තු

අනු අංකය	**ව්‍යාපෘතිය**
01	නේවාසික සංවර්ධනය, අංක 31, රෝහල් පාර, මාදිවල, තලපත්පිටිය ව්‍ය.යෝ.- මොනර්ච් ඉම්පෙරිකල් (පුද්) සමාගම
02	බ්‍රෙබෘක් නේවාසික කුළුණ, අංක 294, 294/1, 294/2, 294/3, 294/A, 294/3A, 294/5 & 294/6, දොස්තර කොල්වින් ආර් ද සිල්වා මාවත සහ No. 11 සහ 15, බ්‍රෙබෘක් පෙදෙස, කොළඹ 02. ව්‍ය.යෝ.- බ්‍රෙබෘක් රෙසිඩෙන්ශල් ටවර් (පුද්) සමාගම
03	මහල් නිවාස සංකීර්ණය, කොලඹගේ මාවත, කොළඹ 06, ව්‍ය.යෝ.- මගා ඉන්ජිනේරින් (පුද්) සමාගම
04	වාණිජ හා කාර්යාල සංවර්ධන ව්‍යාපෘතිය පූජ්‍ය බැද්දේගම විමලවංශ හිමි මාවත (හේලීස් සමූහය) ව්‍ය.යෝ.- සීමාසහිත ලෝක අපනයන මධ්‍යස්ථානය
05	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, අංක 137, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02 (කොළඹ නගර මධ්‍යස්ථානය) ව්‍ය.යෝ.- බ්‍රෙබෘක් රෙසිඩෙන්ශල් ටවර් (පුද්) සමාගම
06	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය කදිරාන ව්‍ය.යෝ.- හෝම්ලෑන්ඩ් හෝල්ඩින් (පුද්) සමාගම
07	හල්බරාව නව පුබුදු ක්‍රීඩාංගන මාවතේ මධ්‍ය ආදායම්ලාභී නේවාසික මහල් නිවාස සංවර්ධනය ව්‍ය.යෝ.-නාගරික සංවර්ධන අධිකාරිය
08	හරිත කැදැල්ල II අදියර අංක: 398, හරිත කැදැල්ල, අවුකන්විල වත්ත පාර, කහතුඩුව, ගෝනපොල ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
09	රාජගිරිය ඔබේසේකරපුර නිවාස ඒකක 300ක් ව්‍ය.යෝ.- සුබසිංහ කන්ට්‍රක්ටර්ස් (පුද්) සමාගම
10	අංක 49 C, බෙස්ලයින් පාර, ඔරුගොඩවත්ත යන ස්ථානයේ මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන මහල් නිවාස සංවර්ධනය ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
11	නිවාස ඒකක 450ක් ඉදිකිරීම, 601 වත්ත, බ්ලූමැන්ඩල් ව්‍ය.යෝ.- ඇක්සස් ඉන්ජිනේරින් (පුද්) සමාගම
12	**පාරිසරික උපදේශන** යාවත්කාලින කිරීම, යෝජිත මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලය අංක 374, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 ව්‍ය.යෝ.- සෙසින්ග් ගෘප් ෆයිව් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම
13	**පාරිසරික උපදේශන** යාවත්කාලින කිරීම- අංක 447, යුනියන් පෙදෙස, කොළඹ 02 හි පිහිටි මහල් නිවාස සංකීර්ණය සඳහා ව්‍ය.යෝ.- සී/ස පී ඩබ්ලිව් ඒ ගෘහ නිර්මාණ ශිල්පීන්

14	අංක 200, නාවල පාර, නාරාහේන්පිට යන ස්ථානයේ පිහිටි මගා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍ය.යෝ.- මගා ඉන්ජිනේරින් (පුද්) සමාගම
15	කැන්ටබරි අදියර II, පිළියන්දල, කහතුඩුව ව්‍ය.යෝ.- හෝම්ලෑන්ඩ් හෝල්ඩින් (පුද්) සමාගම
16	යෝජිත මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන නිවාස ව්‍යාපෘතිය, අනුරාධපුර ව්‍ය.යෝ.-නාගරික සංවර්ධන අධිකාරිය
17	කොළඹ 05 ඇපල්වත්තේ නිවාස ඒකක 700ක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍ය.යෝ.- සීමාසහිත චීන දුම්රිය 25 වන කාර්යාංශ සමූහ පුද් සමාගම
18	කැලණිවැලි දුම්රිය මාර්ග පථයෙහි පදිංචි පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා මාලපල්ලෙහි යෝජිත සහාධිපත්‍යය ව්‍ය.යෝ.- මගා ඉන්ජිනේරින් (පුද්) සමාගම
19	මරදානේ දුම්රිය මෙහෙයුම් මූලස්ථානය සහ දුම්රිය පාලන මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍ය.යෝ.- මගා ඉන්ජිනේරින් (පුද්) සමාගම
20	කොට්ටාව, මාකුඹුර ප්‍රදේශයේ මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන මහල් නිවාස සංවර්ධනය ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
21	ඔරුගොඩවත්ත II අදියරෙහි මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා නිවාස ඒකක 432ක් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ මූල්‍යකරණය ව්‍ය.යෝ.--.නාගරික සංවර්ධන අධිකාරිය
22	මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන නිවාස ව්‍යාපෘතිය, මීගමුව පාර, පැලියගොඩ - I අදියර ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
23	මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන නිවාස ව්‍යාපෘතිය, නුවර පාර, පැලියගොඩ -- II අදියර ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
24	කොට්ටාව, මාකුඹුර ප්‍රදේශයේ මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන නිවාස ව්‍යාපෘතිය ව්‍ය.යෝ.-.නාගරික සංවර්ධන අධිකාරිය
25	ග්‍රෑන්ඩ් කැපිටල් රෙසිඩන්සිස්, අංක 345, පන්නිපිටිය පාර, තලවතුගොඩ ව්‍ය.යෝ.- ග්‍රෑන්ඩ් කැපිටල් රෙසිඩන්සිස්(පුද්) සමාගම

1.2 ව්‍යාපෘති කමිටු, නියාමන කමිටු, ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු, කැබිනට් උප කමිටු, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම් සහ නීති උපදේශන සැසි සඳහා සහභාගී වීම.

වගුව 6 න් දක්වන ලද පාරිසරික උපදේශන කමිටුවලට අමතරව පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිළධාරීන් පහත වගු අංක 7, 8, 9 සහ 10 හි සඳහන් පරිදි පිළිවෙලින් ව්‍යාපෘති කමිටු, නියාමන කමිටු, කැබිනට් උප කමිටු, ආංශික අධීක්ෂණ කමිටු රැස්වීම් සහ නීති උපදේශන සැසි සඳහා ද සහභාගීත්වය දක්වා ඇත.

වගුව **18 : 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ ව්‍යාපෘති කමිටු ලැයිස්තුව

අංකය	**ව්‍යාපෘති කමිටුවේ නම**
1	බනිජ වැලි කැණීම් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය (රැස්වීම් වාර 7 ක් සඳහා සහභාගී වී ඇත) ව්‍යා. යෝ. - ලංකා මිනරල්ස් සෑන්ඩ්ස් ලිමිටඩ්
2	කේබල් කාර් ව්‍යාපෘතිය, නුවරඑළිය ව්‍ය.යෝ.- අවුට්ඩෝර් ඉන්ජිනේරින් ලංකා (පුද්) සමාගම

වගුව **19 : 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නියාමන කමිටු ලැයිස්තුව

අංකය	**ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ නම**
01	වැලිකඩ බන්ධනාගාරය වෙනත් ස්ථානයකට ගෙන ඒම (රැස්වීම් වාර 7ක් සඳහා සහභාගී වී ඇත) ව්‍යා. යෝ. -.නාගරික සංවර්ධන අධිකාරිය
02	මධ්‍යම ප්‍රන්තිකයින් සඳහා වන නිවාස ව්‍යාපෘතිය (රැස්වීම් 5ක් සඳහා සහභාගී වී ඇත) ව්‍යා. යෝ. -.නාගරික සංවර්ධන අධිකාරිය
03	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කඩවත සිට දඹුල්ල දක්වා කොටස (01 කොටස කඩවත සිට මීරිගම දක්වා) ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
04	දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම ව්‍ය.යෝ.- ප්‍රවාහන අමාත්‍යාංශය

වගුව **20 : 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ වෙනත් විවිධ රැස්වීම් ලැයිස්තුව

අංකය	**රැස්වීම්/අදාල ව්‍යාපෘතිය/ අවස්ථාව**
01	මහල් නිවාස සංකීර්ණ පිහිටුවීම සඳහා ව්‍යාපෘති
02	මුතුරාජවෙල තෙත් බිම් ප්‍රදේශයේ පාරිසරික ගැටලුවලට විසඳුම් සෙවීමේ කමිටුව
03	කටුනායක කර්මාන්ත කලාපය
04	කොටිකාම්බොක්ක තිරිවාන ගල් කැණීම හා අගය එකතු කිරීම පිළිබඳ උපදේශක කමිටු රැස්වීම
05	යෝජිත 33 KV අම්පාර උහන සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය
06	අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදන කලාපයක් පිහිටුවීම.
07	දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ගැටලු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක රැස්වීම
08	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් යෝජිත ඉදිකිරීම් ද්‍රව්‍ය නිස්සාරණය කිරීමේ ක්‍රියා පටිපාටිය සංවර්ධනය කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බළකා රැස්වීම
09	මුතුර් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශයේ අවසාදිත වැලි නිස්සාරණය සම්බන්ධ රැස්වීම (ඉඩම් පාදක වැලි රැස්වීම)-වෙල්ලන්වල ස්ටෙට් ලංකා
10	ඛනිජ කැනීම් සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායේ රැස්වීම
11	ඉඩම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද LRC ඉඩමවල පයිනස් ගස් ඉවත් කිරීම.
12	ජාතික පාරිසරික පනත යටතේ පනවා තිබෙන ශබ්ද රෙගුලාසි සංශෝධනය කිරීම
13	යෝජිත නවාතැන් සහ කාර්යාල පරිශ්‍රය සමග පළතුරු ගබඩාවක් ඉදිකිරීම - එකබොඩකොස්ගහවත්ත
14	මධ්‍යම පරිසර අධිකාරිය සහ පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම
15	කළුතර මාතෘ හා ළමා සුරැකුම් රෝහලේ දාහකයක් ස්ථාපනය කිරීම
16	නුවරඑළිය ග්ලෙනෝර්වි වත්තේ යෝජිත නිවාස ව්‍යාපෘතිය

17	ඖෂධ නිෂ්පාදන කලාපය පිහිටුවීම පිළිබඳ රැස්වීම
18	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව සිදු කරන ලද සාකච්ඡාව
19	සුළු භෝග රාජ්‍ය අමාත්‍යාංශය මගින් මොනරාගල වේලිඔය හි සීනි නිෂ්පාදන කර්මාන්ත ශාලාව
20	කඩොලාන ප්‍රතිසංස්කරණය සඳහා ජාතික මාර්ගෝපදේශ කෙටුම්පත් සඳහා වලංගු කිරීමේ වැඩමුළුව
21	එප්පාවෙල පාෂාණ පොස්පේට් කැණීම
22	සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය සඳහා දහනය කිරීමේ පහසුකම්වල ධාරිතාව පුළුල් කිරීම- සී/ස සිසිලි හනරෝ එන්කෙයර් (පුද්) සමාගම
23	අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීමේදී ජනනය වන අළු බැහැරලීමේ ව්‍යාපෘතිය, කෙරවලපිටිය
24	පාරිසරික අනුමැතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද, යෝජිත දුවීකෘත ස්වභාවික වායු හා වානේ කර්මාන්ත සම්බන්ධ සාකච්ඡාව
25	ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය, පිටිපන, හෝමාගම ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය
26	ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් විසින් කැණීම් කරනු ලබන ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ රැස්වීම
27	මුතුරාජවෙල අභයභූමියේ ස්වාරක්ෂක කලාපයේ අනවසර ඉඩම් ගොඩකිරීම පිළිබඳ සාකච්ඡාව
28	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කඩවත සිට දඹුල්ල දක්වා කොටස - (01 කොටස කඩවත සිට මීරිගම දක්වා) පනුකරඳ (Crudia zeylanica) ශාකය නැවත ස්ථානගත කිරීම පිළිබඳ උපදේශක කමිටු රැස්වීම
29	ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජාතික පිවිතුරු නිෂ්පාදන සම්මාන 2021 ක්ෂේත්‍ර ඇගයීමට සඳහා ඇගයුම්කරුවෙකු ලෙස සහභාගී විය
30	සම්පත් පලදායි ලෙස යොදාගනිමින් ශ්‍රී ලංකාව තුල නිවාස හා ඉදිකිරීම් සිදුකිරීම පිලිබඳව වැඩමුළුව
31	පැමිණිලි කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
32	ගම්පහ ආයෝජක හිතකාමී ස්මාර්ට් සිටි ව්‍යාපෘතියේ මූලික රැස්වීම
33	සංචාරක ආයෝජන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම සඳහා අවබෝධතා ගිවිසුම

වගුව **21 : 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකය සහභාගී වූ නීති උපදේශන සැසි ලැයිස්තුව

අනු අංකය	ව්‍යාපෘතියේ නම
1.	ගොල්ෆ් පිටිය ව්‍ය.යෝ.- මැල්වත්ත ප්‍රෝපර්ටිස් ඩිවලප්මන්ට්ස් (පුද්) සමාගම
2.	රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ගය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
3.	මන්නාරම එරුක්කලම්පිටිය ඉස්සන් අභිජනන මධ්‍යස්ථානය ව්‍ය.යෝ.- තැප්‍රෝබේන් ෆ්‍රෝසන් ෆුඩ් (පුද්) සමාගම

මීට අමතරව පාර්ලිමේන්තු උපදේශන කාරක සභා රැස්වීම් සඳහා සුදානම් වීම පිණිස පරිසර අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන රස්විමරස්වීම්වලට සහභාගි වීම සිදු කර ඇත.

3. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී හා පහසු ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට අදාළ ව ජාතික පාරිසරික පනතේ දැනට පවතින නීති රෙගුලාසි යාවත්කාලීන කිරීම.

වර්තමාන තත්ත්වයන් සහ ඉදිරි අවශ්‍යතාවයන් සළකා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය වඩාත් පහසු ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා නියමිත ව්‍යාපෘති ලැයිස්තුව, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන ලැයිස්තුව සහ ප.බ.ඇ. සම්බන්ධ රෙගුලාසි සමාලෝචනය කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. එසේම මේ සම්බන්ධව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

ඒ අනුව, ඉහත ලියකියවිලි අවසාන අදියරේ පවතින අතර ඒවා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

3.1. ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

දැනට පවතින ජාතික පාරිසරික පනතේ පවතින හඳුනා ගත් අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා අවශ්‍ය විධි විධාන සහිතව ජාතික පාරිසරික පනත සංශෝධනය කරමින් පවතී. ඒ අනුව, පරිසර බලපෑම් ඇගයීම් ඒකකය පහත සඳහන් කරුණු සම්බන්ධව ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමට අදාළ ව කටයුතු ආරම්භ කර ඇත.

3.1.1. ජාතික පාරිසරික පනතේ IV ඇ උල්ලංඝනය කිරීම සඳහා දඩ මුදල් පැනවීම

ජාතික පාරිසරික පනතේ iv ඇ උල්ලංඝනය කිරීමේ දී සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් වෙන වෙනම දඩුවම් පැනවීම සඳහා පවත්නා පනතෙහි විධිවිධාන අඩංගු නොවේ.

3.1.2. අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම

අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම පිළිබඳව පනතෙහි පැහැදිලිව සඳහන් කර නොමැත. එසේම පරිසර බලපෑම් අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ එම ක්‍රියාමාර්ග හරහා පරිසරික බලපෑම් අවම වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේද යන්න පිළිබඳ අනුකූලතා වාර්තා ව්‍යාපෘති යෝජක විසින් ඉදිරිපත් කිරීමට අදාල ප්‍රතිපාදන දැනට ජාතික පාරිසරික පනතේ අන්තර්ගත නොවේ. එබැවින් අනුමත කරන ලද ව්‍යාපෘති අධීක්ෂණය/ පසුවිපරම් කිරීම සඳහා පරිසර කළමනාකරණ සැළැස්මක් ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජක වගවන ලෙසට ජාතික පාරිසරික පනතට ප්‍රතිපාදන ඇතුළත් කිරීමට යෝජනා වී ඇත.

4. අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම

ව්‍යාපෘති අනුමත කිරීමේ දී දෙනු ලබන කොන්දේසිවලට යටත්ව ව්‍යාපෘති නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේදැයි සහතික කිරීම සඳහා පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් අනුමැතිය ලබා දුන් ව්‍යාපෘති පසු විපරම් කරනු ලබයි. ඒ අනුව රැස්වීම් හා ක්ෂේත්‍ර පරීක්ෂණ මඟින් පහත සඳහන් ව්‍යාපෘති පසුවිපරම් කිරීම සිදු කර ඇත.

වගුව **22 : 2021** වසර තුළදී පසු විපරම් කරන ලද ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතිය
1	අග්‍රා ඔය කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- සේනෝ මාන් හයිඩ්‍රෝ (පුද්) සමාගම
2	අසුපිනි ඇල්ල කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- නිවිලු (පුද්) සමාගම
3	මධ්‍යම අධිවේගී මාර්ග (කඩවත සිට දඹුල්ල දක්වා) ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
4	මධ්‍යම අධිවේගී මාර්ග (පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස) ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
5	ඩෙල්ටා කුඩා ජල විදුලි ව්‍යාපෘතිය, පුපුරැස්ස ව්‍ය.යෝ.- ලෝටස් ෆ්ලවර් (පුද්) සමාගම
6	දුන්සිනනේ කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- දුන්සිනනේ පවර් (පුද්) සමාගම
7	ගුරුළුවන කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ඩබ්ලිව්. කේ.වී හයිඩ්‍රෝ ටෙක්නික්ස් (පුද්) සමාගම

8	කළුගඟ ජලාශ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
9	කළුපහන කුඩා ජල විදුලි බලාගාරය ව්‍ය.යෝ.- කළුපහන පවර් කම්පැනි (පුද්) සමාගම
10	කොටනකන්ද කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.-ඩී.එම්. කමල් පුෂ්ප මහතා
11	මානෙල්වල කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- පාම්ස් හයිඩ්‍රෝ පවර් (පුද්) සමාගම
12	මෙට්‍රෝ කළම්බෝ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය. ව්‍ය.යෝ.-*නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය*
13	මියනවිට කුඩා ජල විදුලි ව්‍යාපෘතිය
14	නාවල සහ අංගම්පිටිය යා කරන නව පාලම (ඇතුල්කෝට්ටේ) ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
15	කැළණි ගඟ හරහා නව පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
16	නිලඹේ කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- වෙස් වින් පවර් ගලහා (පුද්) සමාගම
17	වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
18	කොළඹ නගරයට පිටත වටරවුම් මාර්ගය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
19	මඩකලපුව, එරාවුර්, පුන්නයිකුඩා හි රෙදිපිළි සැකසීම සඳහා කාර්මික කලාපයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය
20	කහතුඩුව සිට ඉංගිරිය දක්වා රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 1 ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
21	සාලාව අරණායක කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- හයිඩ්‍රෝ ට්‍රස්ට් ලංකා (පුද්) සමාගම
22	ඉහළ කොරවක් ඔය කුඩා ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- සැන්ෆැන් පවර් (පුද්) සමාගම
23	කොළඹ අපද්‍රව්‍ය මගින් බලශක්ති ය නිපදවීමේ ව්‍යාපෘතිය-මුතුරාජවෙල ව්‍ය.යෝ.- වෙස්ටර්න් පවර් (පුද්) සමාගම
24	බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය

5. පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන්

5.1. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළු

ප.බ.ඇ. / මූ.පා.ප. අධ්‍යයන ක්‍රියාවලිය ආශ්‍රිතව පළාත් හා දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් ගේ ගැටලු විසඳීම හා දැනුම වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ වගකීම වේ. ඒ අනුව, මෙම පුහුණු වැඩසටහන ඔස්සේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය නියමාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ හා උපදෙස් පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් හට ලබා දී ඇත.

ඒ යටතේ, පහත සඳහන් වැඩමුළු පරිසර බලපෑම් ඇගයීම් ඒකකය විසින් සිදු කර ඇත.

වගුව **23 : 2021** වසර තුළදී පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ආශ්‍රිත ධාරිතා ඉහළනැංවීමේ වැඩසටහන්

අනු අංකය	පළාත් / දිස්ත්‍රික් කාර්යාලය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	පැවැත්වූ දින ගණන
1.	පළාත් හා දිස්ත්‍රික් කාර්යාල	50	01
2.	පළාත් හා දිස්ත්‍රික් කාර්යාල	30	01

- **විශේෂ විෂය ක්ෂේත්‍ර ඔස්සේ දැනුම වර්ධනය**

පා.බ.ඇ. / මූ.පා.ප. අධ්‍යයන ක්‍රියාවලියට අදාල රාජකාරි කටයුතු වන නියැලී සිටින නිලධාරීන්, මෙම අධ්‍යයන ක්‍රියාවලිය ආශ්‍රිත විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ විශේෂිත වූ දැනුමකින් සමන්විත විය යුතු වේ. ඒ අනුව, පරිසරි බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් පහත දක්වා ඇති වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

වගුව **24: 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ පුහුණු වැඩමුළු

අනු අංකය	පුහුණුව/ වැඩමුළුව	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	පැවැත්වූ දින ගණන
1	පරිසර තිරසාර බව තුළින් කර්මාන්ත හරිතකරණය 2020 පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	14	04
2	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද පාරිසරික කළමනාකරණ පද්ධති -ISO 14001:2015.	14	05
3	IEPSL විසින් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව	03	03
4	ඉන්දියාවේ විද්‍යා හා පරිසරය සඳහා වූ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන මාර්ග සහ මහාමාර්ග ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික බලපෑම් ඇගයීම් පුහුණුව	20	03

5.2. වෙනත් ආයතන මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබා දීම.

වෙනත් ආයතන මඟින් කරනු ලබන ඉල්ලීම් අනුව, පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් පහත සඳහන් වැඩසටහන් සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගී වී ඇත.

වගුව **25 : 2021** වසර තුළදී පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ නිලධාරීන් සහභාගී වූ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන
අභ්‍යන්තර වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය -05	
01	කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව මඟින් අපද්‍රව්‍ය බැහැර කිරීම
02	SCFR අයදුම්පත් අංක 311/2015 සහ 318/2015. Re: මීතොටමුල්ල කසල බහලුම
03	බලශක්ති ජනනය කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය ගම්පහ - බස්නාහිර පළාත

අනු අංකය	වැඩසටහන
04	කොළඹ දිස්ත්‍රික්කයේ ජනාධිපති පදක්කම් ලාභී පරිසර නියමුවන් දැනුවත් කිරීමේ සැසිය.
05	ප්‍රාදේශීය කාර්යාල සඳහා පුහුණු වැඩසටහන
බාහිර වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය - 05	
01	පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ IEPSL වැඩමුළුව
02	මුතුරාජවෙල තෙත් බිමේ තිරසාර භාවිතය
03	විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ ආසියා-අප්‍රිකා වට මේස සමුළුව
04	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කුඩා පරිමාණ ජලවිදුලි බලාගාර පිළිබඳව වැඩසටහන
05	ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා දේශනය

06. පා.බ.ඇ /මූ.පා.ප ක්‍රියාවලියට අදාළව පැන නගින ගැටුම් නිරාකරණයට සහභාගී වීම

6.1 ව්‍යාපෘති පිළිබඳව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම

පා.බ.ඇ /මූ.පා.ප ක්‍රියාවලියට භාජනය වූ ව්‍යාපෘති සහ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පැන නගින ගැටුම් නිරාකරණය කිරීමට පරිසර බලපෑම් ඇගයීම් ඒකකය මැදිහත් වී ඇත. ඒ අනුව, වගු අංක 14 හි සඳහන් වන ව්‍යාපෘති සම්බන්ධයෙන් මතු වූ පැමිණිලි 23 ක් සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් අංශය මැදිහත් වී ඇත.

වගුව **26 : 2021** වර්ෂය තුළ පාරිසරික බලපෑම් ඇගයීම් අංශය පැමිණිලි සඳහා මැදිහත් වූ ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතිය
1.	මධ්‍යම අධිවේගී මාර්ගය ව්‍යාපෘතිය - කඩවත සිට දඹුල්ල දක්වා (අදියර 1, 2 සහ 4) ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
2.	මරදාන සිට රඹුක්ක දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ප්‍රවාහන අමාත්‍යාංශය
3.	රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහා මාර්ගය ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
4.	දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ කළුතර දිස්ත්‍රික්කයේ ගෝනදූව කවටයාගොඩ දිල්වැල්ල පාර ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
5.	කැලණි වැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ව්‍ය-.යෝ. ප්‍රවාහන අමාත්‍යාංශය
6.	නාවල සහ අංගම්පිටිය (ඇතුල්කෝට්ටේ)යා කරන නව පාලම ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
7.	කොළඹ පිටත වට රවුම් මාර්ග ව්‍යාපෘතිය, ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
8.	බෙරගල ඉකෝ ගොල්ෆ් රෙසෝර්ට් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- ඇල්ෆා ඇන්ඩ් ඔමේගා (පුද්) සමාගම
9.	යෝජිත ගොල්ෆ් පිටිය සහ මැල්වත්ත සංවර්ධන ව්‍යාපෘතිය ව්‍ය.යෝ.- මැල්වත්ත දේපළ (පුද්) සමාගම
10.	යෝජිත නිවාස ව්‍යාපෘතිය, රාගල වත්ත, හල්ග්‍රන් ඔය ව්‍ය.යෝ.- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නිල්දණ්ඩාහින්න
11.	රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය -අදියර I (කහතුඩුව සිට ඉංගිරිය දක්වා)

අනු අංකය	**ව්‍යාපෘතිය**
	ව්‍ය.යෝ.- මාර්ග සංවර්ධන අධිකාරිය
12.	මියන්වත්ත කුඩා ජලවිදුලි බලාගාරය ව්‍ය.යෝ.- මිඩ්ලන්ඩ් එනර්ජී (පුද්) සමාගම
13.	ලංකා විදුලිබල මණ්ඩලය සඳහා මුතුරාජවෙල ඉඩම සංවර්ධනය කිරීම ව්‍ය.යෝ.- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
14.	කළුපහන කුඩා ජල විදුලි බලාගාරය ව්‍ය.යෝ.- කළුපහන පවර් කම්පැනි (පුද්) සමාගම

6.2 තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලා සිටින තොරතුරු වලට ප්‍රතිචාර දැක්වීම

තොරතුරු දැනගැනීමේ පනතේ හි විධිවිධාන පරිදි පාරිසරික බලපෑම් ඇගයීම් අංශය වෙතින් මහජනතාව ඉල්ලා සිටින තොරතුරු සඳහා ද අවස්ථා 12 ක දී පිළිතුරු ලබා දී ඇත

4.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ ඒකකය

පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම, ප්‍රකාශිත පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම, ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාල අන්තර් ආයතන සම්බන්ධීකරණය සහ අදාළ ප්‍රතිපත්ති, රෙගුලාසි මාර්ගෝපදේශ සකස් කිරීම සහ ජාතික තෙත්බිම් ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇති උපායමාර්ග හා නිර්දේශ ක්‍රියාවට නැංවීම ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වේ.

4.2.1 **ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව මාර්ගෝපදේශ සකස් කිරීම සහ දැනුවත් කිරීමේ පත්‍රිකා සකස් කිරීම:**

i ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව පළාත් / දිස්ත්‍රික් කාර්යාලවල පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය යටතේ නොවන ක්‍රියාකාරකම් / ව්‍යාපෘතීන් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීමේදී ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමේදී අනුගමනය කලයුතු මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලද අතර සියලුම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වල නිරීක්ෂණය සඳහා බෙදා හරින ලදී.

ii ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් පාර්ශවකාර ආයතන සමඟ කැණීම් නියාමනය කිරීම උදෙසා මාර්ගෝපදේශ ඇතුලත් අත්පොත සකස් කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද සියලුම රැස්වීම් සඳහා සහභාගී වූ අතර එම මාර්ගෝපදේශ ඇතුලත් අත්පොත සඳහා ජාතික පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියට අදාළ සියලුම අදහස් සහ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

iii "ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්" පිළිබඳ අත් පත්‍රිකාවක් සකස් කර අදාළ පාර්ශවකාර ආයතනවල යාවත්කාලීන කරනලද තොරතුරු භාවිතා කර වැඩිදියුණු කරන ලදී.

ivමධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් විසින් 2014 - 2016 වර්ෂවලදී දීප ව්‍යාප්තව සිදුකරන ලද දිය ඇලි පිළිබඳ සමීක්ෂණයේ තොරතුරු උපයෝගී කරගනිමින් අභ්‍යන්තර භාවිතය උදෙසා පොතක් සකස් කරන ලදී.

4.2.2 ස්වභාවික සම්පත් කළමනාකරණය, ඒකකයේ රාජකාරී වලට සෘජුව සම්බන්ධවන පාර්ශවකාර ආයතනවල පවත්වන ලද කමිටු රැස්වීම්, වෙනත් රැස්වීම්, වැඩමුළු හා මධ්‍යම පරිසර අධිකාරියේ වෙනත් අංශ මඟින් පවත්වන ලද තාක්ෂණික කමිටු රැස්වීම් ඇතුළුව රැස්වීම් 109 ට කැඳවීම් අනුව සහභාගී වී අවශ්‍ය අදහස් සහ උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත.

වගුව **27 :** සහභාගී වූ වැඩමුළු/ රැස්වීම් ගණන

	ක්‍රියාකාරකම	**සහභාගී වූ වාර ගණන/ වැඩමුළු ගණන**
1.	ජෛව ආරක්ෂාව/ තත්ව කළමනාකරණ පද්ධතිය /වෙනත් පිළිබඳ වැඩමුළු සහ පුහුණු සැසි	05
2.	ශ්‍රී ලංකා ජලජීවී සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීම්	06
3.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති කමිටු රැස්වීම්	01
4.	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පැවැත්වෙන සැලසුම් කමිටු රැස්වීම්	16
5.	වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදේශණ කාරක සභා රැස්වීම්	07
6.	පාරිසරික බලපෑම් හඳුනාගැනීම්/ පාරිසරික බලපෑම් ඇගයීමට අදාළ විෂය පථය නිර්ණය / තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම්	10
7.	පරිසර අමාත්‍යාංශයේ පවත්වන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම් (එක් එක් ක්ෂේත්‍රයට අදාළව) සකස් කිරීමේ රැස්වීම්, ඇතුළුව පවත්වන ලද වෙනත් රැස්වීම් / ජනාධිපති කාර්ය සාධක බලකාය කැණීම් ක්ෂේත්‍රයට අදාළව පවත්වන ලද රැස්වීම් / වෙනත් රැස්වීම්	64
	එකතුව	**109**

4.2.3 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

i ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන මත 2021 වර්ෂය වන විට පාරිසරික ආරක්ෂක ප්‍රදේශ 10ක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ii 2021 වර්ෂයේදී ජාතික පාරිසරික පනත මගින් පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සලකා බලන ලෙස ප්‍රදේශ 9ක් සම්බන්ධයෙන් ඉල්ලීම් ලැබී ඇත (බස්නාහිර පළාත- 3, මධ්‍යම පළාත -5, වයඹ පළාත -1) .එම

ඉල්ලීම් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කිරීමේදී සලකා බලනු ලබන උපමාන සමග අධ්‍යනය කරන ලද අතර ඒ අතරින් ප්‍රදේශ හතරක් සංරක්ෂණය සඳහා නෛතික ප්‍රතිපාදන පවතින අදාල ආයතන වෙත සංරක්ෂණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇත. ඉන් එක ඉල්ලීමක් සලකා බැලීම ප්‍රතික්ෂේප කරන ලද අතර ප්‍රදේශ හතරක් සම්බන්ධයෙන් පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීමට සලකා බැලීම සඳහා තවදුරටත් අධ්‍යයනය කරමින් පවතී.

iii නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් යෝජිත මුතුරාජවෙල තෙත් බිම් ප්‍රදේශය සංරක්ෂණය සඳහා යෝජිත මහා සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් වූ රැස්වීම් සහ වැඩමුළු වලට සහභාගී වූ අතර ජාතික පාරිසරික පනතට අදාළව තාක්ෂණික උපදෙස් සහ නිරීක්ෂණ ලබා දෙනලදී.

4.2.4 හාලි ඇළ ජල මූලාශ්‍ර රක්ෂිත සංරක්ෂණය සඳහා සලකා බැලීම

හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තේ වතු තුළ පිහිටි ජල මූලාශ්‍ර රක්ෂිත ඉඩම් වල හිමිකම හා ඉඩම් පරිහරණය සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකාර ආයතන සමඟ රැස්වීමක් පවත්වන ලදී. රැස්වීමේ තීරණයට අනුව ජල මූලාශ්‍ර රක්ෂිත ඉඩම් වල වර්තමාන ඉඩම් පරිහරණය හඳුනාගැනීම සඳහා අදාළ පාර්ශවකාර ආයතන සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී. එම අධ්‍යයනයේදී ලද නිරීක්ෂණ අනුව ජල මූලාශ්‍ර රක්ෂිත සඳහා වන සංරක්ෂණ ක්‍රමෝපායන් සලකා බැලීම සිදු කරමින් පවතී.

4.2.5 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය කිරීම

i පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු අදාළ පළාත් / දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය කර පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන ලද අතර අවශ්‍ය අවස්ථාවන් වලදී තාක්ෂණික උපදෙස් ලබා දීම සිදුකරන ලදී.

වගුව **28 :** පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණ කමිටු රැස්වීම්

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ	**පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීම් ගණන**
හන්තාන පරිසර ආරක්ෂක ප්‍රදේශය	04
වරාතැන්න හක්කිද පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	02
මරගල කඳුවැටියපරිසර ආරක්ෂක ප්‍රදේශය	02

ii පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියමාර්ග ගැනීම

ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව පැමිණිලි 19ක් ලද අතර ඉන් 14ක් විසඳීමට පියවර ගෙන ඇත. අනෙකුත් පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

වගුව **29 :** ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලව පැමිණිලි

පැමිණිලි වර්ගය	**පැමිණිලි ප්‍රමාණය**	**විසඳන ලද පැමිණිලි ප්‍රමාණය**	**කටයුතු කරමින් පවතින පැමිණිලි ප්‍රමාණය**
'අ' කාණ්ඩය	10	06	04
'ආ' කාණ්ඩය	09	08	01
මුළු ප්‍රමාණය	19	14	05

iii පාරිසරික ආරක්ෂණ ප්‍රදේශවල කළමනාකරණය

a) පන්සලාතැන්න පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

පන්සලාතැන්න - මාවුස්සාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශයහි සීමා මායිම් නිර්ණය කර මායිම් කණු(301) ප්‍රජා සහභාගීත්වයෙන් ස්ථාපනය කරන ලදී.



රූපය **28 :** පනසලාතැන්න පාරිසරික ආරක්ෂක ප්‍රදේශයහි මායිම් කණු සවි කිරීම

b) බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය නොවන පාරිසරික සංවිධානයක් වන ඉමේස් (EMMACE) ආයතනයේ අනුග්‍රහකත්වයෙන් දැනුවත් කිරීමේ පුවරු 15ක් සවි කරන ලදී.



රූපය **29 :** බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශයහි සවි කරන ලද දැනුවත් කිරීමේ පුවරු

බොල්ගොඩ ජල දේහයේ මායිම් සම්බන්ධයෙන් අධිකරණය විසින් ලබාදී ඇති නඩු තීන්දුව, අනෙකුත් පාර්ශ්වකාර ආයතන සමඟ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

මොරටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ බොල්ගොඩ ජල දේහයේ යෝජිත දැල්කූඩු තුල මසුන් ඇතිකිරීමේ ක්‍රියාකාරම් සඳහා අදාළ පාර්ශවකාර ආයතන වල සහභාගීත්වයෙන් වූ කමිටුවක් මඟින් මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලදී. එම කමිටුව නියෝජනය කරමින් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදෙන ලදී.

c) හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ II වන උපලේඛනයේ දක්වා ඇති අවසර ලත් භාවිතයන්ට අදාළ ව්‍යාපෘති යෝජනා ඇගයීම සම්බන්ධයෙන් හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කළමනාකරණය කරන කමිටුව නියෝජනය වන ආයතන සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණය කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියට වැයවන වියදම් සම්බන්ධයෙන් වන පරිපාලන ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා, දැනුවත් කිරීමේ පුවරු දහයක් ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කර ඇත. ඉන් පහක් සකස් කිරීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී. තවත් සංඥා පුවරු පහක් සකස් කිරීම සඳහා රාජ්‍ය නොවන පාරිසරික සංවිධානයක් වන පරිසර යුක්ති කේන්ද්‍රය එකඟ වී ඒ සම්බන්ධයෙන් කටයුතු සිදුකරනු ලැබේ.

හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය කළමනාකරණය සහ පසුවිපරම් කටයුතු සිදු කිරීමේදී භාවිතා කිරීම සඳහා සකස් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්ට අදාළ ග්‍රාම නිලධාරී වසම් වල සිතියම් අදාළ ග්‍රාම නිළධාරීවරුන්ට ලබාදෙන ලදී.



රූපය **30 :** හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය අයත් ග්‍රාම නිළධාරී වසම් වල සිතියම්

d) මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

මුතුරාජවෙල තෙත්බිම් සම්බන්ධයෙන් පැවැති නඩු කටයුතු වලදී අදාළ තාක්ෂණික උපදෙස් හා නිරීක්ෂණ අධිකරණයට ඉදිරිපත් කරන ලදී. අධිකරණයේ උපදෙස් වලට අනුව මුතුරාජවෙල පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය තුල දැනුවත් කිරීමේ නාම පුවරු තුනක් ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කර ඇත.

e) මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය

පවතින ගැසට් නිවේදනය සංශෝධනය කිරීමටත් සංරක්ෂණ සහ කළමනාකරණ උපාය මාර්ග හඳුනා ගැනීමත් උදෙසා මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයෙහි වත්මන් තත්වය සම්බන්ධයෙන් සහ ගැටලු හඳුනා ගැනීම සඳහා අදාළ පාර්ශවකාර ආයතන සමඟ අධ්‍යයනයක් සිදු කරන ලදී.



රූපය **31 :** අධ්‍යයන වාර්තාව

එම අධ්‍යනය සහ මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශය සඳහා වන කළමනාකරණ වගුව **30 :** සිදු කරන ලද පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන

සැලැස්ම උපයෝගී කර ගනිමින් ගැසට් නිවේදනයේ සංශෝධන සම්බන්ධයෙන් සහ ඉදිරි කළමනාකරණ ක්‍රියාමාර්ග ඇතුළත් අධ්‍යන වාර්තාවක් සකස් කරන ලදී.

4.2.6 පාරිසරික ආරක්ෂක ප්‍රදේශ පසුවිපරම් කිරීම

A. ප්‍රකාශයට පත්කර ඇති පහත වගුවේ පරිදි පාරිසරික ආරක්ෂක ප්‍රදේශ තුළ පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ 48ක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

	පාරිසරික ආරක්ෂක ප්‍රදේශ	**පවත්වන ලද පසුවිරපම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන**
1	බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	28
2	තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	06
3	ග්‍රෙගරි වැව පරිසර ආරක්ෂණ ප්‍රදේශය	03
4	මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	06
5	නකල්ස් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	01
6	වලව්වේවත්ත වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය	03

A. විශේෂ පසුවිපරම වැඩසටහන්

කළුතර දිස්ත්‍රික්කයේ බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය අයත් බොල්ගොඩ ජල දේහයතුල, සිදුවන නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම පිණිස, අඛණ්ඩ පසුවිපරම් වැඩසටහනක් සකස් කිරීම පිළිබඳව කළුතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා සහ අදාළ පාර්ශවකාර ආයතන සමඟ රැස්වීමක් පවත්වන ලදී. අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සභාපතිත්වය (පානදුර, බණ්ඩාරගාව සහ කළුතර) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පසුවිපරම් කමිටු පිහිටුවීමට තීරණය වූ අතර පානදුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා වන කමිටුව පිහිටුවා ඇත.

4.2.7 ප්‍රකාශිත පාරිසරික ආරක්ෂණ ප්‍රදේශවල පවතින ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

A. තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ

මහා මාර්ග අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට අදාළව අංක 30 දරන 2021.06.07 දිනැති කැබිනට් තීරණයකට අනුව පරිසර අමාත්‍යාංශයේ උපදෙස් පරිදි තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ II වන උපලේඛනයට නව අවසරලත් භාවිතයක් ලෙස "අධිවේගී මාර්ගය" ඉදිකිරීම ඇතුළත් කර සංශෝධනය කරන ලදී.

B. ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ

සංචාරක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට අදාළව අංක 10 දරන 2021.05.04 දිනැති කැබිනට් තීරණයට අනුව පරිසර

අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ II වන උපලේඛනය සඳහා කේබල් කාර් ව්‍යාපෘතිය අවසර ලත් ක්‍රියාකාරකමක් ලෙස ඇතුළත් කර ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ සඳහා වූ ගැසට් නිවේදනය සංශෝධනය කරන ලදී.

C. මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ

පවතින ගැසට් නිවේදනය සංශෝධනය කිරීම හා සංරක්ෂණය හා කළමනාකරණ උපාය මාර්ග හඳුනා ගැනීම උදෙසා පාර්ශවකාර ආයතන සමඟ සිදු කරන ලද අධ්‍යයනයේ නිර්දේශ හා මරගල කඳු වැටිය පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය හා සකස් කර ඇති කළමනාකරණ සැලැස්මේ නිර්දේශ ද අනුව මරගල කඳුවැටියේ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ උපලේඛන I, II හා III සංශෝධනය කර, සංශෝධිත ගැසට් නිවේදනය කෙටුම්පත් කරන ලදි.

D. හන්තාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ

හන්තාන පාරිසරික ආරක්ෂණ ප්‍රදේශට අදාළ ගැසට් නිවේදන සංශෝධනය කිරීම සඳහා අදාලවන නව භෞතික සීමා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.

4.2.8 පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරන නිර්ණායක හා ක්‍රමවේදය සංශෝධනය කිරීම:

ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අදහස් ලබා ගෙන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශ කිරීම සඳහා දැනට භාවිතා කරන නිර්ණායක සහ සංශෝධනය සිදු කරමින් කෙටුම්පත සකස් කරන ලදී.

4.2.9 තෙත්බිම් කළමනාකරණය

ලෝක තෙත්බිම් දිනය සැමරීම

A. ජාතික වැඩසටහන

2021 වසරේ ලෝක තෙත්බිම් දින සැමරීමේ ජාතික වැඩසටහන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව "තෙත් බිම් සහ ජලය" යන තේමාව යටතේ සංවිධානය කරන ලදී. ජාතික වැඩසටහන ආනවිලුන්දාව අභය භූමියේ පවත්වන ලදි.

B. පළාත් සහ දිස්ත්‍රික් වැඩසටහන්

ලෝක තෙත්බිම් දිනය සැමරීමේ පළාත් සහ දිස්ත්‍රික් වැඩසටහන් 23 ක් පවත්වන ලදි. එම වැඩසටහන් තෙත්බිම් ආශ්‍රිතව සිදුකරන ලදී. එම වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන්, නිරීක්ෂණ චාරිකා, ශ්‍රමදාන වැඩසටහන් සහ රුක් රෝපණ වැඩසටහන් ඇතුළු වැඩසටහන්වලින් සමන්විත වූ අතර පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, රාජ්‍ය නිළධාරීන් හා ප්‍රජා සහභාගීත්වයෙන් සිදු කරන ලදි.

C. තෙත්බිම් ශ්‍රී ලංකා සඟරාව

තෙත්බිම් පිළිබඳ විද්වත් ලිපි ඇතුළත්ව "තෙත්බිම් ශ්‍රී ලංකා" සඟරාවේ 5 වන වෙළුම ප්‍රකාශයට පත් කරන ලදි. එම සඟරාව අදාළ පාර්ශවකාර ආයතන හා පාසල් වෙත ලබාදීමට කටයුතු කරන ලදී.



රූපය **32 :** තෙත්බිම් ශ්‍රී ලංකා සඟරාව

4.2.10 විශේෂ වැඩසටහන්

i මධ්‍යම පරිසර අධිකාරිය තුළ තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණ ඒකකයට අදාළ තොරතුරු සපයා ඇත.

ii ජනාධිපති පාරිසරික සම්මාන වැඩසටහනේ, රාජ්‍ය නොවන සංවිධාන (NGO) අංශය සහ තනි පුද්ගල අංශය සම්බන්ධයෙන් වන අයදුම්පත් ඇගයීමේ කටයුතු සිදු කරන ලදි.

iii සුරකිමු ගංඟා ව්‍යාපෘතිය

ivසුරකිමු ගංඟා ව්‍යාපෘතිය සඳහා සමාරම්භක උත්සවයේ මධ්‍යම පරිසර අධිකාරියේ මැදිහත්වීම අවශ්‍ය වූ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වන ලදි. ඒ අනුව, මැණික් ගඟ රක්ෂිතයේ මායිම් සලකුණු කිරීමේ කටයුතුවලට සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ, මැණික් ගඟ දෙපස මීටර් 60 රක්ෂිත සීමාවේ මායිම් කණු යොදමින් භෞතිකව භූමියේ සලකුණු කිරීම සිදු කරන ලදි.

4.3 උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය

උපායමාර්ගික පාරිසරික ඇගයීම යනු ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීමේදී පාරිසරිකමය හා වෙනත් තිරසාරභාවයට අදාල කරුණු කෙරෙහි අවධානය යොමුකර ඇති ද යන්න සහතික කර ගැනීමෙහිලා ලෝකයේ බහුලව භාවිතා කරනු ලබන මෙවලමකි. එය බොහොමයක් රටවල උපාය මාර්ගික තීරණ ගැනීමේදී ඇත්වැලක් ලෙස භාවිතා කෙරේ. මධ්‍යම පරිසර අධිකාරිය ද ශ්‍රී ලංකාවට උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය හඳුන්වාදීමට කටයුතු කර ඇති අතර මේවන විට එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සම්පාදනය කරමින් සිටියි. තවද, නියමු පදනමින් උපායමාර්ගික පාරිසරික ඇගයීම් සිදුකිරීම සඳහා අදාල රාජ්‍ය ආයතන යොමු කිරීමට ද මෙම අධිකාරිය කටයුතු කරමින් සිටී.

1.3.1. ශ්‍රී ලංකාව තුල උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය ස්ථාපනය කිරීම.

A. ජාතික පාරිසරික පනත සමාලෝචනය සහ උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාමත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික බලතල ඇතුලත් කිරීම.

වර්තමානයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති, උපාය මාර්ග, සැලසුම් හා වැඩසටහන් සඳහා උපායමාර්ගික පාරිසරික ඇගයීම් සිදු කිරීමට අදාල ප්‍රතිපාදන ඇතුලත් කර ජාතික පාරිසරික පනත සංශෝධනය කරමින් පවතී.

උපායමාර්ගික පාරිසරික ඇගයීම් ශ්‍රී ලංකාවට හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම සඳහා නීති විශාරදයින්, පරිසර විද්‍යා ක්ෂේත්‍ර විශේෂඥයින් හා තෝරාගන්නා ලද අදාල පාර්ශවකාර ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක් 2020 වර්ෂයේදී පිහිටුවන ලදී. ජාතික පාරිසරික පනතේ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් පිලිබඳ යෝජිත සංශෝධන සම්බන්ධයෙන් උපදේශක කමිටුවේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා 4 වන කමිටු රැස්වීම් 2021.07.29 වන දින (කොවිඩ් වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින්) මාර්ගගත ක්‍රමයටසාර්ථකව පවත්වන ලදී.

B. දැනුවත් කිරීම් හා ධාරිතා වර්ධනය කිරීමේ වැඩමුළුව

මෙම අධිකාරිය හා පරිසර යුක්ති කේන්ද්‍රය ඒකාබද්ධව උපාය මාර්ගික පාරිසරික ඇගයීම් සම්බන්ධයෙන් 2021.08.18 සිට 20 දක්වා තෙදින පුහුණු වැඩසටහනක් දෙස් විදෙස් සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. එම පුහුණු වැඩසටහන අවසානයේ ක්‍රියාකාරීව සහභාගීවුවන් වෙත සහභාගීත්වය සඳහා සහතිකපත්‍ර පිරිනමන ලදී.

1.3.2. නියමු පදනම යටතේ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් සිදු කිරීම සඳහා අදාල පාර්ශවකාර ආයතන සමග කටයුතු කිරීම

A. බස්නාහිර පලාත් ඝන අපද්‍රව්‍ය කළමානාකරණ ප්‍රධාන සැලැස්ම සඳහා උපාය මාර්ගික පාරිසරික ඇගයීම

ශ්‍රී ලංකා රජය විසින් සිදුකරන ලද ඉල්ලීමකට අනුව ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත්) සමඟ එක්ව බස්නාහිර පළාත සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්මක් සම්පාදනය කරමින් පවතී. බස්නාහිර පලාත් අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය විසින් එම යෝජිත සැලැස්ම සඳහා උපායමාර්ගික පාරිසරික ඇගයීමක් සිදු කරගැනීමේ අරමුණින් ඊට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාගැනීම් සඳහා මෙම අධිකාරියෙන් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව, 2021.08.13 දින එම උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලියට අදාල පාර්ශවකාර ආයතන සමඟ විෂයගත කමිටු රැස්වීමක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. එම රැස්වීමේදී ලද තොරතුරු අනුව මෙම අධිකාරිය විසින් සම්පාදිත විෂය නිර්ණේය පථය බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත නිකුත් කර ඇත.

B. කොළඹ පුරවරයේ තෝරාගත් ප්‍රදේශ සඳහා වන වැසි ජලාපවහන සැලැස්ම සඳහා වන උපාය මාර්ගික පාරිසරික ඇගයීම

බොල්ගොඩ ගංහා ද්‍රෝණිය සඳහා වන වැසි ජලාපවහන සැලැස්මට අදාල උපායමාර්ගික පාරිසරික ඇගයීමේ පාර්ශවකාර ආයතනවල අවසාන රැස්වීම 2021.11.11 දින මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී.

1.3.3. නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සඳහා මෙම අධිකාරිය නියෝජනය කිරීම.

උපායමාර්ගික පාරිසරික ඇගයීම් ඒකකය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුවේ දී මධ්‍යම පරිසර අධිකාරිය නියෝජනය කරමින් කටයුතු කරන ලදී.

CHAPTER 5 : පර්යේෂණ හා සංවර්ධන ඒකකය

ඕනෑම ආකාරයකින් විය හැකි පරිසර හායනයන් වැලැක්වීම සඳහා අවශ්‍ය පර්යේෂණ /අධ්‍යයන /සමීක්ෂණ සිදුකිරීම හා ඒවා ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය සහ එම තොරතුරු ප්‍රචාරය සහ භූගෝලීය තොරතුරු හා දුරස්ථ සංවේද තාක්ෂණය භාවිතයෙන් ස්වාභාවික සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීමට සහය වීම වේ.

ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් පහත ක්‍රියාකාරකම් 2021 වර්ෂයේදී ඉටුකරන ලදී.

1.1 අධිකාරියේ කාර්යභාරයට අදාලව පර්යේෂණ/ අධ්‍යයන/ සමීක්ෂණ සිදුකිරීම ඒ සඳහා පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණය

- පාරිසරික ඇගයීම් සඳහා පරිසර පද්ධතීන්ගේ සේවා දර්ශක හඳුනා ගැනීම සඳහා කඹරව ගඟ උපදිය බස්නාව අශ්‍රිතව සිදුකරන ලද නියමු අධ්‍යයනය අවසන් අදියරේ පවතින අතර වඩාත් උචිත ආකෘතිය හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍ර සත්‍යාපනය සිදුකල යුතු යුතුව ඇත. මෙම අධ්‍යනයේ ප්‍රතිඵල අධිකාරියේ නිළධාරීන් හට zoom මාර්ගගත රැස්වීම් ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කරන ලදී (රූපය 1).



රූපය **33 :** කඹරව ගංහා උපදිය බස්නාවේ පරිසර පද්ධති සේවාවන් ඇගයීමේදී යොදාගත් පරාමිතීන් සඳහා සමහාරයක් දී නිර්මාණය කරන ලද සිතියම



රූපය **34 :** පර්යේෂණ ප්‍රවෘත්ති පත්‍රිකාව

- 2021 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා 07 ක් අතුරින් 05 ක් සඳහා මුල්‍ය ආධාර ලබාදීමට පර්යේෂණ උපදේශන කමිටුව විසින් අනුමත කරන ලදී. ඒ අතරින් දැනට මුලික වැඩකටයුතු ආරම්භ කරන ලද පහත සඳහන් පර්යේෂණ 02 ක් සඳහා මුලික ගෙවීම් සිදුකරන ලදී.

- වාහන සේවා ස්ථාන වලින් බැහැරකරනු ලබන අවසාදිතය අවධිමත් ලෙස බැහැර කිරීම නිසා පාංශු තත්ත්වය වෙනස්වීම පිලිබඳ අධ්‍යයනය

- CCME ජල තත්ත්ව දර්ශකය භාවිතයෙන් කළු ගංගා ද්‍රෝණියේ මතුපිට ජල තත්ත්වය පිළිබඳ ඇගයීම

- 2019 වර්ෂයේ මුල්‍ය ප්‍රතිපාදන සපයන ලද "කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි මුල්‍ය කාර්ය සාධනය කෙරෙහි හරිත ක්‍රියාකාරකම් වල බලපෑම" යන මාතෘකාව යටතේ කරන ලද දර්ශනපති උපාධියේ වැඩකටයුතු සාර්ථකව අවසන් කර ඇත.

- 2019 වර්ෂයේ මුල්‍ය ප්‍රතිපාදන සපයන ලද "වානිජමය වශයෙන් එළවළු සෝදන ස්ථාන වලින් බැහැරලන ජලයේ තත්ත්වය රසායනික ඔක්සිජන් ඉල්ලුම, ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම හා මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය යන පරාමිතීන් භාවිතයෙන් පිරික්සීම" යන මාතෘකාව යටතේ සිදුකරන ලද අධ්‍යයනය 2021 වර්ෂයේ දී නිමකරන ලදී.

- මධ්‍යම පරිසර අධිකාරියේ නිළධාරීන් විසින් සිදුකරන ලද පර්යේෂණ ප්‍රතිඵල සහ පරිසර ක්ෂේත්‍රයේ නව සොයාගැනීම් ඇතුලත් ප්‍රවෘත්ති පත්‍රිකාවක් නිර්මාණය කරන ලදී (රූපය 2).

1.2 ගෝලීය තොරතුරු පදනම් කරගත් පාරිසරික තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම

- පරිසර ආරක්ෂණ බලපත්‍ර දත්ත පද්ධතියේ මාසික සාරාංශගත කිරීම් සිදුකිරීම

Industrial summary update upto 31.01.2021

	Province	District	Total A, B, C & BOI Industry	Total "A" category	Total "B" category	Total "C" category	Total BOI Industry
1	Western	Colombo	6387	2592	1334	2199	262
		Gampaha	6119	2332	1289	2193	305
		Kalutara	3027	965	659	1268	135
2	Southern	Galle	2960	616	860	1394	90
		Matara	2653	464	525	1641	23
		Hambantota	2763	428	335	1967	33
3	Eastern	Trincomalee	1146	262	211	652	21
		Ampara	1959	412	363	1167	17
		Batticaloa	1316	263	322	716	15
4	Uva	Badulla	2524	429	264	1813	18
		Moneragala	1974	340	163	1457	14
5	Central	Kandy	3888	791	649	2393	55
		Matale	1764	387	224	1129	24
		N'Eliya	832	237	133	439	23
6	North Central	Anuradhapura	2489	644	349	1462	34
		Polonnaruwa	830	231	206	383	10
7	Sabaragamuwa	Ratnapura	2683	679	709	1263	32
		Kegalle	2193	571	677	914	31
8	Northern	Jaffna	1905	400	350	1151	4
		Mannar	472	110	115	246	1
		Vavuniya	456	179	70	202	5
		Kilinochchi	577	70	168	336	3
		Mullaitivu	425	71	116	237	1
9	North Western	Kurunegala	950	538	412	0	0
		Puttalam	347	237	110	0	0
	Total		52,639	14,248	10,613	26,622	1,156
	% of each Category			27	20	51	2

Industrial summary update upto 31.12.2021

	Province	District	Total A, B, C & BOI Industry	Total "A" category	Total "B" category	Total "C" category	Total BOI Industry
1	Western	Colombo	6302	2599	1241	2202	260
		Gampaha	6308	2523	1274	2202	309
		Kalutara	3114	1017	677	1278	142
2	Southern	Galle	2936	610	811	1466	49
		Matara	2843	458	481	1882	22
		Hambantota	2862	442	346	2042	32
3	Eastern	Trincomalee	1147	268	200	659	20
		Ampara	1983	432	367	1167	17
		Batticaloa	1305	269	308	713	15
4	Uva	Badulla	2608	461	257	1877	13
		Moneragala	1974	369	146	1443	16
5	Central	Kandy	3929	829	585	2457	58
		Matale	1834	421	217	1172	24
		N'Eliya	848	243	152	431	22
6	North Central	Anuradhapura	2614	783	377	1430	24
		Polonnaruwa	805	229	188	378	10
7	Sabaragamuwa	Ratnapura	2787	766	726	1264	31
		Kegalle	2311	573	664	1042	32
8	Northern	Jaffna	1925	404	349	1162	10
		Mannar	487	116	113	256	2
		Vavuniya	469	194	68	202	5
		Kilinochchi	594	72	179	340	3
		Mullaitivu	415	71	109	234	1
9	North Western	Kurunegala	934	530	404	0	0
		Puttalam	390	261	129	0	0
	Total		53,724	14,940	10,368	27,299	1,117
	% of each Category			28	19	51	2

1:10,000 අංක 79 සිට 92 ජල මුලාශ්‍ර සිතියම් (290) ගොනුගත කර භූගෝලීය වශයෙන් නිරවද්‍ය කරන ලදී.

පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා වූ දත්ත පද්ධතියේ සියළුම දිස්ත්‍රික්ක වලට අදාල කර්මාන්ත වල ස්ථානීය පිහිටීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කර යාවත්කාලීන කරමින් පවතී.

1.3 ගෝලීය තොරතුරු හා පර්යේෂණ ක්‍රියාවලීන් පිලිබඳ පර්යේෂණ හා සංවර්ධන ඒකකය/ ප්‍රධාන කාර්යාලය/ප්‍රාදේශීය කාර්යාලවල නිළධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්

- දිස්ත්‍රික්ක 25 ට අදාල පරිසර ආරක්ෂණ බලපත්‍ර සඳහා වූ දත්ත පද්ධතිය අන්තර්ජාලයට යොමුගත කර සාරාංශගත කරන ආකාරය පිළිබඳ අධිකාරියේ අදාල දිස්ත්‍රික් නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා Google Earth මෘදුකාංගය ආශ්‍රිතව කරනු ලබන තාක්ෂණික භාවිතයන් පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම.

- මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ආශ්‍රිත භාවිතයන් පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම.

- මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ක්‍රමවත් power point ඉදිරිපත් කිරීමක් සිදුකරන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම.

1.4 භූගෝලීය තොරතුරු තාක්ෂණය හා අදාල සේවාවන් සැපයීම(පාරිසරික සංවේදී කලාප හඳුනාගැනීම සහ ඊට අදාල සිතියම් සැකසීම, භූමි පරිහරණ සිතියම් සැකසීම, චන්ද්‍රිකා ඡායා රූප සැකසීම, භූ ගෝලීය තොරතුරු තාක්ෂණය ආශ්‍රිත විශ්ලේෂණ සිදුකිරීම, භූගෝලීය ස්ථානීය දත්ත ලබාගැනීම)

- ජනාධිපති පරිසර සම්මාන සඳහා සුදානම් වන පරිසර නියමුවන් සඳහා පර්යේෂණ පත්‍රිකා ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

1.4.1 සුරකිමු ගංඟා ව්‍යාපෘතිය සඳහා

- විවිධ පරිපාලන ඒකක වලට අදාල වූ ගැටළු පෙන්වීම සඳහා දිස්ත්‍රික්ක හා අදාල ගංඟා තොරතුරු සංරාංශ ගත කර ලබාදීම.
- දිස්ත්‍රික් කමිටු රැස්වීම් වල ඉදිරිපත් කිරීම් සඳහා දිස්ත්‍රික් 24 ට අදාලව ගංඟා සමීක්ෂණයේ තොරතුරු ඇතුලත් සිතියම් නිර්මාණය කිරීම.
- ගංඟා ආශ්‍රිත සමීක්ෂණයේ දෙවන අදියර සඳහා අන්තර්ජාලගත ප්‍රශ්නාවලි යෙදවුම (App) ප්‍රතිශෝධනය කර භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ ඇතුලත් වීඩියෝ පටයක් සමඟ ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදීම වෙත ලබාදීම .



රූපය : 1 : • ගංඟා ආශ්‍රිත සමීක්ෂණයේ දෙවන අදියර සඳහා අන්තර්ජාලගත ප්‍රශ්නාවලි යෙදවුම

- සුරකිමු ගංඟා මාර්ග ගත භූගෝලීය දත්ත පද්ධතිය පහත යෙදවුම් ඇතුලත් කොට නිර්මාණය කිරීම

1 ගංඟා සමීක්ෂණ දත්ත ඇතුලත් අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව (dashboard)

2 ප්‍රගතිය පසුවිපරම සඳහා වූ අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව

3 ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා වූ අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව

4 දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ඇතුලත්වූ අන්තර්ජාලගත ප්‍රදර්ශන පුවරුව

- පහත සඳහන් අන්තර්ජාලගත ප්‍රශ්නාවලි යෙදවුම් නිර්මාණය කිරීම

1 ව්‍යාපෘති යෝජනා යොමු කිරීම සඳහා

2 ගංඟා ආශ්‍රිත දූෂණය හා අදාල මහජන අදහස් ලබාගැනීම සඳහා

3 ගංඟා ආශ්‍රිත නොවන පාරිසරික ගැටළු හා අදාල මහජන අදහස් ලබාගැනීම සඳහා

4 ස්ථාපිත දිස්ත්‍රික් කමිටු හා අදාල රැස්වීම් වල තොරතුරු යොමුගත කිරීම සඳහා

5 ස්ථාපිත ප්‍රාදේශීය කමිටු හා අදාල රැස්වීම් වල තොරතුරු යොමුගත කිරීම සඳහා

- ප්‍රාදේශීය කාර්යාලවල සුරකිමු ගංඟා වැඩසටහනේ අන්තර්ජාලගත භූගෝලීය දත්ත පද්ධතිය නිසියාකාරව භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම.
- සුරකිමු ගංඟා අන්තර්ජාලගත භූගෝලීය දත්ත පද්ධතිය හා එහි භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ ඇතුලත් වීඩියෝ පටයක් නිර්මාණය කර පළාත් හා දිස්ත්‍රික් කාර්යාලවලට බෙදාහැරීම.
- ව්‍යාපෘති යෝජනා සුරකිමු ගංඟා අන්තර්ජාලගත භූගෝලීය දත්ත පද්ධතියේ ප්‍රදර්ශන පුවරුවට යොමුගත කරන ආකාරය පිළිබඳ ප්‍රාදේශීය කාර්යාල සඳහා මාර්ගෝපදේශන ලබාදීම.

1.4.2 මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සඳහා

- අවශ්‍යතාවය මත සපයන ලද සිතියම් නිමැවුම් - 103
- අධිකාරියේ අනෙකුත් ඒකකයන්හි ඉල්ලීම මත යම් බන්ධාංකයක සාපේක්ෂ භූගෝලීය පිහිටීම පරීක්ෂා කරදීම - 27
- අන්තර්ජාලගත ප්‍රශ්නාවලි යෙදවුම් නිර්මාණය කිරීම – 03

i. පරිසර ආරක්ෂණ අංශය සඳහා දියවන්නා ඔය ආශ්‍රිත කර්මාන්ත තොරතුරු අධ්‍යයනය

ii. පරිසර ප්‍රවර්ධන ඒකකය සඳහා ගස් සිටුවීමේ හා බෙදාහැරීම පිළිබඳ දත්ත රැස්කිරීම

iii. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය - මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දත්ත රැස්කිරීම

Chapter 6 : නීති ඒකකය

"අප එකිනෙකාගේ පැවැත්ම උදෙසා නීතිමය යාන්ත්‍රණය බලාත්මක කිරීම තුළින් පරිසරය සංවර්ධනය කිරීමෙන් ද දැනුම ලබාදීමෙන් ද පරිසරයේ සුවදායී පැවැත්ම තහවුරු කරමු."

6.1 ජාතික පාරිසරික පනත යටතේ ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලාත්මක වන නීති හා රෙගුලාසි ඔස්සේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ නීති අංශය මඟින් සිදු කරන ලද නෛතික කාර්යයන් පහත පරිදි වේ.

4.2 පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

2021වර්ෂය තුලදී මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකය විසින් ගොනු කරන ලද නඩු හා අවසන් කරන ලද නඩු කටයුතු රාශියකි. ඒ අනුව 2021 වර්ෂයේ දී මෙම අධිකාරිය පවත්වාගෙන යන නඩු සංඛ්‍යාව 562 වන අතර, ඒ තුළ අධිකාරියට එරෙහිව පවරන ලද නඩු හා අධිකාරිය විසින් පවරන ලද නඩු ඇතුලත් වන අතර, 2021 වර්ෂය තුල අධිකාරිය විසින් නඩු 144 ක් අළුතෙන් පවරා ඇත.

එකී නඩුකරයන් මඟින් 2021 වර්ෂයේ දඩ මුදල් ලෙස අයකරගෙන ඇති මුළු මුදල රු. 1,101,775.48 කි.

වගුව **31 :** පළාත් තුළ නීති බලාත්මක කිරීමේ ප්‍රගතිය

අනු අංකය	පළාත	2020 වර්ෂය තුළදීඅළුතින් ගොනු කරන ලද නඩු සංඛ්‍යාව	මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා පවත්වාගෙන යන ලද නඩු සංඛ්‍යාව	මධ්‍යම පරිසර අධිකාරිය විසින් අවසන් කරන ලද නඩු සංඛ්‍යාව
01.	බස්නාහිර	72	149	12
02.	මධ්‍යම	26	137	15
03.	ඌව	03	21	01
04.	දකුණ	07	17	00
05.	නැගෙනහිර සහ උතුර	23	61	19
06.	සබරගමුව සහ වයඹ	12	63	16
07.	උතුරු මැද	01	08	00
	එකතුව	**144**	**456**	**63**

6.3 මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු

මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පැවරූ නඩු 106 ක් 2021 වර්ෂයේ දී පවත්වාගෙන ගිය අතර, ඒවා මහේස්ත්‍රාත්, දිසා, මහාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණයන්හි පවරන ලද නඩු වේ.

නීති අංශයේ නිලධාරීන්, මහේස්ත්‍රාත්, දිසා, මහාධිකරණ, අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ වල මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරන ලද නඩු කටයුතු වලට පෙනී සිටින ලදි. තවද, අධිකරණයෙහි ගොනු කරන ලේඛන කෙටුම්පත් කිරීම සහ උපදේශන සාකච්ඡාවලට නීති අංශයේ නිලධාරීන් සහභාගී වන ලදි.

6.4 ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සමහර කර්මාන්තශාලා මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පාරිසරික පනතට අනුකූලව අපජලය පිරිපහදු පද්ධති සකස් කිරීමෙන්ද, සමහර කර්මාන්තශාලා ජාතික පාරිසරික පනතේ ප්‍රකාශිත ප්‍රමිති හා උපමාන වලට අනුකූලව ශබ්ද පාලනය කිරීමෙන්ද සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන්ද අනතුරුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ගන්නා ලදී.

6.5 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම / අත්හිටුවීම / ප්‍රතික්ෂේප කිරීම/ හේතු දැක්වීමේ ලිපි

කර්මාන්තශාලාවල සිදු වන පරිසර දූෂණය සලකා බලා නිකුත්කොට ඇති පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අවලංගු කිරීම සඳහා කර්මාන්තශාලා විසිදෙක (22) ක් වෙත ද, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් එකසිය නවය (109) ක් වෙත ද ලිපියවා ඇත.

තවද, කර්මාන්තශාලා සම්බන්ධව නඩු පැවරීමට අදාළ පියවර ගැනීම සඳහා ශබ්ද මට්ටම් වාර්තා අපදියර විශ්ලේෂණ වාර්තා හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා කැඳවීම සඳහා ලිපිගොනු ගණනාවක් පරිසර දූෂණ පාලන අංශය සහ අදාළ පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල වෙත සහ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කොට ඇත.

6.6 ජාතික පාරිසරික පනතේ 24(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන විධානයන්

2021 වර්ෂයේ නීති ඒකකය මඟින් ජාතික පාරිසරික පනතේ 24ආ වගන්තිය යටතේ විධාන පනහ (50) ක් නිකුත් කර ඇත.

6.7 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර කොන්දේසි

නව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේදී එහි කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ නීති ඒකකයේ නිලධාරීන් සහ පළාත් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති සහකාර නීති නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබයි.

6.8 ජාතික පාරිසරික පනත යටතේ ඉදිරිපත් කර ඇති අභියාචනා (මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය)

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන අභියාචනා විභාග කිරීම් හැට පහ (65) ක් සම්බන්ධයෙන් නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

6.9 නොතාරිස් කටයුතු

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමේදී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ගොඩනැගිලි බදු පදනම මත ලබාගැනීම හා සේවා ලබා ගැනීම සඳහා බාහිර අංශ සමඟ එළඹෙන්නා වූ එකඟතා සහ ගිවිසුම්පත්‍ර පිළියෙළ කිරීම් සිදු කිරීම සහ එකී ගිවිසුම් පත්‍ර අනූ අට (98) ක් සඳහා අනුමැතිය ලබාදීම සිදු කෙරිණ.

6.10 රැස්වීම්

නීති ඒකකයේ නිලධාරීන් පාරිසරික කරුණු සම්බන්ධයෙන් වන රැස්වීම් දෙසිය අසූ තුන (283) ක් සඳහා සහභාගී වී ඇත.

6.11 පැමිණිලි

නීති ඒකකයේ නිලධාරීන් පරිසර දූෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මහජනතාව, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අනෙකුත් ආයතන වලින් යොමු කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගෙන ඇත.

6.12 සාකච්ඡාවලට සහභාගීවීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරන ලද නඩු සහ මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව අධිකරණයේ ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් විරෝධතා, උත්තර, ලිඛිතදේශන සැකසීම සහ විභාග නඩු සම්බන්ධයෙන් උපදේශන සාකච්ඡා පනස් එක (51) ක් සඳහා නීති ඒකකයේ නිලධාරීන් සහභාගී වී ඇත.

6.13 උපදෙස්

නීති ඒකකයේ නිලධාරීන් විසින් පළාත් පාලන ආයතන තනි පුද්ගලයින් සහ වෙනත් අංශවලින් යොමු කරන ලද ගැටළු හයසිය අනූ දෙක (692) ක් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත.

6.14 නීති නිවේදන

පරිසර දූෂණකාරී කර්මාන්ත දෙසීය දොළහ (212) කට එරෙහිව නීති නිවේදන යවා ඇත.

6.15 ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා

අධිකරණ නියෝග වලට අදාළව අධිකරණයට ඉදිරිපත් කිරීම සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉදිරියේ පවත්වනු ලබන අභියාචනා විභාග වලට ඉදිරිපත් කිරීමට නියමිත නිලධාරීන් විසින් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා සඳහා නීති අංශයේ අනුමැතිය ලබා දී ඇත.

6.16 දැනුවත් කිරීම

නීති අංශයේ නිලධාරීන් විසින් ජාතික පාරිසරික පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළ දේශන පනස් පහ (55) ක් වෙනත් ආයතන වල නිලධාරීන් සඳහා පවත්වා ඇත. මධ්‍යම පරිසර

අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වන වැඩමුළු සඳහා සම්පත් දායකයින් ලෙස සහභාගි වී ඇත.

තවද, නීති ශිෂ්‍යයින් සහ අනෙතුත් විශ්ව විද්‍යාල සිසු සිසුවියන්ගේඉල්ලීම් අනුව, පරිසර නීතිය හා පාරිසරික නියෝගයන්පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී.

6.17 ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

‘‘ දූෂකාරකයා ගෙවයි.’’ වැනි මූලධර්ම ඇතුළත් කරමින් තෙත්බිම් සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රතිපාදන ජාතික පාරිසරික පනතට හඳුන්වාදීම, පවතින අඩුපාඩු මහහැරීම හා පවතින දඩ මුදල් සංශෝධනය කිරීමේ අරමුණින් ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත.

මෙයට අදාළ යෝජිත නව සංශෝධන ඇතුළත් කැබිනට් පත්‍රිකාව සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර, එකී කැබිනට් පත්‍රය සංශෝධන පනත කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත එවන ලද අතර නැවතත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් කෙටුම්පත සම්බන්ධ නිරීක්ෂණ අමාත්‍යාංශය වෙත යවා ඇත. ඉන් පසු වැඩිදුර නව සංශෝධන යෝජනා කරන ලද අතර නව සංශෝධන කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යවා ඇත.

මීට අමතරව පහත සඳහන් අති විශේෂ ගැසට් පත්‍ර 2021 වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදි.

- අංක 2211/51හා 2021.01.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (වරක් පමණක් භාවිතා කරනු ලබන ප්ලාස්ටික් තහනම් කිරීම්)
- අංක 2211/50 හා 2021.01.21 දිනැති අති විශේස ගැසට් පත්‍රය (ප්ලාස්ටික් කාණ්ඩ හඳුනා ගැනීමේ උපමාන)
- අංක 2237/07 හා 2021.07.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය (තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය)
- අංක 2247/32 හා 2021.10.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය (ගෙග්‍රරි වැඩ පාරිසරික ආරක්ෂන ප්‍රදේශය)

Chapter 7 : පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය

පාරිසරික තිරසාරභාවය යනු ස්වාභාවික සම්පත් මතුපරපුර සඳහා ද උරුම කිරීම සඳහා පරිසරය සමඟ ඇතිවන වගකිවයුතු අන්තර්ක්‍රියාකාරිත්වය වන අතර තිරසාරභාවය තුළින් අනාගත පරපුරේ අවශ්‍යතා සපුරාලීමේ හැකියාව අවදානමට ලක් නොකරයි. පරිසරය ඕනෑ තරම් ස්වභාවික සම්පත් සපයයි. පරිසරයේ තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා අප මෙම පාරිසරික සේවාවන් සවිඥානිකව භාවිතා කළ යුතුය. ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා විවිධ ඉලක්ක කණ්ඩායම් අතර දැනුවත්භාවයේ මට්ටම ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. මධ්‍යම පාරිසරික අධිකාරියේ පරිසර අධ්‍යාපනය හා දැනුවත් කිරීමේ අංශය ඉහත සඳහන් සාධක කෙරෙහි අවධානය යොමු කරමින් පාරිසරික සංරක්ෂණය සඳහා මහජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වයක් ලබා ගැනීම පිණිස ප්‍රජාවේ විවිධ ඉලක්ක කණ්ඩායම් අතර දැනුවත්භාවයේ මට්ටම ඉහළ නැංවීම සඳහා විවිධ අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

1.දිස්ත්‍රික් හා පාසල් පාරිසරික පුස්තකාල ස්ථාපිත කිරීම.

මධ්‍යම පරිසර අධිකාරියේ, ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය මගින් පරිසර නියමු වැඩසටහන ක්‍රියාකාරීව පවත්වාගෙන යන අවම පහසුකම් ඇති පාසල් පුස්තකාල 05ක් පාරිසරික අධ්‍යාපනය, පාරිසරික සංරක්ෂණය හා ඒ හා සම්බන්ධ ගැටළු පිළිබඳව සැලකිලිමත් වන අතර අනාගතයේදී සිදුවිය හැකි පාරිසරික හායනයන් වැළැක්වීම පිණිස පවත්නා පාරිසරික ගැටළු සඳහා විසඳුම් සෙවීම වෙනුවෙන් තනි තනිව හා සාමූහිකව වැඩ කිරීමට ජනතාව පොළඹවයි.

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා මධ්‍යම පාරිසරික අධිකාරියේ පරිසර අධ්‍යාපනය සහ දැනුවත් කිරීමේ අංශය, පාරිසරික අධ්‍යාපන ඒකකය, පාරිසරික ප්‍රවර්ධන ඒකකය සහ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය ලෙස ඒකක 3 කින් සමන්විත වේ.

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ පාරිසරික තොරතුරු බෙදාහරින නාභික මධ්‍යස්ථානය වේ. මෙහි ප්‍රධාන කාර්යය වන්නේ පාරිසරික තොරතුරු අත්පත් කර ගැනීම, එම තොරතුරු සංවිධානය කිරීම සහ බෙදා හැරීමයි.

තෝරාගෙන එහි පාරිසරික අංශය සංවර්ධනය කිරීම 2021 වර්ෂයේදීත් සිදුකර ඇත. මෙම වැඩසටහන යටතේරු. ලක්ෂ 22ක් වටිනා පොත් හා පුස්තකාල උපකරණ පහත සඳහන් දිස්ත්‍රික්ක වල පාසල් පුස්තකාල සඳහා ලබා දී ඇත. එම පුස්තකාල පිළිවෙලින් පහත පරිදි වේ.



රූපය **36 :** කුරුණෑගලදි.ව/ම/ම/කරඹෙ



රූපය **35 :** මුලතිව දි.මු/ පාලිනගර් මහා විද්‍යාලය, නැගෙනහිර මාන්තෙයි



රූපය **37 :** බදුල්ල දි.බ/ ඇත්තල ගෙදර තක්ෂිලා මහා විද්‍යාලය, මලිත්ත



රූපය **38 :** මාතර දි.මාර/ කඹුරුගමුව මහා විද්‍යාලය, කඹුරුගමුව



රූපය **39 :** මාතලේදි.මප/මා/ග/තොලඹුගොල්ල මහා විද්‍යාලය, ගලේවල

2. පරිසර අධිකාරියේ පළාත් කාර්යාල තුළ පරිසර පුස්තකාල පිහිටුවීම.

මධ්‍යම පරිසර අධිකාරියේ ගාල්ල, මහනුවර හා අම්පාර යන පළාත්/දිස්ත්‍රික් කාර්යාල සඳහා පාරිසරික පුස්තකාල 03 ක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පුස්තකාල ද්‍රව්‍ය හා අවශ්‍ය උපකරණ ලබා දුන් අතර 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මසදී පුස්තකාල විවෘත කිරීම සිදු කර ඇත.මෙම වැඩසටහන යටතේ රු. ලක්ෂ 15ක් වටිනා (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන්) පොත්2,227ක්, පොත් කබඩ්, කියවීම් මේස හා පුටු ලබා දී ඇත.





රූපය **40 :** දකුණු පළාත් කාර්යාලය




රූපය **41 :** මධ්‍යම පළාත් කාර්යාලය




රූපය **42 :** අම්පාර දිස්ත්‍රික් කාර්යාලය

3. පුස්තකාල එකතුව ගොඩනැගීම

ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය සඳහා රු. ලක්ෂ 3 ක් වටිනා පාරිසරික පොත් හා සඟරා 209 ක් මිල දී ගෙන ඇති අතර, පරිත්‍යාගලෙස පොත් හා සඟරා 42 ක් ද පාරිසරික බලපෑම් ඇඟයීම් වාර්තා / මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා 40 ක් නව එකතුවට ඇතුලත්ඇතුළත් කර ඇත. එමෙන්ම තොරතුරු මධ්‍යස්ථානයේ එකතුවට ශ්‍රී ලංකාවේ පාෂාණවර්ග ඇතුළත් ප්‍රදර්ශනාත්මක පුවරුවක් ඇතුළත් කර ඇත.

4. ප්‍රලේඛන සේවා හා පුස්තකාල පිරිසැකසුම්කරණය

A. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන IND/ Cat සහ e – Repository දත්ත පදනම් 03 සඳහා දත්ත 668ක් මෙම වසර තුලදී ඇතුළත් කර ඇත.

B. සඟරා සහ පොත් 209ක් ප්‍රතිග්‍රහණය කර වර්ගීකරණය සිදුකර ඒ සඳහා තීරු සංකේත ලේබල් අලවා ඇති අතර, නව සාමාජික පත් 08 ක් නිකුත් කර ඇත.

C. පුවත්පත් කැපුම් 3975 ක සංඛ්‍යාවක් පුවත්පත් අනුක්‍රමණිකාවට ඇතුලත් කර ඇත.

5.පාරිසරික තොරතුරු හුවමාරු කිරීම

A. ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානය මගින් පාඨකයින් (පැමිණීමෙන්, විද්‍යුත් තැපැල් හා දුරකථන මගින්) 750 දෙනෙක් තොරතුරු ලබාගෙන ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය වෙත පොත් 2173ක් බැහැර දීම සිදුකර ඇත. එමෙන් ම ශ්‍රී ලාංකික පාඨකයින් හා විදේශීය රටවල පාඨකයින්3121ක් ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ මාර්ගගත ඊ දත්ත ගබඩාව (e – Repository) පරිහරණය කර පාරිසරික තොරතුරු අත්පත් කරගෙන ඇත.

B. පාරිසරික පෝස්ටර් 510 කට අධික ප්‍රමාණයක් මහජනතාව අතර බෙදාහරින ලදි.

C. පහත සඳහන් සේවා පවත්වාගෙන යාම වෙනුවෙන් රු. 32, 450/- ක ආදායමක් ලබා දී ඇත.

පාරිසරික බලපෑම් ඇඟයීම් වාර්තා / මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා - ප්‍රකාශන 30

ඡායා පිටපත් ගැනීම් - පිටු 490

6. වෙනත් ක්‍රියාකාරකම්

බ්‍රිතාන්‍ය කවුන්සිල් පුස්තකාල සාමාජිකත්වය යටතේ පොත් පෙට්ටි හුවමාරු කරගැනීමෙන් පොත් 46 ක් පරිසර අධිකාරියේ පාඨකයන් අතර කියවීම සඳහා බෙදාහැර ඇත.

Chapter 8 : සැලසුම් හා පසුවිපම් ඒකකය

ජාතික පාරිසරික පනතින් පැවරී ඇති බලතල යටතේ පරිසරය ආරක්ෂා කිරීම හා කළමනාකරයට අදාල ඵලදායී සේවාවක් සැපයීම සහතික කිරීම වෙනුවෙන් අවශ්‍ය වන්නා වූ කෙටිකාලීන හා දිගුකාලීන උපායමාර්ග හා අරමුණු සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළුම නියාමන ක්‍රියාකාරකම් පෙළගැස්වීම හා සම්බන්ධීකරණය සැලසුම් ඒකකයේ ප්‍රධනම කාර්යභාරය වේ. ඒ අනුව,

8.1 සංයුක්ත සැලැස්ම සකස් කිරීම

මෙම සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ඉදිරි වසර පහක කාල පරිච්ඡේදයක් සඳහා අප අධිකාරියේ කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සම්පත් කාර්‍යක්ෂම ලෙස යොදා ගනිමින් රජයේ පවතින සංවර්ධන ක්‍රියාවලියට පහසුකම් සැපයීම හා සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසරයට අවම හානියක් වනලෙස සංවර්ධන උපායමාර්ග කළමනාකරණය කිරීමය. ඒ අනුව, වසර 05 කට වරක් අප අධිකාරියෙහි සියළුම අංශ, ඒකක, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම සකස් කිරීම සිදු කරනු ලබයි.





රූපය **43 :** ආයතනික සැලසුම් වැඩමුළුව
2021.12.16 දින පැවැත්විණි

8.2 ආයතනික වාර්ෂික වාර්තාව සකස් කිරීම

වාර්ෂිකව, අප අධිකාරිය ලබාගත් ප්‍රගතිය අදාල පාර්ශවකාර ආයතන වෙත සන්නිවේදනය කරන ප්‍රධානතම මාධ්‍ය වන්නේ වාර්ෂික වාර්තාවයි. ඒ අනුව, වාර්ෂිකව අප ඒකකය සියළුම අංශ, ඒකක, පළාත් හා දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරමින් එම කාර්යාල ලබාගත්තා වූ ප්‍රගතිය විධිමත් වාර්තාවක් ලෙස ඉදිරිපත් කරනු ලබයි.

අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම, පසුවිපරම් කිරීම, වාර්තා කිරීම හා අධීක්ෂණය

8.3 පරිසර අධිකාරියේ ඉපයීම් මඟින් ආයෝජනය කරන සංවර්ධන / නියාමන ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීම

අප අධිකාරියේ ඒකක 16 ක් සඳහා අප අධිකාරියේ ඉපයීම් මඟින් ක්‍රියාත්මක කරන නියාමන / සංවර්ධන ක්‍රියාකාරකම් හා අනුමත කරගත් ක්‍රියාකාරී සැලැස්ම මාසිකව පසුවිපරම් කිරීම හා පාර්ශවකාර ආයතන වෙත ප්‍රගතිව වාර්තා කිරීම සිදු කරනු ලබයි.

භාණ්ඩාගාර අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘති (Treasury Funded Acton Plans) පසුවිපරම් කිරීම

භාණ්ඩාගාර අරමුදල් මත පදනම් වන ව්‍යාපෘති මාසිකව පසුවිපරම් කිරීම, පාර්ශවකාර ආයතන වෙත ප්‍රගතිව වාර්තා කිරීම හා අධීක්ෂණය සිදු කරනු ලබයි.

8.4 නව ව්‍යාපෘති යෝජනා

විසර්ජන පනත් කෙටුම් පතෙන් හඳුනාගන්නා ලද නව විෂය තේමාවන් හා ක්ෂේත්‍රයන් යටතේ ව්‍යාපෘති යෝජනා හඳුනාගැනීම, එම ව්‍යාපෘති වාර්තා සැකසීම හා සම්බන්ධීකරණය සැලසුම් ඒකකය හරහා සිදු කරනු ලබයි. ඒ යටතේ විශේෂයෙන්ම විෂයභාර අමාත්‍යාංශය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ආදී පාර්ශවකාර ආයත සමඟ සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

8.5 රැස්වීම්

තීරණ ගැනීමේ කමිටුව, කළමනාකරණ කමිටුව, ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව ක්‍රියාත්මක කිරීම.

- **තීරණ ගැනීමේ කමිටුව**

මෙම කමිටුව සෑම මසකට වරක්ම පැවැත්වෙන අතර, එහිදී පරිසර බලපෑම් ඇගයීම් සිදුකිරීම (EIA) හා මූලික පාරිසරික පරීක්ෂණ සිදුකිරීම (IEE), 'අ' කාණ්ඩයේ සහ 'ආ' කාණ්ඩයේ පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදීම, BOI කර්මාන්තශාලා සඳහා පරිසර නිර්දේශ ලබාදීම සඳහා මෙම කමිටුව වෙත ඉදිරිපත් කර අවසන් අනුමැතිය ලබාදීම සිදුකරනු ලබයි. ඒ අනුව මෙම රැස්වීම් සම්බන්ධීකරණය හා අවසන් තීරණ කෙටුපත් කිරීම සැලසුම් ඒකකය මඟින් සිදුකරනු ලබයි.

- **කළමනාකරණ කමිටු රැස්වීම**

මෙම කමිටුව අධිකාරියේ ඉහළ කළමනාකාරිත්වය සියළුම අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. එහිදී, ප්‍රධාන කාර්යාලය සහ පලාත් හා දිස්ත්‍රික් කාර්යාල වල පරිපාලනය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ, ගැටළු සාකච්ඡා කිරීම හා ඊට අවශ්‍ය ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා තීරණ ලබාදීම මෙම කමිටුව මඟින් සිදු කරනු ලබයි. මෙම රැස්වීම සම්බන්ධීකරණය හා අවසන් තීරණ කෙටුපත් කිරීම සැලසුම් ඒකකය මඟින් සිදුකරනු ලබයි. පවතින වසංගත තත්ත්වය සහ රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ සලකා බැලීම හේතුවෙන් 2021 වර්ෂය තුළ කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා »pමැත.

- **ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීම**

පළාත් කාර්යාලවල පවත්නා මානව සම්පත් කළමනාකරණය, පරිපාලන, මූල්‍ය හා තොරතුරු තාක්ෂණ ගැටළු විසඳීම මෙම කමිටුව පැවැත්වීමේ මූලික අරමුණයි. ඒ අනුව, පලාත් කාර්යාලවල අධ්‍යක්ෂක වරුන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ අංශය ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් මෙම රැස්වීම පවත්වනු ලබයි. මෙම රැස්වීම සම්බන්ධීකරණය හා අවසන් තීරණ කෙටුපත් කිරීම සැලසුම් ඒකකය මඟින් සිදුකරනු ලබයි.

පවතින වසංගත තත්ත්වය සහ රජයේ සෞඛ්‍ය මාර්ගෝපදේශ සලකා බැලීම හේතුවෙන් 2021 වර්ෂය තුළ පවත්වා ඇත්තේ එක් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණි.

8.6 වාර්තා සැකසීම

කාර්ය සාධන වාර්තා, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අනෙකුත් රැස්වීම් හා කමිටු සඳහා පරිසර අධිකාරියේ ප්‍රගතිය හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ වාර්තා කිරීම.

මේ යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව සඳහා අධිකාරියේ ප්‍රගති වාර්තා කිරීම, විෂයභාර අමාත්‍යාංශය හා පාර්ශවකාර ආයතන විසින් ඉල්ලුම් කරනු ලබන සියළුම ප්‍රගතිය සම්බන්ධ වාර්තා අදාල අංශ මඟින් ලබාගෙන, විධිමත් ආකෘතීන්ට අනුව සකස්කර ඉදිරිපත් කිරීම සැලසුම් ඒකකය මඟින් සිදුකරනු ලබයි.

CHAPTER 9 : පැමිණිලි ඒකකය

පැමිණිලි ක්ෂණික ඇමතුම් සේවාව (1981), ලිපි හා විද්‍යුත් තැපෑල මගින් යොමු වේ. මේ ආකාරයට යොමුවන මහජන පැමිණිලි කළමනාකරණය සම්බන්ධීකරණය හා සමාලෝචනය කිරීම සඳහා පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇත.

1. පැමිණිලි සම්බන්ධීකරණ ඒකකයේ ප්‍රධාන කාර්යයන්.

i. මහජන පැමිණිලි වර්ගීකරණය කර දිස්ත්‍රික් කාර්යාල, ඒකක හා වෙනත් අදාළ ආයතන වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කිරීම.

ii. පැමිණිල්ල පිළිබඳ දත්ත හා තොරතුරු මෙන්ම ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු සටහන් කිරීම සඳහා පැමිණිලි මෘදුකාංග දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

iii. මහජන පැමිණිලි ලබා ගැනීම සඳහා ක්ෂණික ඇමතුම් සේවාවක් පවත්වා ගෙන යාම.

iv. මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් හා ඒකක විසින් මහජන පැමිණිලි සඳහා පරීක්ෂා කර ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනය කිරීම.

v. මධ්‍යම පරිසර අධිකාරියේ විෂය පථයට අදාළ නොවන පැමිණිලි වෙනත් ආයතන වෙත සම්බන්ධීකරණය කිරීම.

2. ක්ෂණික ඇමතුම් සේවාව ස්ථාපිත කිරීම.

මහජන පැමිණිලි යොමු කිරීම සඳහා ලබා දී තිබූ 0112888999 දුරකතන අංකය වෙනුවට 2020 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට 1981 ක්ෂණික ඇමතුම් සේවාව හඳුන්වා දෙනු ලැබීය. මෙම ක්ෂණික ඇමතුම් සේවාව හඳුන්වාදීම මඟින් මහජන පැමිණිලි සඳහා වඩා කාර්යක්ෂම ලෙස යොමුවීම අරමුණ වේ. මෙම "1981" කෙටි අංකය වසරේ දින 365 පුරාම පවත්වාගෙන යන අතර ඕනෑම පුරවැසියෙකුට මෙම අංකය හා සෘජුව සම්බන්ධ වී තම පැමිණිල්ල මධ්‍යම පරිසර අධිකාරිය හා ඉදිරිපත් කල හැකිය.

එමෙන්ම මෙම අධිකාරිය වෙත යොමු වන පැමිණිලි අතර ඒවායේ බලපෑම අනුව එම අවස්ථාවේදීම ක්‍රියාත්මක විය යුතු පැමිණිලි වේ. එවැනි පැමිණිලි ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2004 වර්ෂයේ සිට මධ්‍යම පරිසර අධිකාරියේ පිහිටුවන ලද පාරිසරික පොලිස් ඒකකය (EPU) වෙත යොමු කරනු ලැබේ. එම පැමිණිලි සම්බන්ධයෙන් පරිසර පොලිස් ඒකකය සෙසු පොලිස් ස්ථාන හා සම්බන්ධවී කටයුතු කරයි . ඒ අනුව ක්ෂණිකව මැදිහත්ව විමර්ශනය කල යුතු මහජන පැමිණිලි 276 ක් 2021 වර්ෂය තුල පොලිස් පරිසර ඒකකය වෙත යොමු කර ඇත. එයින් පැමිණිලි 251ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ඇත.

3. මහජන පැමිණිලි කළමනාකරණය -2021

3.1 පැමිණිලි පිළිබඳ දත්ත හා තොරතුරු

2021 වර්ෂය තුල මෙම අධිකාරිය වෙත යොමුවී ඇති සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව 3529 කි. එසේ යොමු වී ඇති පැමිණිලි ස්වභාවය අනුව පහත සඳහන් කර ඇත.

- මෙම අධිකාරියේ නීති හා රෙගුලාසි වලින් නියාමනය වන කරුණු වලට අදාලව පැමිණිලි 2491ක් යොමුවී ඇති අතර එම පැමිණිලි සම්බන්ධයෙන් මෙම අධිකාරියේ පළාත්/දිස්ත්‍රික් කාර්යාල කටයුතු කර ඇත.
- මෙම අධිකාරිය මඟින් යම් මැදිහත්වීමක් සිදුකරන වෙනත් ආයතනවල නීති රෙගුලාසි මඟින් නියාමනය වන කරුණු වලට අදාල පැමිණිලි (බී කාණ්ඩයේ පැමිණිලි) 369ක් යොමු වී ඇත. මෙම පැමිණිලි වෙනත් ආයතනවල විෂය පථයට අදාළ වුවද එම ගැටළු විසඳීම සඳහා මෙම අධිකාරියේ මග පෙන්වීම/ නිර්දේශ ලබා දීමේ අවශ්‍යතාවය අනුව සිදු කරයි. උදා: අවනසර මැණික් ගැරීම්, වැලි කැණීම, පහත් බිම් ගොඩ කිරීම.
- පැමිණිලි 669 ක් "සී" වර්ගයට වන අතර එම පැමිණිලි මෙම අධිකාරියේ විෂය පථයෙන් පරිබාහිර ගැටලුවලට අදාලව වේ. මෙම පැමිණිලි විසඳීම සඳහා විෂය අදාළ ආයතන වෙත යොමු කරනු ලැබේ.

උදා: ගෘහස්ථ කසල පිලිස්සීම, ගෘහස්ථ අප ජලය පොදු කාණුවලට මුදා හැරීම, අනවසර ඉදිකිරීම්, කුඹුරු ඉඩම් ගොඩ කිරීම් , පොලිතින් ප්ලාස්ටික් පිළිස්සීම, ශබ්දය සම්බන්ධ පැමිණිලි (ආගමික ස්ථානවල,ව්‍යාපාරික ස්ථානවල ජෙනරේටර් මඟින්) දිස්ත්‍රික් අතර පැමිණිලි ව්‍යාප්තිය වගුව 01 මඟින්ද පැමිණිලි වර්ගීකරණය රූපසටහන මඟින්ද දක්වා ඇත.

වගුව **32 :** දිස්ත්‍රික් අතර පැමිණිලි ව්‍යාප්තිය

පළාත	දිස්ත්‍රික්ය	"අ" කාණ්ඩය	"ආ" කාණ්ඩය	"ඇ" කාණ්ඩය	ව්‍යාප්තිය		පළාත %
					සංඛ්‍යාව	%	
බස්නාහිර	කොළඹ	507	63	238	808	23	51

පළාත	දිස්ත්‍රික්ය	"අ" කාණ්ඩය	"ආ" කාණ්ඩය	"ඇ" කාණ්ඩය	ව්‍යාප්තිය		පළාත %
					සංඛ්‍යාව	%	
	ගම්පහ	584	28	96	708	20	
	කළුතර	220	14	50	284	8	
මධ්‍යම	නුවර	159	28	33	220	6	9
	නුවරඑළිය	21	10	7	38	1	
	මාතලේ	41	14	20	75	2	
දකුණු	ගාල්ල	127	45	43	215	6	14
	මාතර	131	16	26	173	5	
	හම්බන්තොට	70	14	17	101	3	
සබරගමුව	රත්නපුර	61	29	36	126	4	7
	කෑගල්ල	46	24	21	91	3	
වයඹ	කුරුණෑගල	206	18	29	253	7	10
	පුත්තලම	83	15	8	106	3	
උතුරු මැද	අනුරාධපුර	56	5	17	78	2	3
	පොලොන්නරුව	20	2	7	29	1	
උතුරු	යාපනය	40	---	1	41	1	1
	මුලතිව්	0	---	0	0		
	මන්නාරම	2	2	0	4	0	
	වව්නියා	10	1	0	11	0	
	කිලිනොච්චි	9	1	0	10	0	
නැගෙනහිර	ත්‍රිකුණාමලය	9	11	1	21	1	2
	අම්පාර	18	4	2	24	1	
	මඩකලපුව	5	---	0	5	0	
ඌව	බදුල්ල	37	14	8	59	2	3
	මොණරාගල	29	11	9	49	1	
එකතුව		**2491**	**369**	**669**	**3529**	**100**	**100**



රූපය **44 :** පැමිණිලි වර්ගීකරණයට අනුව ව්‍යාප්තිය

2021

3.2 "ඒ" කාණ්ඩයේ පැමිණිලි ප්‍රගතිය. වර්ෂයේ "ඒ" කාණ්ඩයේ පැමිණිලි 2491ක් යොමු වී

ඇති අතර එම සියලු පැමිණිලි විසඳීම සඳහා කටයුතු කරන අතර 2021 වසර අවසානය වන විට එම පැමිණිලි සංඛ්‍යාවෙන් 57 % ක ප්‍රමාණයක කටයුතු සම්පූර්ණ කර ඇත. අංක 02 වගුව මගින් එම පැමිණිලි පිළිබඳ දත්ත දක්වා ඇත.

වගුව **33 : "**ඒ" කාණ්ඩයට අදාළව යොමු වූ පැමිණිලි කළමනාකරණ ප්‍රගතිය- **2021**

දිස්ත්‍රික් කාර්යාලය /ඒකකය	**"අ" කාණ්ඩයේ පැමිණිලි**			
	එකතුව	**ක්‍රියාමාර්ග ගනිමින් පවතින පැමිණිලි - "අ"**	**මෙම අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන සම්පූර්ණ කර ඇති පැමිණිලි -"අ"**	**ප්‍රගතිය %**
කොළඹ	492	211	281	57
ගම්පහ	575	314	261	45
කළුතර	212	123	89	42
නුවර	159	71	88	55
නුවරඑළිය	19	10	9	47
මාතලේ	41	15	26	63
ගාල්ල	127	8	119	94
මාතර	131	35	96	73
හම්බන්තොට	70	21	49	70
රත්නපුර	60	18	42	70
කෑගල්ල	45	16	29	64
කුරුණෑගල	206	85	121	59
පුත්තලම	83	56	27	33
අනුරාධපුර	55	24	31	56
පොලොන්නරුව	20	10	10	50
යාපනය	40	16	24	60
මුලතිව්	----	---	---	---

දිස්ත්‍රික් කාර්යාලය /ඒකකය	"අ" කාණ්ඩයේ පැමිණිලි			
	එකතුව	ක්‍රියාමාර්ග ගනිමින් පවතින පැමිණිලි - "අ"	මෙම අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන සම්පූර්ණ කර ඇති පැමිණිලි -"අ"	ප්‍රගතිය %
මන්නාරම	2	1	1	50
වව්නියා	10	1	9	90
කිලිනොච්චි	9	4	5	56
ත්‍රිකුණාමලය	9	2	7	78
අම්පාර	18	7	11	61
මඩකලපුව	5	2	3	60
බදුල්ල	37	9	28	76
මොණරාගල	27	7	20	74
ප. දු. පා. අංශය	7	1	6	86
සන අප.ක. ඒකකය	---	---	---	---
ප.බ.ඇ. ඒකකය	17	5	12	71
ස්ව. ස. කළ. ඒකකය	10	5	5	50
උපද්‍ර.අ.කළ. ඒකකය	5	2	3	60
එකතුව	2491	1079	1412	57

3.2 මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු වන පැමිණිලි කළමනාකරන ක්‍රමවේදය විශ්ලේෂණය කිරීම

දිස්ත්‍රික් කාර්යාල විසින් ක්‍රියාමාර්ග ගනු ලැබූ ‘‘ඒ’’ කාණ්ඩයේ පැමිණිලි වලින් තෝරාගත් ප්‍රමාණයක් සමාලෝචනය කිරීම පැමිණිලි සම්බන්ධීකරණ ඒකකය විසින් සිදු කරනු ලැබේ. 2021 වර්ෂයේ ‘‘ඒ’’ කාණ්ඩය යටතේ යොමු වූ පැමිණිලි අතරින් 58% ක් සම්බන්ධව සමාලෝචනය කරනු ලැබීය.

CHAPTER 10 : අභ්‍යන්තර විගණන ඒකකය

අභ්‍යන්තර විගණනයේ විෂය පථය

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිට සෘජුව වග කියන ලෙස ආයතනයේ සංවිධාන ව්‍යුහය තුල අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇති අතර අධිකාරියේ සභාපති විසින් අභ්‍යන්තර විගණකගේ විෂය පථය තීරණය කරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය හා සියළුම පළාත්/දිස්ත්‍රික් කාර්යාල වල අභ්‍යන්තර විගණකවරයාගේ විෂය පථය තුළට ඇතුළත් වේ. ඒ අනුව අධිකාරියේ සියලුම ක්ෂේත්‍ර සාමාලෝචනය කිරීමේ බලය අභ්‍යන්තර විගණකවරයාහට පැවරී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය වාර්තා හා ලිපි ලේඛන පරික්ෂා කිරීමට සහ ගබඩා හා පුද්ගලයන් වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය සම්පූර්ණ බලය පවරා ඇත.

අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය

- ගණකාධිකරණ හා අභ්‍යන්තර පාලන ක්‍රියා පිළිවෙල පිළිබඳව සමාලෝචනය.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු විමර්ශනය කිරීම.
- ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ආර්ථික බව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව පිළිබඳව මූල්‍ය හා මූල්‍ය නොවන පාලනයන් පිළිබඳ සමාලෝචනය කිරීම.
- ආයතනයේ අභ්‍යන්තර හා බාහිර නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති හා මඟ පෙන්වීම්

  ක්‍රියාත්මක කෙරේදැයි පරීක්ෂා කිරීම.
- කළමනාකරණය විසින් අවස්ථානුකූලව පවරන ලද විශේෂ විමර්ශන.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

1999 නොවැම්බර් මස 19 දිනැති පී.එෆ්./පී.ඊ.3 හා 2000 මාර්තු 15 දිනැති පී.එෆ්./පී.ඊ.7 අංක දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අනුව මධ්‍යම පරිසර අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. කාර්තුමය වශයෙන් කමිටුව රැස්විය යුතු වුවත් 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්වය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මාර්ගගත ක්‍රමයට පැවැත්වීය. 2021 වර්ෂයේ එහි සභාපති ධුරය දරනු ලබුවේ මුදල් හා ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දේපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අජිත් අබේසේකර මහතායි. මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු අධ්‍යක්ෂ (මුදල්), අධ්‍යක්ෂිකා (සැළසුම්) සකච්ඡා කෙරෙන විෂයට අදාල අධ්‍යක්ෂවරුන් හා විගණන අධිකාරී සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකද සහභාගී විය. මධ්‍යම පරිසර අධිකාරියේ අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස ක්‍රියාකරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ හා තීරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා යොමු කරන ලදී.

2021 වර්ෂයේ විගණන වාර්තා තුළින් පැන නැඟුණු පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදී

01. 1988 අංක 56 හා 2000 අංක 53 දරණ පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරණ පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1993.06.24 දිනැති 772/22 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව පරිසර නිර්දේශ නිකුත් කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමේදී අධිකාරියේ අවධානය යොමුවිය යුතු සිද්ධීන්.

02. 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධි, 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 2008 ජනවාරි 25 දිනැති 1533/16 අංක දරන 2008 ජනවාරි 25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් බලපත්‍රය ලබාගැනීමට අවශ්‍ය වූ කටයුතු නිසි ලෙස හදුනාගැනීම

03. අධිකාරියේ වත්කම් පරිපාලන සම්බන්ධයෙන් දුර්වලතා සඳහා අභ්‍යන්තර පරිපාලන ක්‍රම ඉදිරිපත් කිරීම.

04. විශේෂ විමර්ශන වලින් හඳුනාගත් අභ්‍යන්තර පාලන ක්‍රම ඉදිරිපත් කිරීම.

Chapter 11 : අනුකූලතා පසුවිපරම් ඒකකය

අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදය මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍ර ලබාදීමේ සහ ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිවල ප්‍රධාන අංගයකි. නිකුත් කරන ලද බලපත්‍ර / අනුමැතීන් සඳහා අදාළ ඒකක සහ පළාත්/දිස්ත්‍රික් කාර්යාල හරහා විධිමත් අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදයක් සහිතව ක්‍රියාත්මක කිරීමේ වගකීම අනුකූලතා පසුවිපරම් ඒකකය සතු වේ.

මෙම ක්‍රියාවලිය තුළින් කර්මාන්තකරුවන්/ ආයෝජකයින් පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම වෙනුවෙන් ජාතික පාරිසරික පනතේ නියමිත ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති සඳහා නියම කර ඇති කොන්දේසි, ප්‍රමිතීන් වලට අනුකූලව කටයුතු කරන බව සනාථ කළ හැකිය.

2021 වර්ෂය තුළ අනුකූලතා පසුවිපරම් ඒකකයේ ප්‍රධාන ක්‍රියාකාරකම්;

1. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර / උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමණාකරණ බලපත්‍ර සඳහා විධිමත් අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදයක් පවත්වාගෙන යාම.
2. අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ පොතක් සකස් කිරීම
3. අනුකූලතා පසුවිපරම් කටයුතු සඳහා නව මෘදුකාංග පද්ධතියක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම.

1. විධිමත් අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදයක් පවත්වාගෙන යාම

1.1 පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPLs) පසුවිපරම් සිදු කිරීම

අ) අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් තෝරාගත් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන කර්මාන්ත පිලිබඳ අනුකූලතා පසුවිපරම් කටයුතු සිදු කිරීම

2021 වර්ෂයේදී, අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් පරීක්ෂා කිරීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත ගණනාවක් තෝරා ගන්නා ලදී. පරීක්ෂා කිරීම සඳහා කර්මාන්ත තෝරා ගැනීමේදී, කැළණි ගංගා ද්‍රෝණියේ සහ කළු ගඟ ද්‍රෝණියේ පිහිටි කර්මාන්ත වලට ප්‍රමුඛතාවය ලබා දී ඇත. කැළණි සහ කළු ගංඟා ද්‍රෝණිවල පිහිටි කර්මාන්ත වලින් එම ගංඟා දූෂණය වීම අවම කිරීම මෙහි පරමාර්ථය විය.

කෙසේ නමුත්, දිවයින පුරා කොවිඩ් වසංගත තත්වයේ පැතිරීයාම නිසා සැලසුම් කළ පරිදි පසුවිපරම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර අනුකූලතා පසුවිපරම් ඒකකයේ කර්මාන්ත පසුවිපරම් කිරීමේ ප්‍රගතිය වගුව 1 මගින් දක්වා ඇත.

ඉහත ගංඟා ද්‍රෝණි ආශ්‍රිත කර්මාන්තවල පසුවිපරම් කටයුතුවලට අමතරව, මහා පරිමාණ දූෂකාරක ජනනය කරන කර්මාන්ත කිහිපයක් සහ පැමිණිලි සහිත කර්මාන්ත කිහිපයක් අදාල දිස්ත්‍රික් කාර්යාලවල නිලධාරීන් සමඟ ඒකාබද්ධව පසුවිපරම් කොට වාර්තා ඉහළ කළමණාකාරිත්වය වෙත යොමු කිරීමට කටයුතු කොට ඇත.

වගුව **34 : : 2021** වර්ෂයේදී අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් සිදු කරන ලද කර්මාන්ත පසුවිපරම් කටයුතු

ගංඟා ද්‍රෝණිය	අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් සිදු කළ අනුකූලතා පසුවිපරම් ක්ෂේත්‍ර පරීක්ෂණ ගණන
කැළණි ගංගා ද්‍රෝණිය තුල	28
කළු ගංගා ද්‍රෝණිය තුල	12
වෙනත්	10
එකතුව	50

ආ) පළාත්/ දිස්ත්‍රික් කාර්යාල මගින් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර පසුවිපරම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම

2021 වර්ෂය සඳහා වාර්ෂික අනුකූලතා පසුවිපරම් සැලසුම් මධ්‍යම පරිසර අධිකාරියේ සියලුම පළාත්/දිස්ත්‍රික් කාර්යාල විසින් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබීය. කෙසේ නමුත් රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි පසුවිපරම් කටයුතු සිදු කිරීමට නොහැකි වුවද දිවයින පුරා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදී ඇති කර්මාන්ත 2549ක් පිළිබඳව පසුවිපරම් පරීක්ෂා මෙම අධිකාරියේ පළාත්/ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කර ඇත. අනුකූලතා පසුවිපරම් ඒකකය විසින් පළාත්/දිස්ත්‍රික් කාර්යාල වල අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

වගුව **35 : : 2021** වර්ෂයේදී පළාත්/ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කල අනුකූලතා පසුවිපරම් කටයුතු

පළාත්/ දිස්ත්‍රික් කාර්යාලය	සිදු කළ අනුකූලතා පසුවිපරම් පරීක්ෂණ ගණන		
	A කාණ්ඩය	B කාණ්ඩය	එකතුව
කොළඹ	228	93	321
කළුතර	27	0	27
ගම්පහ	36	15	51
ගාල්ල	24	56	80
මාතර	35	68	103
හම්බන්තොට	13	6	19
මහනුවර	60	50	110
නුවරඑළිය	46	64	110
මාතලේ	46	49	95
කෑගල්ල	46	49	95
රත්නපුර	175	150	325
කුරුණෑගල	70	42	112
පුත්තලම	45	18	63
අම්පාර	11	34	45
ත්‍රිකුණාමලය	27	75	102
මඩකලපුව	9	25	34
අනුරාධපුර	53	32	85
පොළොන්නරුව	28	49	77
බදුල්ල	47	36	83
මොණරාගල	25	5	30
යාපනය	116	142	258
කිලිනොච්චි	31	73	104
මුලතිව්	39	52	91
මන්නාරම	53	81	134
වවුනියාව	22	13	35
එකතුව	1312	1237	2549

1.2 උපලේඛනගත අපද්‍රව්‍ය කළමණාකරණ බලපත්‍ර පසුවිපරම් සිදු කිරීම

උපලේඛනගත අපද්‍රව්‍ය කළමණාකරණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන කර්මාන්තද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අනුකූලතා පසුවිපරම් පරීක්ෂණ සමඟ පරීක්ෂා කළ අතර, එහිදී හඳුනාගත් ගැටළු සඳහා වන නිර්දේශ /යෝජනා උපද්‍රවකාරී අපද්‍රව්‍ය සහ රසායනික කළමණාකරණ ඒකකය වෙත වැඩිදුර සොයා බලා කටයුතු කිරීමට යොමු කර ඇත.

2. අනුකූලතා පසුවිපරම් ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ පොතක් සකස් කිරීම

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන නියමිත ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා නිලධාරීන්ගේ භාවිතය පිණිස මාර්ගෝපදේශ පොතක් සකස් කරන ලදී.

3. අනුකූලතා පසුවිපරම් කටයුතු සඳහා නව මෘදුකාංග පද්ධතියක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම

අනුකූලතා පසුවිපරම් කටයුතු සඳහා නව මෘදුකාංග පද්ධතියක්, PSI දත්ත පද්ධතිය හා ඒකාබද්ධව සකස් කරමින් පවතී.

Chapter 12 : විමර්ශණ ඒකකය

2018 මාර්තු මාසයේ දී විමර්ශන ඒකකය පිහිටුවන ලද අතර එය අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක වේ. තහනම් පොලිතින් සම්බන්ධ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මහපෙන්වීම යටතේ තීරණාත්මක පාරිසරික ගැටළු පිළිබඳ විශේෂ විමර්ශන සිදු කිරීම මෙම ඒකකයේ කාරය භාරයට අයත් වේ. මෙම ඒකකය අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, කාර්යාල සහායකවරයෙකු සහ පරිසණක අභ්‍යාසලාභියෙකුගෙන් සමන්විත වේ. 2021 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරියෙකු මෙම ඒකකයට අනුයුක්ත කරන ලද අතර උපාධිධාරී අභ්‍යාසලාභියෙකු 2021 වර්ෂයේ ඔක්තොම්බර් මාසයේ දී අනුයුක්ත කරන ලදී.

A. හැඳින්වීම

ප්ලාස්ටික් සහ පොලිතින් නිෂ්පාදන නූතන සමාජයට අත්‍යවශ්‍ය භාණ්ඩයක් බවට පත්ව ඇත. කෙසේ වෙතත්, පොලිතින් මළු, පොලිතින් ආහාර දවටන, බීම බට, පොලිස්ටයරින් ආහාර ඇසුරුම් පෙට්ටි, කෝප්ප, හැඳි සහ ඇසුරුම් ද්‍රව්‍ය වැනි තනි භාවිත ප්ලාස්ටික් නාගරික අපද්‍රව්‍ය වලින් සියයට 15 කට ආසන්න ප්‍රමාණයක් පෙන්නුම් කරයි. ඒ අනුව, එවැනි නිෂ්පාදන අනිසි ලෙස භාවිත කිරීම, අවිධිමත් ලෙස බැහැර කිරීම සහ පිළිස්සීම සමාජ, පාරිසරික, සෞඛ්‍ය හා ආර්ථික ගැටලු රාශියකට හේතු වී ඇත.

ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල පොලිතීන් සහ ප්ලාස්ටික් පරිභෝජනය කිලෝග්‍රෑම් 0.5 ක් පමණ වන අතර දිනකට ලන්ච් ෂීට් මිලියන 20 ක් හා ප්ලාස්ටික් ෂොපින් බෑග් මිලියන 15 ක් පමණ රට තුළ භාවිතා වන බවට වාර්තා වේ.

ප්ලාස්ටික් හා පොලිතින් ආශ්‍රිත නිෂ්පාදන දිරාපත් වීම සඳහා දිගු කාලයක් ගතවන බැවින් මෙම නිෂ්පාදන පරිසරයට බැහැර කළ පසු පරිසරයට විවිධ බලපෑම් ඇති කරයි. එනමුත් පොලිතීන් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල සේවක පිරිසක් සිටින බව ද නොසලකා හැරිය නොහැකි කරුණකි.

තනි භාවිත ප්ලාස්ටික් මගින් සිදුවන පාරිසරික බලපෑම සැලකිල්ලට ගෙන පොලිතින් නිෂ්පාදන කිහිපයක් තහනම් කරමින් හා පොලිතින් සැරසිලිවලට භාවිතා කිරීම සහ ප්ලාස්ටික් අඩංගු අපද්‍රව්‍ය පිළිස්සීමට අදාල ක්‍රියාකාරකම් තහනම් කරමින් ජාතික පාරිසරික පනතේ 23 ද වගන්තිය යටතේ පනවන ලද නියෝග හා රෙගුලාසි 2017 සැප්තැම්බර් මස 01 දින අංක 2034/33, 2034/34, 2034/35, 2034/36, 2034/37 හා 2034/38 දරණ ගැසට් පත්‍ර මගින් නියම හා රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් පසුව, තවත් තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය කීපයක් තහනම් කරමින් ජාතික පාරිසරික පනතෙහි 23 ද වගන්තිය යටතේ අංක 2211/51 දරණ 2021 ජනවාරි මස 21 දිනැති ගැසට් පත්‍රය මගින් 2021 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහාය ඇතිව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ සියලුම පළාත් / දිස්ත්‍රික් කාර්යාල මගින් මුළු දිවයිනම ආවරණය වන පරිදි වැටලීම් සිදු කරමින් පවති. රට තුළ පැවතුණු කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ඉන් පසුව පැනවූ නිරෝධායන ඇඳිරි නීතිය සහ රට වසා දැමීම හේතුවෙන් 2021 වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර තිබූ වැටලීම් සංඛ්‍යාව සීමා කිරීමට සිදු විය.

2021 වසර තුළදී වැටලීම් 3512 ක් සිදු කර ඇති අතර ඒ අනුව ලබා ගත් ප්‍රගතිය 63% කි. අනාවරණය කරගත් උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව 522 කි. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ඒකාබද්ධව සිදු කරන ලද වැටලීම් වලදී අත්අඩංගුවට ගෙන ඇති මුළු පොලිතින් ආහාර දවටන තොගය කිලෝග්‍රෑම් 19821.3 ක් (ටොන් 19.8) වන අතර ඒ අනුව, පොලිතින් ආහාර දවටන මිලියන 9.9 ක් පරිසරයට බැහැර කිරීම වළක්වා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරියට හැකි විය. එය තනි භාවිත ප්ලාස්ටික් දූෂණය පාලනය කිරීම සඳහා මෙම වැටලීම් වැඩසටහන තුළින් අත්කරගත් විශාල ප්‍රගතියක් ලෙස සැලකිය හැකිය.

පහත ප්‍රස්තාරයෙන් දිස්ත්‍රික්ක පදනමින් සිදු කරන ලද වැටලීම් ප්‍රමාණය පෙන්නුම් කරයි.



රූපය **45 :** දිස්ත්‍රික් මට්ටමින් වැටලීම් වැඩසටහන



රූපය **46 :** තහනම් නිෂ්පාදන අයිතම අනුව වැටලීම් ප්‍රතිශතය

1. ශ්‍රී ලංකාව තුල භාවිතය සඳහා පොලිතින් අමුද්‍රව්‍ය ලෙස යොදා ආහාර දවටන නිෂ්පාදනය, රටතුල විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කිරීමේ රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම;

දිවයින පුරා පොලිතින් අමුද්‍රව්‍ය ලෙස භාවිතා කර ආහාර දවටන නිෂ්පාදනය කරන ආයතන, විකිණීම සිදු කරන වෙළඳ ආයතන හා වාණිජ භාවිතා කරන්නන් ආවරණය වන පරිදි වැටලීම් වැඩසටහන සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. ඉහත රෙගුලාසි බලාත්මක කිරීම සඳහා සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 2313 ක් වන අතර අනාවරණය වූ උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව 130 කි. ඇතැම් අවස්ථාවල නිෂ්පාදකයන් සහ වෙළඳ ආයතන වලට නඩු පැවරීමෙන් පසුව ද එම නීති විරෝධී ව්‍යාපාරය දිගටම කරගෙන යන බව වාර්තා වුණි. එබැවින්, රට තුළ තනි භාවිත පොලිතීන් දූෂණය පාලනය කිරීම සඳහා වැටලීම් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ.

2018 සිට 2021 දක්වා කාලය තුළ පොලිතින් ආහාර දවටන සඳහා වූ වැටලීම්වල මුළු වැටලීම් සංඛ්‍යාවට එදිරිව උල්ලංඝනය කිරීම් ප්‍රතිශතය පහත රූපය 03 මගින් දක්වා ඇත.



රූපය **47 :** වැටලීම් සංඛ්‍යාවට එදිරිව උල්ලංඝනය කිරීමේ ප්‍රතිශතයේ ව වාර්ෂික ප්‍රවණතාවය

a. නීති විරෝධී ආහාර දවටන (ලන්ච් ෂීට්) නිෂ්පාදන සමාගම් වැටලීම

ජාතික පාරිසරික පනත යටතේ පවතින නීතිමය ප්‍රතිපාදනවලට අනුව, මධ්‍යම පරිසර අධිකාරියට නීති විරෝධී ආහාර දවටන තොග අත් අඩංගුවට ගැනීමට හැකියාවක් නොමැති නමුත් එම නිෂ්පාදන වල සාම්පල ගැනීම සිදුකර අදාළ ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට බලතල පවතී. එබැවින්, නීති විරෝධී ආහාර දවටන නිෂ්පාදන කර්මාන්ත සහ තොග අලෙවි කරන්නන් වැටලීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (CAA) සමඟ ඒකාබද්ධ වැටලීම් සැලසුම් කරන ලදී. එහිදී නිෂ්පාදන කර්මාන්ත 93 ක වැටලීම් සිදු කර ඇති අතර ඉන් කර්මාන්ත 10 ක නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කරන අතරතුර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමඟ ඒකාබද්ධව සිදු කරන ලද වැටලීම්වලදී පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ ප්‍රතිපාදන යටතේ නිෂ්පාදිත තොග අත්අඩංගුවට ගැනීම සිදු කරන ලද අතර වරදකරුවන්ට දඩ නියම කිරීමෙන් පසුව එම නිෂ්පාදන මහේස්ත්‍රාත්වරයාගේ නියෝග අනුව විනාශ කර ඇත.

වගුව **36 :** පොලිතින් ආහාර දවටන නිෂ්පාදන සමාගම්වලට අදාළ වැටලීම් කටයුතු පිළිබඳ විස්තර

අනුක්‍රමික අංක	සමාගමේ නම සහ ලිපිනය	වැටලීමේ දිනය	අත්අඩංගුවට ගත් ලන්ච් ෂීට් ප්‍රමාණය/කි.ග්‍රෑ.
1	බණ්ඩාරනායක මුදියන්සේලාගේ අජිත්, නො: 220, කජුගහයටදෙණිය, පුවක්වත්ත, මීගොඩ	2021.01.25	2720
2	පි එස් ටී පොලිතින්, අංක: 550/35 එල්, රණවිරුගම, පැලැන්දගොඩ පාර, පනාගොඩ	2021.03.24	1160
3	කේ එච් ඒ තනුජා ඉන්දිකා, අංක. 580/එෆ්, හංවැල්ල පාර, හුණුපිටිය, අත්තනගල්ල	2021.04.01	1930
4	වැලිගමගමගේ ජයන්ත පුෂ්පකුමාර, අංක 130, ශ්‍රී ධර්මාරාම මාවත, දෙමටගොඩ	2021.07.15	333.5
5	කැනමෝ ග්‍රීන් පැක් ප්‍රයිවේට් ලිමිටඩ්, 148/2/4, පැලවත්ත, පන්නිපිටිය	2021.10.08	15.25
6	කලිඩ් පැක් පොලිතින් ප්‍රොඩක්ට් , 459/2A, හිජ්රා මාවත, තිහාරිය	2021.10.11	47.45 කි
7	ඒ පී ඉන්ඩස්ට්‍රීස්, අංක 88/2, තලම්පිටියගොඩ, ආටිගල, හංවැල්ල.	2021.11.25	5159
8	ඩැනිෂ් පොලි ඉන්ඩස්ට්‍රීස්, අංක 273/6, ෆර්ගූසන් පාර, මට්ටක්කුලිය	2021.12.07	600
9	වැලිගමගමගේ ජයන්ත පුෂ්පකුමාර, අංක 130, ශ්‍රී ධර්මාරාම මාවත, දෙමටගොඩ	2021.12.20	1740
10	වැලිගමගමගේ ජයන්ත පුෂ්පකුමාර, අංක 130, ශ්‍රී ධර්මාරාම මාවත, දෙමටගොඩ	2021.12.27	2470
	මුළු ගණන		**16175.2**

මෙම ඒකාබද්ධ වැටලීම් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධියට පත් කර නීති විරෝධී නිෂ්පාදන පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදි.




රූපය **48 :** හෝමාගම සමාගමක පොලිතින් ලන්ච් ෂීට් වැටලීම

b. නීති විරෝධී ආහාර දවටන තොග හා සිල්ලර වෙළඳ ආයතන වැටලීම්

වැටලීම් වැඩසටහනෙහි පවතින දත්තවලට අනුව නීති විරෝධී ආහාර දවටන අලෙවි කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් තොග සහ සිල්ලර වෙළඳසැල් වැටලීම් 460ක් සිදු කර ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (CAA), පොලිසිය හා ඒකාබද්ධව කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල නීති විරෝධී පොලිතින් ආහාර දවටන අලෙවි කරන තොග වෙළෙඳසැල් වැටලීම් සිදු කර නීති විරෝධී ආහාර දවටන තොග අත්අඩංගුවට ගැනීම කර ඇත.

වගුව **37 :** පොලිතින් ආහාර දවටන තොග වෙළෙඳුන් සම්බන්ධ වැටලීම් කටයුතු පිළිබඳ විස්තර

අනුක්‍රමික අංක	වෙළඳ ව්‍යාපාරයේ නම සහ ලිපිනය	වැටලීමේ දිනය	අත්අඩංගුවට ගත් ලන්ච් ෂීට් ප්‍රමාණය/ කි.ග්‍රෑ.
1	ජී.එස් මාර්කටින්, අංක 130, කැස්බෑව පාර, කටුවාවල, බොරලැස්ගමුව	2021.03.24	197 .00
2	බදුආදීන් මොහොමඩ් අස්මිත්, නිව් මුරුගන් වෙළඳසැල්, අංක 157/ටී/1/24, මාලිගාවත්ත, කොළඹ 10	2021.04.29	590 .00
3	කොලොන්දවේඩු විමලනාදන්, නිව් ලක්ෂ්මි ට්‍රේඩර්ස්, අංක 57/17, බෝඩිරාජ් මාවත, කොළඹ 11	2021.07.12	300.00
4	සහිර් හුසන් අබ්දුල් හුසන්, එම් එස් ට්‍රේඩර්ස්, අංක 180/76/සී, පීපල්ස් පාර්ක් සාප්පු සංකීර්ණය, කොළඹ 11	2021.07.12	75.00
5	තිස්සී වීරසිංහම් ශාන්ත කුමාර, (වෑන් රථය- පී සී 1604), ඩැනිෂ් පොලි ඉන්ඩස්ට්‍රීස්, නො. 273/6, ෆර්ගුෂන් පාර, මට්ටක්කුලිය	2021.07.15	500.00
6	රාජේන්ද්‍රන් කංගනාදන්, නිව් කුමාර ට්‍රේඩර්ස්, අංක 173,5 වන හරස් පටුමග, කොළඹ 11	2021.08.02	275.00
7	ශාන්ත ජෝන්ස් වෙළඳ මධ්‍යස්ථානය, අංක 32/ඊ, ශාන්ත ජෝන්ස් පාර, කොළඹ 11	2021.08.03	246.82
8	මුතුවීරන් කන්දසන්, පිටකොටුව පොලිතින්, අංක 135, බෑන්ක්ෂෙල් වීදිය, කොළඹ 11	2021.11.01	88.00
9	වඩිවේලි ජයසීලන්, නිව් ප්‍රේමා ට්‍රේඩර්ස්, LG 180, පෙපල්ස් පාර්ක්, කොළඹ 11	2021.11.15	75.00
10	හුසානා ස්මයිල් ඇලිබෝයි, , අංක.112, පරණ යෝන් වීදිය, කොළඹ 11	2021.11.22	375.00
11	අරයූර් සිල්ලර වෙළඳසැල, ප්‍රධාන වීදිය, ආර්යම්පති 02	2021.11.09	2.28
12	එස් කේ ආර් වෙළඳසැල, ප්‍රධාන වීදිය, ආරයම්පති	2021.11.09	0.57
13	පොලිතින් කෝනර්, වෙරළ පාර, කාත්තන්කුඩි 03	2021.11.09	3.99
14	ඒ එෆ් ඇග්‍රෝ, අංක 114, ප්‍රධාන වීදිය, කාත්තන්කුඩි 06	2021.11.09	10.4
15	ඩබ්. එච් එච් මධුශංක මහතා, ඩබ්. එච් ස්ටෝස්,, බංගමුව පාර, අකුරැස්ස	2021.11.17	486
16	පාලිත මහතා, පාලිත ස්ටෝර්ස්, බංගම පාර, අකුරැස්ස	2021.11.17	
17	ඒ ඩී චමින්ද ජයන්ති මහතා, ඒ ඩී ටී ට්‍රේඩර්ස්, අංක 1/29 බංගම පාර, අකුරැස්ස	2021.11.17	

අනුක්‍රමික අංක	වෙළඳ ව්‍යාපාරයේ නම සහ ලිපිනය	වැටලීමේ දිනය	අත්අඩංගුවට ගත් ලන්ච් ෂීට් ප්‍රමාණය/ කි.ග්‍රෑ.
18	නිව් අමීර් ස්ටෝස්, වෙලගෙදර වීදිය. කුරුණෑගල.	2021.12.21	600
	එකතුව		3824.49

අත්අඩංගුවට ගන්නා ලද පොලිතින් ආහාර දවටන තොගය අධිකරණ නියෝග ලැබෙන තුරු දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනයේ ගබඩා කර තබන ලද අතර, කොළඹ, හෝමාගම සහ අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණ විසින් නිකුත් කරන ලද අධිකරණ නියෝග යටතේ දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනය තුළ එම පොලිතින් ආහාර දවටන තොග කි.ග්‍රෑ 9374.31ක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් ඉදිරිපිට විනාශ කර අධිකරණයට වාර්තා කරන ලදී.





රූපය **49 :** දොම්පේ සනීපාරක්ෂක කසළ රඳවනය තුල පොලිතින් ආහාර දවටන තොග විනාශ කිරීම

c. පොලිතින් ආහාර දවටන (ලන්ච් ෂීට්) වාණිජ මට්ටමින් භාවිතා කරන්නන් වැටලීම

මධ්‍යම පරිසර අධිකාරිය විසින් පොලිතින් ආහාර දවටන වාණිජ භාවිතය සම්බන්ධයෙන් ආපනශාලා සහ හෝටල් වැටලීම් 760ක් සිදුකර ඇත. වාණිජ මට්ටමින් නීතිවිරෝධී ලෙස පොලිතින් ආහාර දවටන භාවිතා කරන්නන්ට එදිරිව ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත.

නීතිවිරෝධී පොලිතින් ආහාර දවටන පිළිබඳ විමර්ශන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ නීති විරෝධී ලන්ච් ෂීට් විකිණීම, අර්පණය සහ ප්‍රදර්ශනය පාලනය කිරීම සඳහා ජාතික පාරිසරික පනත යටතේ කොළඹ මහ නගර සභාව වෙත බලතල විමධ්‍යගත කිරීමට තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් කොළඹ මහ නගර සභාව සමඟ සාකච්ඡා කර මෙය ක්‍රියාත්මක කිරීමට ක්‍රියා පටිපාටියක් සකස් කරමින් පවතී.

2. දේශීය භාවිතය සඳහා වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලීන් (HDPE) අමුද්‍රව්‍යයක් වන යම් මළු නිෂ්පාදනය, රටතුල විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කිරීමේ රෙගුලාසිය බලාත්මක කිරීම;

ඉහත රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී හඳුනා ගත් ගැටළු අනුව ජාතික පාරිසරික පනතෙහි 23ද වගන්තිය යටතේ සඳහන් කරණු ලබන නිශ්චිත පරිමාණයකට වඩා අඩු පොලිතින් මළු භාවිතය තහනම් කිරීමට කටයුතු කරමින් සිටී.

3. ප්ලාස්ටික් අඩංගු කසල හෝ පහසුවෙන් දැවෙන වෙනත් කසල විවෘතව පිළිස්සීම, පිළිස්සීමට ඉඩ දීම හෝ අවසර දීම තහනම් කරමින් නිකුත් කරන ලද රෙගුලාසි බලාත්මක කිරීම;

පොලිතින් සහ ප්ලාස්ටික් එළිමහනේ විවෘතව පිළිස්සීමෙන් සිදුවන බලපෑම පිළිබඳව නිවෙස්වලට දැනුම් දීම සඳහා ආදර්ශ ලිපියක් සකස් කර මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/දිස්ත්‍රික් කාර්යාල හරහා පළාත් පාලන ආයතන වෙත යොමු කර ඇත.

4. දේශපාලන, ජාතික, සංස්කෘතික හෝ වෙනත් ඕනෑම උත්සවයක හෝ අවස්ථාවක සැරසිලි ලෙස පොලිඑතිලීන්, පොලි ප්‍රොපිලීන්, පොලිඑතිලීන් නිෂ්පාදන හෝ පොලි ප්‍රොපිලීන් නිෂ්පාදන භාවිතා කිරීම තහනම් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කිරීම;

මධ්‍යම පරිසර අධිකාරිය සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට, දිස්ත්‍රික් සංවිධායකවරුන්ට, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට සහ සභකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට මෙම රෙගුලාසි පිළිබඳව දැනුවත් කර එය පිළිපදින ලෙස ඉල්ලීම් කර ඇත. මේ නිසා පසුගිය මහමැතිවරණයේදී මැතිවරණ ප්‍රචාරක කටයුතු පොලිතින් ද්‍රව්‍ය වලින්

තොර වූ අතර ප්‍රාදේශීය මට්ටමේ උත්සවවලදී පොලිතින් සැරසිලි ද්‍රව්‍යයක් ලෙස භාවිත කිරීමද මේ වන විට අවම වී ඇත.

5. දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලිස්ටයරින් වලින් ආහාර ඇසුරුම් පෙට්ටි , පිඟන් , කෝප්ප හා හැදි නිෂ්පාදනය කිරීම හා ඒවා විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කිරීම;

මේ සම්බන්ධයෙන් සිදුකළ වැටලීම්වලදී අනාවරණ වූයේ එවැනි නිෂ්පාදන වෙළඳපොලේ නොමැති බව හා පාරිභෝගිකයින් භාවිත නොකරන බවයි.

6. කෘෂිරසායන ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා PET හෝ PVC ද්‍රව්‍ය භාවිතා කිරීම තහනම් කිරීම සහ යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා මිලිලීටර 20ට / ග්‍රෑම් 20ට සමාන හෝ අඩු සැෂේ ප්ලාස්ටික් කුර සහිත කොටින් බඩස්, සුළං වලින් පිරවිය හැකි සෙල්ලම් බඩු, භාවිතා කිරීම තහනම් කිරීම පිළිබඳ නියෝගය ක්‍රියාත්මක කිරීම;

මෙම නියෝගය 2021 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත් කරන ලද අතර, මේ පිලිබඳව එම නිෂ්පාදන කර්මාන්ත හා පාර්ශවකාර ආයතන සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මෙම නියෝගයට අනුගත වීම අරමුණු කර ගෙන සැෂේ නිෂ්පාදන, පෝච් (pouch) ආකාරයට හෝ බෝතල් වලට පරිවර්තනය කිරීමට හෝ වැඩි පරිමාවකින් යුත් සැෂේ ආකාරයට පරිවර්තනය කිරීමටත්, ප්ලාස්ටික් කඳ සහිත කොටින් බඩස්වල ප්ලාස්ටික් කඳට ආදේශකයක් ලෙස කඩදාසි හෝ ලීයෙන් සකස් කරන ලද කඳ සහිත කොටින් බඩස් නිර්මාණයටත් පෙළඹී ඇත. COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැෂේ ආකාර හිසකෙස් වර්ණක වෙළඳපොලේ මන්දගාමී ලෙස විකිණීම සිදුවන බැවින් බොහෝ හිසකෙස් වර්ණක නිෂ්පාදක සමාගම්, 2021 මාර්තු 31 දින ප්‍රකාශයට පත් කරන ලද නියෝගයට පෙර නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන අලෙවි කර ගැනීමට ඉල්ලීම් කර ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද ඉහත නියෝගය බලාත්මක කිරීම සඳහා දිවයින පුරා වැටලීම් 866ක් සිදු කර ඇති අතර, ඉන් සැෂේ නිෂ්පාදන සමාගම් සහ වෙළඳසැල් ඇතුළුව උල්ලංඝනය කිරීම් 392ක් අනාවරණය කර ගන්නා ලදී. පරිමාව මිලි ලීටර් 20 වන සැෂේ ආකාර මෘදුකාරක නිෂ්පාදනය සිදු කරමින් සිටියදී කර්මාන්තයක වැටලීමක් සිදු කර එම කර්මාන්තයට එරෙහිව නඩු පැවරීම සිදු කරන ලදී.


සැෂේ පැකට් නිෂ්පාදනය කළ කර්මාන්ත ශාලාවක්
මධ්‍යම පරිසර අධිකාරිය වටලයි
පැකට් 3,000ක් අත්අඩංගුවට

රූපය **50 :** සැෂේ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක සිදු කරන ලද වැටලීමක් පිළිබඳ පළවූ පුවත්පත් වාර්තාවක්

B. දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දායක වීම

විමර්ශන ඒකකය විසින් එක්වරක් භාවිත කරන ප්ලාස්ටික් අක්‍රමවත් ලෙස බැහැර කිරීම හේතුවෙන් ඇතිවන බලපෑම එම තත්වය පාලනය කිරීමට ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති රෙගුලාසි පිළිබඳව 2021.02.09 සහ 2021.10.28 යන දිනවලදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආපනශාලා 14ක කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

පොලිතින් වැටලීම් වැඩසටහනට සම්බන්ධ නිලධාරීන්ගේ කුසලතා හා දැනුම ඉහළ නැංවීම සඳහා 2021.11.23 වන දින පොලිමර් පරීක්ෂා කිරීම සඳහා අතේ රැගෙන යා හැකි රාමන් වර්ණාවලීක්ෂමානය භාවිතා කිරීම පිළිබඳ මාර්ගගත විදේශ පුහුණුවක් පවත්වන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ ඉල්ලීම මත මෙම උපකරණයේ සැපයුම් සමාගම විසින් මෙම විදේශීය පුහුණුව සංවිධානය කරන ලදී.

C. වැව් ඉවුරු තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය විශ්ලේෂණය

අංක 2211/51 දරණ ගැසට් පත්‍රයේ දක්වා ඇති පරිදි සැෂේ තහනම් කිරීම සඳහා රෙගුලාසි පැනවීම සාධාරණීකරණය කිරීම සඳහා, වාරි වැව් ඉවුරුවල සැෂේ බැහැර කිරීම පිළිබඳ සමීක්ෂණයක් විමර්ශන ඒකකය විසින් සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා අනුරාධපුර, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන ආවරණය වන පරිදි දිය නෑම සඳහා බහුලව භාවිතා වන වාරි වැව් හයක් තෝරා ගන්නා ලදී.
2021 වර්ෂයේ පෙබරවාරි මාසයේදී තුරුවිල වැව සහ තිසා වැව් ඉවුරුවලින් සැලකිය යුතු සැෂේ ප්‍රමාණයක් හමු වී ඇති අතර එම වසරේ දෙසැම්බර් මාසයේදී අනෙකුත් වාරි වැව්වල එම සැෂේ හමු වීම්

අඩු ප්‍රමාණයක් වාර්තා වී ඇති බව උක්ත විශ්ලේෂනයේ දි පෙනී ගොස් ඇත.

D. තීරණාත්මක පාරිසරික ගැටළු විමර්ශනය

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් මත 2021 වර්ෂයේ දී මෙම ඒකකය පහත සඳහන් තීරණාත්මක පාරිසරික ගැටළු සම්බන්ධයෙන් විශේෂ විමර්ශන සිදු කරන ලදී.

වගුව **38 :** තීරණාත්මක පාරිසරික ගැටළු විමර්ශනය පිළිබඳ විස්තර

අනුක්‍රමික අංකය	ගැටළුව	ස්ථානයේ නම සහ ලිපිනය	විමර්ශන සිදු කල දිනය
1.	ශබ්දය සහ කම්පන දූෂණය පිළිබඳ පැමිණිල්ල	ඒ.කේ සමන්ත මහතා, එෆ් එස් ඒ හෝල්ඩින් ලංකා, කහහැල්හේන, දිද්දෙණිය උතුර, හංවැල්ල.	2021.03.26
2.	ස්ලැග් අපද්‍රව්‍ය විවෘතව බැහැර කිරීම	එස් ආර් ස්ටීල් ප්‍රයිවට් ලිමිටඩ්, කොටදෙණියාව සහ එස් ආර් ස්ටීල් ප්‍රයිවට් ලිමිටඩ්, දිවුලපිටිය	2021.03.31
3.	අන්තරායකර රසායනික ද්‍රව්‍ය ප්‍රතිකර්මය නොකර පරිසරයට බැහැර කිරීම.	වෝග් ජුවලර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, 52 බී, ගාලු පාර, කොළඹ 03.	2021.04.29
4.	ශබ්දය සහ දූවිලි දූෂණය පිළිබඳ පැමිණිල්ල	කළුගල් කැණීමේ කර්මාන්තය සුදත් ජයමාන්න. අංක 41/1A, බෝපේගෙදරවත්ත, බෝපේගෙදර, ජම්බුගස්පිටිය	2021.10.14
		කළුගල් ඇඹරීමේ කර්මාන්තය සුදත් ජයමාන්න අංක 41/1A, බෝපේගෙදරවත්ත, බෝපේගෙදර, ජම්බුගහපිටිය.	
5.	පරිසර ආරක්ෂණ බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම සඳහා වන අභියාචනය	ගල් මෝල, තිලකරත්න වික්‍රමසිංහ, කරන්දෙණිය 6 කණුව, කොස්වතු මාවත, කරන්දෙණිය, ගාල්ල.	2021.11. 12
6.	පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නොමැතිව ක්‍රියාත්මක වන සේවා ස්ථානය පිළිබඳ පැමිණිල්ල	මිස්ටර් ක්ලීන්, අංක 757, අනුරාධපුර පාර, දඹුල්ල.	2021.11. 19
7.	පරිසර අනුමැතිය අවලංගු කිරීමට මහවැලි අධිකාරියේ ලිපිය	එම් ටු එම් සොලුෂන් (පුද්) සමාගම මෙගාවොට් 1 සූර්ය බලාගාරය කොන්ගමුල්ල, පල්ලෙකැලේ, මහනුවර	2021.11. 22
8.	පාරිසරික නිර්දේශ නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අභියාචනය	විතානාච්චි මහතා, මහහේන්ගොඩ, බද්දේගම.	2021.11. 25
9.	පස් කැණීමේ ව්‍යාපෘතියේ බිල්පත් විසඳීමේ ගැටළුව	ගිනිගත්හේන යෝජිත සතිපොළ සංවර්ධනය සඳහා පස් කැණීමේ ව්‍යාපෘතිය	2021.12. 13

E. භෞතික ප්‍රගතිය

2021 වර්ෂය සඳහා වැටලීම් 5614ක් ඉලක්ක කර ඇති අතර වැටලීම් 3512ක් සිදු කර ඇත. ඒ අනුව වසරේ වැටලීම් වල භෞතික ප්‍රගතිය 63% කි.

F. මූල්‍ය ප්‍රගතිය

මෙම ඒකකයට රුපියල් මිලියනයක් වෙන්කර ඇති අතර 84% මුල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා රු 837,730 ක මුදලක් භාවිතයට ගෙන ඇත.

Chapter 13 : තොරතුරු තාක්ෂණ ඒකකය

13.1 හැඳින්වීම

ආයතනයක ස්වභාවය වෙනස් කිරීමෙහිලා තාක්ෂණයට සැලකිය යුතු බලපෑමක් එල්ල කල හැකි අතර එමගින් පුද්ගල කාර්යක්ෂමතාවය වේගවත් කල හැක. ඒ අතරින් තොරතුරු තාක්ෂණයට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි ,ඒ මන්දයත් තොරතුරු තාක්ෂණය ආයතනයක සේවානියුක්තිකයන්ට නිර්මාණශීලී වීමටත් ඵලදායී වීමටත් ඉඩ සලසා දෙන බැවිනි. මධ්‍යම පරිසර අධිකාරියේ ස්ථාපනය කර ඇති තොරතුරු තාක්ෂණ ඒකකය ඩිජිටල් තාක්ෂණය සමඟ තොරතුරු තාක්ෂණ මෙවලම් භාවිතයෙන් සාර්ථක පාරිභෝගික සේවාවක් ලබාදෙන අතර එමගින් ආයතනයේ කීර්තිය පවත්වා ගෙන යාම සඳහා විශාල දායකත්වයක් ලබා දෙනු ලැබේ.

13.2 2021 වර්ෂය තුල තොරතුරු තක්ෂණ ඒකකයේ ප්‍රධාන කාර්යයන්

1. ජාල පහසුකම් හා යටිතල පහසුකම් සංවර්ධනය.

– මධ්‍යම පරිසර අධිකාරියේ ජාල පහසුකම් සංවර්ධනය සඳහා සහාය ලබා දීම.

– තොරතුරු ජාලය සඳහා හදිසි උපස්ථ සැලසුම් පවත්වා ගෙන යාම සහ දුරස්ථ ස්ථාන කලමනාකරණය.

– කාර්යක්ෂම දෝෂ නිවැරදි කිරීමේ ක්‍රම මඟින් මධ්‍යම පරිසර අධිකාරියේ තොරතුරු ජාලය අධීක්ෂණය සහ සහය ලබා දීම.

2. මධ්‍යම පරිසර අධිකාරියේ සේවා ක්ෂේත්‍ර සඳහා මෘදුකාංග ස්ථාපිත කිරීම, සංවර්ධනය හා වැඩිදියුණු කිරීම මඟින් ක්‍රියාකාරිත්වය වේගවත් කිරීම.

3. දෝෂ නිරාකරණය සහ නඩත්තුව සඳහා දෘඩාංග වල සහාය ලබා දීම.

4. පූර්ණ ඒකාබද්ධ මෘදුකාංග විසඳුම් ERP පද්ධතිය ස්ථාපිත කිරීම සහ ඉහත සඳහන් සංවර්ධිත මෘදුකාංග පද්ධති EPL ජංගම යෙදුම සමඟ ඒකාබද්ධ කිරීම.

– තනි තනිව සංවර්ධනය කරන ලද ERP යෙදුම සංවර්ධනය හා සංරචක ඒකාබද්ධ කිරීම.

– අදාල ක්ෂේත්‍ර සඳහා ජංගම යෙදවුම් සංවර්ධනය මගින් සම්පූරණ විසඳුම් ලබාදීම.

13.3 විද්‍යුත් තැපැල් පද්ධති ආකෘතිය

පළාත් හා දිස්ත්‍රික් කාර්යාල 25 ඇතුළුව සමස්ත මධ්‍යම පරිසර අධිකාරිය සඳහා (Microsoft outlook) විද්‍යුත් තැපැල් පද්ධතිය ස්ථාපිත කරන ලදී.

අනාගතයේදී මෙම විද්‍යුත් තැපැල් පද්ධතියේ වැඩි දියුණු කිරීමක් අවශ්‍ය වුවහොත් එය රජයේ රෙගුලාසි වලට අනුව සිදු කරන ආකාරය පිලිබඳව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියෝජිතායතනය (ICTA) සමඟ මූලික සාකච්ඡාවක් පවත්වන ලදී.

13.4 මෘදුකාංග පද්ධති සංවර්ධනය

2017 වර්ෂයේ සැප්තැම්බර් මස මුල් බාගයේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ආධාර යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ තොරතුරු තාක්ෂණ ඒකකයේ සහ පරිසර දූෂණ පාලන ඒකකයේ සහයෝගීත්වයෙන් නිර්මාණය කරන ලද පරිසර පරිසර දූෂණ පාලන මූලාශ පරිගණක දත්ත පද්ධතිය වර්තමානයේදී ද මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල ජාලයේ සාර්ථකව ක්‍රියාත්මක වේ. මීට අමතරව මේ වන විට පැමිණිලි කලමනාකරණ මෘදුකාංග පද්ධතියක් ද සේවනියුක්තිකයන්ගේ වෛදය රක්ෂණ හිමිකම පිළිබඳ තොරතුරු නිරීක්ෂණය කල හැකි මෘදුකාංග පද්ධතියක් ද සියලුම කාර්යාලවල සාර්ථකව ක්‍රියාත්මක වේ.

2021 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ ඒකකය මෙම දත්ත හා මෘදුකාංග පද්ධති නඩත්තුව හා සංවර්ධනය කිරීමටත් සහය විය.

13.5 මධ්‍යම පරිසර අධිකාරියේ ඩිජිටල් පරාවර්තනය (2020 - 2030)

මධ්‍යම පරිසර අධිකාරියේ සමස්ත ක්‍රියාකාරිත්වය 2021 වර්ෂය අවසානයේදී සම්පූර්ණ ඩිජිටල් රාමුවක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ඒකකය මූලික සාකච්චා සහ සැලසුම් ආරම්භ කරන ලදී. පාරිසරික ගැටළු පිළිබඳ ගෝලීය ප්‍රමිති පෙළ ගැස්වීම, මධ්‍යම පරිසර අධිකාරිය හරහා පුරවැසියන්ට හොඳම සේවාවන් සහ ප්‍රතිලාභ ලබා දීම. පූර්ණ මහජන අවධානය යොමුවූ අංශ කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි පළමු අදියර යටතේ සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සාධක පහත පරිදි පෙලගැස්විය හැක.

- කඩදාසි රහිත සේවාස්ථානය
- විමෝචනය ශූන්‍ය කිරීම
- පුනර්ජනනීය බල ශක්තිය
- හරිත සංස්කෘතිය



රූපය **51 :** ඩිජිටල් පරාවර්තනයේ දළ සැලැස්ම

Chapter 14 : මධ්‍යම පරිසර අධිකාරියේ විමධ්‍යගතකරණ වැඩ පිළිවෙල

14.1 මධ්‍යම පරිසර අධිකාරියේ බලය පලාත් කාර්යාල වෙත විමධ්‍යගතකරණය කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය ප්‍රධාන කාර්යාලය වශයෙන්, ජාතික ප්‍රමිතීන්, මිනුම් දඬු ප්‍රකාශයට පත් කිරීම හා අවශ්‍ය මාර්ගෝපදේශ පිළියෙල කිරීම ජාතික වශයෙන් සිදු කරන අතර ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ඉලතල ක්‍රියාත්මක කිරීම සඳහා 2002 වසරේ දී මධ්‍යම හා දකුණු පළාත සඳහා ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවිය.

2002 වසරේ එසේ ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමෙන් ලබා ගන්නා ලද අත්දැකීම මත එම වැඩ පිළිවෙල මුළු දිවයින පුරා ව්‍යාප්ත කරන ලද අතර, 2007 වසර වන විට සියළුම පළාත් පාදක කොට ගෙන පළාත් කාර්යාල පිහිටුවා, පරිසර කළමනාකරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, ජාතික පාරිසරික පනත යටතේ පැවරී ඇති බලතල වලින් කොටසක් මෙම පළාත් කාර්යාල ප්‍රධානීන් වෙත මධ්‍යම පරිසර අධිකාරිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පවරන ලදි.

14.2. පළාත් පාලන ආයතන වෙත බලතල විමධ්‍යගත කිරීම

උප ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යම පරිසර අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පවරාදීමේ වගන්ති ජාතික පාරිසරික පනත මඟින් සම්පාදනය කොට ඇත.

ඒ අනුව, එකී පනතේ 26 වන වගන්තිය අනුව, මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල, කාර්යය හෝ කර්තව්‍ය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ රජයේ යම් නිලධාරියෙකුට පවරා දෙනු ලැබිය හැකිය. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතින් පවරා ඇති බලතල අනුව අනුව, අධිකාරියේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.

මේ වගන්තිය අනුව, 1993 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරියේ බලතල වලින් යම් කොටසක් පළාත් පාලන ආයතන වලට පවරා දීමේ මූලික කටයුතු සිදු කරන ලද අතර, 1994.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සුළු පරිමාණ කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල හා තවත් කටයුතු 12 ක් සඳහා බලතල පළාත් පාලන ආයතන වෙත එනම්, මහ නගර සභා, නගර සභා හෝ ප්‍රාදේශීය සභා වෙත පවරන ලදි.

1993 වසරේ දී සුළු පරිමාණ කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විමධ්‍යගත කරන ලද බලතල නැවත පවරාගෙන 2000 අංක 53 දරන සංශෝධිත පවතින් ප්‍රකාශයට පත් කරන ලද, 1159/22 දරන ගැසට් නිවේදනයට අනුව, එම ගැසට් නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් කර්මාන්ත / කටයුතු 45 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල එම පළාත් පාලන ආයතන වෙත පවරා දෙන ලදි.

ඉන්පසු නැවතත්, අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නියමිත කටයුතු 'අ' , 'ආ' සහ 'ඇ' වශයෙන් කාණ්ඩ තුනක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 පෙබරවාරි 14 දින පළාත් පාලන ආයතන වෙතපවරා තිබූ බලතල නැවතත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ගන්නා ලද අතර, 2008.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත ගැසට් නිවේදනයේ 'ආ' කාණ්ඩයට අයත් නියමිත කටයුතු සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලතල නැවතත්, පළාත් පාලන ආයතන වලට පවරා දෙන ලද අතර, එම ආයතන ඒ අනුව කටයුතු කරන ලදි.

14.3 දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීම් කමිටුව (DELEC)

- 1995 වසරේ දී දිස්ත්‍රික් පාරිසරික නීති බලගැන්වීමේ කමිටුව නමින්, කමිටු සෑම දිස්ත්‍රික්කයක් පාසාම පිහිටුවීමේ පරිපාලනමය ක්‍රියාවට නංවන අතර, මෙම කමිටුවේ සභාපති වශයෙන් අදාල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කටයුතු කරයි.
- මෙම කමිටුවේ අනිකුත් සාමාජිකයන් වනුයේ;
- සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ
- ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී
- දිසා වන නිලධාරී
- පළාත් පාලන සහකාර කොමසාරිස්
- වන ජීවී දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ප්‍රධානී
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන ප්‍රධානීන්
- එම පරිපාලන දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින්

මෙම කමිටුවේ ලේකම් වශයෙන් ප්‍රාදේශීය පරිසර නිලධාරියෙක් කටයුතු කරනු ඇත.

එසේම අවශ්‍යතාවය මත මෙම කමිටුව සඳහා වෙනත් සාමාජිකයන් හා නියෝජිතයන් පත් කළ හැකිය.

මෙම කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික වැරදි හෝ අක්‍රමිකතා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කර, ඊට අදාල ක්‍රියාත්මක කළ යුතු නිර්දේශයන් අදාල ආයතන වන පොලිසිය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ පළාත් ආයතන ලවා සිදුකරවීමය.

මෙම කමිටුවේ මූලික කර්තව්‍යය වනුයේ, මහජනයාගෙන් ලැබෙන්නා වූ පාරිසරික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමය.

මෙම කමිටු රැස්වීම් සෑම මසකම, සෑම දිස්ත්‍රික්කයකම, දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබයි

Chapter 15 : මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීයකරණ වැඩ පිළිවෙල

15.1. හැඳින්වීම

පරිසර ආරක්ෂණය සඳහා පළාත් කාර්යාල වෙත පවරා ඇති බලතල අතරින් ප්‍රධානතම නෛතික ක්‍රියාවලිය වනුයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී ජාතික වශයෙන් පනවා ඇති, අපද්‍රව්‍ය පිට කිරීම සඳහා වූ ප්‍රමිතීන් හා උපමාන, වායු විමෝචන හා ශබ්ද මට්ටම් අනුව ක්‍රියාත්මක කිරීම තුලින් පාරිසරික ආරක්ෂාව මෙම බලපත්‍ර ක්‍රමය තුලින් තහවරු කෙරේ. ශ්‍රී ලංකාවේ වර්තමානය දෙස බැලීමේ දී පෙනී යන්නේ මෙම පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමට ප්‍රථම එනම්, මීට දශක දෙකකට හෝ තුනකට පෙර ස්ථානගත කරන ලද කර්මාන්ත වලින් විශාල වශයෙන් පාරිසරික ගැටළු ඇති වී තිබෙන බවය.

කාර්මික අපද්‍රව්‍යන්ද (පිලියම් කල හෝ නොකළ) ආසන්නතම ජල ප්‍රවාහ වන ගංහා, වැව් සහ මුහුදු වැනි නිදහස් පරිසරයට මුදාහැරීම සාමාන්‍යයෙන් සිදු වේ. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය විසින් පොදු මහජනතාවගේ ඉල්ලුම සඳහා අවශ්‍ය වන ජලය සපයා ගනු ලබන්නේ ගංහා වලිනි. එහෙයින් අපද්‍රව්‍ය ජල මූලාශ්‍ර වලට මුදා හැරීම විශාල ප්‍රශ්නයක් වී ඇත. පොදු ජනතාවගේ පානීය ජල ප්‍රභව අපවිත්‍ර වීම කෙරෙහි මතුපිට ජල දූෂණයට අමතරව භූගත ජල දූෂණය ද බලපානු ලබයි.

පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම සම්බන්ධව වර්තමානයේ පවතින ප්‍රමිතීන් මඟින් භූගත ජලය නැවත පිරීම සහ එහි ආරක්ෂාව යන කරුණු ආවරණය නොවේ.

15.2 පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය

2021 වර්ෂයේ දී ‘‘අ’’ කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 947 ක් සහ ‘‘ආ’’ කාණ්ඩයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 517 ක් අලුතින් නිකුත් කර ඇති අතර ‘‘අ’’ කාණ්යේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 7,474 ක් සහ ‘‘ආ’’ වර්ගයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර 1,567 ක් අළුත් කරන ලදී.

නෛතිකව බැඳී පවතින නිකුත් කරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍රයන්හි නිර්දේශිත ක්‍රියාකාරකම් අඩංගු වී ඇත. එහෙයින් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තුලින් නිකුත් කරන්නා වූ කොන්දේසි කඩකිරීම ජාතික පාරිසරික පනත අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. නිර්දේශිත ක්‍රියාකාරකම් වලින් වැඩි සංඛ්‍යාවක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇති දත්ත අනුව මහා පරිමාන හා මධ්‍යම පරිමානයෙන් පරිසර දූෂණයට දායක වන කර්මාන්තශාලා වලින් 37% ක් බස්නාහිර පළාත තුල පිහිටා ඇත. මධ්‍යම පළාතේ එම අගය 10% ක් වන අතර සහ දකුණු පළාතේ එම අගය 13% සහ 40% ක් වන ඉතිරිය අනකුත් පළාත් වන සබරගමුව, නැගෙනහිර, උතුරු මැද, ඌව, උතුර සහ වයඹ පළාත් වල පිහිටා ඇත. මෙම කර්මාන්ත සමීක්ෂණය අදාල පළාත් වල පරිසර නිලධාරීන් විසින් කරන ලද අතර, ඒ සඳහා මහ පෙන්වීම් පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් ලබාදෙන ලදි.

නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍රය අළුත් කළ යුතු වේ. එමෙන්ම, යම් කර්මාන්ත කරුවෙක් තම බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට පටහැනි ලෙස ක්‍රියාකර ඇති බව ඔප්පු වුවහොත් එම බලපත්‍ර අවලංගු කිරීමේ බලතල ද අධිකාරිය සතු වේ. එම අවලංගු කිරීමකින් පසු යම් කෙනෙක් අභියාචනාවක් ඉදිරිපත් කරන්නේ නම්, පාරිසරික අමාත්‍යාංශයේ ලේකම්වරයාට එය ඉදිරිපත් කළ යුතු අතර, එතුමාගේ තීරණය ඒ සම්බන්ධයෙන් වූ අවසාන තීරණය වේ.

වගුව **39 :** පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාපටිපාටිය පලාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

පළාත	දිස්ත්‍රික්කය	නිකුත් කරන ලද බලපත්‍ර ගණන						අළුත් කරන ලද බලපත්‍ර ගණන					
		2019		2020		2021		2019		2020		2021	
		"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"	"A"	"B"
බස්නාහිර	කොළඹ	158	97	141	36	154	24	1532	223	922	101	461	85
	ගම්පහ	162	76	95	87	270	67	854	155	803	113	1486	278
	කළුතර	76	59	89	56	24	9	471	74	370	50	374	8
මධ්‍යම	මහනුවර	62	30	29	13	18	7	470	49	278	823	622	130
	මාතලේ	43	19	31	18	51	15	247	32	238	23	269	33
	නුවරඑළිය	30	5	6	1	6	1	168	20	106	11	132	4
දකුණු	ගාල්ල	41	118	24	46	34	45	409	128	274	159	483	172
	මාතර	34	36	16	19	19	25	279	96	252	72	371	140
	හම්බන්තොට	33	32	31	35	55	37	248	6	257	18	276	41
සබරගමු	කෑගල්ල	8	30	8	18	9	26	222	61	81	35	284	129
	රත්නපුර	21	60	18	3	10	5	131	28	59	23	215	31
උතුරු මැද	අනුරාධපුර	87	39	66	39	95	61	384	82	307	50	423	46
	පොලොන්නරුව	12	16	15	9	21	15	208	15	136	26	150	44
නැගෙනහිර	ත්‍රිකුණාමලය	8	14	14	15	25	17	186	14	100	32	195	68
	අම්පාර	8	10	12	9	33	48	182	30	169	66	354	35
	මඩකලපුව	10	5	26	57	16	10	80	69	258	71	168	58
ඌව	බදුල්ල	43	16	5	14	21	21	300	49	151	23	359	63
	මොණරාගල	19	14	10	6	13	2	272	20	45	11	57	12
උතුරු	යාපනය	7	11	0	8	3	15	119	33	131	42	282	68
	කිලිනොච්චි	7	6	3	6	4	23	62	18	52	66	45	21
	මුලතිව්	1	8	0	20	2	5	48	10	62	33	18	23
	වව්වනියා	33	12	16	6	34	10	100	4	116	9	185	24
	මන්නාරම	3	8	3	4	6	5	38	12	68	19	145	24
වයඹ	කුරුණෑගල	50	19	23	14	16	13	131	43	101	16	87	24
	පුත්තලම	29	26	17	5	8	11	54	7	61	6	33	6
මුළු එකතුව		**985**	**766**	**698**	**544**	**947**	**517**	**7195**	**1278**	**5397**	**1898**	**7474**	**1567**

15.3 නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

යම් ස්ථානයක නව කර්මාන්තයක් ස්ථානගත කිරීමට ප්‍රථම අධිකාරියේ නිර්දේශය ලබා ගැනීම මූලික අවශ්‍යතාවන් වන අතර එමඟින් එම

ස්ථානගත කිරීම වළක්වාගත හැකි වී තිබෙන අතර මේ නිසා කර්මාන්තකරුවන්ට නියම ස්ථානයේ නියම කර්මාන්තය අදාල පරිසර දූෂණ පාලන පිරිවිතරයන් අනුගමනය කිරීම තුලින් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති නිසා ඔවුන්ටද විශාල වශයෙන් ප්‍රතිලාභ අත් වී තිබේ. එමෙන්ම සුදුසු ස්ථානයන්හි සුදුසු කර්මාන්ත ස්ථානගත කිරීම තුලින් අසල්වාසීන්ටද පරිසර දූෂණයෙන් හෝ කර්මාන්තය නුසුදුසු ප්‍රදේශයක ස්ථානගත වීම වැළැක් වේ. මෙම පාරිසරික නිර්දේශ නිකුත් කිරීම තුලින් නුසුදුසු ස්ථානයන් හි නුදුසු කර්මාන්ත

මහජන පීඩාවන්ගෙන් තොරව වාසය කිරීමේ හැකියාව ලැබී ඇත.

2021 වසර තුල නව කර්මාන්ත 1322 ක් නිර්දේශ සඳහා අයදුම් කළද 2020 වසරේ අයදුම්පත් ද ඇතුළුව කර්මාන්ත 822 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත. එමෙන්ම අයදුම්පත් 41ක් නිර්දේශ ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා නොමැති බැවින් ප්‍රතික්ශේප කර ඇත.

වගුව **40 :** නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ නිකුත් කිරීම

පළාත	දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් ගණන			අනුමැතිය ලබාදුන් ගණන			ප්‍රතික්ෂේප ගණන		
		2019	2020	**2021**	2019	**2020**	**2021**	2019	2020	**2021**
බස්නාහිර	කොළඹ	82	57	60	47	36	27	1	1	0
	ගම්පහ	169	157	190	120	55	117	14	2	21
	කළුතර	136	88	48	72	49	53	00	4	2
මධ්‍යම	මහනුවර	51	6	18	37	22	12	2	0	0
	මාතලේ	41	30	20	36	18	10	2	1	0
	නුවරඑළිය	19	9	11	15	3	16	00	0	0
දකුණු	ගාල්ල	68	73	84	45	31	35	2	9	5
	මාතර	61	42	46	41	21	35	7	4	6
	හම්බන්තොට	75	54	72	37	34	50	1	2	0
සබරගමු	කෑගල්ල	8	7	0	15	7	1	1	0	0
	රත්නපුර	43	2	94	20	2	0	00	0	0
උතුරු මැද	අනුරාධපුර	81	72	57	63	42	46	1	2	2
	පොලොන්නරුව	25	26	8	19	19	4	1	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	35	17	21	35	26	20	00	0	0
	අම්පාර	25	29	29	35	32	36	00	1	1
	මඩකලපුව	36	32	33	44	46	35	12	0	0

පළාත	දිස්ත්‍රික්කය	ලැබුණු අයදුම්පත් ගණන			අනුමැතිය ලබාදුන් ගණන			ප්‍රතික්ෂේප ගණන		
උඩ	බදුල්ල	16	19	58	18	13	39	4	1	1
	මොණරාගල	49	35	113	28	20	46	00	1	2
උතුරු	යාපනය	48	64	68	24	39	29	00	0	0
	කිලිනොච්චි	77	66	85	62	63	63	00	0	0
	මුලතිව්	37	23	37	32	22	24	00	0	0
	වව්වනියා	57	15	21	38	24	34	00	2	0
	මන්නාරම	16	21	57	31	11	36	00	0	0
බයඹු	කුරුණෑගල	143	52	25	89	47	17	1	2	1
	පුත්තලම	57	55	67	43	48	37	4	0	0
මුළු එකතුව		**5174**	**1051**	**1322**	**1046**	**730**	**822**	**53**	**32**	**41**

15.4. ISO 14000 තත්ත්ව සහතිකකරණය පිළිබඳ බස්නාහිර පළාත් කාර්යාලයේ දායකත්වය.

ISO 14000 ප්‍රමිති යටතේ නව කාර්මාන්ත සහතික කිරීම සඳහා බස්නාහිර පළාත් කාර්යාලය දායක වීම

කාර්මික හා තාක්ෂණික කරුණු පිළිබඳව ප්‍රවීණ දැනුම ලබා දෙමින් කර්මාන්ත සඳහා ISO 14001 සහතිකය ලබා දීමේදී බස්නාහිර පළාත් කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට සහාය වේ. පහත වගුවේ දැක්වෙන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සිදු කරන ලද විගණන ක්‍රියාවලියේ තාක්ෂණික හා නෛතික යෙදවුම් සහිතව අ ISO 14001 සහතික ලබා දුන් කර්මාන්ත සඳහා ය.

15.5. පරිසර කළමනාකරණය

15.5.1. මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය (IEE)

1993 වසරේ සිට සියළු ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත්විය යුතුය. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති, කර්මාන්ත, උද්‍යාන වැඩි දියුණු කිරීම ආදී මහා පරිමාණ නියමිත කටයුතු මෙම ක්‍රියාවලියට අයත් වේ. පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රියාවලියේ දී මහා පරිමාණ ව්‍යාපෘතීන් පරිසර බලපෑම් මුල් අවධියේ ම හඳුනාගෙන එම බලපෑම් අවම කිරීමේ අවශ්‍ය නිර්දේශ සපයනු ලැබේ. මේ නිසා ව්‍යාපෘති යෝජකට ව්‍යාපෘතියේ මුල් අදියරේම පරිසර බලපෑම් අවම කර ගැනීමට හැකි වේ.

පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යටත් ව්‍යාපෘති සම්බන්ධයෙන් නිර්දේශ නිකුත් කිරීම පළාත් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ .

පහත දැක්වෙන්නේ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියට භාජනය වීමට යෝජනා වූ ව්‍යාපෘතින් පිළිබඳ විස්තර.

වගුව **41 :** මූලික පාරිසරික පරීක්ෂණ **(IEE) /** පරිසර බලපෑම් ඇගයීම **(EIA)** නියමයන්ට අනුකූලව **2021** වසර තුළදී අනුමත වූ ව්‍යාපෘති ලැයිස්තුව.

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය		
		2019	2020	2021	2019	2020	2021	2019	2020	2021
බස්නාහිර	කොළඹ	3	0	0	5	9	0	00	00	0
	ගම්පහ	3	0	0	00	0	0	00	00	0
	කළුතර	4	4	2	00	5	0	00	00	0
දකුණු	ගාල්ල	11	2	8	9	0	2	00	00	0
	මාතර	1	0	1	12	1	0	00	00	0
	හම්බන්තොට	4	3	0	2	5	7	00	00	0
මධ්‍යම	මහනුවර	71	72	67	72	16	37	00	00	0
	මාතලේ	4	0	0	11	0	0	00	00	0
	නුවරඑළිය	7	8	0	15	3	0	00	00	0
සබරගමු	කෑගල්ල	9	0	0	11	6	7	00	00	0
	රත්නපුර	17	13	38	1	0	0	3	00	0
ඌව	බදුල්ල	56	30	179	34	29	148	00	00	0
	මොණරාගල	9	0	1	6	3	2	00	00	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	00	0	0	3	0	0	00	00	0
	අම්පාර	00	0	0	00	0	0	00	00	0
	මඩකලපුව	00	0	0	00	1	0	00	00	0
උතුරු මැද	අනුරාධපුර	2	2	3	2	4	2	00	00	0
	පොලොන්නරුව	7	0	2	5	0	1	00	00	0
වයඹ	කුරුණෑගල	1	3	0	1	2	0	00	00	0
	පුත්තලම	00	0	0	5	1	0	00	00	0

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන			අනුමත කල ගණන			ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය		
		2019	2020	2021	2019	2020	2021	2019	2020	2021
උතුරු	යාපනය	15	3	0	10	2	0	00	00	0
	කිලිනොච්චි	00	0	0	00	0	0	00	00	0
	මුලතිව්	00	0	0	00	0	0	00	00	0
	වව්වනියා	00	2	2	00	3	1	00	00	0
	මන්නාරම	00	0	0	00	0	0	00	00	0
එකතුව		**224**	**142**	**303**	**204**	**90**	**207**	**03**	**00**	**00**

2021 වසර තුල දී අයදුම්පත් 303 ක් ලැබුණු අතර ඉන් 207ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර අපේක්ෂිත තත්වයේ නොවන අයදුම්පත් මේ වසරේ ලැබී නොතිබිණි.

15.5.2 ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා පාරිසරික නිර්දේශ ලබාදීම.

ඒ ඒ ව්‍යාපෘති යෝජකයන් විසින් ඉදිරිපත් කරන්නා වූ ඉල්ලුම් පත්‍ර අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් පරිසරයට සිදු වන්නා වූ අහිතකර බලපෑම් අවම කිරීමට අදාල කොන්දේසි සමඟ මෙම පාරිසරික නිර්දේශ නිකුත් කරනු ලැබේ. ඒ අනුව, ගත වූ වසර තුල හෝටල්, දැව හෙලීම්, විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම් හා ඉඩම් කට්ටි කිරීම ආදී වශයෙන් වූ ව්‍යාපෘතින් 1,163 (පසුගිය වසරේ අයදුම්පත් ද ඇතුළුව) ක් සඳහා පහත දැක්වෙන පරිදි පාරිසරික නිර්දේශ පළාත් කාර්යාල විසින් නිකුත් කරන ලදි. සංවර්ධිත ක්‍රියාවලියේ මූලික සැලසුම් අවධියේ ම පාරිසරික බලපෑම් හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදවීමට ඉහත සඳහන් ක්‍රියාවලිය පහසුකම් සලසයි.

වගුව **42 : 2021** වසරේදී ලැයිස්තුගතකොට නැති ක්‍රියාකාරකම් සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ ලැයිස්තුව

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන	අනුමත ගණන	ප්‍රතික්ෂේප වූ ගණන	පැමිණිලි පසුවිපරම් ගණන
බස්නාහිර	කොළඹ	71	58	0	0
	ගම්පහ	0	52	2	0
	කළුතර	42	34	0	0
දකුණ	ගාල්ල	48	9	0	0
	මාතර	1	15	0	0
	හම්බන්තොට	0	19	0	0
මධ්‍යම	මහනුවර	0	151	0	0
	මාතලේ	120	49	0	0
	නුවරඑළිය	0	11	0	0
සබරගමුව	කෑගල්ල	0	78	0	0
	රත්නපුර	0	63	0	0

පළාත	දිස්ත්‍රික්කය	අයදුම්පත් ගණන	අනුමත ගණන	ප්‍රතික්ෂේප වූ ගණන	පැමිණිලි පසුවිපරම් ගණන
ඌව	බදුල්ල	3	2	0	0
	මොණරාගල	33	52	0	0
නැගෙනහිර	ත්‍රිකුණාමලය	0	75	0	0
	අම්පාර	0	123	0	0
	මඩකලපුව	0	48	0	0
උතුරු මැද	අනුරාධපුර	38	12	0	0
	පොලොන්නරුව	0	1	3	0
උතුරු	යාපනය	0	21	0	0
	කිලිනොච්චි	103	73	0	0
	මුලතිව්	59	120	0	0
	වව්වනියා	6	10	0	0
	මන්නාරම	0	3	0	0
වයඹ	කුරුණෑගල	73	43	5	0
	පුත්තලම	5	41	0	0
එකතුව		**602**	**1163**	**10**	**0**

ඉහත වගුවේ දැක්වෙන්නේ 2020 දී ලබා දී ඇති එවැනි නිර්දේශයන්ගේ තොරතුරු ය

CHAPTER 16 : ප්‍රාදේශීය මෙහෙයුම් අංශය

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලය (පළාත් / දිස්ත්‍රික් කාර්යාල) මඟින් සපයනු ලබන සේවාවන් වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂමව ඉහළ නැංවීම සහතික කිරීමේ අරමුණින් ප්‍රාදේශීය මෙහෙයුම් අංශය 2018 දෙසැම්බර් මාසයේදී ස්ථාපිත කරන ලදි. එහිදී මෙම අංශය වෙත පහත සඳහන් ප්‍රධාන වගකීම් දෙක පවරන ලදි.

i මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශ හා ඒකක සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මඟින් ඉටු කරනු ලබන කාර්යයන්/ ක්‍රියාකාරකම් විධිමත් කිරීම.

ii ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලය ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම.

මීට අමතරව, මධ්‍යම පරිසර අධිකාරියෙහි තොරතුරු තාක්ෂණ ඒකකයෙහි අධික්ෂණය හා නිසි මඟ පෙන්වීම මෙන්ම සුරකිමු ගංඟා වැඩසටහන ඇතුළු ප්‍රාදේශීය කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘති ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වීම සහ අවශ්‍ය සහයෝගය ලබාදීම 2021 වසරේදී ප්‍රාදේශීය මෙහෙයුම් අංශය වෙත පැවරී තිබුණි.

කොවිඩ්- 19 (covid-19) ගෝලීය වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා රජය ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් (දිවයින පුරා ඇදිරි නීතිය පැනවීම,තෝරාගත් ප්‍රදේශ හුදකලා කිරීම , කාර්යාල වේලාවන් සීමා කිරීම වැනි..) 2021 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ඇතැම් වැඩ සටහන් හා ක්‍රියාකාරකම් වලට බලපෑම් එල්ල විය. එසේ වුවද , මෙම අංශය වෙත පවරන ලද ප්‍රධාන වගකීම් දෙක යටතේ 2021 වසරේදී පහත කාර්යයන් සිදු කරන ලදි.

16.1 මධ්‍යම පරිසර අධිකාරියේ අදාළ අංශ හා ඒකක සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් පළාත් හා දිස්ත්‍රික් කාර්යාල මඟින් ඉටු කරනු ලබන කාර්යයන්/ ක්‍රියාකාරකම් විධිමත් කිරීම.

A. පළාත් හා දිස්ත්‍රික් කාර්යාල වල (ප්‍රාදේශීය කාර්යාල) ප්‍රගතිය ඇගයීමට ලක් කිරීම හා අවශ්‍ය අවස්ථා වලදී නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගැනීම

2021 වසර තුලදී වරින් වර රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය යටතේ ප්‍රාදේශීය කාර්යාල වල පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම ප්‍රායෝගික නොවූ බැවින් මාර්ගගත තාක්ෂණය ඔස්සේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම වඩාත් සුදුසු විකල්පය බව තීරණය කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගතිය සමාලෝචනය, මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම, කළමණාකාරීත්වයේ කඩිනම් මැදිහත්වීම සහ නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල වල පවතින තාක්ෂණික, පරිපාලනමය සහ ප්‍රවර්ජනය සම්බන්ධ (Logistic) ගැටළු හඳුනා ගැනීම සහ කඩිනම් හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාල ජාලය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රාදේශීය මෙහෙයුම් අංශයේ වගකීම ක්‍රියාත්මක කිරීම යන අරමුණු ලඟා කරගැනීම සඳහා සභාපතිතුමා සහ / හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 11ක් 2021 වසර තුලදී පවත්වන ලදී.

රැස්වීම	දිනය
1. ප්‍රාදේශීය අධ්‍යක්ෂවරු ස සමඟ පවත්වන ලද රැස්වීම	2021.01.13
2. ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගති සමාලෝචන රැස්වීම	2021.07.01
3. ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගති සමාලෝචන රැස්වීම	2021.10.06
4. ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගති සමාලෝචන රැස්වීම	2021.10.13
5. ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගති සමාලෝචන රැස්වීම	2021.11.10
6. සභාපතිතුමා සමඟ පවත්වන ලද විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම - උතුරු මැද පලාත (අනුරාධපුර, පොලොන්නරු දිස්ත්‍රික්ක)	2021.11.11
7. සභාපතිතුමා සමඟ පවත්වන ලද විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම - නැගෙනහිර පලාත (ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක)	2021.12.10

ප්‍රාදේශීය කාර්යාල මඟින් සිදුකරන ලද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය, පරිසර නිර්දේශ ලබාදීමේ ක්‍රියාවලිය,මහජන පැමිණිලි, මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය, පරිසර නියමු ඩැඩසටහන, පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන්, පුස්තකාල සේවා සැපයීම මඟින් පරිසර තොරතුරු බෙදාහැරීම සහ පාර්ශවකරුවන් වෙත රසායනාගාර සේවා සැපයීම වැනි අංශ වල

කාර්ය සාධනය, ඉහතින් සඳහන් පරිදි පවත්වන ලද රැස්වීම් වලදී සමාලෝචනය කරන ලදී.

එහිදී කාර්ය සාධනය ඉහළ නැංවීම, දෝෂ ගවේෂණය සහ බාධක සහ සීමා කාරී සාධක මැඩපවත්වා ගනිමින් වඩාත් හොඳ සේවාවක් පාර්ශවකරුවන් වෙත සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාල වෙත සුදුසු උපදෙස් ලබා දෙන ලදී.

මීට අමතරව පරිසර කළමණාකරණය, පසුවිපරම් කිරීම සහ බලාත්මක කිරීම මෙන්ම ප්‍රාදේශීය කාර්යාල වල කළමණාකරණ සහ පරිපාලනමය ගැටළු ද ඉහත ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සාකච්ඡා කරන ලද අතර එම බොහෝ ගැටළු සඳහා සුදුසු පිළියම් යෝජනා කර ක්‍රියාත්මක කරන ලදී.

B. මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශ සහ ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් වෙත අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් ලබාදීම

දීර්ඝ කාලීනව පවතින ලද පරිසර ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් ලබාදීම සඳහා ද ප්‍රාදේශීය මෙහෙයුම් අංශය සම්බන්ධ විය. විශේෂයෙන්ම සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් වරින් වර යොමු කරන ලද පැමිණිලි සම්බන්ධව අදාල අංශ සහ ඒකක සමඟ සම්බන්ධීකරණයෙන් අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම් ලබාදෙන ලදී. අවශ්‍ය විට දී මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීමද සිදුකරන ලදී. මෙලෙස තාක්ෂණික මඟපෙන්වීම් ලබාදීම සඳහා ප්‍රාදේශීය මෙහෙයුම් අංශය සම්බන්ධ වන ලද ගැටළු කිහිපයක් පහත දක්වා ඇත.

i දික්වැල්ලෙහි පිහිටා ඇති කුමාරසිංහ ගල් ඇඹරුම්හලෙහි ගැටළුව
ii ගොඩකවෙල පිහිටි ඩොලමයිට් කැණීමේ කර්මාන්තය
iii ඔරුමික්ස් ඇස්ෆෝල්ට් පුද්ගලික සමාගමට අයත් මීරිගම පිහිටි කළුගල් කැඩීමේ ව්‍යාපාරය සම්බන්ධ ගැටළුව

16.2 ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල ජාලය ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම

A. ප්‍රාදේශීය කාර්යාල ජාලය තුල ගැටුම් නිරාකරණය සහ දෝෂ ගවේෂණය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සහ අදාල අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය සහ තාක්ෂණික දායකත්වය ලබාගනිමින් ප්‍රාදේශීය කාර්යාල ජාලය තුල හදිසි ප්‍රතිචාර පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. මෙම මාර්ගෝපදේශය ප්‍රාදේශීය කාර්යාල වෙත යොමු කරන ලද අතර එක් එක් කාර්යාලය සඳහා වෙන වෙනම "හදිසි ප්‍රතිචාර සැලැස්ම" සකස් කරන ලෙසට දන්වන ලදී.

මේ සම්බන්ධව 2021.07.20 සහ 2021.08.05 වන දිනයන්හි ප්‍රාදේශීය කාර්යාල සමඟ සාකච්ඡාවන් පවත්වන ලද අතර එම සාකච්ඡා වලදී යොමු කරන ලද මාර්ගෝපදේශයට අනුකූල වන පරිදි හදිසි ප්‍රතිචාර සැලැස්ම සකස් කිරීම සඳහා වැඩදුර දැනුවත් කිරීම් සිදු කරන ලදී.

මීට අමතරව 2021.09.10 වන දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත නිළධාරීන් සම්බන්ධ කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයෙහි හදිසි ප්‍රතිචාර කණ්ඩායම් ක්‍රියාත්මක කිරීම තුළින් ලබාගත් අත්දැකීම් හුවමාරු කර ගැනීමත් දිවයිනේ බටහිර මුහුදු තීරය ආසන්නව සිදු වූ "එක්ස්ප්‍රස් පර්ල්" නෞකා අනතුර නියාමනය කිරීමෙන් ලත් අත්දැකීම් සම්බන්ධවත් දැනුවත් කිරීමේ දේශන දෙකක් පවත්වන ලදී.

මීට අමතරව ප්‍රාදේශීය මෙහෙයුම් අංශයේ ආරාධනය පරිදි ජාතික ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රදීප් කොඩිප්පිලි මහතා විසින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සහ හදිසි ප්‍රතිචාර රාමුව පිළිබඳව මාර්ගගත තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021.10.06 වන දින පවත්වන ලදී.

B. ප්‍රාදේශීය කාර්යාල වල කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් / වැඩමුළු හඳුනා ගැනීම සහ එම පුහුණු වැඩසටහන් / වැඩමුළු පැවැත්වීම

ප්‍රාදේශීය කාර්යාල වලට අනුයුක්ත නිලධාරීන් සඳහා පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුවක් පැවැත්වීම.

ප්‍රාදේශීය කාර්යාල පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය සහ මූලික පාරිසරික පරීක්ෂණ සිදුකිරීමේදී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු සම්බන්ධ පුහුණු සැසි දෙකක් මාර්ගගත තාක්ෂණය ඔස්සේ 2021.10.29 සහ 2021.12.28 යන දිනයන්හි දී පවත්වන ලදී.

මෙහිදී මධ්‍යම, වයඹ, ඌව, දකුණු සහ සබරගමුව පලාත් වලින් යොමු කරන ලද ගැටළු සාකච්ඡා කරන ලද අතර සියළුම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මෙම වැඩමුළුවට සහභාගීවන ලදී. මෙහිදී සියළුම පළාත් සඳහා පොදු නිර්ණායක පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවය මතුවූ අතර ඒ සඳහා මූලික කරුණු සාකච්ඡා කරන ලදී.

C. 2021 වසරේදී කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා සහ ඇදිරි නීතිය පනවන ලද කාලසීමා තුල දී සිදු කරන ලද කාර්යයන්

ජනාධිපති ලේකම් කාර්යාලය, රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍ර ලේඛ සහ මාර්ගෝපදේශයන්ට අනුව සියළුම රාජ්‍ය ආයතන වල කටයුතු සඳහා මාර්ගගත ක්‍රමවේද, ඩිජිටල් පහසුකම් සහ ක්‍රමවේද භාවිතා කර පාර්ශවකාර

ආයතන සහ සේවාලාභීන් හට වඩා වේගවත් සේවාවක් ලබාදීමට උපදෙස් දෙන ලදී.
ඒ අනුව ප්‍රාදේශීය මෙහෙයුම් අංශය විසින් අදාල අංශ හා ඒකක වල සහය ලබාගනිමින් පහත සඳහන් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.
i කළමනාකාරීත්වය, ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ජාලය අතර ඵලදායී සන්නිවේදනයක් සහ මනා සම්බන්ධීකරණය තහවුරු කර ගැනීමට විද්‍යුත් පහසුකම් සහ සමාජ මාධ්‍ය භාවිතා කිරීම.
ii ප්‍රාදේශීය කාර්යාල මඟින් යොමු කරන ලද රාජකාරී ලැයිස්තු රජය විසින් වරින් වර නිකුත් කරනු ලද මාර්ගෝපදේශයන්ට අනුගත වන බවට තහවුරු කර ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතිය සඳහා යොමු කිරීම.
iii මෙම කාලසීමාව තුල ප්‍රාදේශීය කාර්යාල මඟින් මහජනතාවට සහ අනෙකුත් පාර්ශවකරුවන් වෙත සේවා සැපයීමේදී පැන නඟින ලද පරිපාලනමය, කළමනාකරණ සහ ප්‍රවර්ජනය සම්බන්ධ (Logistics) ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

16.3 ප්‍රාදේශීය මෙහෙයුම් අංශය මඟින් සිදුකරන ලද සෙසු ක්‍රියාකාරකම්

A. සුරකිමු ගංඟා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දක්වන ලද දායකත්වය

1.ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පිහිටුවීම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශය සකස් කිරීම.
ප්‍රාදේශීය මෙහෙයුම් අංශය විසින් මෙම මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී. මෙම මාර්ගෝපදේශය සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් මුද්‍රණය කර ඇති අතර ප්‍රාදේශීය තලයේ සිට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය යනාදිය අඩංගු වේ.
2. කතරගමදී පවත්වන ලද සුරකිමු ගංඟා වැඩසටහනෙහි ජාතික සමාරම්භක උත්සවය 2021.03.22 කතරගමදී පවත්වන ලද සුරකිමු ගංඟා වැඩසටහනෙහි ජාතික සමාරම්භක උත්සවයේ සංවිධාන කටයුතු සඳහා ප්‍රාදේශීය මෙහෙයුම් අංශය දායක විය.
3. සුරකිමු ගංඟා වැඩසටහනෙහි ප්‍රාදේශීය සමාරම්භක උත්සව සම්බන්ධීකරණය කතරගමදී පවත්වන ලද සුරකිමු ගංඟා වැඩසටහනෙහි ජාතික සමාරම්භක උත්සවයට සමගාමීව 2021.03.22 සෙසු පලාත් වලද, පලාත් සමාරම්භක උත්සව පවත්වන ලදී. මෙම පලාත් සමාරම්භක උත්සව සංවිධානය කිරීම ප්‍රාදේශීය මෙහෙයුම් අංශයේ සම්බන්ධීකරණයෙන් සිදුකරන ලදී.



රූපය **52 :** සුරකිමු ගංඟා වැඩසටහනෙහි බස්නාහිර පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **53 :** සුරකිමු ගංඟා වැඩසටහනෙහි මධ්‍යම පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **54 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි දකුණුපලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **55 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි සබරගමුව පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **56 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි වයඹ පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **57 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි සබරගමුව පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **58 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි නැගෙනහිර පලාතේ පලාත් සමාරම්භක උත්සවය



රූපය **59 :** සුරකිමු ගංගා වැඩසටහනෙහි උතුරුපලාතේ පලාත් සමාරම්භක උත්සවය

4. සුරකිමු ගංඟා ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඇගයීමේ කමිටුවට සහභාගී වීම

ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් සකස් කර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ඔස්සේ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලබන ව්‍යාපෘති යෝජනා එලෙස මූලය ප්‍රතිපාදන සැලසීම සලකා බැලීම සඳහා , පරිසර අමාත්‍යංශය මඟින් පත් කරන ලද , “ව්‍යාපෘති යෝජනා ඇගයීමේ කමිටුව” සඳහා යොමුකරනු ලබයි. මෙම කමිටුවේ සාමාජිකයෙකු ලෙස ප්‍රාදේශීය මෙහෙයුම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරන අතර 2021 වර්ෂය තුලදී රැස්වීම් වාර 10 ක් පවත්වා ඇත.

5. සුරකිමු ගංඟා වැඩසටහන පිළිබඳව පානීය ජලය බෝතල් කිරීමේ සහ විවිධ පාන වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්තකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

නිෂ්පාදන ක්‍රියාවලියේදී අමුද්‍රව්‍යක් ලෙස සැලකිය යුතු ප්‍රමාණයක් ජලය භාවිතා කරන, පානීය ජලය බෝතල් කර ඇසුරුම් කිරීමේ කිරීමේ සහ විවිධ පාන වර්ග නිෂ්පාදනය කිරීම වැනි කර්මාන්ත වල කර්මාන්තකරුවන් හට සුරකිමු ගංඟා ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021.03.15 වැනි දින ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. සුරකිමු ගංඟා වැඩසටහන සඳහා ඔවුන් දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ විය.

16.6 ප්‍රාදේශීය කාර්යාල ජාලය සමඟ පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් හා අනෙකුත් රැස්වීම්

සුරකිමු ගංඟා වැඩසටහන සම්බන්ධව ප්‍රාදේශීය කාර්යාල සහ/හෝ ප්‍රධාන කාර්යාලයෙහි අනෙකුත් අංශ සමඟ මාර්ගගත තාක්ෂණය ඔස්සේ රැස්වීම් 45ක් 2021 වසර තුලදී පවත්වන ලදී. සුරකිමු ගංඟා ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාල යොමු කිරීම මෙම මාර්ගගත රැස්වීම් වල ප්‍රධාන අරමුණ විය.

2021 අගෝස්තු මස 20, 23, 24, 25, 26, 28 සහ 31 යන දිනයන්හි මුළු දිවයිනයෙහිම පිහිටි ප්‍රාදේශීය කාර්යාල ආවරණය වන පරිදි මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලද රැස්වීම් මාලාවේදී එම කාර්යාල වලින් යොමු කරන ලද සහ යොමු කිරීමට අපේක්ෂිතව තිබූ ව්‍යාපෘති යෝජනා සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම සඳහා අදාලත්වය සහ සුදුසු බව ඉතා පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් කරන ලද අතර වැඩසටහනෙහි අරමුණු සමඟ අනුගත වන අයුරින් ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී. ප්‍රාදේශීය කාර්යාල වලට අනුයුක්ත පරිසර නිලධාරීන් ඇතුළු සියළුම නිලධාරීන් මෙම සාකච්ඡා සඳහා සහභාගී විය.

B. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන අංශයේ වැඩිදියුණු කිරීම සඳහා දක්වන ලද දායකත්වය

ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ගවයින් 1000 සිට 1500 දක්වා ප්‍රමාණයකින් සමන්විත මහා පරිමාණ කිරි ගොවිපළ 10 සිට 15 දක්වා සංඛ්‍යාවක් සුදුසු ස්ථානවල නවීන තාක්ෂණය යොදා ගනිමින් පිහිටුවීමට අනුමැතිය ලබා දී ඇත. මෙම මුලපිරීමත් සමඟම, වියළි කලාපයේ මහා පරිමාණ බඩ ඉරිඟු / තෘණ ආහාර ගොවිපළවල් ස්ථාපිත කිරීමෙන්, වඩාත් සුදුසු වගා ක්‍රමයක් හරහා කිරි ගවයන් සඳහා ආහාර අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස නිෂ්පාදනය කිරීම සහ සැපයීම සහතික කිරීමට රජය අපේක්ෂා කරයි.

ජනාධිපති කාර්ය සාධක බලකායේ නියමයන්ට අනුව කිරි නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉල්ලුම් කරන ලද ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ නිර්දේශ කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරීත්වය පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) සාමාජිකයෙකු ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්තුමා නියෝජනය කරමින් ප්‍රාදේශීය මෙහෙයුම් අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන ලදී.

මෙහිදී, යෝජිත ඉඩම් නිදහස් කිරීමේ ක්‍රියාවලියේදී ඉඩම් හිමි ආයතන විසින් සංවිධානය කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ද නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය.



රූපය **60 :** කිරිගොවිපල සඳහා යෝජිත ඉඩම් සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුවේ පරීක්ෂණ වාරිකාව- ලුණුගම්වෙහෙර **13.03.2021**



රූපය **61 :** කිරිගොවිපල සඳහා යෝජිත ඉඩම් සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුවේ පරීක්ෂණ වාරිකාව- තෙලහැර, නිකවැරටිය **23.03.2021**

C. මධ්‍යම පරිසර අධිකාරියට අනුයුක්ත පරිසර නිලධාරීන් සඳහා ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය පිටු දැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය මඟින් සංවිධානය කර 2021.01.15 වන දින පවත්වනු ලැබූ “2021 අයවැය යෝජනා” පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සම්බන්ධීකරණ කටයුතු ප්‍රාදේශීය මෙහෙයුම් අංශය විසින් සිදු කරන ලද අතර එහි ප්‍රගතිය වාර්තා කිරීමද සිදු කරන ලදී.

D. පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම් අංශය මඟින් පවත්වාගෙන යනු ලබන පරිසරය සම්බන්ධ කටයුතු වල නියැලෙන රාජ්‍ය නොවන සංවිධාන ඇතුලත් ලැයිස්තුව යාවත්කාලීන කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල ජාලය තුල සම්බන්ධීකරණය, ප්‍රාදේශීය මෙහෙයුම් අංශය මඟින් සිදු කරන ලදී.

CHAPTER 17 : පළාත් කාර්යාල වල සාර්ථක වැඩසටහන්

A. එක්ස්ප්‍රස් පර්ල් නැවේ සිදුවීම

සිංගප්පූරුවට අයත්ව තිබූ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව යුරෝපයේ සිට ගමන් අරඹා 2021/05/20 දින කොළඹ වරාය ආසන්නයට පැමිණ ඇති අතර එම නෞකාව ගැඹුරු මුහුදට රැගෙන යාමට ගත් සියලු උත්සාහයන් ව්‍යර්ථ වීමෙන් පසු ගිනිගෙන ඇත. ඒ සමගම උස්වැටකෙයියාව වෙරළ තීරයට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ගොඩගැසී තිබූ අතර ඒ වන විට කොවිඩ් රැල්ල හේතුවෙන් අවුරුදු උත්සව සමයේ සිට රටම වසාදමා තිබූ බැවින් ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ අනුමැතිය ඇතිව මෙම තත්ත්වය නිරීක්ෂණය කිරීමට කටයුතු කළේය. ඒ සඳහා ආරක්ෂක අංශ නිලධාරීන් කණ්ඩායම් දෙකක් උස්වැටකෙයියාව වෙරළ තීරයේ සිට කොච්චිකඩේ වෙරළ තීරය දක්වා ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කර ඇත. ඒ අතරම ගින්න හේතුවෙන් ඇති වූ කළු දුමාරය මීගමුව වෙරළ තීරයෙන් රට තුළට පැමිණ වයඹ කලාපයට හමා යමින් තිබූ බැවින් මධ්‍යම පරිසර අධිකාරියේ වායු තත්ත්ව ඒකකය විසින් සුදුසු ස්ථානවල වාතයේ ගුණාත්මකභාවය මැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. බස්නාහිර, දකුණු සහ වයඹ පළාත් වල නිලධාරීන් ප්‍රතිවක්‍රීකරණය කිරීම සඳහා එකතු කරන ලද ප්ලාස්ටික් බැහැර කිරීම සඳහා ගබඩා පරිශ්‍රයක් තෝරා ගැනීම සඳහා ක්ෂේත්‍ර කාර්යයන්හි නිරත වූහ.

සිද්ධිය සම්බන්ධයෙන් ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ කණ්ඩායම් දෙකක් අඛණ්ඩව නිරීක්ෂණ සිදු කරන ලදී. මීගමුව/ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සරක්කුව මුහුදු තීරයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහය ඇතිව ටොන් 500ක් පමණ බරැති ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස් කර ගබඩා ස්ථාන වෙත යවා ඇත. මෙම සිදුවීමෙන් මුහුදු මසුන් 1000කට ආසන්න ප්‍රමාණයක්, කැස්බෑවන් 70ක් සහ ඩොල්ෆින් 6 දෙනෙකුට බලපෑම් එල්ල වූ බව වාර්තා වේ. තවද නෞකාවේ ඉන්ධන ලෙස භාවිතා කරන ලද තෙල්, සාගර ජලය අපවිත්‍ර වීමට හේතු විය. සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ජෛවවිවිධත්වයට සිදුවන හානිය සම්බන්ධයෙන් නීතිමය හා තාක්ෂණික උපදේශන සහිතව තොරතුරු රැස් කරන ලදී.

මීළඟ හදිසි සිදුවීම වාර්තා වූයේ 2021.02.03 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් නගර සභාවේ කටුනායක අපනයන සැකසුම් කලාපය තුළ පිහිටි සීමාසහිත ඉන්සේ ඉකෝ සයිකල් ලංකා හිය. සීමාසහිත සියම් සිටි සිමෙන්ති ලංකා හි පිහිටි දාහකයට ප්‍රවාහනය කිරීමට නියමිතව තිබූ අන්තරායකර අපද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානයේ ගබඩා කර තිබූ විෂ රසායන ද්‍රව්‍ය අලුයම ගිනිගෙන තිබේ. ගින්න නිවීමට යොදාගත් ජලය කර්මාන්ත පරිශ්‍රයේ රැඳී ඇති බැවින් අපවිත්‍ර ජලය පොළවට කාන්දු නොවන පරිදි පරිසර හිතකාමී ලෙස බැහැර කරන ලෙස 2021/02/03 දින සමාගමට ලිඛිතව උපදෙස් ලබාදී ඇත.

බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් පට්ටිවිල ජල පවිත්‍රාගාරයෙන් 2021/06/05 දින ලද තොරතුරකට අනුව සපුගස්කන්ද පිරිපහදු සංකීර්ණයෙන් දූෂිත තෙල් සහිත ජලය ගලා යන බව දන්වා ඇත. අඛණ්ඩ වර්ෂාපතනයේ ප්‍රතිඵලයක් ලෙස පට්ටිවිල ජල පොම්පාගාරයේ සපුගස්කන්ද තෙල් පිරිපහදුව පහළ උන්නතාංශය සහ තාවකාලික ගබඩා ටැංකි අසල සවිකර ඇති යන්ත්‍රෝපකරණවල API Separator හි තෙල් සහිත රොන්මඩ සමඟ තෙල් මිශ්‍රවීම වැළැක්වීමට වහා ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය.

ඒ නිසා වෙරළාරක්ෂක භටයන් ගෙන්වා ඔවුන්ගේ උපරිම සහයෝගය සහ වෙහෙස මහන්සි වී අපද්‍රව්‍ය ගහට ගලා ඒම වැළැක්වීමට වැලි කොට්ට යොදා අපද්‍රව්‍ය එක්රැස් කර බවුසර් යොදා පරිසර හිතකාමී ලෙස මුදා හැරීමට කටයුතු කරන ලදී. මේ සඳහා 2021 ජුනි 05, 07, 09 සහ 11 යන දිනවල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කරන ලදී..

රක්ගහවත්ත ඇළ හරහා අර්ධ වශයෙන් පිරිපහදු කළ අපජලය කැලණි ගඟට හැරවීම සම්බන්ධයෙන් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් දියත් කරන ලද පැමිණිල්ලට අනුව 2021/08/02 දින පරීක්ෂා කිරීම් සිදු කරන ලදී. අපජලය රසායනිකව පිරිපහදු කර ජීව විද්‍යාත්මක පිරිපහදුව සඳහා යොමු කළද පිටකරන අපජලයේ අධික උෂ්ණත්වය හේතුවෙන් ජීව විද්‍යාත්මක පිරිපහදුව අඩාල වී ඇති බව අනාවරණය විය. අපජල පවිත්‍රාගාරයේ නඩත්තු කටයුතු ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලයට පවරා තිබූ අතර, 1990 දශකයේ පැවති බියගම අපනයන සැකසුම් කලාපයට වඩා කාර්මික ධාරිතාවය ඉහළ යාම හේතුවෙන් දැනට පවතින අපජල පවිත්‍රාගාරයේ ධාරිතාව මේ සඳහා ප්‍රමාණවත් නොවන බව තොරතුරු අනුව වාර්තා විය. මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ආයෝජන මණ්ඩලයට දැනුම් දෙන ලෙස පරිසර දූෂණ පාලන ඒකකය ලිඛිතව දැනුම් දෙන ලදී.

2021 ඔක්තෝම්බර් මස 22 වන දින අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මීවිටිගම්මන දම්රෝ ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලාවේ ගබඩාවේ හදිසි ගින්නක් හටගෙන ඇති අතර එම ගින්නෙන් එම කර්මාන්තයේ සියලුම ගොඩනැගිලි විනාශ විය.

B. ලෝක ජල දින වැඩසටහන

ලුණුගම්වෙහෙර ජලාශයේ ජල පෝෂක සංරක්ෂණ වැඩසටහන

ජල පෝෂක සංරක්ෂණ වැඩසටහන යටතේ කිරිදිඔය ජාතික ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් ලුණුගම්වෙහෙර ජලාශයේ ජල පෝෂක ප්‍රදේශවල කුඹුක්, මී, බුළු ඇතුළු පැළ 200ක් රෝපණය කර ලෝක ජල දිනය වෙනුවෙන් ප්‍රජාව දැනුවත් කරන ලදී. (ඇමුණුම-6)

C. කැකිරි ඕබඩ විද්‍යාලය, වලස්මුල්ල

ලෝක ජල දිනය නිමිත්තෙන් වැඩසටහන් දෙකක්, ලෝක ජල දිනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, පදක්කම් ප්‍රදානය සහ පැළ සිටුවීමේ වැඩසටහන් වලස්මුල්ල කැකිරි ඕබඩ විද්‍යාලයේ දී පැවැත්විණි.

D. තහනම් පොලිතින් වැටලීමට විශේෂ වැඩසටහනක්

2021 නොවැම්බර් 14 වැනි දින අකුරැස්ස කොට්ඨාශයේ වැලිගම, කොක්මාදුව පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන්, මාතර දිස්ත්‍රික් කාර්යාලයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ නිලධාරීන් සහ මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයේ මාත්‍රාර නිලධාරීන් විසින් වැටලීමේදී තහනම් ආහාර අහුලාගත් කිලෝග්‍රෑම් 486ක් සොයාගෙන ඇත.



E. සුරකිමු ගඟ වැඩසටහන යටතේ "කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අක්කරායන් ගඟ සහ පරිසර පද්ධතිය සුරැකීම" ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය

සුරකිමු ගඟ වැඩසටහන යටතේ ක්‍රියාත්මක “කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අක්කරායන් ගඟ සහ පරිසර පද්ධතිය සුරැකීම” ව්‍යාපෘතියේ නිල සමාරම්භක උත්සවය 2021.11.04 දින පෙ.ව.9.30ට අක්කරායන් ගංගා ද්‍රෝණියේදී පැවැත්විණි. කිලිනොච්චි දිසාපතිනි රූපාවතී කේතීස්වරන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ධීවර අමාත්‍ය ගරු K.N.ඩග්ලස් දේවානන්ද මහතා සහභාගී විය





F. රුක් රෝපණ වැඩසටහන

පර් ආරු ගංගා පරිසර පද්ධතියට යාබදව රුක් රෝපණ වැඩසටහන පවත්වා ඇත. රුක් රෝපණ වැඩසටහන සහ සංඥා පුවරුව නිල වශයෙන් පර් ආරු ගඟට යාබදව ඉදිකරන ලදී. වවුනියාව දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට ප්‍රාදේශීය ලේකම්, ගොවිජන දෙපාර්තමේන්තුව, WRDS, RDS, ගොවි සංවිධාන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, සංවර්ධන නිලධාරීන් ආදී අදාළ පාර්ශවකරුවන් සක්‍රීයව සහභාගී විය. පැල 300කට ආසන්න ප්‍රමාණයක් මෙහිදී රෝපණය කරන ලදී.





G. කුඹුක්, මී (ඉලුප්පයි) සහ *Cassia fistula* ගස් ගං පත්ලේ සිටුවා.

ලෝක තෙත්බිම් දිනය - පෙබරවාරි 2 නිමිත්තෙන් දිස්ත්‍රික් වැඩසටහන 2021 පෙබරවාරි 13 වන දින වේලාල්වේලි, තුපන්කේනි හිදී පවත්වන ලද අතර රුක් රෝපණ වැඩසටහන තුපන්කේනි වැව් පෝෂක ප්‍රදේශයේදී සිදු කරන ලදී.



ලෝක තෙත් බිම් දිනය - 2021 මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයේදී

තවද මෙම වැඩසටහනට සමගාමීව මෙම දැනුවත් කිරීමේ වැඩසටහන තුම්පන්කේනි වේලාවේලි තුම්පන්කේනි කන්නකි විද්‍යාලය හිදී පැවැත්විණි..



වෙල්ලාවේලි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, පද්දිරුප්පු කලාපයේ කලාප අධ්‍යක්ෂ, මඩකලපුව වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ සහ සංවර්ධන නිලධාරී, පාසල් විදුහල්පති, පරිසර නියමු කණ්ඩායම්, ගුරුවරුන් සහ මිරිදිය ධීවර සාමාජිකයින් සහභාගී විය.



H. පොලිතීන් වැටලීම-2021

2021 වසරේ මුලතිව් දිස්ත්‍රික්කයේ පොලිතින් වැටලීම් හයක් සිදු කර ඇත.

i යුරෝපා සංගමයේ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියෙන් අරමුදල් ලබා ගැනීම

මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයට රු. 630,000.00 පශ්චාත් කොවිඩ් තත්ත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ පසුගාමී කාර්යයන් ප්‍රතිනිර්මාණය කිරීම ක්‍රියාවට නැංවීම සහ පාරිසරික ආරක්ෂාව, තිරසාර සංවර්ධනය සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම සහ ඒකාබද්ධ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉලක්කගත අගය දාම සහ ව්‍යාපාර සම්බන්ධයෙන් අර්බුදයෙන් ඔබ්බට පවත්වා ගත හැකි ක්‍රියාමාර්ග සහ සේවාවන් ක්‍රියාත්මක කිරීම. යුරෝපීය සංගමය විසින් අරමුදල් සපයන ලදී.

ii මරගල පරිසර ආරක්ෂණ ප්‍රදේශයෙහි පර්යේෂණ අධ්‍යයන

මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය විසින් මරගල පරිසර ආරක්ෂණ ප්‍රදේශයෙහි පාරිසරික ඇගයීම

සඳහා ඉෙව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා දර්ශක සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයනයක් සාර්ථකව ආරම්භ කර ඇත. ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් සඳහා සිදු කරන ලද මෙවැනි අධ්‍යයනයක පළමුවැන්න මෙයයි. පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ සහභාගීත්වයෙන් අධ්‍යයනය සිදු කෙරේ.

iii මරගල පරිසර ආරක්ෂණ ප්‍රදේශයෙහි නීති විරෝධී මානව ක්‍රියාකාරකම් සඳහා ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග

වන විනාශය සහ අනවසර වගා කිරීම් වැනි අයථා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් මරගල පරිසර ආරක්ෂණ ප්‍රදේශය මේ වන විට විවිධ තර්ජන සහ ගැටලුවලට මුහුණ පා සිටින බැවින් මොනරාගල දිස්ත්‍රික් කාර්යාලය මොනරාගල පොලිස් ස්ථානය හා එක්ව වැටලීම් වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. එම හෙළිදරව් කිරීම් මත මොණරාගල මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා තුනක් ඉදිරිපත් කර අධිකරණ නියෝගය යටතේ අනවසර වගාවන් ඉවත් කර ඇත.

II. Eco Park වැඩසටහන මොනරාගල

මොණරාගල ප්‍රාදේශීය සභාවේ සහ EPP දිස්ත්‍රික් සමාජයේ සහයෝගයෙන් මොණරාගල නගරයේ අක්කර දෙකක භූමි ප්‍රමාණයකින් නාගරික උද්‍යානයක් ස්ථාපිත කරන ලදී. පරිසරය සුරැකීම, හරිත ආවරණය වැඩි කිරීම, මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සහ සමාජ දැනුවත්භාවය පතුරුවා හැරීම යන අරමුණු ඇතිව සෙවණ දෙන ගස් 50කට අධික ප්‍රමාණයක් සහ අනෙකුත් වැදගත් ගස් විශේෂ ප්‍රමාණයක් සිටුවා, බංකු සවි කරන ලදී.

Chapter 18 : මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කරණු ලබන විශේෂ ව්‍යාපෘත

18.1 "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන

A. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මතුපිට ජල සම්පත්වලින් සමන්විත වන ප්‍රධානතම ජලමූලාශ්‍ර වන ගංගා ද්‍රෝණි සම්බන්ධ මූලික ගැටලු වන්නේ විවිධ මානව ක්‍රියාකාරකම් නිසා ඇති වන ජල සම්පත ක්ෂය වීම හා හායනය වීමයි. නාගරික ප්‍රදේශවල මතුපිට අභ්‍යන්තර ජලය ගෘහස්ථ අපද්‍රව්‍ය හා කාර්මික අපද්‍රව්‍යවලින් සහ ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික අපද්‍රව්‍ය වලින් දැඩි ලෙස දූෂණය වී ඇත.

වසර ගණනක් මිනිසා විසින් අවධිමත් ව මෙම ගංගා භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ බොහෝ ගංගාවන්ගේ ජලය සෘජුවම භාවිතයට ගැනීමට නුසුදුසු තත්වයට පත්ව ඇත. මේ හේතුවෙන් වර්තමානය වන විට පානීය අවශ්‍යතාවයන් මෙන් ම වෙනත් කටයුතු සඳහා පරිභෝජනයට අවශ්‍ය ජලය සපයා ගැනීම දුෂ්කර තත්වයකට පත්ව ඇත.

මෙරට ගංගා සහ ජලය සංරක්ෂණය උදෙසා ආයතන රැසක් පිහිටවා ඇත. මෙම ආයතන සියල්ල විවිධාකාර වූ වගකීම් ඉටුකරමින් සිටින නමුත් මෙම ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නොමැතිවීමෙන් සමහර කාර්යයන් නිසි ලෙස ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය වේ.

‘‘සුරකිමු ගංගා’’ ජාතික පාරිසරික වැඩසටහන මගින් මෙම තත්වය මගහරවා ගැනීමට, ගංගා සංරක්ෂණය සඳහා අදාළ සියලු පාර්ශවයන් ඒකරාශී කර මෙම සියලුම ගංගා ද්‍රෝණි සංරක්ෂණයට කටයුතු කිරීම උදෙසා නිසි තිරසාර සංරක්ෂණ වැඩසටහනක් සැකසීමට කටයුතු යොදා ඇත.

2020 වසරේදී මධ්‍යම පරිසර අධිකාරිය මගින් ස්ථාන 10,377 නිරීක්ෂණය කොට ගංගාවන් පිළිබඳ ව කරන ලද සමීක්ෂණයේ දී හෙළිවූ කරුණු අනුව ගංගා ජලයේ ගුණාත්මකභාවයට හානිවන පහත කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

- අපජලය එක්වීම හේතුවෙන් සිදුවන ජල දූෂණය
- ඝන අපද්‍රව්‍ය සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හේතුවෙන් සිදුවන ජල දූෂණය
- පාංශු බාදනය සහ ගං ඉවුරු බාදනය
- අනවසර හා අවිධිමත් ඉදිකිරීම්
- ගංගා රක්ෂිත නීත්‍යානුකූල නොවීම
- අනවසර හා පාලනයකින් තොරව සිදුවන ඛණිජ කැනීම්.

B. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන ස්ථාපිත කිරීම

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් වත්මන් රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තිය යටතේ සැමට ජලය ලබාදීමේ අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාවේ සියලුම ගංගා, ජල මූලාශ්‍ර පවිත්‍ර කොට විධිමත් සැලැස්මක් යටතේ පොදු ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම අරමුණු කර ගනිමින් ‘‘සුරකිමු ගංගා’’ ජාතික පාරිසරික වැඩසටහන ස්ථාපනය කර ඇත.

මේ සඳහා ජාතික වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සම්පාදනය කරන ලද අතර එම වැඩසටහන සඳහා පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

C. අපේක්ෂිත ප්‍රතිඵල හා ප්‍රතිලාභ

"සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි සියල්ලම සංරක්ෂණය කිරීමේ උදාර චේතනාවෙන් හා පුළුල් දැක්මක් සහිතව ආරම්භ කරන ලද කර්තව්‍යයකි. මෙම වැඩසටහන තුළින් පිරිසිදු ජලධාරාවක් මෙන්ම ජෛව විවිධත්වයෙන් සපිරි ගංගා පරිසර පද්ධතියක් බිහි කිරීමට අපේක්ෂිතය. මේ අනුව මෙම වැඩසටහන පරිසරය සංරක්ෂණය කරමින් රට සංවර්ධනය කරා මෙහෙයවීම සඳහා වන ඉලක්ක සපුරාගැනීමට සැකසුනු ප්‍රධාන වැඩසටහනකි.

D. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මෙහෙයුම් යාන්ත්‍රණය

"සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ ප්‍රධාන ස්ථර (කමිටු) 03 ක් හරහා මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වේ.

- ජාතික මට්ටමින් ස්ථාපිත අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව.
- දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් කමිටුව.

• ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය කමිටුව.

සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන ජාතික මට්ටමින් මෙහෙයවීම සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් **අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුවක්** ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ ලේකම්වරයා වශයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබයි. සුරකිමු ගංගා වැඩසටහනට අදාල සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන් හෝ එම ලේකම්තුමා විසින් නම් කරන ලද අතිරේක ලේකම්වරයෙකු මෙම කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කරනු ලබයි. අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව මාස දෙකකට වරක් රැස් වේ.

මෙම ජාතික වැඩසටහන රට තුළ කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් "**සුරකිමු ගංගා දිස්ත්‍රික් කමිටු**" 25 ක් පිහිටුවා ඇත. මෙම කමිටුව දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වන අතර මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයේ අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂවරයකු ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි. කමිටුවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සංයුතියකින් යුතු මෙම කමිටුව මසකට වරක් රැස් වේ.

මෙම වැඩසටහනේ ප්‍රධාන සහ බිම් මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමිවන්නේ **සුරකිමු ගංගා ප්‍රාදේශීය කමිටුව** වෙතයි .ඒ අනුව ගංගා සංරක්ෂණය කර කළමනාකරණය කිරීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කමිටු 310ක් පිහිටුවා ඇත. තවද මේ සඳහා අදාළ වන සියළුම ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද මෙම කමිටුව මඟින් සිදුකෙරේ.

සුරකිමු ගංගා ජාතික පාරිසරික වැඩසටහන ක්‍රියාත්මක කරවීම හා මෙහෙයවීම, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කමිටු, අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව හා සම්බන්ධීකරණය ආදී කටයුතු සඳහා "**සුරකිමු ගංගා" ලේකම් කාර්යාලය** පිහිටුවා ඇති අතර මෙම කාර්යාලය, බත්තරමුල්ල පිහිටි මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ස්ථානගත කර ඇත.

E. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ ප්‍රගතිය

1. "සුරකිමු ගංගා" ජාතික සමාරම්භක උත්සවය

"සුරකිමු ගංගා" ජාතික සමාරම්භක උත්සවය ඓතිහාසික රුහුණු කතරගම පූජා භූමිය ආශ්‍රිතව මැණික් නදිය කේන්ද්‍ර කරගෙන අතිගරු ජනාධිපතිතුමා සහ අදාළ ආයතන වල රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2021 මාර්තු මස 22 වන දින පවත්වන ලදී.

එහිදී පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කතරගම මහාදේවාලයයේ දියවඩන නිළමේතුමා හා එක්ව පහත සඳහන් සංරක්ෂණ විශේෂාංග ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

• මැණික් ගඟ ආශ්‍රිතව බැතිමතුන්ට ගිමන් හැරීම සඳහා උද්‍යානයක් (River Park) ඉදිකිරීම

• ගඟ දෙපස පැති බැම් (Gabion Wall) ඉදිකිරීම

• පූජා භූමිය ආශ්‍රිත ගං ඉවුරු වල කුඹුක් ගස් සියයක් සිටුවීම හා නඩත්තු වැඩ පිළිවෙලක් හඳුන්වා දීම

• GPS තාක්ෂනය ඔස්සේ පරිසර ආරක්ෂණ කළාප ලෙස නම් කල යුතු ස්ථාන සලකුණු කිරීම

• ගඟේ ඉහළ සහ පහල හඳුනාගත් ස්ථාන දෙකක ගඟ හරහා ආරක්ෂිත දැල් දෙකක් සවි කිරීම

• ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය යටතේ ශිල්පිය ක්‍රම මගින් පමණක් වැලි ගොඩදැමීමට ක්‍රියාමාර්ග සැලසීම

• ප්‍රධාන තොටුපල වලට අමතරව අනෙක් තොටුපළවල් ආශ්‍රිතව අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා කසල බඳුන් ස්ථාපනය.

• මහා දේවාලය හා පූජා භූමිය ආශ්‍රිතව බැහැරලන පළතුරු සතුන්ගේ ප්‍රයෝජනය සඳහා කැලයට මුදාහැරීම සහ ඉතිරි පළතුරු ප්‍රාදේශීය සභාව මගින් ප්‍රතිචක්‍රීකරණයට පියවර ගැනීම

• ප්ලාස්ටික් මල් හා ප්ලාස්ටික් මල් මාලා වෙනුවට ස්වභාවික මල් හා ප්‍රතිචක්‍රීකරණය කල හැකි මල් පමණක් පූජ කිරීම දිරිගැන්වීමට ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම

• "සුරකිමු ගංගා" ජාතික සමාරම්භක උත්සවයට සමගාමීව අනෙක් පළාත් 08 තුළද ඒ ඒ පළාත් වලට සුවිශේෂිත වූ ගංගා මුලිකකොට ගනිමින් සමාරම්භක උත්සව පවත්වන ලදී.






ජාතික සමාරම්භක උත්සවය - උගව පළාත

"සුරකිමු ගංගා" පළාත් සමාරම්භක උත්සව

වගුව **43 :** "සුරකිමු ගංගා" පළාත් සමාරම්භක උත්සව

පළාත	**සමාරම්භක උත්සව පවත්වන ලද ස්ථාන**
බස්නාහිර පළාත	සීතාවක සහා බල ප්‍රදේශයට අයත් කැළණි ගඟට යාබද පහළ හංවැල්ල ප්‍රදේශයේ ස්ථානයක්
දකුණු පළාත	අම්බලන්තොට නගරය ආසන්නයේ ගං ඉවුර
නැගෙනහිර පළාත	අම්පාර දිස්ත්‍රික්කයේ , අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගල්ඔය ගඟ අසබඩ දී
සබරගමුව පළාත	සමන් දේවාලය අසබඩ දී
වයඹ පළාත	බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දැදුරු ඔයට මායිම් වන කඩුක්කුලිය ග්‍රාමීය ජල යෝජනා ක්‍රමය අසලදී
මධ්‍යම පළාත	ගන්නොරුව යුධ හමුදා කඳවුර අසල මහවැලි ගංඟා අසබඩ දී
උතුරු පළාත	කිලිනොච්චි දිස්ත්‍රික්කය තුල කනකරයන් ආරු ගි ද්‍රි ආරු අසබඩ දී (Dri Aru)
උතුරු මැද පළාත	අනුරාධපුර බන්ධනාගාර පරිශ්‍රයේ මල්වතුඔය අසබඩ දී





රූපය **62 :** බස්නාහිර පළාත් සමාරම්භක උත්සවය




රූපය **63 :** සබරගමු පළාත් සමාරම්භක උත්සවය




රූපය **64 :** නැගෙනහිර පළාත් සමාරම්භක උත්සවය




රූපය **65 :** වයඹ පළාත් සමාරම්භක උත්සවය




රූපය **66 :** උතුරු පළාත් සමාරම්භක උත්සවය




රූපය **67 :** උතුරු මැද පළාත් සමාරම්භක උත්සවය




රූපය **68 :** දකුණු පළාත් සමාරම්භක උත්සවය




රූපය **69 :** මධ්‍යම පළාත් සමාරම්භක උත්සවය

2. “සුරකිමු ගංගා” භූගෝලීය තොරතුරු තාක්ෂණික (GIS) වෙබ් අඩවිය

ශ්‍රී ලංකාවේ ගංගා සංරක්ෂණයේ ප්‍රමුඛතම වැඩසටහන වශයෙන් “සුරකිමු ගංගා” වැඩසටහනේ අවකාශීය දත්ත සහ තොරතුරු රැස්කිරීම, කළමනාකරණය සහ ඉදිරිපත් කිරීම සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික පහසුකම් භාවිතයෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර තිබේ. මෙම පද්ධතිය ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට, වාර්තා කිරීමට මෙන්ම මහජනතාවට ද ව්‍යාපෘති ප්‍රගතිය නිරීක්ෂණය කළ හැකි පරිදි ජනතාවට විවෘත වෙබ් අඩවියක් ලෙස පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මෙමගින් සපයනු ලබන සේවාවන් වන්නේ,

- ගංගාවල දූෂණ මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා සිදුකරන ලද සමීක්ෂණ දත්ත හා තොරතුරු ලබාගැනීම
- අලුතින් හඳුනාගනු ලබන දූෂණ මූලාශ්‍ර වාර්තා කිරීම
- ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය කමිටු සාමාජිකයින්ගේ තොරතුරු ලබාගැනීම
- ව්‍යාපෘති යෝජනා ලබාදීම සහ ලබාදී ඇති ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය
- ව්‍යාපෘති කටයුතු වල ප්‍රගතිය වාර්තා කිරීම සහ ප්‍රගතිය පසුවිපරම් කිරීම
- “සුරකිමු ගංගා” මාර්ගෝපදේශය සහ ව්‍යාපෘති යෝජනා ආකෘති පත්‍ර බාගත කිරීම
- මහජනතාවට පාරිසරික ප්‍රශ්න පිළිබඳව තොරතුරු වාර්තා කළ හැකි වීම

ඉහත සේවාවන් ලබාගැනීම සඳහා “සුරකිමු ගංගා” භූගෝලීය තොරතුරු තාක්ෂණික වෙබ් අඩවියට https://surakimuganga.maps.arcgis.com සබැඳිය ඔස්සේ සම්බන්ධ වීමේ හැකියාව ඇත.

3."සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ ප්‍රාදේශීය කමිටු සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සහ බෙදාහැරීම

ජාතික වශයෙන් ගංගා පිළිබඳ හඳුනාගත් ගැටළු සඳහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වැඩපිළිවෙලක් සකස් කර ව්‍යාපෘති යෝජනා හරහා එය ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය කමිටු වල මූලික කාර්යභාරය වේ. ඒ අනුව එකී කමිටු නියෝජිතයින් එකම අරමුණකට අනුව ක්‍රියාත්මක වී නිවැරදි ලෙස ව්‍යාපෘති වාර්තා සකස් කිරීම වෙනුවෙන් “සුරකිමු ගංගා” මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කරන ලදී. 2021 වසර තුළ සිංහල මාධ්‍යයෙන් පිටපත් 3000 ක් ද දමිළ මාධ්‍යයෙන් පිටපත් 1500 ක් ද මුද්‍රණය කර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ මධ්‍යම පරිසර අධිකාරියේ සියලුම දිස්ත්‍රික් සහ පළාත් කාර්යාල වෙත බෙදාහරින ලදී.

4.“සුරකිමු ගංගා” ජාතික පාරිසරික වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා වල ප්‍රගතිය.

2021 වර්ෂය සඳහා “සුරකිමු ගංගා” ප්‍රාදේශීය කමිටු මගින් ව්‍යාපෘති යෝජනා 118ක් ඉදිරිපත් වී තිබූ අතර ඉන් ව්‍යාපෘති යෝජනා 86ක් ව්‍යාපෘති ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. එම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා වලින් ව්‍යාපෘති 50 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත කරන ලදී.

අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක වන ස්ථාන සහිත ශ්‍රී ලංකා සිතියම



රූපය **70 :** අනුමත කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක වන ස්ථාන සහිත ශ්‍රී ලංකා සිතියම

වගුව **44 : 2021** වසර තුළ ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා **50** ක් "සුරකිමු ගංගා" ව්‍යාපෘති ඇගයීම් කමිටුව මගින් අනුමත කරන ලදුව ප්‍රතිපාදන නිදහස් කර ඇත.

	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සංරක්ෂණය වන ගංගාව/ඇල ඔය	ව්‍යාපෘතිය	අනුමතකළ ප්‍රතිපාදන රු.
1	බස්නාහිර පළාත	කොළඹ	සීතාවක	වක් ඔය	සූකර පාලනය හේතුවෙන් වක් ඔය හරහා කැළණිගඟට සිදුවන දූෂණය පාලනය	5,210,000.00
2			කොළඹ	කැළණි ගඟ සම්හන්ධ ඇල මාර්ග	කැලණි ගඟ සම්හන්ධ ඇල මාර්ග 03ක් සඳහා කසල බාධක ඉදිකිරීම	2,618,000.00
3		ගම්පහ	දොම්පේ	පහුරු ඔය	මල්වාන පාලම අසල ආරක්ෂිත දැල් වැටක් සවිකිරීම	1,230,000.12

	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සංරක්ෂණය වන ගංගාව/ඇල ඔය	ව්‍යාපෘතිය	අනුමතකළ ප්‍රතිපාදන රු.
4			බියගම	පහුරු ඔය	මල්වාන ආශ්‍රිත ඉවුර ආරක්ෂා කිරීම සඳහා ගේබියන් බැම්මක් දැමීම	8,782,595.91
5			මීරිගම	ඇල්ලේ ඔය	ඇල්ලේ ඔයෙහි මුරුතවෙල ඇනිකට්හි ජලයේ පාවීඵන ප්ලාස්ටික් සහ පොලිතීන් එක්රැස් කිරීමට ආරක්ෂිත දැලක් සවිකිරීම	300,000.00
6			ජා ඇල	ජා ඇල	ජා ඇල පාලම අසල ජලයේ පාවීඵන ප්ලාස්ටික් සහ පොලිතීන් එක්රැස් කිරීමට ආරක්ෂිත දැලක් සවිකිරීම	431,773.00
7			කැළණිය	කැළණි ගඟ	කැළණි ගඟ වෙත මළ අපද්‍රව්‍ය එකතුවීම වැලැක්වීමේ ව්‍යාපෘතිය	19,271,412.00
8		කළුතර	පාලින්දනුවර	ලත්පදුර ඇල	ලත්පදුර කඩවීදිය ඇල මාර්ගය පවිත්‍ර කිරීම හා ඉවුරු සංරක්ෂණය	864,000.00
9			මතුගම	රන්වලාගල ඇල්ල	රන්වලාගල ඇල්ල පෝෂිත ප්‍රදේශය සංරක්ෂණය	1,676,650.00
10			මදුරාවෙල	කළු ගඟ	නාර්තුපාන කළු ගඟ ඉවුර සංරක්ෂණය කිරීම	1,573,986.68
11	මධ්‍යම පළාත	නුවර එළිය	නුවර එළිය	ග්‍රෙගරි වැව ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශ	ග්‍රෙගරි වැව ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශයන්හි කසල අපහරණ වැඩසටහන	3,975,000.00
12			අඹගමුව	සීතගඟුල/ කැළණි ගඟ	නල්ලතන්නිය ප්‍රදේශයේ අපජල කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීම	250,000.00
13		මාතලේ	මාතලේ	සුදු ගඟ/ දියබුබුල ඔය	මාතලේ සුදු ගඟ හා දිය බුබුළ ඔය ඉවුරු සංරක්ෂණය, ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය	1,282,659.00
14			ලග්ගල පල්ලෙගම	-	නකල්ස් සංරක්ෂිත කලාපයේ ඝණ අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම	3,268,749.10
15		මහනුවර	උඩුනුවර	-	උඩුනුවර ප්‍රාදේශීය ඝණ අපද්‍රව්‍ය සහ අප ජල කළමනාකරණ ව්‍යාපෘති ය	3,236,845.00
16	දකුණු පළාත	මාතර	අකුරැස්ස	නිල්වලා ගඟ	නිල්වලා ගඟ සංරක්ෂණ වැඩසටහන	3,365,890.42
17		ගාල්ල	කරන්දෙණිය	හල්වතුර ඇල	හල්වතුර ඇල සංරක්ෂණය කිරීම	4,074,852.00
18		ගාල්ල	බලපිටිය	මාදු ගඟ	මාදුගඟ සංරක්ෂණ වැඩසටහන	2,683,178.00
19		ගාල්ල	අම්බලන්ගොඩ	හල්වතුර ඇල	හල්වතුර ඇල සංරක්ෂණය	7,009,700.00
20		හම්බන්තොට	අම්බලන්තොට	වලවේ ගඟ (2)	වලවේ ගඟ සංරක්ෂණය කිරීම	6,190,038.80
21		හම්බන්තොට	අම්බලන්තොට	වලවේ ගඟ	වලවේ ගඟ සංරක්ෂණය කිරීම	8,659,000.00
22		හම්බන්තොට	ලුණුගම්වෙහෙර	කිරිදි ඔය	කිරිදි ඔය සංරක්ෂණ වැඩසටහන	1,873,000.00

	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සංරක්ෂණය වන ගංගාව/ඇල ඔය	ව්‍යාපෘතිය	අනුමතකළ ප්‍රතිපාදන රු.
23	ඌව පළාත	මොණරාගල	කතරගම	මැණික් ගඟ	මැණික් ගඟ සංරක්ෂණ ව්‍යාපෘතිය	5,450,700.00
24		මොණරාගල	බඩල්කුඹුර	මැණික් ගඟ	මැණික් ගඟ සංරක්ෂණ ව්‍යාපෘතිය	6,756,017.85
25		බදුල්ල	ඇල්ල, හාලිඇල,බදුල්ල,සොරනාතොට,මීගහකිවුල,කන්දකැටිය	බදුලු ඔය	බදුලු ඔය සංරක්ෂණ වැඩසටහන	3,034,704.28
26	උතුරු පළාත	වවුනියා	වවුනියා	පේ ආරු	පේ ආරු සංරක්ෂණය ව්‍යාපෘතිය	1,178,800.00
27		මුලතිවු	ඔඩ්ඩුසුඩාන්	කනකරායන් ආරු	කනකරායන්ආරු සංරක්ෂණ වැඩසටහන	1,008,000.00
28		කිලිනොච්චි	කරච්චි	අක්කරායන් ආරු	අක්කරායන්ආරු සංරක්ෂණ වැඩසටහන	4,113,105.00
29	වයඹ පළාත	කුරුණෑගල	කුලියාපිටිය-බටහිර	කරඔලන් ඔය	කරඔලන් ඔය ආශ්‍රිත කෘෂි රසායන භාවිතයනිසා සිදුවන ජල දූෂණය අවම කිරීම	18,000.00
30			පොල්පිතිගම	මී ඔය	මී ඔයෙහි ආක්‍රමණික ජලජ ශාක ඉවත් කිරීම	615,000.00
31			පොල්පිතිගම	මී ඔය	මී ඔය ආශ්‍රිත කෘෂි රසායන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන	266,000.00
32			කුරුණෑගල	දැදුරු ඔය	ගනේවත්ත මාර්ගයේ දැදුරුඔය පාලම අසල ඝණ අපද්‍රව්‍ය පාලන වැඩසටහන	74,900.00
33			මහව	මී ඔය	වස විසෙන් තොර මී ඔයක්	128,300.00
34			ඉබ්බාගමුව	දැදුරු ඔය	දැදුරු ඔයට කෘෂි අප ජලය එක්වීමෙන් සිදුවන දූෂණය පාලනය කිරීම	277,500.00
35			පඩුවස්නුවර	කරඔලන් ඔය	කරඔලන් ඔයට කෘෂි අප ජලය එක්වීම පාලනය	72,100.00
36			පොල්ගහවෙල	මා ඔය	මහ ඔයෙහි යෝධ නිදික්මිබා ආක්‍රමණික ශාක ඉවත්කිරීම	75,550.00
37	සබරගමුව පළාත	කෑගල්ල	සියළුම ප්‍රා.ලේ	දිස්ත්‍රික්කය තුළින් ගලාබසින අතුගංගා කිහිපයක් ආශ්‍රිතව	කෑගල්ල දිස්ත්‍රික්කයේ පවතින ගංගා හා අතු ගංගා වලට නොදිරන අපද්‍රව්‍ය එක්වීම වැලැක්වීමේ ඒකාබද්ධ වැඩසටහන	7,200,000.00
38		රත්නපුර	බලංගොඩ	වලවේ ගඟ	වලවේ ගඟේ පෝෂිත ඇල මාර්ගයක ජල දූෂණය වැලැක්වීම	3,900,000.00
39		රත්නපුර	කුරුවිට	කුරු ගඟ	කුරුගඟ සංරක්ෂණ ව්‍යාපෘතිය	1,495,400.00
40	උතුරු මැද	අනුරාධපුර	නුවරගම්පළාත	මල්වතු ඔය	මල්වතු ඔය සංරක්ෂණය	3,298,115.75

	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	සංරක්ෂණය වන ගංගාව/ඇල ඔය	ව්‍යාපෘතිය	අනුමතකළ ප්‍රතිපාදන රු.
41	පළාත	අනුරාධපුර	නුවරගම්පළාත	මල්වතු ඔය	මල්වතුඔයට අප ජල මුදාහැරීම් අවම කිරීම	398,824.83
42		පොළොන්නරුව	තමන්කඩුව	මහවැලි ගඟ	දිවුලාන විල්ලුව වෙත අප ජලය එක්වීම පාලන	407,068.80
43	නැගෙනහිර පළාත	මඩකලපුව	පෝරතිවුපත්තු	පාත්තන්තෝඩතානි ගඟ සහ අන්දලු ඔය සංරක්ෂණය	පාත්තන්තෝඩතානි ගඟ සහ අන්දලු ඔය සංරක්ෂණය	1,650,000.00
44		අම්පාර	අම්පාර, දමන, නින්දවූර්, සමන්තුරෙයි, අඩාලච්චේනෙයි	ගල්ඔය	ගල්ඔය සංරක්ෂණ වැඩසටහන	6,819,000.00
45	සබරගමු පළාත	කෑගල්ල	යටියන්තොට	කැළණි ගඟ	ශ්‍රීපාද සමයේ කැළණි ගඟ සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය	346,788.40
46	දකුණු පළාත	ගාල්ල	නාගොඩ	ගිංගඟ	ගිංගඟ ස්වභාවික පරිසර පද්ධතියක් ලෙස සංරක්ෂණය කිරීම	2,205,219.12
47	මධ්‍යම පළාත	නුවරඑළිය	අඹගමුව	සීතගඟුල	නල්ලතන්නිය සිට ශ්‍රීපාදස්ථානය දක්වා මාර්ගයේ ප්ලාස්ටික් බෝතල් එකතු කිරීමේ බඳුන් ස්ථානගත කිරීම	926,972.00
48	සබරගමු පළාත	රත්නපුර	බලන්ගොඩ	වේ ගඟ, වලවේ ගඟ, දොරවෙල ඔය, වේලි ඔය	ප්‍රාදේශීය මට්ටමින් ගංගා ඉවුරු සංරක්ෂණය හා පාංශු බාදනය අවම කිරීම	709,150.00
49	සබරගමු පළාත	රත්නපුර	කල්තොට	වේ ගඟ, වලවේ ගඟ, දොරවෙල ඔය, වේලි ඔය	ප්‍රාදේශීය මට්ටමින් ගංගා ඉවුරු සංරක්ෂණය හා පාංශු බාදනය අවම කිරීම	2,364,650.00
50	සබරගමු පළාත	රත්නපුර	ඇඹිලිපිටිය	චන්ද්‍රිකාවැව	1. චන්ද්‍රිකාවැව පිටවාන ආශ්‍රිතව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 2. පල්ලෙබැද්ද ගිරාඳුර ප්‍රදේශයේ ගඟ ආශ්‍රිත ඝනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 3. ප්ලාස්ටික් හා වීදුරු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් සැකසීම හා පුවරු සකස් කිරීම	388,936.92

5. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ පොදු කර්තව්‍යන්ගේ ප්‍රගතිය

වගුව **45 :** "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ පොදු කර්තව්‍යන්ගේ ප්‍රගතිය

	ප්‍රධාන ක්‍රියාකාරකම	**තොරතුරු / 2021 වසර සඳහා වාර්ෂික ඉලක්ක**	**31.12.2021 දින දක්වා ප්‍රගතිය**
1	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම පැවැත්වීම	දැනුවත් කිරීමේ සැසි 25 ක් පවත්වා ඇත	25
2	"සුරකිමු ගංගා" දිස්ත්‍රික් කමිටු පිහිටුවීම	දිස්ත්‍රික් කමිටු 25 ක් පිහිටුවා ඇත	25
3	"සුරකිමු ගංගා" ප්‍රාදේශීය කමිටු පිහිටුවීම	ප්‍රාදේශීය කමිටු 310	310
4	"සුරකිමු ගංගා" වැඩසටහන සඳහා සකස් කරන ලද මාර්ගෝපදේශය (සිංහල මාධ්‍ය 3000) "සුරකිමු ගංගා" වැඩසටහන සඳහා සකස් කරන ලද මාර්ගෝපදේශය. (දෙමළ මාධ්‍ය 1500)	සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල හා පළාත් කාර්යාල අතර බෙදා හැරීම සිදුකර ඇත.	සම්පූර්ණ කර ඇත
5	ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම්	රැස්වීම් 3 ක් පවත්වා ඇත	3
6	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටු රැස්වීම	පරිසර අමාත්‍යාංශය විසින් සාමාජිකයින් 7 දෙනෙකු පත් කර ඇත	
6.1	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටු රැස්වීම් පැවැත්වීම	රැස්වීම් වාර 10ක් පවත්වා ඇත.	10
6.2	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලැබී ඇති ව්‍යාපෘති යෝජනා ගණන	ව්‍යාපෘති යෝජනා 118 ක් ලැබී ඇත.	118
6.3	ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටුවට යොමු කර ඇති ව්‍යාපෘති යෝජනා ගණන	ලැබී ඇති ව්‍යාපෘති යෝජනා 118න් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති යෝජනා 86 ක් කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.	86
6.4	ඇගයීම් කමිටුව මගින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන	ව්‍යාපෘති යෝජනා 50 ක් අනුමත කර ඇත.	50
7	ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (ව්‍යාපෘති යෝජනා ඇගයීම් කමිටුවේ උපදෙස් පරිදි)	ව්‍යාපෘති පසු විපරම් කිරීම සඳහා ඒකාබද්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන ලදී.	22

6. "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය

වගුව **46 :** "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘති කාලසීමාව	වෙන් කරන ලද ප්‍රතිපාදන (2021) රුපියල් මිලියන	වෙන් කරන ලද ප්‍රතිපාදන	31.12.2021 දිනට ප්‍රගතිය	
			රුපියල්	%
ජනවාරි - දෙසැම්බර් 2021	200 (20 - කළමනාකරණ හා දැනුවත් කිරීම්, 130-ව්‍යාපෘති සහ ප්‍රාදේශීය මට්ටමේ මුදල් වෙන් කිරීම්, 50 – පැළ තවාන් වැඩසටහන සඳහා)	20	19,031,411.18	95.16
		130	137 020 787.75	101.4
		50	ප්‍රතිපාදන පරිසර අමාත්‍යාංශය විසින් පැල තවාන වැඩසටහන සඳහා 2021 අගෝස්තු මස 25 වන දින මාරු කර ඇත	

18.2 පාසල් පරිසර නියමු වැඩසටහන

පරිසර සංරක්ෂණ ක්‍රමවේදයන් පාසල් පද්ධතිය තුළින් අනාගත පරපුරට දායාද කිරීම උදෙසා මධ්‍යම පරිසර අධිකාරිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ ද පූර්ණ සහයෝගය ඇතිව ජාතික පරිසර නියමු වැඩසටහන පාසල් පද්ධතිය තුළට හඳුන්වා දෙන ලදී.

පාසල් සිසුන් පාරිසරික විෂය ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා දැනුම න්‍යායික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සංවර්ධනය කර පාරිසරික දැනුම, ආකල්ප, කුසලතා වලින් හෙබි පාරිසරික සංවේදී පුද්ගලයන් බවට පත් කිරීම මෙම වැඩසටහනේ අභිලාෂය වේ. පාරිසරික පණිවුඩය අනාගත පරපුරට සම්ප්‍රේෂණය

කිරීම හා සමාජගත කිරීම පරිසර නියමු වැඩසටහනේ දීර්ඝකාලීන ප්‍රතිලාභය වේ.

18.3.1. පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහන් හි ප්‍රගතිය

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහන සූම් තාක්ෂණය (Zoom technology) හා වෙනත් තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගෙන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම වසරේ අධ්‍යාපන වර්ෂය 2022 මාර්තු මස දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් අදාළ පදක්කම් පරීක්ෂණ මේ වන විට සිදු කරමින් පවති. කෙසේ වුවද, ජනාධිපති පදක්කම් පරීක්ෂණ පවත්වා ජනාධිපති පදක්කම්ලාභීන් 129 දෙනෙකු තෝරා ගන්නා ලදී.

A. **පෙර පාසල් ගුරු අත්පොත නැවත මුද්‍රණය කිරීම**

පෙර පාසල් දරුවන්ගේ පාරිසරික සංවේදීතාව ඉහළ නැංවීම උදෙසා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පෙර පාසල් වැඩසටහන ආරම්භ කරන ලදී. පෙර පාසල් ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය ගුරු අත්පොත පළමු මුද්‍රණය 2015 වසරේ සිදු කරන ලද අතර තවදුරටත් වැඩසටහන ව්‍යාප්ත කිරීම අරමුණු කර ගෙන මේ වසරේ දී ගුරු අත්පොත් 2000ක් මුද්‍රණය කරන ලදී.



B. **පරිසර නියමු ළමා සමාජ වැඩසටහන**









පිවිතුරු හරිත පරිසරයක් බිහි කිරීම උදෙසා,ප්‍රාථමික අංශයේ 1 වසරේ සිට 6 වසර දක්වා ඉගෙනුම ලබන පාසල්සිසුන්තුළආකල්පමය වෙනසක් ඇති කිරීම

සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකි.මෙම වැඩසටහනට සම්බන්ධ කරගන්නා සිසුන් 6 වසරේ දී පරිසර නියමු වැඩසටහන් සඳහා සම්බන්ධ වේ.

වගුව **47 : 2021** වසරේ දී පරිසර ළමා සමාජ වැඩසටහන සඳහා නිෂ්පාදිත ද්‍රව්‍ය

අ.	සහතික වර්ග	සංඛ්‍යාව
01	තුරුලතා සහතික	85000
03	විහඟ සහතික	25000
03	සොබා සහතික	11000

C. පරිසර නියමු වැඩසටහනට අදාළ ද්‍රව්‍ය නිෂ්පාදනය

පරිසර නියමු වැඩසටහනට ඇතුළත් වන නියෙමුවෙකුට සහතික 05ක් දිනාගැනීමට අවස්ථාව සැලසේ. ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පදක්කම්ලාභීන් සඳහා අවශ්‍ය සහතික හා පදක්කම් මධ්‍යම පරිසර අධිකාරියේ පළාත්/දිස්ත්‍රික් කාර්යාල මගින් පාසල් වෙත ලබා දේ.

වගුව **48 : 2021** වසරේ දී පරිසර නියමු වැඩසටහන සඳහා නිෂ්පාදිත ද්‍රව්‍ය.

අ.	නිෂ්පාදිත ද්‍රව්‍ය	සංඛ්‍යාව
01	පරිසර නියමු සටහන් පොත්	80000
02	පරිසර නියමු හිස්වැසුම්	53000
04	පරිසර නියමු පදක්කම	80000
05	හරිත සහතික	50000
06	හරිත පදක්කම	50000
07	රජත සහතික	25000
08	රජත පදක්කම	25000
09	ස්වර්ණ සහතික	1500
10	ස්වර්ණ පදක්කම	1500
11	පරිසර නියමු ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය	1500
	පරිසර නියමු ගුරුවරුන් සඳහා සහතික පත්‍ර	2500
12	පරිසර ධජ	2000

D. විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්

2021 වසර ආරම්භයේ දී පරිසර ළමා සමාජ ගුරුභවතුන්, පරිසර නියමු කාර්යභාර ගුරුභවතුන්, විදුහල්පතිවරුන් හා පරිසර නියමු නායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදි. පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් විදුහල්පතිවරුන් 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

E. පදක්කම් පරීක්ෂණ පැවැත්වීම

ජනාධිපති පදක්කම් පූර්ව පරීක්ෂණ 05ක්, ජනාධිපති පදක්කම් පරීක්ෂණ 12ක්, හරිත පදක්කම් පරීක්ෂණ 50ක්, රජත පදක්කම් පරීක්ෂණ 31 ක් හා ස්වර්ණ පදක්කම් පරීක්ෂණ 14ක් පවත්වන ලදී.

F. ජාතික අධ්‍යාපන විද්‍යායීය ශික්ෂණලාභීන් පුහුණු වැඩසටහන්

පරිසර නියමු වැඩසටහනට සමගාමී නව වැඩසටහනක් ලෙසින් "හරිත නායක" 2020 වැඩසටහන අධ්‍යාපන විද්‍යායීයවලට .වසරේදී හඳුන්වා දීමට සැලසුම් කරන ලදි පැවති කොරෝනා වසංගත තත්ත්වය වසරේ දී 2021 හේතුවෙන් මෙම වැඩසටහන හඳුන්වා දීමටකටයුතු කරන ලදි ,ඒ අනුව . අධ්‍යාපන විද්‍යායීය කථිකාචාර්යවරුන් පුහුණු 3ක් ක්‍රියාත්මක කිරීමට කිරීමේ වැඩසටහන් වසංගත තත්වය හේතුවෙන් ථිකාචාර්යවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් දෙනෙකුගේ 33 සහභාගිත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවනාගාරයේදී අප්‍රේල් දින පවත්වන ලදි 22 මස.



G. **දිස්ත්‍රික් පරිසර නියමු පුවත්පත මුද්‍රණය කිරීම**

දිස්ත්‍රික්කය තුළ පරිසර නියමු වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් හි එකතුවක් ප්‍රකාශයට පත් කිරීමත් අත්දැකීම් හා දැනුම බෙදා ගැනීමත් අරමුණු කර ගෙන දිස්ත්‍රික්ක 25 හි පරිසර නියමු පුවත්පත් 25ක් නිකුත් රන ලදී.එක් දිස්ත්‍රික්කයකින් පිටපත් 1000ක් පමණ නිකුත් කරන අතර දිස්ත්‍රික්කයේ පාසල් හා රාජ්‍ය ආයතන අතර මෙම පුවත්පත බෙදා හැරේ.

H. **පරිසර නියමු කොමසාරිස්වරුන් හා සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

හම්බන්තොට, ගාල්ල, මාතර, මන්නාරම හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි වැඩසටහන් 5ක් පවත්වන ලදි.

I. **පරිසර නියමු කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් උපදේශකවරුන් සඳහා වාර්ෂික ප්‍රවාහන දීමනා ලබා දීම.**

පරිසර නියමු කොමසාරිස්වරුන් හා උපදේශකවරුන් 50 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවකට මේ වසරේ දී ප්‍රවාහන දීමනා ලබා දෙන ලදි.

J. **ජාතික පරිසර නියමු මෙහෙයුම් කමිටුව**

2004 වසරේ පරිසර නියමු වඩසටහන පිළිබඳ ස්වාධීන අධ්‍යයනයක් සිදු කර එහි නිර්දේශ අනුව, පරිසර නියමු වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සැකසීම අරමුණු කරගෙන ජාතික පරිසර නියමු මෙහෙයුම් කමිටුව ස්ථාපනය කරන ලදි. වසරකට කමිටු රැස්වීම් 02ක් පවත්වන අතර 2021 වසරේ දී එක් රැස්වීමක් පවත්වන ලදි.

K. **ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම**

පරිසර නියමු වැඩසටහනේ දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, දත්ත යාවත්කාලීන කිරීම හා දත්ත හුවමාරු කර ගැනීමඅරමුණු කර ගෙන ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය 2021 වසරේ දී වැඩිදියුණු කරන ලදි.

L. **ජනාධිපති පදක්කම්ලාභී සංසදය මගින් පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම**

පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභීන් විසින් පිහිටුවා ගන්නා ලද පරිසර නියමු සංසද මගින් දිස්ත්‍රික් මට්ටමේ විවිධ පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කරයි.

ඒ අනුව, 2021 වසරේ දී කොළඹ, කළුතර, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල, හම්බන්තොට හා මාතර යන දිස්ත්‍රික්ක 9 හි නාගරික තුරුවියන් රැක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.



18.3.2. මාධ්‍ය වැඩසටහන

A. පොත් ප්‍රකාශයට පත් කිරීම

1. **"පරිසරය පිළිබඳ සර්ව ආගමික ඉගැන්වීම් "**

පරිසරය පිළිබඳ විවිධ ආගමික ඉගැන්වීම් ඒකරාශි කරමින්මෙම ග්‍රන්ථය සම්පාදනය කරන ලද අතර ආගමික ඉගැන්වීම් හා පරිසර සංරක්ෂණය අතර අන්තර් සම්බන්ධතාව සමාජගත කිරීම මෙහි මූලික අරමුණ වේ. සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදි.



රූපය **71 : 1.**"පරිසරය පිළිබඳ සර්ව ආගමික ඉගැන්වීම්" ග්‍රන්ථය

2. මධ්‍යමපරිසරඅධිකාරියේ 40 වනසංවත්සර සැමරුම් ග්‍රන්ථය

මධ්‍යම පරිසර අධිකාරියේ 40 වසරක ගමන්මග සැමරීම නිමිත්තෙන් මෙම පොත ප්‍රකාශයට පත් කරන ලදි. දැනට වසර 40කට පෙර කොළඹ මාලිගාවත්තෙන් ඇරඹී මධ්‍යම පරිසර අධිකාරිය දශක 4ක කාලයක් තිස්සේ ජාතික සංවර්ධනය උදෙසා දායක වෙමින් පරිසර සංරක්ෂණය වෙනුවෙන් ඉටු කරන ලද සුවිශේෂී කාර්යභාරය මෙම ග්‍රන්ථයට ඇතුළත් කර ඇත.

3. ජනාධිපතිපදක්කම්ප්‍රදානෝත්සවය පිළිබඳ ග්‍රන්ථය

පරිසර නියමු වැඩසටහනේ ඉහළම පදක්කම වන ජනාධිපති පදක්කම අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති මන්දිරයේ දී පැවැත්වේ.ඒ අනුව පසුගිය වසරවල ජනාධිපති පදක්කම්ලාභීන්ගේ තොරතුරු ඇතුළත් කරමින් මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදි. ජනාධිපති පදක්කම ලබා ඇති නියමු නාම ලේඛන, අදාළ පාසල් මෙන්ම ඊට දායක වූවන්ගේ තොරතුරු ද මෙම ග්‍රන්ථයට ඇතුළත් කර ඇත.



4. "ගෙත්තමක සිත්තම" පාරිසරිකරූසටහන්ග්‍රන්ථය

ජ්‍යෙෂ්ඨ පාරිසරික නීතිඥ ආචාර්ය, ජගත් ගුණවර්ධන මහතා විසින් අදින ලද විහඟ චිත්‍ර ඇතුළත් "ගෙත්තමක සිත්තම" පාරිසරික සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදි. පරිසර විෂයය ක්ෂේත්‍රයේ සෞන්දර්යාත්මක ප්‍රකාශනයක් පත් කරන ලදි.



B. ගුවන්විදුලි වැඩසටහන් විකාශනය කිරීම.

"සංහිත", "මිටියාවත" හා "පරිසර වියමන" ලෙස වැඩසටහන් 03ක් විකාශනය කරන ලදි.

1. "සංහිත" ගුවන්විදුලි වැඩසටහන

පරිසර නියමුවන්ගේ නායකත්ව ගුණාංග වර්ධනයටත්, පරිසර නියමු වැඩසටහන ප්‍රවර්ධනය කිරීමත් උදෙසා "රන්ගිරි ශ්‍රී ලංකා" ගුවන්විදුලි නාළිකාව ඔස්සේ සතිපතා සෑම සෙනසුරාදාවකම විකාශනය කරන ලදි. මධ්‍යම, වයඹ, උතුරුමැද හා නැගෙනහිර පළාත් හි පරිසර ක්‍රියාකාරකම් සඳහා වැඩි ප්‍රමුඛතාව ලබා දෙන ලදි.

2. "මිටියාවත"ගුවන්විදුලි වැඩසටහන

පරිසර විෂය ක්ෂේත්‍රයට අදාළ විවිධ මාතෘකා පිළිබඳව නාට්‍යානුස්වරූපයෙන් ඉදිරිපත් කරන ලද චින්දනාත්මක පරිසර වැඩසටහනකිත ශ්‍රී ලංකා ගුවන් විදුලියේ වෙළඳ සේවය ඔස්සේ 2021 සැප්තැම්බර් මස සිට 2022 ජනවාරි මාසය දක්වා සෑම සෙනසුරාදාවකම එෆ් එම් 94.3 හා 94.5 ඔස්සේ පෙ.ව. 8.30ට ප්‍රචාරය කරන ලද පැය ¼ ක ගුවන් විදුලි වැඩසටහනකි.

3. "පරිසර වියමන" ගුවන්විදුලි වැඩසටහන

කොවිඩ්වසංගත තත්ත්වය හමුවේ මෙරට පාසල් දරුවන්ගේ අධ්‍යයන කටයුතු අඩාල වීම වළක්වාලමින් ඔවුන් වෙත දැනුම ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් Vision FM නමින් නව ගුවන් විදුලි නාළිකාවක් ආරම්භ කරන ලදි. එම එෆ් එම් නාළිකාව ඔස්සේ 2021 ඔක්තෝම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා දිනපතා පෙ.ව. 6.25ට ප්‍රචාරය කරන ලද පරිසර අධ්‍යාපන වැඩසටහනකි.

G. රූපවාහිනී වැඩසටහන් විකාශනය කිරීම - "තක්ෂිලාව" (සිංහල හා දෙමළ) සහ "මිස්ටර් ග්‍රීන්"

1. "තක්ෂිලාව" පරිසර අධ්‍යාපනික වැඩසටහන් මාලාව

පරිසර නියමු පදක්කම් ක්‍රියාවලිය පිළිබඳ පැය ½ක කාලයක් තුළ ඉදිරිපත් කරන ලද නව පරිසර අධ්‍යාපනික වැඩසටහනකි. ස්වාධීන රූපවාහිනී නාළිකාව ඔස්සේ සැප්තැම්බර් 09 සිට නොවැම්බර් 14 දක්වා වැඩසටහන් 10ක් ද, වසන්තම් ටීවී නාළිකාව ඔස්සේ (දෙමළ) වැඩසටහන් 7ක් ලෙසින් විකාශනය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව 17කි.

2. "මිස්ටර් ග්‍රීන්"

විනාඩි 5ක කාලයක් තුළ පරිසර සංරක්ෂණයට අදාළව ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලද කෙටි පණිවුඩ, රූපවාහිනී පණිවිඩ ස්වාධීන රූපවාහිනී, ජාතික රූපවාහිනිය හා ස්වර්ණවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදි.

H. රූපවාහිනී වෙළඳ ප්‍රචාරය

පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා,කෙටි පාරිසරික පණිවුඩ,ස්වාධීන රූපවාහිනිය, දෙරණ, සිරස, හිරු, ස්වර්ණවාහිනි හා හරිත රූපවාහිනි මාධ්‍යය ඔස්සේ විකාශනය කරන ලදි.

I. පොලිතීන් භාවිතය අවම කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන

පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පාසල් තුල ක්‍රියාත්මක කරන ලදි.

J. **පුවත්පත් අතිරේක**

පරිසර නියමු ජනාධිපති පදක්කම සම්පූර්ණ කිරීම සඳහා පදක්කම්ලාභියා විසින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතුය. මෙම ව්‍යාපෘති අතරින් ප්‍රශස්ත මට්ටමේ ව්‍යාපෘති 17ක් තෝරා එම ව්‍යාපෘති දිනමිණ හා තිනකරන් පුවත්පත් හි අතිරේක පිටුවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

18.3.2. වෙනත් වැඩසටහන්

විජය ළමා පුවත්පතේ ‘‘සංහිත‘‘පරිසර පිටුවේ සතිපතා පුවත්පත් අතිරේක පලකිරීම.

විදුසර විද්‍යා සහරාවේ පරිසර නියමු වැඩසටහනට අදාල පුවත්පත් අතිරේක සතිපතා පලකිරීම.

18.3 පාරිසරික අධ්‍යාපන, දැනුවත්කිරීම් සහ ජනාධිපති පරිසර සම්මාන වැඩසටහන.

18.4.1 අධ්‍යාපනික ද්‍රව්‍ය සංවර්ධනය කිරීම සහ නැවත මුද්‍රණය කිරීම (පෝස්ටර්, පත්‍රිකා සහ පොත් පිංච)

පාරිසරික අධ්‍යාපනය යනු දැනුම, කුසලතා සහ ආකල්ප ලබා ගැනීමේ ක්‍රියාවලියක් වන අතර එය පරිසරයේ ගුණාත්මක **බව ඉහළ නැංවීමට සහ පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමට** යොදා ගත හැකිය. පෝස්ටර් සහ පත්‍රිකා යනු **දැනුම ව්‍යාප්ත කිරීම සඳහා අතිමහත්** ලෙස භාවිතා වන හොඳ අධ්‍යාපනික ද්‍රව්‍ය වේ. මෙම ක්‍රියාකාරකම යටතේ. පරිසර ප්‍රවර්ධන ඒකකය මගින් 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පෝස්ටර්, පත්‍රිකා, වීඩියෝ සහ අනෙකුත් අධ්‍යාපනික ද්‍රව්‍ය පහත පරිදි නිෂ්පාදනය කරන ලදී.

A. **PET සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අධ්‍යාපන ද්‍රව්‍ය සකස් කිරීම.**

මුද්‍රිත මාධ්‍ය හරහා දැනුම බෙදා හැරීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින් **පරිසර** අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ **පරිසර** ප්‍රවර්ධන ඒකකය විසින් “ප්ලාස්ටික් සහ PET අපද්‍රව්‍ය කළමනාකරණය” පිළිබඳ නව පෝස්ටර් 6ක් සකස් කිරීමට දායක විය. මෙම පෝස්ටර් සිංහල සහ දෙමළ මාධ්‍යවලින් මුද්‍රණය කර ඇත. සාමාන්‍ය ජනතාව සඳහා වඩාත් ඵලදායී දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පුළුල් ප්‍රේක්ෂක පිරිසක් ඇමතීමට එක් එක් පෝස්ටරයට අදාළ වීඩියෝ දර්ශන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් නිෂ්පාදනය කරන ලදී. ඉහත සඳහන් පෝස්ටර් සහ අදාළ වීඩියෝ දර්ශන ප්‍රධාන වශයෙන් පාසල් සිසුන්ගේ දැනුවත් කිරීමේ මට්ටම ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ නිවෙස්වලට පණිවිඩ යැවීම සඳහා යොදා ගැනේ. TOT වැඩසටහන් සඳහා මෙම පෝස්ටර් භාවිතා කිරීම සඳහා PET සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රජා පුහුණු අත්පොතක් සිංහල මාධ්‍යයෙන් සහ දෙමළ මාධ්‍යයෙන් සම්පාදනය කර මුද්‍රණය කරන ලදී. මෙම අධ්‍යාපන ද්‍රව්‍ය සියල්ල මධ්‍යම පරිසර අධිකාරියසහ ආසියාවේ සොලිඩරිඩෑඩිජාලයේ සහයෝගිතා ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ මධ්‍යම, ඌව සහ වයඹ පළාත් සභා සමඟ එක්ව නිෂ්පාදනය කර ප්‍රකාශයට පත් කරන ලදී. මේ වන විට “හරිත ටීවී” නාලිකාවේ වීඩියෝ විකාශය වේ. ව්‍යාපෘතියේ අරමුණු අනුව පෝස්ටර් සහ පුහුණු අත්පොත් බෙදා දී ඇත.



රූපය **72 : PET** සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පෝස්ටර් සහ ගුරු පුහුණු අත්පොත

B. අත්පිටපත් සහ සජීවිකරණ වීඩියෝ සකස් කිරීම.

2021 වර්ෂයේදී තනි භාවිත ප්ලාස්ටික් නිෂ්පාදන වර්ග හතරක් තහනම් කරන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රවර්ධන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා, පරිසර ප්‍රවර්ධන ඒකකයවිසින් රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත්පත් වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම සඳහා එක්සත් රාජධානියේ අරමුදල් සපයන ව්‍යාපෘතියක් (Cefas) සමඟ සම්බන්ධීකරණය කරන ලදී. දෙරණ TV, ස්වර්ණවාහිනී, සිරස TVවැනි ප්‍රමුඛ පෙළේ රූපවාහිනී නාලිකා කිහිපයකම ඉහත වෙළඳ දැන්වීම් විකාශය විය. තවද, නිෂ්පාදනය කරන ලද ද්‍රව්‍ය විවිධ මාධ්‍ය මධ්‍යස්ථාන සමඟ බෙදා හැරීම සඳහාත්, ජනප්‍රිය කිරීම සඳහාක්පරිසර ප්‍රවර්ධන ඒකකයසෙෆාස්ව්‍යාපෘතියසමඟ සම්බන්ධීකරණය කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලද ෂොපින් බෑග් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැන්වීම රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, හරිත TV සහ සිරස TV ඔස්සේද විකාශය විය.

C. පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳ කෙටි වාර්තා වීඩියෝ දර්ශන සකස් කිරීම.

ක්ෂේත්‍ර වෘත්තිකයන්ගේ ප්‍රවීණත්වය ලබා ගනිමින් තලංගම සහ වලව්වත්තවතුරාන පරිසර ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳ කෙටි වාර්තා වීඩියෝ පට 2 ක් සිංහල මාධ්‍යයෙන් සහ දමිළ මාධ්‍යයෙන් නිෂ්පාදනය කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේමුහුණු පොත සහ යූ ටියුබ්වෙත මෙම වාර්තා චිත්‍රපට හඳුන්වා දී ඇත.





රූපය **73 :** පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳ වාර්තා චිත්‍රපට

D. සම්මානලාභී ගීත තුනක් රූපරවනය කිරීම.

2020 ලෝක පරිසර දිනයේදී සම්මාන ලද ගීත සඳහා දෘශ්‍ය වීඩියෝ පට 3ක් පුහුණු කලාකරුවන්ගේ සහ වෘත්තිකයන්ගේ ප්‍රවීණත්වය ලබා ගනිමින් නිෂ්පාදනය කරන ලදී. මෙම වීඩියෝ මධ්‍යම පරිසර අධිකාරියේ මුහුණු පොතසහ "හරිත TV" වෙත හඳුන්වා දී ඇත.



රූපය **74 :** සම්මානලාභී ගීතවල වීඩියෝ දර්ශන

E. ජලගෝලය පිළිබඳ කෙටි වාර්තාමය වීඩියෝ සකස් කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි නව විෂය මාලාවට හඳුන්වා දුන් නව විෂය නිර්දේශයට පහසුකම් සැලසීම සඳහා ජලගෝලය පිළිබඳ කෙටි අධ්‍යාපනික වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කරන ලදී.



රූපය **75 :** ජලගෝලය පිළිබඳ අධ්‍යාපනික වාර්තා චිත්‍රපටිය

18.4.2 සොබාක්ෂේත්‍ර මධ්‍යස්ථානවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සොබාක්ෂේත්‍ර මධ්‍යස්ථාන පුළුල් ලෙස භාවිතා කරනුයේ ප්‍රායෝගික ආකාරයෙන් දැනුවත්භාවය ගොඩනැගීමට අවස්ථා ලබා දීම සඳහා ය. පරිසර ප්‍රවර්ධන ඒකකයයටතේ ක්‍රියාත්මක වන සොබාක්ෂේත්‍ර මධ්‍යස්ථාන 4ක් ඇත. පවතින වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේදී පහත සඳහන් පරිදි වැඩසටහන් 6ක් පමණක් පවත්වන ලදී.

රූමස්සල	3
කෑගල්ල	1
අත්තිඩිය	2
කුණ්ඩසාලේ	-

318.4.3 වත්මන් ගැටළු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

පාරිසරික අධ්‍යාපනයේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වල වැදගත්කම අවබෝධ කර ගනිමින්, පහත දැක්වෙන පරිදි වර්තමාන පාරිසරික ගැටළු විසඳීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකයවිසින් විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා සහභාගීත්ව වැඩසටහන් පවත්වයි.

A. මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

නිවසේ සිට වැඩ කරන කාලය තුළසහභාගිවන්නන් යම් ස්ථානයකට එක්රැස් කිරීම වෙනුවට, පවතින කොවිඩ්වසංගත තත්ත්වයන් හේතුවෙන් ZOOM සහ TEAMS තාක්ෂණය භාවිතා කරමින් මාර්ගගත පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීමට පරිසර ප්‍රවර්ධන ඒකකයපියවර ගෙන ඇත. පරිසර ප්‍රවර්ධන ඒකකයවිසින් පරිසරය හා සම්බන්ධ වත්මන් ගැටළු සම්බන්ධයෙන් මාර්ගගත වෙබිනාර් වැඩසටහන්පැවැත්වීම සඳහා විශේෂ පැකේජයක් මිලදී ගන්නා ලදී. අනෙකුත් බොහෝ වැඩසටහන් පැවැත්වුණේ වැඩසටහන් සංවිධායක කමිටු මගින් සපයන ලද සබැඳි භාවිතා කරමිනි.**2021 වර්ෂයේ විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා පවත්වන ලද අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පහත පරිදි වේ.**

1. **කොළඹවිශ්වවිද්‍යාලයේ** ශාස්ත්‍ර පීඨයේ සමාජ විද්‍යා අංශයේ ඉල්ලීම පරිදි ක්‍රීඩා අධ්‍යයන කටයුතුවල නියැළෙන දෙවන වසරේ සිසුන් සඳහා "ක්‍රීඩා කළමනාකරණයේ හරිත භාවිතයන්" පිළිබඳ විශේෂ **මාර්ගගත** දේශනයක් පවත්වන ලදී.

2. ලෝක ළමා දිනය සැමරීම සඳහා හොරණ හේලීස් රෙදි කර්මාන්තායතනය විසින් සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන් සඳහා මුහුණු පොත හරහා "පරිසරය සුරකින ආකාරය" පිළිබඳ විශේෂ සජීවී දේශනයක් පවත්වන ලදී. මෙම වැඩසටහනට සමගාමීව පාසල් සිසුන් අතර පරිසරය **අධ්‍යාපනයට**

අදාළව පවත්වන ලද තරඟද අතර ජයග්‍රාහකයින් සඳහා තිළිණ ප්‍රදානය කරන ලදී.





රූපය **76 :** ලෝක ළමා දින වැඩසටහනේ විශේෂ අවස්ථා

3. ලෝක ළමා දිනය සැමරීම සඳහා කොල්ලුපිටිය ශාන්ත පාවුළු මිලාගිරි සිසුන් සහ ආරාධිත පාසල්වල පරිසර නියමු සිසුන් සඳහා "පරිසරය සුරකින ආකාරය" මැයෙන් විශේෂ දේශනයක් පවත්වන ලදී.

4. කොළඹ ආනන්ද විද්‍යාලයේ සිසුන් සහ ආරාධිත පාසල්වල පරිසර නියමු සිසුන් සඳහා "රුක් රෝපණයේ වැදගත්කම" පිළිබඳ මාර්ගගත දේශනයක් පවත්වන ලදී.

5. මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) උපාධි අපේක්ෂකයින් පිරිසක් සඳහා "කඩොලාන පරිසර පද්ධතියේ වැදගත්කම" පිළිබඳ මාර්ගගත දේශනයක් පවත්වන ලදී.

6. කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි සිසුන් පිරිස සඳහා "තලංගම වැව සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම" පිළිබඳ මාර්ගගත දේශනය පවත්වන ලදී.

7. ලෝක පරිසර දිනය සැමරීම සඳහා වත්තල ලයිසියම් ජාත්‍යන්තර විද්‍යාලයේ සිසුන් සඳහා "පරිසරය සංරක්ෂණය කිරීමේදී සිසුන්ගේ කාර්යභාරය" පිළිබඳ මාර්ගගත දේශනයක් පවත්වන ලදී.

8. මහරගම හයිලන්ඩ් විද්‍යාලයේ සිසුන් සඳහා "ඕසෝන් ස්ථරයේ වැදගත්කම" පිළිබඳ විශේෂ සජීවී දේශනයක් මුහුණු පොත හරහාපවත්වන ලදී.

9. 2021 අප්‍රේල් 22 වැනි දින මිහිකත දිනය සැමරීම සඳහා බියගම ප්‍රයිම් ඉන්ටර්නැෂනල් හි කාර්ය මණ්ඩලය සඳහා "පරිසර සංරක්ෂණය" පිළිබඳ විශේෂ දේශනයක් පවත්වන ලදී. මෙම වැඩසටහන ඉන්දුනීසියාවේ ප්‍රයිම් ඉන්ටිමේට්ස් ඇතුළු සියලුම ප්‍රයිම් ඉන්ටිමේට්ස් කණ්ඩායම් සඳහා ඒකාබද්ධ සැසියක් ලෙස පවත්වන ලදී.

10. සීමාසහිත ක්ලීන්ටෙක් පුද්ගලික සමාගමෙහි කාර්ය මණ්ඩලය සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ස්මාර්ට් අපද්‍රව්‍ය කළමනාකරණය, නව තාක්ෂණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නීති, අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ රෙගුලාසි, ජාතික නියාමන ආයතන (වගකීම් සහිත ආයතන), අපද්‍රව්‍ය කළමනාකරණයපිළිබඳ ජාත්‍යන්තර නීති සහ රෙගුලාසි ආදී විවිධ මාතෘකා ආවරණය කරමින් විශේෂ මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී.

11. සීමාසහිත ක්ලීන්ටෙක් පුද්ගලික සමාගමෙහිදී "අපද්‍රව්‍ය කළමනාකරණයේ සේවකයින්ගේ වගකීම" සහ සේවා ඇගයීම පිළිබඳ විශේෂ දේශනයක් පවත්වන ලදී.

12. කොළඹ දිස්ත්‍රික්කයේ බාලදක්ෂිකාවන්ගේ ජනාධිපති පදක්කම සඳහා වන "මිහිතල සුරකින්නිය" පදක්කමට අදාළ මාතෘකා ආවරණය කරමින් විශේෂ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

B. මාර්ගගත වෙබිනා වැඩසටහන් පැවැත්වීම

1. " පරිසර පද්ධති යළි ශක්තිමත් කිරීම අපි කැපවෙමු" යන තේමාව යටතේ ආශ්‍රිත මාතෘකා 5ක් ආවරණය කරමින්විශේෂ වෙබිනාවැඩසටහනක් පවත්වන ලදී

2. "තිරසර කාර්මික ක්‍රියාවලියක් සඳහා කැප වෙමු" යන තේමාව යටතේ අදාළ මාතෘකා 6ක් ආවරණය කරමින් විශේෂ වෙබිනාවැඩසටහනක් පවත්වන ලදී.

3. "කාබනික පොහොර භාවිතය සහ එහි මැතකාලීන ප්‍රවණතා" යන තේමාව යටතේ අදාළ මාතෘකා 5ක් ආවරණය වන පරිදි විශේෂ වෙබිනාවැඩසටහනක් පවත්වන ලදී.







රූපය 77 : වෙබිනා වැඩසටහන්වල ප්‍රචාරක

C. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තරුණ කමිටු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

තරුණ කමිටු සාමාජිකයින්ගේ දැනුවත්භාවයේ මට්ටම ඉහළ නැංවීම සඳහා සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීසහ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී තරුණ පරපුර පරිසර සංරක්ෂණය සඳහා පෙළඹවීම සඳහා වැඩසටහන් දෙකක් දකුණු පළාත් කාර්යාල සම්බන්ධීකරණය කරමින් පවත්වන ලදී.

D. බාහිර සංවිධාන සමඟ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

වැඩසටහන් සම්බන්ධීකරණය පරිසර ප්‍රවර්ධන ඒකකයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වලින් එකකි. මේ සම්බන්ධයෙන් පරිසර ප්‍රවර්ධන ඒකකය, කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය සමඟ සම්බන්ධීකරණය කරන ලද අතර, පරිසර ප්‍රවර්ධන ඒකකයසහ මධ්‍යම පරිසර අධිකාරියේ අනෙකුත් අංශවල සහයෝගයෙන් පරිසරය පිළිබඳ විෂය නිර්දේශයට අදාළ පුහුණු වැඩසටහන සහ දින හතරක දේශන මාලාව සාර්ථකව නිම කරන ලදී. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, පාරිසරික නීතිය, වාතය, ජලය සහ ශබ්ද දූෂණය, පරිසර ආරක්ෂණ බලපත්‍ර පටිපාටිය, ස්වභාවික සම්පත් කළමනාකරණය, පරිසර සැලසුම්කරණය සහ කළමනාකරණය සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටිය (EIA/IEE) වැනි පරිසරයේ බොහෝ අංග මෙම දේශන මාලාවෙන් ආවරණය විය.

E. පුවත්පත් ලිපි සහ සඟරා ලිපි හරහා දැනුවත් කිරීම.

"ඕසෝන් ස්ථරය" පිළිබඳ සවිස්තරාත්මක ලිපියක් ලියන ලද අතර එය ඩේලි මිර පුවත්පතේ පළ විය. “ජෛව විවිධත්වය” පිළිබඳ සවිස්තරාත්මක ලිපියක් ලියන ලද අතර එය පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද “සෝබා සඟරාවේ” පළ විය. "තෙත් බිම්වල සතුන්ගේ විවිධත්වය" මැයෙන් ලියැවුණු කවි පෙළක් ද එහි පළ විය.

18.4.5 රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම

රුක් රෝපණ ක්‍රියාකාරකම් සමාජය විසින් ක්‍රියාත්මක කළ යුතු සහ අධීක්ෂණය කළ යුතු පිරිසිදු හා හරිත පරිසරය සඳහා වූ හොඳම තිරසාර ක්‍රියාකාරකම වේ. පැළ රෝපණයේ අරමුණ වන්නේ පැළ රෝපණයේසහසුරැකීමේ වැදගත්කම පිළිබඳව සමාජය දැනුවත් කිරීම, පරිසරය කෙරෙහි ප්‍රජාවගේ සැලකිල්ල ප්‍රකාශ කිරීම සහ දේශගුණික විපර්යාස වැනි වන විනාශයේ අහිතකර බලපෑම් අවම කිරීමවේ.

"පිරිසිදු හා හරිත පරිසරයක" අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමෙන්මධ්‍යම පරිසර අධිකාරියේ දැක්මට අනුව 2021 වර්ෂයේදී පරිසර ප්‍රවර්ධන ඒකකයවිසින් පහත පරිදි විවිධ රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී.

A. කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ රුක් රෝපණ වැඩසටහන.

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හරිත පුහුණු කමිටුව විසින් 'වඩාත් යෝග්‍ය සහ සෞඛ්‍ය සම්පන්න ලෝකයක් ගොඩනැගීම' යන ලෝක සෞඛ්‍ය සංවිධානයේ තේමාව යටතේ රුක් රෝපණ වැඩසටහනක් පවත්වන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ සම්බන්ධීකරණයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ 30 වැනි සංවත්සරය සැමරීම නිමිත්තෙන් හරිත පුහුණු කමිටුව විසින් සංවිධානය කරන ලද රුක් රෝපණ වැඩසටහනකින් මෙම උත්සවය ආරම්භ විය. මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර ප්‍රවර්ධන ඒකකයවිසින් මෙම හරිත ක්‍රියාකාරකම් සඳහා ආවේණික ශාක විශේෂ 30ක් ඇතුළුව පැළ 60ක් පරිත්‍යාග කරන ලදී.





රූපය **78 :** කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ රුක් රෝපණ වැඩසටහනේ විශේෂ අවස්ථා

B. "හුස්ම දෙන තුරු" රුක් රෝපණ වැඩසටහන්

මධ්‍යම පරිසර අධිකාරියේ EPU විසින් "හුස්ම දෙන තුරු" වැඩසටහන යටතේ රුක් රෝපණ වැඩසටහන් කිහිපයක් පහත පරිදි පවත්වන ලදී.

1. ඇක්සෙස් ඉංජිනේරු පුද්ගලික ආයතනය හා එක්ව පවත්වන ලද දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව සිට බද්දේගම පිටවීම දක්වා මාර්ග රක්ෂිතය දෙපස පැළ 1000ක් සිටුවීමේ රුක් රෝපණ වැඩසටහන.

2. ඇක්සෙස් ඉංජිනේරු පුද්ගලික ආයතනය හා එක්ව පවත්වන ලද ගාල්ල, වක්වැල්ල ගිංගඟ වේල්ලේ රුක් රෝපණ වැඩසටහන.

3. මාතර පරවාහැර විහාර පරිශ්‍රයේ ඇක්සෙස් ඉංජිනේරු පුද්ගලික ආයතනය සහ සණසස බැංකු සාමාජිකයින්ගේ සහයෝගයෙන් පවත්වන ලද පැළ 4000ක් රෝපණ කිරීමේවැඩසටහන.

4. බස්නාහිර පළාත් කාර්යාලය සමඟ ඇක්සෙස් ඉංජිනේරු පුද්ගලික ආයතනය පාසල්. විශ්වවිද්‍යාල, විහාරස්ථානවල පැල 2000කට වැඩි ප්‍රමාණයක් රෝපණය කරන ලදී.

5. දකුණු පළාත් කාර්යාලයට අනුබද්ධ කොග්ගල මාර්ටින් වික්‍රමසිංහ කෞතුකාගාරය ආශ්‍රිතව රුක් රෝපණ වැඩසටහන් දෙකක් ද කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය සමඟ එක් රුක් රෝපණ වැඩසටහනක් ද පවත්වන ලදී.



රූපය **79 : :**"හුස්ම දෙන තුරු" රුක් රෝපණ වැඩසටහන්වල විශේෂ අවස්ථා

තරුණ පරම්පරාව අතර පැළ බෙදාදීම.

සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට සහ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් තරුණ කමිටු සාමාජිකයින් අතර රුක් රෝපණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීමෙන් අනතුරුව පැළ (400ක් පමණ) බෙදා දෙන ලදී.

C. "සිසු තුරු උදාන" රුක් රෝපණ වැඩසටහන

මධ්‍යම පරිසර අධිකාරියේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ මහජන බැංකුවේ දායකත්වය ඇතිව පාසල් ප්‍රජාවන් සඳහා මෙම වැඩසටහන පැවැත්වීමට යෝජනා කරන ලදී. මහජන බැංකුව හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිතය.මෙම ව්‍යාපෘතිය යටතේ සිසුවෙකු විසින් පැළයක් සිටුවනු ලබන අතර එය සිසුවා විසින් රැකබලාගත යුතුය.මෙම පරිසර හිතකාමී ක්‍රියාකාරකම සඳහා ශිෂ්‍යයාට මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පතුවක් ලෙස මාසික දීමනාවක් ලබාදේ.මෙම වැඩසටහන 2021 ලෝක පරිසර දිනයට සමගාමීව අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ජාතික වැඩසටහන ආනන්ද විද්‍යාලයේ දියත් කිරීමට සහ සමගාමීදිස්ත්‍රික් වැඩසටහන් 25 ක් සංවිධානය කර තිබුණි.කෙසේ වෙතත්, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 'සිසු තුරු උදාන' ජාතික රුක් රෝපණ වැඩසටහන අවලංගු කරන ලදී.

18.4.6 විශේෂ දින වැඩසටහන සහ අනෙකුත් වැඩසටහන් පැවැත්වීම

මෙම ක්‍රියාකාරකම යටතේ පහත වැඩසටහන් පවත්වන ලදී.

1. කළුතර, බේරුවල සහ පානදුර යන ප්‍රදේශවල වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.(ඉකෝ ස්ප්‍රින්ඩිල්ස්අනුග්‍රහයෙනි)

2. දකුණු පළාත් කාර්යාලවලට අනුබද්ධිත නැකතට පැලයක් රුක් රෝපණයකිරීම.

3. බස්නාහිර පළාත් කාර්යාලවලට අනුබද්ධ මිහිකත දිනය සැමරීම සඳහා රචනා තරගයක් පැවැත්වීම.

4. කොවිඩ්වසංගතය හමුවේ කාර්ය මණ්ඩලයේ කායික හා මානසික යහපැවැත්ම සඳහා යෝග අභ්‍යාස වැඩමුළුවක් සංවිධානය කිරීම.

5. බස්නාහිර පළාත් කාර්යාල ආශ්‍රිතව ලෝක පරිසර දිනය වෙනුවෙන් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම.

6. ලෝක පරිසර දිනය නිමිත්තෙන් දකුණු පළාත් කාර්යාල ආශ්‍රිතව පරිසර රචනා තරගයක් පැවැත්වීම.

7. කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල ආශ්‍රිතව රුක් රෝපණ වැඩසටහනක්, රචනා හා පෝස්ටර් තරඟ පැවැත්වීම.

18.4.7 පාරිසරික පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය පැවැත්වීම - ICEG 2021

මධ්‍යම පරිසර අධිකාරියේ 40 වැනි සංවත්සරය සැමරීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකය 2021 පරිසර පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සංවිධානය කළ අතර එය 2021 නොවැම්බර් 24 සහ 25 යන දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා ශාලාවේදී (BMICH)දී සාර්ථකව පවත්වන ලදී.සමුළුවේ සමාරම්භක උත්සවය 2021 නොවැම්බර් 24 වන දින BMICH හි ලෝටස් ශාලාවේදී පරිසර අමාත්‍ය සහ ගරු ආරාධිත අමුත්තා වන ගරු මහින්ද අමරවීර, ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත රාජධානියේ තානාපතිනි ගරුතන්ජා ගොංග්‍රිජ්ප් මැතිණියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ICEG 2021 Colombo හි ප්‍රධාන දේශනය ගරු තන්ජාගොංග්‍රිජ්ප් මැතිණියසහ සම්මානිත මහාචාර්ය අයි.ඒ.යූ.එන්ගුණතිලක මහතා විසින් පවත්වන ලදී.

ICEG ප්‍රධාන සැසි 06 කින් සමන්විත වූ අතර ඒ අනුව සාරාංශ පහත පරිදි ලැබිණි.

1. පරිසර ප්‍රතිපත්තිය, පාලනය සහ නියාමන ප්‍රතිසංස්කරණ (සාරාංශ 17)

2. පරිසර අධ්‍යාපනය පරිසරය සන්නිවේදනය සහ පරිසර ප්‍රවර්ධනය (සාරාංශ 16)

3. පරිසර පුරවැසි විද්‍යාව (සාරාංශ 202)

4. අපද්‍රව්‍ය කළමනාකරණය (සාරාංශ 27)

5. පරිසර කළමනාකරණය සහ තක්සේරුව (සාරාංශ 49)

6. පරිසර දූෂණය පාලනය පාරිසරික සෞඛ්‍යය සහ දේශගුණික විපර්යාස (සාරාංශ 68)

මෙම සම්මන්ත්‍රණය සඳහා ICEG වෙබ් අඩවිය හරහා දේශීය සාරාංශ 185ක් සහ විදේශීය සාරාංශ 17ක් ICEG වෙබ් අඩවිය හරහා (www.encon.cea.gov.lk) සාරාංශ 202ක් ලැබී ඇත.



රූපය **80 :** පාරිසරික පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ විශේෂ අවස්ථා

18.4.8 වෙනත් ක්‍රියාකාරකම්

ප්‍රධාන ක්‍රියාකාරකම් වලට අමතරව මධ්‍යම පරිසර අධිකාරියේපරිසර ප්‍රවර්ධන ඒකකයපහත ක්‍රියාකාරකම් ද සිදු කරයි.

A. ඩෙංගු මදුරු වාහකයින් බෝවන වාසස්ථාන සෙවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය පරිශ්‍රයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහනක් පැවැත්වීම.

ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝවන වාසස්ථාන සෙවීම සඳහා පරිසර ප්‍රවර්ධන ඒකකයේ වගකිවයුතු නිලධාරීන් සති දෙකකට වරක් මධ්‍යම පරිසර අධිකාරිය පරිශ්‍රයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහනක් පවත්වයි. ඩෙංගු රෝග වාහක මදුරුවන් බෝ විය හැකි වාසස්ථාන පිළිබඳව පරිපාලන ඒකකයේ අදාළ නිලධාරීන් දැනුවත් කළ අතර විමර්ශන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස බලයලත් නිලධාරීන්ගේ උපදෙස් පරිදි අදාළ ස්ථානඉවත් කර ඉදිකිරීම් නවීකරණය කරන ලදී.

B. බාලදක්ෂිකාවන්ගේ පෘථිවි පදක්කම් පරීක්ෂණය පැවැත්වීම

බාලදක්ෂිකා සංගමයේ ඉල්ලීම් අනුව පරිසර ප්‍රවර්ධන ඒකකයේ බලයලත් නිලධාරීවිසින් බාලදක්ෂිකාවන්ගේ "මිහිතලය සුරකින්නිය" පදක්කම් සඳහා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. අදාළ වර්ෂයේදී, ඔවුන්ගේ විභාග සඳහා සූදානම් වීමට බාලදක්ෂිකාවන්16 දෙනෙකු උපදෙස් ලබා ගත් අතර, මිහිතල පදක්කම් පරීක්ෂණයේ මාර්ගෝපදේශයන්ට අනුව මාර්ගගත පරීක්ෂණ පවත්වන ලදී.

C. පරිසර සභාව පැවැත්වීම

පරිසර සභාවේ 3 වැනි සැසිවාරය 2020 දෙසැම්බර් 17 වැනි දින පවත්වන ලදී.පරිසර පනතේ සඳහන් අමාත්‍යාංශ සහ අනෙකුත් නව අමාත්‍යාංශ

නියෝජනය කරන සහිකයින් තෝරා පත් කර ගැනීම සඳහා 14 වැනි සැසිවාරය සඳහා පරිසර අමාත්‍යාංශය විසින් නාමයෝජනා කැඳවන ලදී. ඒ අනුව, සමාරම්භක රැස්වීම 2021නොවැම්බර් මස 29 වන දින මධ්‍යම පරිසර අධිකාරියේ දී පැවැත් වූ අතර, ආයතන 15 ක් නියෝජනය කරමින් සාමාජිකයින් සහභාගී විය. මෙම අවස්ථාව ඉස්මතු කිරීමින් ශ්‍රී ලාංකේය වැදි ජනතාවගේ නායක ඌරුවරිගේ වන්නියලතෝ සහභාගි විය.මෙම පරිසර සභාවට පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ඇතුළු අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය ද සහභාගි වූහ.





රූපය **81 :** පරිසර සභාවේ විශේෂ අවස්ථා

18.4.10 මාධ්‍ය ඒකකය යටතේ සිදුකරන ක්‍රියාකාරකම්

මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික සංරක්ෂණයට අදාළවපරිසර ප්‍රවර්ධන ඒකකයේ ක්‍රියානාරකම්සම්බන්ධ තොරතුරු බෙදා හැරීම සඳහා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් ඇමතීමට විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතා කෙරේ. ඒකකයේ අරමුණු ජය ගැනීම සඳහා සහ පාරිසරික ගැටළු සම්බන්ධ විශේෂිත කරුණු පිළිබඳව ප්‍රචාරණය ලබාදීම සඳහා පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කෙරේ. අදාළ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

A. "සොබාකෙත" ගුවන් විදුලි වැඩසටහන

පාරිසරික ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ පරිසර සංරක්ෂණය සහ ආරක්ෂාව පිළිබඳ පණිවිඩය බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්තාව ඔස්සේ 94.3/94.5 සංඛ්‍යාත යටතේ "සොබාකෙත" ගුවන් විදුලි වැඩසටහන විකාශනය කෙරේ. සෑම ඉරිදාවකම පෙරවරු 8.00 සිට 8.45 දක්වා සෝබාකෙත ගුවන් විදුලි වැඩසටහන විකාශය වේ. පරිසරය සම්බන්ධ ප්‍රශ්නයක් ඇසීමෙන් වැඩසටහනට ප්‍රතිපෝෂණ ශ්‍රාවකයන්ගෙන් ලැබේ. සෑම සතියකම ජයග්‍රාහකයින් තිදෙනෙකු තෝරාගනු ලැබේ.

2021 වර්ෂය තුළ EPU විසින් සම්පත් පුද්ගලයින් 45 දෙනෙකු සමඟ සම්බන්ධීකරණය කරමින් "සොබාකෙත" ගුවන්විදුලි වැඩසටහන් 52 ක් විකාශනය කරන ලද අතර එම වැඩසටහන් අතරතුර ප්‍රවෘත්ති 105 කට ආසන්න ප්‍රමාණයක් විකාශනය කරන ලදී.

B. රූපවාහිනී සහ ගුවන්විදුලි සාකච්ඡා

මෙම ඒකකය විසින් 2021 වර්ෂයේදී රූපවාහිනී සාකච්ඡා 17ක් (බොහෝ විට හරිත රූපවාහිනියේ) සහ විශේෂ සිදුවීම් පිළිබඳ ගුවන්විදුලි සාකච්ඡා 03ක් සංවිධානය කර ඇත. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්තාව, ස්වාධීන රූපවාහිනී ජාලයස්වර්ණවාහිනී, සිරස, දෙරණ සහ හරිත TV, ලක්විරු ගුවන් විදුලිය, ලක්හඩ, V FM, සියතTVඔස්සේ වැඩසටහන් විකාශය විය. එපමනක් නොව, 2021 වර්ෂයේ මතු වී ඇති තත්ත්වයන් අනුව මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

C. මාධ්‍ය භාවිතය

මාධ්‍ය භාවිතයෙන් සමාජයක පුළුල් පරාසයක් දැනුවත් කළ හැකිය. එබැවින් මධ්‍යම පරිසර අධිකාරිය ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත් සහ වෙබ් අඩවිය හරහා සිය ප්‍රවෘත්ති, ලිපි සහ ක්‍රියාකාරකම් බෙදා හරිනු ලැබේ. ඒ අනුව වසර පුරා මාධ්‍ය නිවේදන 29ක් සහ පත්‍රිකා ලිපි 11ක් පළ කර ඇත. පත්‍ර ලිපි සහ මාධ්‍ය නිවේදන වැඩිපුරම පළ වූයේ සිළුමිණ, දිවයින, දිනමිණ, අද, අරුණ, ද අයිලන්ඩ්, ඩේලි නිව්ස්, ඩේලි මිරර්, තිනකරන් යන පුවත්පත්වල ය.

D. විද්‍යුත් මාධ්‍ය භාවිතය



මධ්‍යම පරිසර අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු බෙදා හැරීම සඳහා, පරිසර ප්‍රවර්ධන ඒකකයේ මාධ්‍ය අංශය විසින් මධ්‍යම පරිසර අධිකාරියේවෙබ් අඩවියේ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පුවත් 43ක් උඩුගත කරන ලදී. සමාජ

මාධ්‍ය වේදිකා වඩාත් ජනප්‍රිය සහ පරිශීලක හිතකාමී බැවින්, මධ්‍යම පරිසර අධිකාරියේ නිල මුහුණු පොතට වැඩි නියැලීමක් සහ අනුගාමිකයින් ලබා ගැනීම සඳහා බාහිර සමාගමක් සමඟ ප්‍රවර්ධන ව්‍යාපාරයක් සිදු කරන ලදී.

අධිකාරියේ අවශ්‍යතාවයට අදාළ ආකර්ෂණීය වීඩියෝ, පෝස්ටු පළ කිරීම් ආදිය නිර්මාණය කිරීම සඳහා, පරිසර ප්‍රවර්ධන ඒකකයේමාධ්‍ය අංශය සම්බන්ධීකරණය, මඟ පෙන්වීම, තොරතුරු ලබා දීම සහ බාහිර සමාගම විසින් නිෂ්පාදනය කරන ලද පෝස්ටු සහ වීඩියෝ සංශෝධනය කිරීම සිදු කර ඇත. ඊට අමතරව මධ්‍යම පරිසර අධිකාරිය විසින් කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ මාධ්‍ය අංශය විසින් පුවත් සකස් කර උඩුගත කරන ලදී. තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිෂ්පාදනය කරන ලදමාධ්‍ය නිවේදන, පුවත්පත් ලිපි, පුවත් කැපීම්, ප්‍රවෘත්ති ක්ලිප, වීඩියෝ ක්ලිප ද පිටුවට උඩුගත කරන ලදී. මේ අනුව, 2021 වසර පුරා මුහුණු පොතටඋඩුගත කිරීම් 459 ක් සිදු කර ඇත

E. වැඩසටහන් සහ සිදුවීම් ආවරණය කිරීම

මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණුවලට අනුකූලව ඵලදායී වන ව්‍යාපෘති, වැඩසටහන් සහ සිදුවීම් ආවරණය කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය පුළුල් දායකත්වයක් සපයයි. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය 2021 දී රාජකාරී සිදුවීම් 58 ක් ආවරණය කර ඇත.

F. රාජ්‍ය නොවන සංවිධානය ලියාපදිංචි කිරීම

මෙම ක්‍රියාකාරකම යටතේ 2021 දී රාජ්‍ය නොවන සංවිධාන දෙකක් ලියාපදිංචි කර ඇත.

G. පාරිසරික පුවත් පත්‍රිකාව සහ "සොබාකෙත සඟරාව" සකස් කිරීම

පාරිසරික පුවත් පත්‍රිකාව යනු ද්විවාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද පුවත් පත්‍රිකාවකි. 2021 වර්ෂයේදී ද එක් එක් වෙළුමෙන් පිටපත් 10,000 ක් මුද්‍රණය කර ලියාපදිංචි පාඨකයන් අතර බෙදා හරින ලදී.



රූපය **82 :** පාරිසරික පුවත් හසුන



සොබාකෙත සඟරාව වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන අතර එය වර්තමාන පාරිසරික ගැටළු සහ පරිසරයේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් ලිපි වලින් සමන්විත වේ. 2021 වර්ෂයේදී සොබාකෙත සඟරාවේ වෙළුම්

රූපය **83 :** සොබාකෙත සඟරාව

දෙකක් ප්‍රකාශයට පත් කරන ලද අතර එකක් කතරගම සුරකිමු ගණ වැඩසටහනින් එළිදැක්වූ අතර අනෙක බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා ශාලාවේදී ICEG- 2021 හිදී එළිදැක්විණි.





රූපය **84 :** සොබාකෙත සඟරා එළිදැක්වීම

තවද, විශේෂ කටයුතු සහ අවස්ථා වලදී ගරු පරිසර අමාත්‍යතුමන්, පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමන්,

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිතුමන්, අධ්‍යක්ෂ ජනරාල්තුමන් සඳහා කථා පිටපත්සකස් කිරීම ද ඒකකය විසින් සිදු කරන ලදී. එපමණක් නොව, අලුත් අවුරුදු පණිවිඩ සකස් කිරීම, වීඩියෝ ක්ලිප් සඳහා පිටපත්ද එම ඒකකය විසින් නිෂ්පාදනය කරනු ලැබේ.

වසංගත තත්ත්වය යටතේ වුවද මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීමේ අංශයේ පරිසර ප්‍රවර්ධන ඒකකය ප්‍රජාවට ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දෙමින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගෙන ඇත.

18.4 ශ්‍රී ලංකාවේ ගෘහස්ත වාතය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නවතම සොයා ගැනීම් වලට අනුව මිලියන 07 ක ප්‍රමාණයක් 2012 වසරේදී ගෘහස්ත වාතය අපවිත්‍ර වීම හේතුකොටගෙන මරණයට පත්ව ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරියේ වායු තත්ත්ව පසු විපරම් අංශය මගින් 2016 වසරේ උක්ත මාතෘකාව යටතේ ව්‍යාපෘති යෝජනාවක් සකස් කොට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදි. ඉන්පසු මේ සඳහා 2019 වසරේ කැබිනට් අනුමැතිය ලබා ගත් අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික ප්‍රතිපාදන 2021 වසරේදී ලැබිණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ හඳුනාගත් මූලික ක්‍රියාකාරකම් වන, ගෘහස්ත වාතයේ ගුණාත්මක තත්ත්වය මැන බැලීම 2021 වසරේ දෙසැම්බර් 06 වන දින සිට ආරම්භ කළ අතර බස්නාහිර පළාතේ ස්ථාන 25 ක එනම් පාසල් 09, රජයේ ආයතන 10 හා නිවාස 06 ක (ඇමුණුම I) ගෘහස්ත වාතයේ තත්ත්වය මනින ලදි.

මේ සඳහා බාහිර පාර්ශවයන් ලෙස රජයේ ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත දත්ත එක් රැස් කිරීමේ කටයුතු (අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 404/4817/21 මගින්) පවරන ලදි. ඒ අනුව උක්ත ස්ථාන 25 හි මැනීම් කටයුතු එම ආයතනයේ නිලධාරීන් මගින් මධ්‍යම පරිසර අධිකාරිය සමග එක්ව සිදු කරන ලදි.

තවද මෙම ව්‍යාපෘතියේ 02 වන අදියර ලෙස හම්බන්තොට, බදුල්ල හා අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වල ස්ථාන 15 කදී ඉදිරි දින වල මෙම මැනීම් කටයුතු සිදු කිරීමට නියමිතය. 03 වන අදියර ලෙස යාපනය, නුවර, මඩකලපුව යන දිස්ත්‍රික්ක වලද ස්ථාන 15ක් මැනීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය යටතේ උක්ත දිස්ත්‍රික්ක 06 තුලද අදාළ මූලික දත්ත 2022 පළමු කාර්තුව තුල ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර දෙවන කාර්තුව තුලදී අභ්‍යන්තර වායු දූෂණය පාලනයට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයක් සම්පාදනය කිරීම, එය මුද්‍රණය කිරීම, දූෂකාරක හේතුවෙන් සෞඛ්‍යයට ඇතිවිය හැකි බලපෑම් අවම කිරීම සඳහා වූ නිර්දේශ ලබා දීම, නිවාස, රාජ්‍ය ගොඩනැගිලි හා ව්‍යාපාරික ස්ථාන තුලින් ජනනය වන දූෂකාරක වායුන් මගින් ඇතිවන බලපෑම පිළිබඳව ගෘහනියන් හා රාජ්‍ය, පෞද්ගලික ආයතන වල සේවකයින් දැනුවත් කිරීම යන කටයුතු සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ ගුණාත්මක තත්ත්වයෙන් යුතු ගෘහස්ත වායු පරිසරයක් ඇති කිරීම මගින් කාර්යක්ෂම, නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමයි. විශේෂයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවකයන්ගේ පාසල් දරුවන්ගේ නිරෝගීභාවය ඇතිවීම මත රටේ සියලු අංශ වල කාර්යක්ෂමතාවය වැඩි දියුණුවේ. ඒ සඳහා ආයතන, පාසල් පරිශ්‍ර මෙන්ම නිවාස තුලද ගෘහස්ත වාතයේ ගුණාත්මකභාවය බලපානු ඇත. තවද අභ්‍යන්තර වායු දූෂණය පාලනය කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයක් සම්පාදනය කර එය මුද්‍රණය කර බෙදා හැරීමටද නියමිත වේ.

CHAPTER 19 : මානව සම්පත් සංවර්ධන, පරිපාලන සහ මූල්‍ය අංශය

19.1 මානව සම්පත් සංවර්ධන ඒකකය

කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම මානව සම්පත් සංවර්ධන ඒකකයේ ප්‍රධාන කාර්යයක් වන අතර, ඊට අමතරව විනය පරීක්ෂණ හැසිරවීම ද සිදු කෙරේ.

2021 වර්ෂය තුළ කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය වශයෙන් පහත සඳහන් පුහුණු අවස්ථා ලබා දෙන ලදී.

දේශීය පුහුණුවීම්

(1) 2021 වර්ෂය තුළ මධ්‍යම පරිසර අධිකාරියේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම වගුව **49 :** දේශීය පුහුණුවීම්

කළමනාකරුවන්, ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන්, පරිසර නිලධාරීන්, කළමනාකරණ සහකාරවරුන්, පුස්තකාල කාර්ය මණ්ඩලය, නීති සහ අභ්‍යන්තර විගණන ඒකක සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් ඇතුළු මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 25ක් සංවිධානය කර පහසුකම් සැලසීම.

(2) ඉහත වැඩසටහන් අතරට පහත කණ්ඩායම් පුහුණු සහ වැඩමුළු ඇතුළත් විය

පුහුණු වැඩසටහනේ නම		සහභාගි වූ නිළධාරීන් සංඛ්‍යාව
01.	පරිපාලන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	10
02.	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	28
03.	බස්නාහිර පළාතට අනුයුක්ත පරිසර නිලධාරීන් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන	38

විදේශ පුහුණුවීම්

2021 වර්ෂය තුළ නිලධාරීන් 04 ක් නම් කරන ලද අතර 01 නිළධාරියෙකු දේශගුණික විපර්යාස අනුවර්ත පුහුණුවක් කෙටි කාලීන පුහුණුවීමන් ලබා ඇත.

19.2 මානව සම්පත් කළමණාකරන ඒකකය

මානව සම්පත් කළමණාකරන උප ඒකකය මගින ප්‍රධාන වශයෙන් පහත කාර්යයන් ක්‍රියාවට නංවනු ලැබේ.

- සමස්ත මානව සම්පත් සැලසුම්කරණය
- තෝරා ගැනීම්, බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම්
- වැටුප් කළමනාකරණය සහ සුපරීක්ෂණය

2021 වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධන ඒකකය මගින් මූලික පරීක්ෂණ 15ක් සිදු කරන ලදී.

- එක් එක් සේවකයාගේ කාර්යයාමනය ඇගැයීම
- සේවකයින්ගේ දුක්ගැනවිලි සමනය කිරීම
- මානව සම්පත් දත්ත ගබඩාව පවත්වාගෙන යාම

2021.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1166 ක් වන අතර, ස්ථිර සේවයේ යෙදී සිටි මුළු සේවක සංඛ්‍යාව 908 ක් විය.

වගුව **50 : 2021** වර්ෂයේ සේවයට බදවා ගැනීම්, උසස්වීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය හැර යාම සහ විශ්‍රාම ගැනීම.

තනතුර		2021			
		බදවා ගැනීම්	උසස්වීම්	ඉල්ලා අස්වීම් / සේවය හැර යාම	විශ්‍රාම ගැනීම
1	**ජ්‍යෙෂ්ඨ කළමනාකරණ**				
	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්		04		01
	අධ්‍යක්ෂ		02		
2	**මධ්‍යම කළමනාකරණ**				
	සහකාර අධ්‍යක්ෂ	02	04		
	පුස්තකාලයාධිපති	01			
3	**කණිෂ්ඨ කළමනාකරණ**				
	මානව සම්පත් නිලධාරි				01
	මූල්‍ය නිලධාරි				01
	ප්‍රසම්පාදන නිලධාරි	01			
	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරි		05	02	
4	**බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති**				
	පරිසර නිලධාරි			06	03
5	**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)**			01	01
6	**ප්‍රාථමික මට්ටම (ශිල්පීය)**				
	රියදුරු			01	01
		04	**15**	**10**	**08**

ඉහත දක්වා ඇති උසස්වීම් වලට අමතරව, සහකාර අධ්‍යක්ෂවරු 04 ක් මධ්‍යම කළමනාකරණ මට්ටමේ පළමු ශ්‍රේණියට උසස් කල අතර, එක් ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරියෙකු කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළමු ශ්‍රේණියට උසස් කරන ලදි. තවද පරිසර නිලධාරි 02 ක් බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති සේවයේ පළමු ශ්‍රේණියට ද, එක් පරිසර නිලධාරියකු බලාත්මක/මෙහෙයුම්/ව්‍යාපෘති සේවයේ දෙවන ශ්‍රේණියට උසස් කල අතර කළමනාකරණ සහකාරවරු 03 ක් කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) සේවයේ පළමු ශ්‍රේණියටද, එක් කළමනාකරණ සහකාරවරයෙකු කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවයේ පළමු ශ්‍රේණියටද, රියදුරු 03ක් ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය) පළමු ශ්‍රේණියට සහ රියදුරු 02ක් ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය) දෙවන ශ්‍රේණියට උසස් කරන ලදි. කාර්යාල සහායක 02ක් ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) දෙවන ශ්‍රේණියට උසස් කරන ලදි.

19.3 මුදල් ඒකකය

2021 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පිහිටි ස්ථානය සහ නෛතික ස්වභාවය

මධ්‍යම පරිසර අධිකාරිය යනු ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ප්‍රධාන කාර්යාලය අංක. 104, ‘‘පරිසර පියස’’, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

අධිකාරියේ තාක්ෂණික නිපුණත්වය සහ කැපවීම මත පරිසර දූෂණය පාලනය කිරීම, ස්වාභාවික සම්පත් කළමනාකරණය කිරීම සහ පරිසර අධ්‍යාපනය ලබාදීම හරහා පරිසරය ආරක්ෂා කිරීම හා එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

1.3 සේවක සංඛ්‍යාව

2021 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ සේවක සංඛ්‍යාව 908 ක් විය. (2020 – 923)

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 සකස් කිරීමේ පදනම

2.1.1 අනුකූලතා ප්‍රකාශනය

මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇත.

2.1.2 මිණුම් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා ගැළපීම් සිදුකර නැත.

2.1.2 සංසන්දනාත්මක තොරතුරු

මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩ පදනමකින් අදාළ කර ගෙන ඇති අතර, එම ප්‍රතිපත්ති පෙර වර්ෂයේදී යොදා ගන්නා ලද ඒවාට අනුරූප වේ. වර්තමාන තත්ත්වය තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පෙර වර්ෂයේ සංඛ්‍යා ද නැවත ඉදිරිපත් කර තිබේ.

2.2 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලු කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩ ලෙස අදාළ කර ගෙන තිබේ.

2.1.2 විදේශ මුදල් ඒකක ගනුදෙනු

මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අධිකාරියේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් ඉදිරිපත් කර තිබේ. විදේශ මුදල් ඒකක වලින් සිදු කෙරෙන ගනුදෙනු අදාළ ගනුදෙනුව සිදු කරනු ලබන දිනට පවතින සක්‍රීය විනිමය අනුපාතිකයට මූලිකව වාර්තා කරනු ලැබේ. විදේශීය මුදල් ඒකක වලින් නාමනය කර ඇති විදේශ රටවලින් ලැබෙන පරිත්‍යාග, මුදල් වත්කම් සහ වගකීම් ගනුදෙනුව සිදු කෙරෙන දිනට පවතින තත්කාලීන අනුපාතිකයට පරිවර්තනය කරනු ලැබේ.

2.2.2 ආදායම් හඳුනාගැනීම

වියදම් මෙන්ම ආදායම ද උපචිත පදනමින් ගණනය කර ඇත. වර්ෂ 03 ක කාලයක් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයාගත් ආදයම 2021 වර්ෂය සඳහා උපයාගත් ආදායමෙන් $^1/_3$ ක් පමණක් සඳහා ගණන් බලා, ඒ අනුව ඉතිරිය පෙර වර්ෂ දෙක සඳහා ගළපා ඇත. තවද, එක් අවුරුද්දක කාලයක් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර නිකුත්කිරීම මගින් ලැබුණු ආදායම්, එය ලැබුණු දිනය කුමක් වුවද, එය එම වර්ෂයේ ආදායමක් සේ සළකා ගිණුම් තබා ඇත.

පොළිය සහ කුලී ආදායම හැර අනෙකුත් ආදායම් අත්පිට මුදල් පදනමින් වාර්තා කර ඇත.

2.2.3 දේපළ, පිරියත සහ උපකරණ

2.2.3.1 හඳුනා ගැනීමේ පදනම

වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලාඒම සිදු විය හැකි නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට සඳහන් කරනු ලැබේ.

වත්කමක් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් සහ එම වත්කම අපේක්ෂිත කාර්යය සඳහා භාවිතයට ගත හැකි වන පරිදි ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුව ම අදාළ වන අනෙකුත් වියදම් ද, කොටස් ගලවා අයිතම ඉවත් කර එම අයිතම පිහිටා ඇති පරිශ්‍රය නැවත සකස් කිරීම සඳහා දරනු ලබන වියදම් ද, ප්‍රාග්ධනිත කළ ණය ගැනුම් පිරිවැය ද පිරිවැයට ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් විවිධ ප්‍රයෝජනවත් ජීවත කාලයන් සහිත කොටස් වලින් සමන්විත වන විට, ඒවා වෙන් වෙන්වූ දේපළ, පිරියත සහ උපකරණ අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගිණුම් තබනු ලැබේ.

2.2.3.2 ප්‍රත්‍යාගණන ආකෘතිය

ධාරණ අගය වාර්තාකරණ වර්ෂය අවසානයට පවතින සාධාරණ වටිනාකම යොදා ගනිමින් තීරණය කරනු ලබන ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන ආකාරයකට ප්‍රමාණවත් නිත්‍ය බවක් සහිතව ප්‍රත්‍යාගණනයන් සිදු කරනු ලැබේ.

වාහන (මෝටර්සයිකල් හැර) ප්‍රත්‍යාගණනය කරනු ලබන විට, ධාරණ අගයෙහි ප්‍රත්‍යාගණනය සමග ස්ථාවර ලෙස දළ ධාරණ අගය ගැළපීම් කරනු ලැබේ. සමුච්චිත හානිකරණ පාඩු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, දළ ධාරණ අගයෙහි සහ ධාරණ අගයෙහි වෙනස සමාන වන ලෙස එම දිනට සමුච්චිත ක්ෂය ගළපනු ලැබේ.

ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ අගයෙහි යම් වැඩිවීමක් සිදු වුව හොත් එය අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගනු ලබන අතර, හිමිකම්වල ප්‍රත්‍යාගණන සංචිතයට එකතු කරනු ලැබේ. එම වැඩිවීම එම වත්කමෙහි ම පූර්වයෙන් ලාභාලාභවල හඳුනාගන්නා ලද ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට ලාභාලාභවල හඳුනාගනු ලැබේ.

ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ අගයෙහි යම් අඩුවීමක් සිදු වුව හොත්, එය ප්‍රවර්තන වර්ෂයේ ලාභාලාභවල හඳුනාගනු ලැබේ. එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන සංචිතයෙහි යම් ණය ශේෂයක් පවතින්නේ නම් එම ශේෂයෙහි ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගනු ලැබේ. අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගනු ලබන අඩුවීම හිමිකම්වල ප්‍රත්‍යාගණන සංචිතයෙහි එකතුවී ඇති අගය අඩු කරයි.

වත්කම ගිණුම්වලින් ඉවත් කළ විට, වාහනවලට අදාළ ප්‍රත්‍යාගණන සංචිතය රඳවාගෙන ඇති ආදායමට සෘජුව ම මාරු කරනු ලැබේ.

2.2.3.3 බැහැර කිරීම මත ලාභ සහ පාඩු

දේපළ, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීම මත ලබන ලාභ සහ පාඩු එම දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල ධාරණ අගය ඒවා බැහැර කිරීම මගින් ලැබෙන ආදායම සමග සංසන්දනය කිරීම මගින් තීරණය කරනු ලබන අතර, එය ලාභාලාභ ප්‍රකාශනයෙහි "වෙනත් ආදායම්/වෙනත් වියදම්" තුළ ශුද්ධ ලෙස හඳුනාගනු ලැබේ.

2.2.3.4 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේදී එම කොටස මගින් ලැබිය හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් එම කොටස ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයෙහි හඳුනාගනු ලැබේ. ප්‍රතිස්ථාපිත කොටසෙහි ධාරණ අගය ඉවත් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සිදු කරනු ලබන සේවාකිරීම් පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභාලාභවල හඳුනාගනු ලැබේ.

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතයෙන් අපේක්ෂා කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ නැවත ස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා දරනු ලබන වියදම් දැරූ විට වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.2.3.5 ගිණුම් වලින් ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීම හෝ බැහැර කිරීම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එම දේපළ, පිරියත සහ උපකරණ අයිතමයෙහි ධාරණ අගය ගිණුම්වලින් ඉවත් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ගිණුම්වලින් ඉවත් කිරීම මගින් ඇතිවන ලාභය හෝ පාඩුව, එම අයිතමය ඉවත් කරන විට ලාභයෙහි හෝ පාඩුවෙහි ඇතුළත් කරනු ලැබේ.

වත්කම්වල අවශේෂ්‍ය වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලයන් සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දී ම සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැළපීම් කරනු ලැබේ.

2.2.3.6 ප්‍රදානයන් ලෙස ලැබෙන දේපළ, පිරියත සහ උපකරණ

යම් ප්‍රදානයක් යටතේ අත්පත්කර ගනු ලබන දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයට ප්‍රාග්ධනිත කරනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය අඩුකළ පිරිවැයට දක්වා ඇත. සින්නක්කර ඉඩම් ඒ සඳහා දරන ලද පිරිවැයට සඳහන් කරනු ලැබේ.

2.2.3.7 අගය ක්ෂය කිරීම

ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා පිරිවැය කපා හැරීම පිණිස සින්නක්කර ඉඩම්වලින් හැර අනෙකුත් සියලුම දේපළ, පිරියත සහ උපකරණ වලින් අගය ක්ෂයවීම් අඩු කර ඇත.

දේපළ, පිරියත සහ උපකරණ සරල රේඛීය ක්‍රමයට අගය ක්ෂය කර ඇති අතර, එයට අදාළ වන අනුපාත පහත සඳහන් පරිදි වේ:

ගොඩනැගිලි - ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල	වර්ෂයකට 2.5%
මෝටර් වාහන	වර්ෂයකට 25%
ලීබඩු සහ කාර්යාලීය උපකරණ	වර්ෂයකට 10%
පිරියත සහ උපකරණ	වර්ෂයකට 10%
පරිගණක සහ උපාංග	වර්ෂයකට 25%
ගිණුම්කරණ මෘදුකාංග	වර්ෂයකට 50 %
රසායනාගාර උපකරණ	වර්ෂයකට 10%
පුස්තකාල පොත්	වර්ෂයකට 10%
දොම්පෙ සනීපාරක්ෂක කසල රඳවනය	වර්ෂයකට 2.5%
සොබාදහම් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	වර්ෂයකට 10%
නාම පුවරුව	වර්ෂයකට 10%
ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි වර්ණාලේප	වර්ෂයකට 20%
ජංගම රසයනාගාරය	වර්ෂයකට 10%

2.2.4 කල්බදු වත්කම් සහ ක්‍රමක්ෂය

කල්බදුවලට පාදක වන වත්කමක හිමිකම හා සම්බන්ධ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සාරානුකූල ලෙස පවරා නොදෙන කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

කල්බදු වත්කම් කල්බදු ගිවිසුමෙහි කල්බදු කොන්දේසි අනුව තක්සේරු කරනු ලබන අතර කල්බදු ගිවිසුම් කාලපරිච්ඡේදය මත පදනම්ව ක්‍රමක්ෂය ගාස්තු අය කරනු ලැබේ. කල්බදු වත්කම් පිරිවැයෙන් ශුද්ධ සමුච්චිත ක්‍රමක්ෂය ගාස්තු අඩුකළ අගයට මිනුම් කරනු ලැබේ. හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ වන්නේ නම් වත්කමේ සංරචක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ද එකී පිරිවැයට ඇතුළත් වේ. ගිවිසුම්ගත කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකින් පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ:

කල්බදු ඉඩම් - වර්ෂයකට 2%

ඉඩම - රත්නපුර කාර්යාලය - වර්ෂයකට 3.33%

2.2.5 තොග

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට තොග මනිනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී තොග විකිණිය හැකි මිලෙන් ඇස්තමේන්තු කළ සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු කළ පිරිවැය අඩුකළ මිල වේ.

තොග ඒවායෙහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය පහත සඳහන් පිරිවැය සූත්‍රය භාවිතා කරමින් ගණනය කරනු ලැබේ:

පෙර පිවිසි පෙර නිකුතු පදනමින් මිලදීගැනුම් පිරිවැයට

වර්ෂය තුළ සිදු කරන ලද සමස්ත රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ මිලදී ගැනීම් පරිභෝජනයන් ලෙස සළකා ඇත. මෙම අයිතම මිනුම් කිරීමේ දුෂ්කරතාවය නිසා සහ සාපේක්ෂ ලෙස භාවිතා කිරීමේ පිරිවැය අඩු නිසා මෙම ක්‍රමය අනුගමනය කර තිබේ.

2.2.6 ආයෝජන

මාස තුනකට වඩා වැඩි කල්පිරීමේ කාලයක් සහිත මුදල් වෙළඳපොළ උපකරණවල සිදු කරනු ලබන ආයෝජන කෙටිකාලීන ආයෝජන ලෙස සළකනු ලබන අතර එම ආයෝජන ඒ සඳහා දරන ලද පිරිවැයට දක්වා ඇත. ස්ථාවර තැන්පතුවල සහ කෙටි කාලීන තැන්පතුවල සිදු කරනු ලබන ආයෝජන පිරිවැයට දක්වා ඇත. එවැනි ආයෝජන වලින් ලැබෙන ආදායම උපචිත පදනමකින් ගණනය කර ඇත.

2.2.7 මුදල් සහ මුදල් සමාන දේ

මුදල් සහ මුදල් සමාන දේ අත ඉතිරි මුදල් සහ ඉල්ලූ විට ආපසු ගැනීම සඳහා බැංකුවල තැන්පත් කර ඇති මුදල් වලින් සමන්විත වේ.

2.2.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර තිබේ

2.2.9 බදු අයකිරීම

බදු වියදම් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි සහ එහි සංශෝධන මගින් සලසා ඇති විවිධාන ප්‍රකාරව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇත.

2.2.10 සේවක ප්‍රතිලාභ

2.2.10.1 නිර්වචිත දායක සැලසුම

නිර්වචිත දායක සැලසුම් සඳහා ඇති බැඳීම දරන ලද වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය සේවකයින්ගේ දළ වැටුප්වලින් 15% ක් හා 3% ක් පිළිවෙලින් අර්ථසාධක අරමුදලට සහ භාර අරමුදලට දායක කරයි.

2.2.10.2 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

පාරිතෝෂිකය නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් වේ. අදාළ ආඥාපනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට මධ්‍යම පරිසර අධිකාරිය බැඳී සිටියි. මෙම වගකීම ඉටු කිරීම පිණිස, සේවකයින් සේවයට බැඳුණු පළමුවන වර්ෂයේ සිට ආරම්භ කර සම්පූර්ණ කරන ලද එක් එක් වර්ෂය සඳහා මුදල් වර්ෂයේ අවසන් මාසයේ දී සියලු ම සේවකයින්ගේ මාසික වැටුපෙන් අර්ධයක ප්‍රමාණයක් පදනම් කරගෙන ගණනය කරනු ලබන මුදලට සමාන මුදලක ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන එනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික මුදලට අදාළව සියලු ම සේවකයින් සඳහා විශ්‍රාම පාරිතෝෂික ගෙවීම පිණිස ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ කාණ්ඩ කර ඇත.

භාණ්ඩාගාරයට අනුව, අවශ්‍ය වූ විට භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දෙන නිසා අරමුදලක් පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.

2.2.11 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් ඉල්ලූ විට හෝ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දිනයේ සිට වර්ෂයක කාලයක් ඇතුළත ගෙවිය යුතු වන වගකීම් වේ. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දිනයෙහි සිට වසරකට වඩා වැඩි කාලයකට පසුව ගෙවීමට ඇති නිග ශේෂයන් ජංගම නොවන වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී දන්නා සියලුම වගකීම් ගණනය කර තිබේ.

2.2.12 ප්‍රදානයන් ගිණුම් කිරීම

2.2.12.1 රජයේ ප්‍රදාන

ඉදිරිපත්කිරීමේ ක්‍රම ද ඇතුළත්ව, රජයේ ප්‍රදානයන් සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත සඳහන් පරිදි වේ:

වත්කම් මිලදීගැනීම සඳහා ලබාදුන් රජයේ ප්‍රදානයන් එම වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලයන් තුළ ලැබූ ආදායම් ලෙස හඳුනාගෙන තිබේ.

විදේශීය නියෝජිතායතන වලින් ලැබුණු අනෙකුත් පුනරාවර්තන ප්‍රදාන සහ ඒ මත දරනු ලැබූ වියදම් ලාභ අලාභ ගිණුමට ඇතුළත් කර ඇත.

පාසල් වැඩසටහන් සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානයන්හි ප්‍රත්‍යක්ෂ වත්කම් නොමැති නිසා එම ප්‍රදානයන් වර්ෂය තුළ වියදමක් ලෙස සළකා ඇත.

2.2.12.2 අනෙකුත් නියෝජිතායතනවලින් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

වෙනත් නියෝජිතායතන වලින් ලැබුණු ප්‍රදානයන් ගණනය කිරීම සඳහා ද රජයෙන් ලැබුණු ප්‍රදානයන් ගණනය කිරීමට යොදාගනු ලැබූ ක්‍රමය ම යොදා ගෙන ඇත.

2021 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරියට පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබේ.

වගුව **51 : 2021** වර්ෂය තුළදී ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන

විස්තරය	රු.
භාණ්ඩාගාරය - පුනරාවර්තන	750,000,000
භාණ්ඩාගාරය - ප්‍රාග්ධන - මුදලින්	55,000,000
සුරකිමු ගංගා	10,101,720
අභ්‍යන්තර ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය පිළිබඳ පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම	8,498,190
CEFAS	4,284,205
ඒකාබද්ධ ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පසුවිපරම් ව්‍යාපෘතිය	3,049,342
එක්සත් ජාතීන්ගේ ප්‍රදාන යටතේ පවත්වන ලද ව්‍යාපාර තරගය - මොණරාගල	628,960
පරිසර නියමු වැඩසටහන	145,000
පරිසර අධ්‍යාපනය සහ දැනුම්වත් කිරීම	105,000

2.2.14 අසම්භාව්‍යයන් සහ වගකීම්

අසම්භාව්‍යයක් යනු පසුගිය සිදුවීමක් හේතුවෙන් ඇතිවිය හැකි වත්කමක් හෝ වගකීමක් විය හැකි අතර, මධ්‍යම පරිසර අධිකාරියේ පාලනයෙන් ඔබ්බෙහි වූ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදුනොවීම මත පමණක් ඒවා තහවුරු වනු ඇත.

හඳුනාගෙන ඇති සියලු ම වගකීම්වල ප්‍රමාණය තීරණය කිරීමේදී ප්‍රත්‍යක්ෂ සියලුම අවදානම් සැලකිල්ලට ගෙන තිබේ. අසම්භාව්‍ය වගකීම් යනු ආර්ථික ප්‍රතිලාභ පවරාදීම සසම්භාවී නොවන හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි, අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම්වලින් පමණක් පැවැත්ම තහවුරු කෙරෙන, ඉදිරියේදී ඇතිවිය හැකි බැඳීම් වේ. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා නොකරන නමුත් ඒවා නුදුරෙහි සිදුවන්නේ නම් එහි අනාවරණය කර ඇත.

අධ්‍යක්ෂ (නීති) විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව, 2021 දෙසැම්බර් 31 දින වන විට මධ්‍යම පරිසර අධිකාරියට එරෙහිව පවරනු ලැබ ඇති, විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 106 ක් වන අතර, ඉන් 05 ක් හිමිකම් ඉල්ලා පවරන ලද නඩු බව පෙනී යයි. මධ්‍යම පරිසර අධිකාරයට එරෙහිව දැනට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩුකර මගින් මධ්‍යම පරිසර අධිකාරියෙහි වාර්තා කර ඇති මූල්‍ය ප්‍රතිඵලවලට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවනු ඇත.

2.2.15 ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සිදුවීම්

ශේෂපත්‍ර දිනයට පසුව සිදුවූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සැළකිල්ලට ගෙන ඇති අතර, යෝග්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදාළ සටහනෙහි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

වගුව **52 :** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

මධ්‍යම පරිසර අධිකාරිය				**පිටුව 01**
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**සටහන**	**2021**	**2020**
				පුනප්‍රකාශිත
			රු.	**රු.**
මෙහෙයුම් ආදායම				
ම.ප.අ. ආදායම		**4**	372,053,921	317,814,571

මධ්‍යම පරිසර අධිකාරිය				**පිටුව 01**
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**සටහන**	**2021**	**2020**
				පුනප්‍රකාශිත
			රු.	**රු.**
පුනරාවර්තන ප්‍රදාන	- භාණ්ඩාගාරය		750,000,000	670,500,000
	- වෙනත්	**4.1**	161,324,157	36,120,516
ප්‍රමාදවී ලැබුණු ආදායම			82,016,119	75,726,689
මුළු ආදායම			**1,365,394,197**	**1,100,161,776**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි		**5**	794,792,961	799,929,951
ගමන් වියදම්		**6**	49,657,888	45,652,026
භාවිතා කරන ලද තොග සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය		**7**	84,725,656	68,818,253
නඩත්තු		**8**	43,831,779	38,978,035
ගිවිසුම්ගත සේවා		**9**	85,704,531	85,530,442
පර්යේෂණ සහ සංවර්ධන		**10**	40,188,281	23,154,930
අගය ක්ෂයවීම සහ ක්‍රමක්ෂය		**11**	143,603,311	137,324,094
වෙනත් මෙහෙයුම් වියදම්		**12**	3,403,288	5,664,876
වැඩසටහන් ක්‍රියාකාරකම්		**13**	140,991,498	30,043,202
මුළු මෙහෙයුම් වියදම්			**1,386,899,194**	**1,235,095,809**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවූ අතිරික්තය/(ඌනතාවය)			**(21,504,997)**	**134,934,033)**
බැංකු ගාස්තු			616,762	577,972
මුළු මෙහෙයුම් නොවන වියදම්			**616,762**	**577,972**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)			**22,121,759)**	**(135,512,005)**
අනෙකුත් විස්තීර්ණ ආදායම්				
ප්‍රත්‍යාගණන සංචිතය			-	243,723,311
මුළු විස්තීර්ණ ආදායම			**(22,121,759)**	**08,211,307**
05 වැනි පිටුවේ සිට 32 වැනි පිටුව දක්වා දී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන්නේය.				

වගුව **53 :** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මධ්‍යම පරිසර අධිකාරිය			**පිටුව 02**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය			
දෙසැම්බර් 31 වන දිනට	**සටහන**	**2021**	**2020**
			පුනප්‍රකාශිත
		රු.	**රු.**
වත්කම්			

මධ්‍යම පරිසර අධිකාරිය			**පිටුව 02**
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය			
දෙසැම්බර් 31 වන දිනට	**සටහන**	**2021**	**2020**
			පුනප්‍රකාශිත
		රු.	**රු.**
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**14**	885,115,348	963,246,243
ආයෝජන	**15**	9,960,000	9,960,000
මාර්ගස්ථ බඩු සහ සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	**16**	52,927,928	36,354,395
		948,003,277	**1,009,560,638**
ජංගම වත්කම්			
තොග	**17**	25,076,674	14,728,271
ලැබිය යුතු මුදල්	**18**	93,620,849	102,539,653
පූර්ව ගෙවීම්	**19**	4,094,857	5,062,736
මුදල් සහ මුදල් සමාන දෑ	**20**	422,697,450	279,148,281
මුළු ජංගම වත්කම්		**545,489,830**	**401,478,941**
මුළු වත්කම්		**1,493,493,106**	**1,411,039,579**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු	**21**	181,187,498	149,717,401
උපචිත වියදම්	**22**	190,131,514	123,678,723
විලම්බිත ආදායම සංචිතය		18,378,000	19,305,280
ජංගම නොවන වගකීම්			
කොම්පෝස්ට් කූඩ සංචිතය		7,887,531	7,887,531
පුනරාවර්තන ප්‍රදාන	**23**	27,871,443	35,968,846
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	**24**	377,888,375	359,068,596
මුළු වගකීම්		**803,344,361**	**695,626,377**
මුළු ශුද්ධ වත්කම්		**690,148,745**	**715,413,202**
ශුද්ධ වත්කම්/හිමිකම්			
සමුච්චිත අරමුදල		74,181,224	74,181,224
ඉදිරියට ගෙනා අතිරික්තය		(385,736,678)	(260,418,380)
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)		(22,121,759)	(135,512,005)
ප්‍රත්‍යාගණන සංචිතය		243,723,311	243,723,311
ප්‍රාග්ධන ප්‍රදානs	**25**	780,102,649	793,439,051
		690,148,745	**715,413,202**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

වගුව **54 :** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**සටහන**	**2021**	**2020**
				පුනප්‍රකාශිත
			රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) මුදල් ප්‍රවාහ				
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ඇතිවූ අතිරික්තය/(ඌනතාවය)			(22,121,759)	(135,512,005)
ගැළපීම්:				
	අගය ක්ෂය කිරීම	**11**	143,603,312	137,324,094
	කොට්ඨාස පරිසර නිලධාරීන්ගේ යතුරුපැදි පවරා දීම මත ලැබුණු ලාභය			(274,500)
	පෙර වර්ෂයේ ගැළපීම්		10,193,706	(1,929,782)
	අත්පිට මුදල් නොවන අයිතම සඳහා ගැළපීම්		(8,639,855)	1,805,934
	ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		(82,016,119)	(75,726,689)
	මූල්‍ය පිරිවැය		616,762	577,972
	පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	**5**	30,487,677	29,373,658
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය			72,123,725	(44,361,319)
	තොග (වැඩිවීම)/ අඩුවීම	**17**	(9,353,659)	(5,140,440)
	ලැබිය යුතු මුදල් (වැඩිවීම)/ අඩුවීම	**18**	8,918,804	13,342,101
	පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	**19**	967,879	2,172,798
	ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම)	**21**	31,470,097	24,009,614
	උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම)	**22**	66,452,791	(15,491,094)
	විලම්බිත ආදායම සංචිතය වැඩිවීම/(අඩුවීම)		(927,280)	(1,817,280)
	පුනරාවර්තන ප්‍රදාන	**23**	(9,092,147)	(7,947,834)
මෙහෙයුම් තුළින් ජනනය වූ මුදල්			160,560,209	(35,233,453)
	ගෙවන ලද මූල්‍ය පිරිවැය		(616,762)	(577,972)
	ගෙවන ලද පාරිතෝෂික		(11,667,898)	(15,184,086)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) ශුද්ධ මුදල් ප්‍රවාහ			**148,275,549**	**(50,995,511)**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**සටහන**	**2021**	**2020**
				පුනප්‍රකාශිත
			රු.	**රු.**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ඇති වූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) මුදල් ප්‍රවාහ				
	දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	**14**	(57,281,058)	(34,621,249)
	මාර්ගස්ථ බඩු සහ සිදු කරමින් පවතින වැඩ	**16**	(16,573,533)	7,003,329
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ඇති වූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) ශුද්ධ මුදල් ප්‍රවාහ			**(73,854,591)**	**(27,617,920)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇති වූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) මුදල් ප්‍රවාහ				
ප්‍රාග්ධන ප්‍රදාන වලින් උපයාගත් /(යොදා ගත්) මුදල		**25**	69,128,212	40,141,250
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇති වූ / (ක්‍රියාකාරකම් වල යොදා ගත්) ශුද්ධ මුදල් ප්‍රවාහ			**69,128,212**	**40,141,250**
මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)			143,549,170	(38,472,181)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ			279,148,281	317,620,462
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ		**20**	422,697,450	279,148,281
05 වැනි පිටුවේ සිට 32 වැනි පිටුව දක්වා දී ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වන්නේය.				

වගුව **55 :** හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

මධ්‍යම පරිසර අධිකාරිය					**පිටුව 03**
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය					
2021 දෙසැම්බර් 31 වන දිනට					
	සමුච්චිත අරමුදල	**මෙහෙයුම් අතිරික්තය/ (ඌනතාවය)**	**ප්‍රාග්ධන ප්‍රදානය**	**ප්‍රත්‍යාගණන සංචිතය**	**මුළු**
	රු.	**රු.**	**රු.**	**රු.**	**රු.**
2020.01.01 දිනට ශේෂය	**74,181,224**	**(245,648,808)**	**745,697,234**	**-**	**574,229,650**
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)	-	(135,512,005)	-	-	(135,512,005)

මධ්‍යම පරිසර අධිකාරිය					**පිටුව 03**
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය					
2021 දෙසැම්බර් 31 වන දිනට					
පෙර වර්ෂයේ ගැළපීම්	-	(1,929,782)	-	-	(1,929,782)
සින්නක්කර වත්කම් කල්බදු වත්කම් ලෙස නැවත වර්ගීකරණය කිරීම	-	(12,839,790)	-		(12,839,790)
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කිරීම	-	-	-	243,723,311	243,723,311
ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ වෙනස්වීම	-	-	47,741,816	-	47,741,816
2020.12.31 දිනට ශේෂය	**74,181,224**	**(395,930,385)**	**793,439,050**	**243,723,311**	**715,413,202**
වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය)	-	(22,121,759)	-	-	(22,121,759)
පෙර වර්ෂයේ ගැළපීම්	-	10,193,706	-	-	10,193,706
ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ වෙනස්වීම	-	0	(13,336,401)	-	(13,336,401)
2021.12.31 දිනට ශේෂය	**74,181,224**	**(407,858,437)**	**780,102,649**	**243,723,311**	**690,148,745**

වගුව **56 :** සටහන **4** ම.ප.අ. ආදායම

මධ්‍යම පරිසර අධිකාරිය				**පිටුව 12**
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා			**2021**	**2020**
			රු.	**රු.**
4	**ම.ප.අ. ආදායම**			
	පරීක්ෂා කිරීමේ ගාස්තු		210,490,189	179,843,177
	ආදායම් බලපත්‍ර ගාස්තු		111,447,908	87,185,318
	ආයෝජන මණ්ඩල පරීක්ෂා කිරීම් ගාස්තු		2,348,610	1,044,359
	ආයෝජන මණ්ඩල බලපත්‍ර ගාස්තු		5,054,750	1,767,944
	උපදේශක ගාස්තු		2,507,922	270,800
	වාතයේ ගුණාත්මක භාවය සහ ශබ්ද මට්ටම පරීක්ෂා කිරීම		2,171,265	2,076,684
	ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු		896,447	731,204
	ජලයේ ගුණාත්මකභාවය		9,435,381	13,290,357
	අධිකරණයේ නඩුවලින් ලැබුණු ආදායම		1,101,775	1,273,363
	ඩිජිටල් සිතියම		2,889	15,296
	පොළී ආදායම		3,715,542	3,558,745
	විවිධ ආදායම්		613,182	643,119

මධ්‍යම පරිසර අධිකාරිය				පිටුව 12
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්				
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා			**2021**	**2020**
			රු.	රු.
	එක් මාසයක වැටුප අයකර ගැනීම		158,688	249,680
	වාහන රක්ෂණ හිමිකම්පෑම් -ම.ප.අ.		989,118	1,579,095
	කොම්පෝස්ට් ආදායම		57,991	206,139
	කාර්මික අපද්‍රව්‍ය ආදායම		5,141,185	8,433,190
	සායනික අපද්‍රව්‍ය - පරිපාලන ගාස්තු		2,250,372	2,408,647
	වීරවිල බංගලාව වෙන්කරගැනීමේ ගාස්තු		6,000	6,050
	ගලි බව්සර් ලියාපදිංචි කිරීම		40,000	180,000
	උපද්‍රවකාරී අපද්‍රව්‍ය වැඩසටහන		9,203,449	10,159,449
	පාරිසරික බලපෑම තක්සේරු කිරීම (පාරිසරික බලපෑම තක්සේරු කිරීම) සහ මූලික පාරිසරික පරීක්ෂණ (IEE) ව්‍යාපෘති ආදායම		4,208,673	-
	බැදුම්කර පියවීම - සේවා නියුක්ති		108,613	-
	විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම		103,972	-
	ගොඩනැගිලි කුලී		-	2,430,556
	බාසල් සම්මුතිය ආදායම		-	164,213
	බැහැර කරන ලද ද්‍රව්‍ය වෙන්දේසිය		-	22,685
	කොට්ඨාස පරිසර නිලධාරීන්ගේ යතුරුපැදි පවරා දීම මගින් ලැබූ ලාභය		-	274,500
			372,053,921	**317,814,571**

වගුව **57 :** සටහන **4 -** වෙනත් පුනරාවර්තන ප්‍රදාන

මධ්‍යම පරිසර අධිකාරිය			පිටුව 13
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්			
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**2021**	**2020**
		රු.	රු.
4	**වෙනත් පුනරාවර්තන ප්‍රදානs**		
	පරිසර නියමු වැඩසටහන - අමාත්‍යාංශය	59,855,000	7,049,427
	ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ වැඩසටහන - සුන්දරපොල	81,827	104,725
	පරිසර අධ්‍යාපන සහ හරිත තිළිණ වැඩසටහන	19,895,000	6,534,291
	පරිසර නියමු කඳවුර - ගාල්ල (සොහා කෙත)	46,355	164,150

මධ්‍යම පරිසර අධිකාරිය			**පිටුව 13**
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්			
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**2021**	**2020**
		රු.	රු.
	ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන පිළිබඳ පසුවිපරම් ව්‍යාපෘතිය	2,709,870	6,941,136
	පෙතියාකන්ද ව්‍යාපෘතිය	6,212,221	5,005,130
	කැළණි ගඟ ආදායම	16,093	11,761
	තෙත්බිම් දින වැඩසටහන	120,000	457,500
	ඕසෝන් වියන දැනුවත් කිරීමේ වැඩසටහන	26,047	-
	CEFAS පරිත්‍යාග ආදායම	1,783,821	-
	ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය පිළිබඳ පසුවිපරම් ක්‍රියාත්මක කිරීම	8,942,946	-
	ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වායු ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	5,900,000	-
	ගුවන්විදුලි වැඩසටහන් ආදායම	233,975	-
	SDF ව්‍යාපෘති ආදායම	19,401,779	-
	විද්‍යුත් අපද්‍රව්‍ය ආදායම	2,240,150	-
	හුස්ම දෙන තුරු ජාතික රුක් රෝපණ වැඩසටහන	228,865	-
	ප්‍රවීණත්වය පරීක්ෂා කිරීමේ වැඩසටහන	20,000	-
	ICEG MAS සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම	190,561	-
	සුරකිමු ගංගා	33,419,646	-
	පරිසර සංරක්ෂණය	-	5,095,725
	පිළිසරු ව්‍යාපෘතිය	-	3,731,762
	H & M කමිටු ගෙවීම්	-	50,000
	ලෝක පරිසර දිනය	-	15,000
	තෙත් බිම් සිතියම්කරණය සහ ප්‍රමුඛතාකරණය	-	341,083
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය-පාසල්	-	14,500
	විද්‍යුත් අපද්‍රව්‍ය වැඩසටහන	-	4,325
	පරිසර නියමු කඳවුර- දකුණු පළාත් සභාව	-	600,000
		161,324,157	**36,120,516**

වගුව **58 :** සටහන **5 -** පුද්ගල පඩිනඩි

මධ්‍යම පරිසර අධිකාරිය			**පිටුව 14**
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්			
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**2021**	**2020**
		රු.	**රු.**
5	**පුද්ගල පඩිනඩි**		
	වැටුප් සහ වේතන	595,380,072	599,087,188
	සේ.අ.අ. දායකත්වය	86,700,571	88,480,417
	සේ.භා.අ. දායකත්වය	17,471,511	17,638,343
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	14,769,943	13,811,620
	ඉතිරි කර ගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම්	38,903,442	40,282,958
	පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	30,487,677	29,373,658
	අධ්‍යක්ෂ මණ්ඩල සහ සභා සාමාජිකයින් සඳහා ගෙවීම්	216,000	168,000
	සභා, කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා විනෝදාස්වාදය	608,712	775,902
	වෘත්තීයවේදී දීමනා	10,255,033	10,311,865
		794,792,961	**799,929,951**

වගුව **59 :** සටහන **6 -** ගමන් වියදම්

6	**ගමන් වියදම්**		
	දේශීය	47,737,390	45,314,296
	විදේශීය	1,920,498	337,730
		49,657,888	**45,652,026**

වගුව **60 :** සටහන **7 -** සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම

7	**භාවිතා කරන ලද සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය**		
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	9,407,326	6,338,261
	ඉන්ධන සහ ප්‍රවාහන	73,645,578	61,510,364
	නිල ඇඳුම්	820,510	650,058
	පුවත්පත්	369,193	307,570
	මුද්‍රණ කටයුතු	483,050	12,000
		84,725,657	**68,818,253**

වගුව **61 :** සටහන **8 –** නඩත්තු

8	**නඩත්තු**		
	මෝටර්වාහන අලුත්වැඩියාව සහ නඩත්තුව	17,580,423	14,471,310

8	**නඩත්තු**		
	ගොඩනැගිලි අලුත්වැඩියාව සහ නඩත්තුව	18,209,396	17,912,168
	කාර්යාල උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව	8,041,960	6,594,556
		43,831,779	**38,978,035**

වගුව **62 :** සටහන **9 -** ගිවිසුම්ගත සේවා

9	**ගිවිසුම්ගත සේවා**		
	විදුලි බලය	9,268,158	11,036,381
	ආරක්ෂක සේවා	27,108,640	26,309,270
	රක්ෂණ	12,064,355	12,708,309
	තැපැල් ගාස්තු	2,894,436	2,939,655
	දුරකථන	11,480,332	11,347,932
	ගොඩනැගිලි කුලී	19,244,355	17,621,263
	ජල සැපයුම	1,357,325	1,510,692
	සාමාජික ගාස්තු	61,931	52,940
	විගණන ගාස්තු	2,225,000	2,004,000
		85,704,531	**85,530,442**

වගුව **63 :** සටහන **10 -** පර්යේෂණ සහ සංවර්ධන

10	**පර්යේෂණ සහ සංවර්ධන**			
	පරිසර අධ්‍යාපන සහ දැනුම්වත් කිරීමේ වියදම්		20,965,252	7,266,122
	පරිසර දූෂණ පාලන	**10.1**	10,491,868	8,206,325
	පරිසර කළමනාකරණ සහ තක්සේරු	**10.2**	1,908,370	3,939,735
	ක්‍රමෝපායික පරිසර ඇගයීම් ඒකකය		16,000	62,247
	විමර්ශන ඒකකය		882,350	279,320
	නීති වියදම්		3,936,831	1,649,076
	මානව සම්පත් සංවර්ධන		1,662,889	1,412,346
	පුස්තකාල ඒකකය		303,071	234,125
	ප්‍රාදේශීය මෙහෙයුම් අංශය		21,650	105,634
			40,188,281	**23,154,930**

වගුව **64 :** සටහන **11 -** අගය ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය

11	**අගය ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය**		
	දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනය	19,760,000	19,760,000

11	**අගය ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය**		
	ගොඩනැගිලි	5,410,847	5,329,159
	මෝටර් වාහන	63,687,192	61,597,404
	ලීබඩු සහ සවිකිරීම්	3,488,253	4,030,218
	පරිගණක සහ උපාංග	12,868,996	17,042,030
	කාර්යාලීය උපකරණ	9,260,369	9,542,279
	රසායනාගාර උපකරණ	13,996,782	12,912,524
	පුස්තකාල පොත්	347,013	469,427
	පිරියත සහ යන්ත්‍රසූත්‍ර	213,403	213,403
	නාම පුවරුව	79,195	86,768
	ප්‍රාදේශීය කාර්යාලය	3,700,688	3,680,218
	සොබාදහම් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය	89,388	139,717
	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වර්ණාලේප කිරීම	1,531,239	1,531,239
	ජංගම රසායනාගාරය	8,275,200	94,961
	රත්නපුර කල්බදු ඉඩම ක්‍රමක්ෂය	315,490	315,490
	ප්‍රධාන කාර්යාල කල්බදු ඉඩම ක්‍රමක්ෂය	579,256	579,256
		143,603,312	**137,324,094**

වගුව **65 :** සටහන **12 -** වෙනත් මෙහෙයුම් වියදම්

12	**වෙනත් මෙහෙයුම් වියදම්**		
	මාධ්‍යවල වෙළඳ දැන්වීම්	301,006	511,799
	විවිධ	52,353	33,715
	සුභසාධන වියදම්	2,907,624	3,074,588
	ජාතික උත්සව	142,305	2,044,774
		3,403,288	**5,664,876**

වගුව **66 :** සටහන **13 -** වැඩසටහන් ක්‍රියාකාරකම්

13	**වැඩසටහන් ක්‍රියාකාරකම්**		
	පරිසර නියමු වැඩසටහන - අමාත්‍යාංශය	59,750,000	7,591,446
	දොම්පේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වියදම්	11,347	3,865,693
	පෙතියාකන්ද වියදම්	6,212,221	5,005,130
	කැළණි ගඟ වියදම්	16,093	12,935
	ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන පිළිබඳ පසුවිපරම් ව්‍යාපෘතිය	2,709,870	2,628,492

13	**වැඩසටහන් ක්‍රියාකාරකම්**		
	ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව බැක්ටීරියා විද්‍යාත්මක පරීක්ෂණය	40,500	74,520
	තෙත්බිම් දිනය වියදම්	120,250	457,500
	සරකිමු ගංගා	33,419,646	-
	SDF ව්‍යාපෘති වියදම්	19,401,779	-
	ගුවන් විදුලි වැඩසටහන් වියදම්	233,975	-
	වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ වියදම්	1,042,036	-
	ඕසෝන් වියන දැනුම්වත් කිරීමේ වැඩසටහනේ වියදම්	26,047	-
	පරිසර නියමු වැඩසටහන් වියදම්- ගාල්ල. සොබා කෙත	46,355	-
	හුස්ම දෙන තුරු ජාතික රුක් රෝපණ වැඩසටහන	228,865	-
	ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලාශවල ගුණාත්මභාවය පරීක්ෂා කිරීම සඳහා වන පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම	9,765,516	-
	ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වාතයේ ගුණාත්කභාවය වැඩිදියුණු කිරීම	5,900,000	-
	ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ මාර්ගගත වැඩසටහනේ වියදම්	81,852	-
	ICEG වියදම් සඳහා අනුග්‍රාහකත්වය	201,325	-
	CEFAS පරිත්‍යාග ආශ්‍රිත වියදම්	1,783,821	-
	පරිසර නියමු කඳවුර - ගාල්ල	-	164,150
	පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන	-	4,956,226
	පිළිසරු ව්‍යාපෘතිය	-	3,731,762
	ලෝක පරිසර දිනය	-	15,000
	එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) - විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන	-	73,015
	තෙත්බිම් සිතියම්කරණය සහ ප්‍රමුඛත්වය ලබාදීම	-	341,083
	SAICM පරිසර දූෂණ පාලනය	-	300,000
	ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වියදම් - සුන්දරපොල	-	104,725
	දැනුම්වත් කිරීමේ වැඩසටහනේ වියදම් - මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර.	-	28,424
	MAS ක්‍රීඩා - රුක් රෝපණවැඩසටහන් වියදම්	-	92,395
	නියමු කඳවුර - දකුණු පළාත	-	600,705
		140,991,498	**30,043,202**

වගුව **67 :** සටහන **15 –** ආයෝජන

15	**ආයෝජන**		
	භාණ්ඩාගාර බිල්පත් - ලංකා බැංකුව	9,960,000	9,960,000
		9,960,000	**9,960,000**

වගුව **68 :** සටහන **16 -** මාර්ගස්ථ බඩු සහ සිදු කරමින් පවත්න වැඩ

16	**මාර්ගස්ථ බඩු සහ සිදු කරමින් පවතින වැඩ**		
	ප්‍රාග්ධන	48,465,247	31,891,713
	රන්දෙණිය සොබා කෙත	4,168,141	4,168,141
	රත්නපුර කාර්යාල ගොඩනැගිල්ල හූ තාක්ෂණ	294,541	294,541
		52,927,929	**36,354,395**

වගුව **69 :** සටහන **17 –** තොග

17	**තොග**		
	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	8,324,844	8,555,042
	පොත් සහ ප්‍රකාශන	13,365,178	3,405,797
	මෝටර් රථ අමතර කොටස්	1,202,360	1,564,592
	විද්‍යුත් උපකරණ	397,068	523,720
	ඩීසල් තොගය	792,480	679,120
	රසායනාගාර උපකරණ අමතර කොටස් (CEFAS පරිත්‍යාග)	994,744	-
		25,076,674	**14,728,271**

වගුව **70 :** සටහන **18 –** අය විය යුතු මුදල්

18	**අය විය යුතු මුදල්**			
	විවිධ අත්තිකාරම්	**18.1**	108,859	107,863
	නොපියවූ මිලදී ගැනීම් අත්තිකාරම්	**18.2**	2,539,534	2,780,592
	ලැබිය යුතු තැන්පතු	**18.3**	1,516,311	1,394,125
	යතුරුපැදි ණය - රියදුරු	**18.4**	129,649	550,315
	පාරිසරික බලපෑම තක්සේරු කිරීම අත්තිකාරම් පාරිසරික බලපෑම තක්සේරු කිරීම අය විය යුතු	**18.5**	83,223	395,940
	ආපදා ණය		80,466,422	89,394,469
	උත්සව අත්තිකාරම්		315,350	279,850
	පවුල් වෛද්‍ය රක්ෂණය		304,088	371,366
	විශේෂ අත්තිකාරම්		75,059	75,859
	මුදල් අග්‍රිම		5,000	5,000
	වැටුප් අත්තිකාරම්		175,077	7,819
	දොම්පේ අය විය යුතු		4,929,405	7,174,955
	EEA අත්තිකාරම්		30,735	-
	පූර්ව ගෙවීම්		1,675,350	-

18	**අය විය යුතු මුදල්**			
	CEFAS විසින් ප්‍රතිපූරණය කරන ලද රේගු නිෂ්කාශන වියදම්		1,266,786	-
	පොලිතින් වැටලීම් අත්තිකාරම්-කළුතර ප්‍රාදේශීය කාර්යාලය		-	1,500
			93,620,849	**102,539,653**

වගුව **71 :** සටහන **19 –** පූර්ව ගෙවීම්

19	**පූර්ව ගෙවීම්**			
	කල්තබා ගෙවීම්	**19.1**	4,079,418	5,047,298
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ අත්තිකාරම් අග්‍රිම		15,439	15,439
			4,094,857	**5,062,737**

වගුව **72 :** සටහන **20 -** මුදල් සහ මුදල් සමාන දෑ

20	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	ලංකා බැංකුව, පැලවත්ත - - ජංගම ගිණුම් අංක 0002937303	208,592,020	276,438,462
	ලංකා බැංකුව, ආයතනික ශාඛාව - ජංගම ගිණුම් අංක 1608	214,105,430	2,709,819
		422,697,450	**279,148,281**

වගුව **73 :** සටහන **21 –** ගෙවිය යුතු

21	**ගෙවිය යුතු**			
	පාරිසරික බලපෑම තක්සේරු කිරීම් ව්‍යාපෘති	**21.1**	169,421,327	140,432,753
	ගෙවිය යුතු තැන්පතු		35,514	35,514
	යතුරු පැදි සඳහා ලැබුණු අත්තිකාරම්		2,862,570	2,734,391
	ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු		887,764	865,717
	වෛද්‍ය රක්ෂණ හිමිකම්පෑම්		204,363	204,362
	ගෙවිය යුතු මුද්දර බදු		4,904,305	3,092,518
	රඳවා ගැනීමේ ගාස්තු		1,260,056	1,152,565
	යතුරු පැදි රක්ෂණය		69,851	69,851
	බාසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම		174,365	174,365
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දීමනා (කොට්ඨාස කාර්යාලය)		3,000	3,000
	කාර්යසාධන බැඳුම්කර		40,210	93,670
	ඝායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩසටහන ගෙවිය යුතු		323,669	319,309
	ගෙවිය යුතු මෝටර් රථ ණය		6,667	-
	අත්තිකාරම් පොළී ගිණුම		224,380	-
	ගෙවිය යුතු පාරිතෝෂික ගිණුම		769,458	-

21	ගෙවිය යුතු			
	ලැබුණු SDF ව්‍යාපෘති අත්තිකාරම්		-	90,000
	උත්සව අත්තිකාරම් - ලංකා බැංකුව		-	210,000
	කල්තබා ලැබුණු පොළී (ස්ථාවර තැන්පතු)		-	239,388
			181,187,498	**149,717,402**

වගුව **74 :** සටහන **22 -** උපචිත වියදම්

22	**උපචිත වියදම්**		
	වැටුප් සහ වේතන	5,442,384	5,618,099
	සේ.අ.අ.	7,286,077	7,327,676
	සේ.නි.භා.අ.	1,457,215	1,465,535
	අතිකාල	1,921,462	1,620,163
	දේශීය ගමන් වියදම්	4,910,247	4,085,090
	ගොඩනැගිලි අලුත්වැඩියා සහ නඩත්තු	2,531,185	1,430,603
	කාර්යාලීය උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු	1,152,030	2,096,050
	ආරක්ෂක ගාස්තු	4,516,740	6,208,500
	විදුලිබල ගාස්තු	1,489,236	904,858
	ඉන්ධන සහ ප්‍රවාහන	10,250,437	5,190,568
	ලිපිද්‍රව්‍ය	1,023,206	722,670
	විදුලි සංදේශ	1,015,540	1,163,199
	පුවත්පත්	22,040	27,300
	ජල සැපයුම්	54,290	97,812
	ගෙවිය යුතු වැට් බදු	3,716,846	5,252,289
	විගණන ගාස්තු	6,557,425	4,108,200
	NRM අංශය	99,895	1,013,155
	පාසල් වැඩසටහන - අමාත්‍යාංශය	31,082,818	1,745,142
	සුභසාධන වියදම්	46,925	454,365
	රක්ෂණය	1,163,135	1,044,495
	උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණ අංශය	1,064,558	45,000
	WIP ප්‍රාග්ධන වත්කම්	35,915,452	22,951,348
	මෝටර් රථ අලුත්වැඩියා කිරීම	1,504,344	1,574,291
	අසනීප නිවාඩු	38,995,865	41,010,497
	දේශීය පුහුණු	106,877	229,740
	තැපැල් ගාස්තු	29,203	16,475
	පාසල් වැඩසටහන (317)	7,397,055	394,095
	කාර්යාල ගොඩනැගිලි කුලී	2,198,900	1,486,800
	පරිසර දූෂණ පාලනය	515,990	628,960
	රසායනාගාරය	1,947,841	1,709,153
	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය	544,799	69,233
	SEA ඒකකය	188,530	190,530
	විමර්ශන අංශය	289,500	57,000

22	උපචිත වියදම්		
	WEPA ව්‍යාපෘතිය	409,875	409,875
	පෙතියාකන්ද	1,170,725	25,333
	සැලසුම් අංශය	4,527	22,815
	කැළණි ගඟ වියදම්	2,761	1,174
	නීති අංශය	136,620	568,250
	පුස්තකාල තොරතුරු කේන්ද්‍රය	2,300	17,696
	සරකිමු ගංගා	333,877	-
	පාරිසරික පුවත් ලිපි	467,975	-
	සාමාජික ගාස්තු	8,000	-
	ඕසෝන් වියන දැනුම්වත් කිරීමේ වැඩසටහන	4,650	-
	අනුකූලතාවය අධීක්ෂණය කිරීම	55,000	-
	ඒකාබද්ධ පසුවිපරම් වැඩසටහන	888,705	-
	හුස්ම දෙන තුරු ජාතික රුක් රෝපණ වැඩසටහන	2,000	-
	පසුවිපරම් ක්‍රියාත්මක කිරීම	5,453,192	-
	ශ්‍රී ලංකාවේ ගෘහස්ත වාතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	4,751,410	-
	මාර්ගගතව ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම	1,852	-
	මාධ්‍යවල වෙළඳ දැන්වීම් පළ කිරීම	-	74,588
	දොම්පේ සනීපාරක්ෂක කසල රඳවනය	-	620,102
		190,131,514	**123,678,723**

වගුව **75 :** සටහන **23 -** පුනරාවර්තන ප්‍රදාන

23	පුනරාවර්තන ප්‍රදානs		
	මාලේ ප්‍රකාශනය	1,146,316	1,146,316
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රදාන	14,531,330	14,531,330
	GIS තොරතුරු පද්ධතිය	67,009	67,009
	පරිසර දූෂණ ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත සංචිතය සකස් කිරීම	110,732	110,732
	මහා පරිමාණ ජලයේ ගුණාත්මකභාවය ප්‍රදාන	659,937	659,937
	KITA ප්‍රදාන	105,822	105,822
	ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ වැඩසටහ	509,422	509,422
	SAICM පරිසර දූෂණ පාලනය	1,520,268	1,520,267
	කැළණි ගඟ ප්‍රදාන	585,355	602,622
	ජලයේ ගුණාත්මකභාවය - ප්‍රධාන ජලාශ	1,116,259	1,116,258
	දොම්පේ ප්‍රදාන	944,287	957,463
	පරිසර නියමු වැඩසටහන - ගාල්ල	190,090	236,445

වගුව **76 :** සටහන **24 -** පාරිතෝෂික සඳහා වෙන් කිරීම

	ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පර්යේෂණ ආයතනය	190,657	190,657
	උපදුවකාරී අපද්‍රව්‍ය පිළිබඳ දීපව්‍යාප්ත සමීක්ෂණය	1,672,419	1,672,419
	තෙත්බිම් සිතියම්කරණය සහ ප්‍රමුඛතාකරණය	480,164	480,164
	එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) - විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන	72,940	961,666
	මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර සඳහා දැනුම්වත් කිරීමේ වැඩමුළුව	123,540	123,540
	විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රදාන	500,000	500,000
	ගුවන්විදුලි වැඩසටහන් ප්‍රදාන	13,465	247,440
	ඕසෝන් වියන දැනුම්වත් කිරීමේ වැඩසටහන	273,954	-
	හුස්ම දෙන තුරු රුක් රෝපණ වැඩසටහන	540,635	-
	CEFAS ආයතනය - රසායනාගාර පරිත්‍යාග	994,744	-
	මාර්ගගතව ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම	1,520,673	-
	පිළිසරු ව්‍යාපෘතිය	1,426	-
	S & D කෙමිකල් - රුක් රෝපණ ප්‍රදාන	-	78
	පොලිතින් පිළිබඳ ජාතික වැඩසටහන	-	13,040
	ආසියාවේ ජල පාරිසරක සහයෝගීත්වය	-	1,415
	ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පසුවිපරම් ව්‍යාපෘතිය	-	7,357,463
	තෙත්බිම් දිනය	-	112,500
	අභ්‍යන්තර ජලාශවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම	-	2,628,492
	සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවා	-	115,801
	පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය	-	48
		27,871,443	**35,968,846**

24	පාරිතෝෂික සඳහා වෙන් කිරීම	377,888,375	359,068,596
		377,888,375	**359,068,596**

වගුව **77 : :** සටහන **25 -** ප්‍රාග්ධන ප්‍රදාන

25	**ප්‍රාග්ධන ප්‍රදාන**	**රු.**	**රු.**
	නෙදර්ලන්ත ප්‍රාග්ධන ප්‍රදාන	2,028,383	2,107,499
	EA1P ප්‍රදාන	4,002,801	4,176,836
	ප්‍රාග්ධන ප්‍රදාන - භාණ්ඩාගාර අරමුදල්	232,540,252	213,431,113
	පුස්තකාල පොත් ප්‍රදාන	3,711	6,660

25	ප්‍රාග්ධන ප්‍රදාන	රු.	රු.
	අන්තර්ජාතික සංවර්ධන සංගමය	72,774,613	89,763,163
	ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ප්‍රාග්ධන ප්‍රදාන	476,038	588,426
	GIS ප්‍රාග්ධන ප්‍රදාන	289,505	407,872
	සොබා දහම් ක්ෂේත්‍ර මධ්‍යස්ථානය ප්‍රදාන	312,500	325,000
	අතරමැදි මහල	16,875,000	17,500,000
	පුස්තකාල තොරතුරු කේන්ද්‍රය	112,201	278,286
	නියමු වැඩසටහන - අමාත්‍යාංශ අරමුදල්	556,458	730,493
	මධ්‍යම පරිසර අධිකාරියේ රසායනාගාරය ශක්තිමත් කිරීම	39,289,001	49,466,834
	පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය	10,826	10,826
	SAICM උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය	104,578	158,867
	SAICM පරිසර දූෂණ පාලනය	617,415	932,755
	පිළිසරු ව්‍යාපෘතිය - රසායනාගාර උපකරණ	1,485,092	2,042,361
	EDCF ගොඩනැගිලි අරමුදල	1,342,991	1,384,960
	KOICA ප්‍රාග්ධන ප්‍රදාන	286,559,440	306,337,579
	ජලයේ ගුණාත්මකභාවය - JAICA	2,926,950	3,712,223
	ජලය අධීක්ෂණය කිරීම (JICA)	489,667	713,592
	යුනිසෙෆ් (UNICEF)	41,600	52,000
	UNREDD වැඩසටහන	1,020,833	1,195,833
	පරිසර සංරක්ෂණ ව්‍යාපෘතිය	9,068,653	10,438,227
	UNESCO ප්‍රාග්ධන ප්‍රදාන	72,417	88,217
	පරිසරය පිළිබඳ දැනුම්වත් කිරීම සහ හරිත තිළිණ	880,445	834,740
	WEPA	1,693,426	1,958,099
	ඩිලූ ට්‍රාන්ස්පෝර්ට් (පුද්) සමාගම	21,921	26,121
	කැපිටල් මහරාජා ඕර්ගනයිසේෂන් සමාගම	142,194	165,494
	අමාත්‍යාංශය - මෝටර් වාහන	700,000	1,400,000
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය කොට්ඨාස කාර්යාලය - මෝටර් වාහන	175,000	350,000
	කැළණි ගඟ ප්‍රාග්ධන ප්‍රදාන	44,652	44,652
	ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ රසායනාගාර සවිබල ගැන්වීම	99,204	110,604
	VET දෙපාර්තමේන්තු වැඩසටහන - මෝටර් වාහන	80,974,867	82,657,039
	ව්‍යාපාර තරඟය - මොණරාගල - ප්‍රාග්ධන ප්‍රදාන	612,296	-
	ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පසුවිපරම් වැජසටහන	2,787,184	-
	සුරකිමු ගංගා	6,554,211	-

25	ප්‍රාග්ධන ප්‍රදාන	රු.	රු.
	පසුවිපරම් ක්‍රියාත්මක කිරීම- ප්‍රාග්ධන වත්කම්	8,330,483	-
	CEFAS පරිත්‍යාග ප්‍රාග්ධන ප්‍රදාන	4,085,841	
	ජංගම දුරකථන ආරක්ෂිත ලෙස බැහැර කිරීම	-	28,840
	ජෝන් කීල්ස් පදනම	-	11,820
		780,102,649	**793,398,391**

Chapter 20 : විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } FWL/B/CEA/01/21/17 මෙබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූනි 29 දින

සභාපති,
මධ්‍යම පරිසර අධිකාරිය.

මධ්‍යම පරිසර අධිකාරියේ 2021 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මධ්‍යම පරිසර අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මාර්ගස්ථ තොග ශේෂය තුළ ස්ථාවර වත්කම් මිලදීගැනීමට ලබාදී ඇති රු.8,054,407 ක්ද,ගෙවීමක් සිදු නොකරන ලද අයිතම 17 ක වටිනාකම වූ රු. 8,856,689 ක මුදලක්ද මාර්ගස්ථ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2021 ජනවාරි 01 දිනට මාර්ගස්ථ තොග ශේෂය තුල ඇතුලත්ව තිබුණු රු.1,430,000 වටිනා වායු සමීකරණ යන්ත්‍ර 03 ක වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට වූ මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂයෙන් ඉවත් කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු මාර්ගස්ථ තොග ශේෂයේ වටිනාකම රු.18,341,096 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් අධිකාරියට පවරා දී තිබුණු ඉඩමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවීමට නියම කරන ලද පොලී මුදල වූ රු.17,770,995 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. මෙම නිසා වර්ෂයේ ඌණතාවය ඉහත අගයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) 2004 වර්ෂයේ සිට කොම්පෝස්ට් බඳුන් විකිණීමෙන් ලද මුදලින් ආදායම් ගිණුමට බැර විය යුතු ප්‍රමාණය හඳුනා ගැනීමකින් තොරව රු.7,887,531 ක ශේෂයක් ජංගම නොවන වගකීම් යටතේ කොම්පෝස්ට් බඳුන් සංචිත ලෙස ගිණුම් ගත කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අඳාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 751	2021 දෙසැම්බර් 27 දින රු.15,434,000 ක මුදලකට අධිකාරිය නමින් මිලදී ගනු ලැබූ ට්‍රැක්ටර් හතර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.
(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ 111 පරිච්ඡේදය	සුරකිමු ගංඟා ජාතික පාරිසරික වැඩසටහන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පත්කර තිබූ වැඩසටහන් කළමනාකරුවෙකු වෙත 2021 අප්‍රේල් මස සිට දෙසැම්බර් දක්වා මාසික වැටුප හා ඉන්ධන දීමනාව වශයෙන් මසකට රු.170,000 බැගින් ගෙවීම් කර තිබුණු අතර මේ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.
(ඇ) කොම්ප්ට්‍රෝල් ජනරාල්ගේ 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	
i. 2(අ) ඡේදය	අධිකාරියට අයත් වාහන 03 ක් අපහරණය සඳහා යෝජනා කර තිබුණද 2022 මැයි 15 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
ii. 2 (ආ) ඡේදය	අධිකාරියට අයත් වාහන 04 ක් සම්බන්ධයෙන්

	අළුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය	2019 හා 2020 වර්ෂවලට අදාලව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
(ඉ) 2021 ඔක්තෝබර් 06 දිනැති අමප/022/321/1679/ටී බී ආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය	මධ්‍යම පලාත් කාර්යාලයේ පලමු මහලේ ඉදි කිරීම කටයුතු සඳහා 2021 අගෝස්තු 26 දින රු.5,000,000 ක මුදලක් පරිසර අමාත්‍යාංශය මඟින් අධිකාරියට ලබා දී තිබුණ ද 2021 ඔක්තෝබර් 06 දිනැති අමප/022/321/1679/ටී බී ආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලෙස දන්වා තිබුණි. ඒ අනුව, අධිකාරිය මෙම මුදල ආපසු හරවා යැවීමට 2021 දෙසැම්බර් 20 දින තෙක් මාස තුනකට ආසන්න කාලයක් ප්‍රමාද කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 24(ඈ) -2(1) වගන්තිය	පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වගකිව යුතු බව දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශයට පත් කර තිබූ පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ 05 කට අදාලව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී

ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) රු.1,083,333 ක් වැය කර තණ කොල කපන යන්ත්‍ර 60 ක් (Bush cutter) 2021 දෙසැම්බර් 27 දින මිලදීගෙන තිබුණු අතර 2022 අප්‍රේල් 7 දින සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී ඉන් යන්ත්‍ර 55 ක් භාවිතා නොකර මාස 04 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2021 වර්ෂය තුළදී රු.7,420,000 ක් වැය කර මිලට ගෙන තිබූ පරිසර නියමු කැප වටිනාකමින් සියයට 84.53 ක් එනම් රු.6,272,000 ක් වටිනා කැප 2022 මාර්තු 18 දින වන විටත් අදාල කාර්යය වෙනුවෙන් යොදුවා නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල 25 කට අදාල බැංකු ගිණුම් 21 ක 2021 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු.201,109,015 ක ශේෂය අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුමට බැර විය යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දින වන විට කාර්යාල 18 කින් එකතු කරන ලද ආදායම් බැර නොවී පැවතුණි.

(ආ) අධිකාරියට අවුරුදු 50 ක බදු පදනම මත 2000 වර්ෂයේ අතිරේකව ලබා ගත් පර්චස් 129.88 ඉඩම් කොටස වර්ෂ 19 කට වැඩි කාලයක් භුක්ති විඳීම සිදුකර තිබුණද අදාල බදු මුදල් ගෙවා නීත්‍යානුකූලව පවරා ගැනීමක් සිදුකර නොතිබුණි. මෙම ඉඩම් කොටස නීත්‍යානුකූලව පවරා නොගැනීම නිසා එයින් පර්චස් 20 ක ඉඩම් කොටසක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් විදුලිබල මණ්ඩලයට ලබා දීමට කටයුතු කිරීම නිසා අධිකාරියට එම ඉඩම් ප්‍රමාණය අහිමි වී තිබුණි.

(ඇ) සුරකිමු ගංගා වැඩසටහනේ අරමුණු වලට පටහැනිව එම ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් රු.2,030,000 ක් වැය කර Electric cart රථයක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත විගණිත දිනය වන විටත් සංශෝධනය කර නොතිබුණි.

පිටුව 8 | 9

(ඉ) පිළිසරු ව්‍යාපෘතිය විසින් අධිකාරිය වෙත 2018 දෙසැම්බර් 06 දින ලබා දී තිබූ වාහන තුනක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පරිසර කළමනාකරණ කටයුතු සිදු කිරීමේදී කොරතුරු රැස්කිරීම අරමුණු කොටගෙන රු.මිලියන 1.39 කට 2020 දෙසැම්බර් 15 දින මිලදීගෙන තිබූ ඩ්‍රෝන යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

(උ) 2021 වර්ෂයේ පරිසර අමාත්‍යාංශයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර තිබූ අධිකාරියේ Eco Club Materials and EPP Materials හි ප්‍රගතියට අදාලව ඉදිරිපත් කර තිබූ අයිතම 15 ක සත්‍ය වශයෙන් ආයතන වෙත බෙදාහරින ලද ප්‍රමාණයන් අතර ඒකක 387,523 ක වෙනසක් පැවතුණි.

(ඌ) ක්‍රියාකාරී සැලැස්මේ අයිතම අංක 2.3.3 යටතේ අධිකාරියේ සියලුම රසායනාගාර සඳහා Procurement of consumables glassware chemicals and safety requirements මිලදී ගැනීම සඳහා රු.මිලියන 2 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති